
Enid Blyton
මැලෝරි ටවර්ස් පාසල
MALORY TOWERS 6
අවසන් වාරය
පරිවර්තනය
ගාමිණී සමරකෝන්

# 01

'මගේ අවසන් වාරය...!' පහත මාලයට බැසීමට සූදානම් වන අතරේ ඩැරල් සිතුවා. 'මගේ අන්තිම වාරය...! ඊළඟ උපන් දිනයට මට දහ අටක්. මම දැන් හුඟක් ලොකුයි.'

පහතින් කෑ ගැසීමක් නැඟුණා.

"ඩැරල්...! ඔයා එන්නේ නැද්ද? තාත්තා අහනවා, අද ද නැති නම් හෙට ද යන්නේ කියලා."

"එනවෝ...!" ඩැරල් ආපසු කෑ ගැසුවා.

ටෙනිස් පිත්ත හා කුඩා සූට්කේසය වහා අතට ගත් ඈ සුපුරුදු පරිදි එකවර පඩි දෙකක් බසිමින් පහත මාලයට දිව ගියා.

"මේ නිල ඇඳුම ඇඳගෙන මම ඔයත් එක්ක යන අවසාන වතාව." ඩැරල් තරමක් බැරෑරුම්ව කිව්වා. "ඊළඟ වාරයේ ඔයා යන්නේ තනියම ෆෙලිසිටි. කොහොමද, ඔයා ඒකට කැමතිද?"

"කොහෙත්ම නැහැ." ෆෙලිසිටි කීවේ තරමක සතුටින්. "ඒත් ඔයාට විශ්වවිද්‍යාලයට ගිහින් සතුටින් කාලය ගෙවන්න පුළුවන් නේ. ඔය තරම් ආඩම්බර වෙන්න එපා."

"කොහොම වුණත් අවසානය කවදත් ටිකක් දුකයි." ඩැරල් කිව්වා.

ඈ ෆෙලිසිටි සමග මෝටර් රථය බලා පිටතට ගියා. ඔවුන්ගේ පියා රථයේ නළාව හැඬවීමට ආසන්නව සිටියා.

"දෙවියන්ගේ පිහිටයි. අන්තිමට ඔයාලා දෙන්නා ආවා." ඔහු කිව්වා. "නගින්න...! දැන් අම්මා කොහේද? ලාභට ගෙම්බෝ එකතු කරනවා වගේ. ඇත්තටම මේ පවුලට හරක් දක්කන මිනිහෙක් ඕනෑ කරනවා කට්ටිය ගාල් කරන්න...! ඇති යන්තම්, මෙන්න එනවා...!"

රිවර්ස් මහත්මිය රථයට නගිත්ම ෆෙලිසිටි නැවතත් බැස ගත්තා. එය නොදුටු ඇගේ පියා රථය පණ ගැන්වූවා. ඩැරල් බෙරිහන් දුන්නා.

"තාත්තා.... තාත්තා...! ඉන්න... ෆෙලිසිටි බැහැලා...!"

ඔහු මව්තයෙන් වටපිට බැලුවා.

"ඒත් මම දැක්කා එයා නගිනවා." ඔහු කිව්වා. "අපොයි, එයා කොහේද ගියේ?"

"මම හිතන්නේ එයාට අමතක වෙලා කට්ටියට ආයුබෝවන් කියන්න." ඩැරල් සිනාවක් නගමින් කිව්වා.

වේගයෙන් දිව ආ ෆෙලිසිටි නැවත මතු වුණා. හති දමමින් ඈ රථය තුළට පැන ගත්තා.

"වත්තේ වැඩ කරන කෙනාට කියන්න බැරි වුණා." ඈ කිව්වා. "මගේ පැළ ටික බලාගන්න එයා පොරොන්දු වුණා. මගේ ස්ට්‍රෝබෙරි ගස්වල ගෙඩි කීයක් හැදෙයි ද කියලා එයා ගණන් කරන්නම් කිව්වා. අනේ මේ හැම දෙයක්ම දාලා යන්න දුකයි."

"එහෙමනම් නවතින්න." ඩැරල් කිව්වා.

"ඒත්, මට යන්න ඕනෑ." ෆෙලිසිටි කිව්වා. "හැමදේටම ආයුබෝවන් කියලා එක රවුමක් ගිහින් ආවට පස්සේ මට හිතෙනවා මට ආසාවෙන් ඉස්කෝලයට යන්න පුළුවන් කියලා. මේ... මම කල්පනා කළේ අර එපා කරපු ජොසපින් ආපසු එනවාද කියලයි. එයා කිය කියා හිටියේ එයාගේ අහංකාර පවුලේ අයත් එක්ක ඇමෙරිකාවට යනව ද මොකක්ද කියලා. ගිහිල්ලා නම් හොඳයි."

"මමත් හිතනවා හොඳයි කියලා." කට සැර, අවිනීත ගති ඇති ජොසපින් ජෝන්ස්ව සිහි වූ ඩැරල් කිව්වා. "කොහොම වුණත් එයා මැලෝරි ටවර්ස්වලට ගැළපෙන්නේ නැහැ. මට හිතාගන්න බැහැ, ප්‍රින්සිපල් මැඩම් එයාව ගත්තේ ඇයි කියලා."

"හරි, මම හිතන්නේ එයා හිතන්න ඇති මැලෝරි ටවර්ස්වලදී එයා ටිකක් හොඳ කෙනෙක් වෙලා මොනවා හරි ඉගෙන ගනියි කියලා." ෆෙලිසිටි කිව්වා. "හුඟක් අයට එහේදී යහපත් අතට වෙනස් වෙන්න පුළුවන්. මම වුණත් බලන්න."

"අපොයි... යහපත් වෙලා ද?" ඩැරල් ව්‍යාජ මුහුණක් මවා ගනිමින් කිව්වා. "දැනගන්නත් සතුටුයි. අපොයි... මේක මගේ අවසාන වාරය නොවුණා නම් කියලා හිතෙනවා. මීට අවුරුදු හයකට ඉස්සර, අවුරුදු දොළහක කුණිස්සෙක් වගේ මම මුලින්ම ඉස්කෝලයට ගිහින් වැඩි කාලයක් ගතවෙලා නැහැ වගේ පෙනෙන්නේ."

"ඔන්න, ආයෙත් අඬන්න වගේ කතාව." ෆෙලිසිටි විනෝදයෙන් කිව්වා. "මට හිතාගන්න බැහැ, ඔයාට ආඩම්බර වෙන්න, සතුටු වෙන්න බැරි ඇයි කියලා. ඔයා පන්ති දෙකක ක්‍රීඩා නායිකාව වුණා, ඔයා පන්ති කීපයක නායිකාව වෙලා හිටියා. දැන් ඔයා මුළු ඉස්කෝලයේම ප්‍රධාන ශිෂ්‍ය නායිකාව හැටියට වාර දෙකක් ඉඳලා තියෙනවා. මට කවදාවත් එහෙම වෙන්න බැරි වෙයි."

"මම හිතනවා ඔයාට ඒක පුළුවන් කියලා." ඩැරල් කිව්වා. "කොහොම වුණත් සැලීයි, මමයි දෙන්නම එකම විශ්වවිද්‍යාලයකට යන එක ගැන මට සතුටුයි. අපි දෙන්නා තවම ඉන්නේ එකට. තාත්තා, අමතක කරන්න එපා. අපි සැලීව එක්ක යන්න ඕනෑ."

"මට අමතක වෙලා නැහැ." ඇගේ පියා කිව්වා.

ඔහු සැලී හෝප්ගේ නිවසට යන පාරට රථය හැරෙව්වා. ඉක්මනින්ම ඔවුන් ඇගේ මිදුල හරහා යන විට සැලී හා වයස අවුරුදු හයක් හෝ හතක් වන ඇගේ නැගණිය ඉදිරි පඩි මත රැඳී සිටියා.

"හලෝ ඩැරල්, හලෝ ෆෙලිසිටි." සැලී හඬ නැගුවා. "මම ලෑස්තියි. අම්මා... ඔයා කොහේද? ඩැරල්ලා ඇවිදින්...!" සැලීගේ කුඩා නැගණිය කතා කළා. "මමත් දවසක මැලෝරි ටවර්ස්වලට එනවා...! තව අවුරුදු හයකින්."

"ඒක වාසනාවක්, ඩැෆී...!" ෆෙලිසිටි හඬ නගා කිව්වා. "ඒක තමයි ලෝකයේම තියෙන හොඳම ඉස්කෝලය."

රථයට ගොඩ වූ සැලී, ඩැරල් හා ෆෙලිසිටි අතර තෙරපී වාඩි වුණා. ඇය අත වනා සමුගත් පසු ඔවුන් නැවත ගමන් ඇරඹුවා.

"මේ අවසාන වතාව ඩැරල්...!" ඈ කිව්වා. "මේ පළමු වතාව නම් කියලා හිතෙනවා."

"ඔ... ආයෙත් පටන් ගන්න එපා." ෆෙලිසිටි කිව්වා. "ගමන පුරාම ඩැරල් කෙඳිරි ගගා ආවේ."

"ඔයාගෙන් අවවාද එපා, ෆෙලිසිටි රිවර්ස්." සැලී සිනාවක් නගමින් කිව්වා. "ඔයා තවම දෙකේ පන්තියේ මොට්ට කෙල්ලක් කියන එක අමතක කරන්න එපා...!"

"ඊළඟ වාරයේදී මම තුනේ පන්තියේ." ෆෙලිසිටි කිව්වා. "මම ටික ටික ඉහළට එනවා...! ටිකක් කල් යයි තමා."

"හුඟක් කල් යනවා වගේ මුලදී පෙනෙන්නේ." සැලී කිව්වා. "දැන් අපි අවසාන වාරයට ඇවිදින් හිටියට කාලය එකපාරම ඉවර වුණා වගේ."

මුළු ගමන පුරාම නැවතීමකින් තොරව ඔවුන් කතා බහේ යෙදී සිට මැලෝරි ටවර්ස්වලට ළඟා වත්ම ඩැරල් හා සැලී නිහඬ බවකට වැටුණා.

"දැන් අපි ඇවිදින් ඉවරයි." ෆෙලිසිටි ගයන්නට වුණා. "තාත්තා, ඉක්මනින් යමු. ඉස්සරහින් යන කාර් එක අල්ලන්න. මට විශ්වාසයි ඒක සූසන්ලගේ කියලා."

ඒ සමගම ගොරවා ගෙන ආ මෝටර් රථයක් ඔවුන්ගේ කාරය පමණක් නොව ඉදිරියෙන් යන රථය ද පසු කරගෙන ගියා. රිවර්ස් මහතා තදින් තිරිංග තද කළ අතර වේගවත් රථය නිසා ඔහුට තම රථය කානුවට ගැනීමට සිදු වුණා.

"ඒ ජොසපින්ලාගේ කාර් එක...!" ෆෙලිසිටි කෑ ගැසුවා. "දැක්කද, යක්ෂයින්ගේ හැටි...!"

"යක්ෂයෝ තමයි කියන්න සුදුසු වචනය...!" ඇගේ පියා තරහින් කිව්වා. "මාව කානුවට තල්ලු කරගෙන ගියේ. මොනවා කරනවා කියලා හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ. ගම්බද පාරක එහෙමත් කාර් එළවනවද?"

"ඕ... එයාලා හැමදාම එහෙම තමයි." ෆෙලිසිටි කිව්වා. "ජෝගේ තාත්තාට පැයට හැතැප්ම අනූවට අඩුවෙන් එළවන්න බැහැ. එයා කියනවා එයාට කාර් හතරක් තියෙනවාලු. ඒ වගේ ලොකු ඒවා."

"ඉතින් එයාට තිබුණාවේ." ඈගේ පියා තරහින් රතුව ගොරෝසු හඬින් කිව්වා.

ඩැරල් මෙන්ම ඔහු ද ඉක්මනින් කෝප වන කෙනෙක්.

"මට මිනිහාව ඉස්කෝලයේදී හම්බ වුණොත් පාරේ යන හැටි ගැන මම මිනිහට දෙකක් කතා කරනවා. පාරේ යන ඌරෙක්...!"

"ඕ... තාත්තා, ඔයා කිව්ව එක හරියටම හරි. එයා ඌරෙක් වගේ මහතයි. ඌරෙකුගේ වගේ පුංචි ඇස්. ජෝන් ඒ වගේමයි." ෆෙලිසිටි මහ හඬින් සිනාසුණා.

"මම හිතන්නේ එයා ඔයාගේ යාළුවෙක් නෙවෙයි, එහෙමනම්." ඈගේ පියා කිව්වා.

"මගේ යාළුවෙක් නොවෙයි." ෆෙලිසිටි කිව්වා. "මගේ යාළුවා සූසන්. ඔන්න අපි ආවා. අන්න... ජූන් ඉන්නවා ගේට්ටුව ළඟ...! අන්න ජූලි, පැම්. හේයි පැම්...! පැම්...!"

"මගේ කන් බිහිරි කරන්න එපා." ඈගේ මව සිනාසෙමින් කිව්වා.

ඩැරල්, ෆෙලිසිටි හා සැලී ඔවුන්ගේ ගමන් මලු තදින් අල්ලා ගෙන පිටතට පැන්නා. ඒ සැණින් ඔවුන් ප්‍රීතියෙන් ඉපිල ඝෝෂාකාරී වූ දැරියන් සමූහයක් අතරට වැදුණා.

"ඩැරල්, ඔයා මට ලියුමක් එව්වේ නැහැ...!"

"ෆෙලිසිටි, ඔයා ජූලිව දැක්කාද? එයාට එයාගේ පෝනියාව ආපසු ගෙනෙන්න ඉඩ දීලා. ජක් හෝනර්...! හරි අපූරු පෝනියෙක්."

"හෙලෝ සැලී, ඔයා කළු වෙලා."

"අන්න ඇලිසියා...! ඇලිසියා... ඇලිසියා...! බෙටී...! මේ හැම කෙනෙක්ම එක සැරේ එනවා."

උස් කටහඬක් ඇති මිනිසෙක් අනවශ්‍ය ප්‍රමාණයට ඇඳුම් ආයිත්තම්වලින් සැරසුණ කාන්තාවක සමග රැස් කන දැරියන් තල්ලු කරමින් විශාල ඇමෙරිකානු මෝටර් රථයක් වෙතට ඇදෙමින් සිටියා. ඒ රිවර්ස් මහතාගේ මෝටර් රථය පාරෙන් ඉවතට යාමට සැලැස්වූ රථයයි.

"හොඳයි, ආයුබෝවන් ජෝ...!" ඔහු කියමින් සිටියා. "ඔයා පන්තියේ අන්තිමයා වෙන්න බලන්න. ඒ දවස්වල මමත් එහෙමයි. ටීචර්ස්ලා මොන විකාර කිව්වත් ගණන් ගන්න එපා. හත්... හා...! ඔයා කැමති ඕනෑම දෙයක් කරලා සතුටින් ඉන්න."

ඩැරල් හා සැලී පිළිකුලින් එකිනෙකා දෙස බලා ගත්තා. පියා අවවාද උපදෙස් දෙන්නේ එම අයුරින් නම් ජෝ එතරම් නරක දැරියක වීම ගැන පුදුම වන්නට දෙයක් නැහැ. ඒ වගේම පුදුම කටක්.

ජෝගේ පියා පැහැදිලි ලෙසම තමා ගැන සතුටට පත් වුණා. ඒ මේ අත නළියන දැරියන්ට සිනාවක් පෑ ඔහු පපුව පුම්බා තම පුෂ්ටිමත් දියණියගේ පිටට තට්ටු කළා.

"අපි ගිහින් එන්නම් ජෝ...! ඔයාට වැඩිපුර කෑම අවශ්‍ය නම් අපිට දන්වලා එවන්න."

ඔහු තමා දෙස බලා සිටින රිවර්ස් මහතා දැක හිස සලා මඳ සිනාවක් පෑවා.

"ඔයාගෙත් ළමයෙක් මෙහේ ඉන්නවාද?" ඔහු සතුටින් විමසුවා.

"මගේ දෙන්නෙක් ඉන්නවා." රිවර්ස් මහතා පැහැදිලි නොසැලෙන ස්වරයෙන් කිව්වා. "ඒත් මෙන්න මේක අහගන්න, මිස්ටර් ජෝන්ස්. මේ දැන් ටිකකට කලින් මම මගේ වාහනය කානුවට දා ගත්තේ නැති නම්, ඔහේ අර පටු පාරෙදි එක පාරම ඉස්සර කරද්දී මට එක දුවෙක්වත් නැති වෙන්න තිබුණා. ලැජ්ජා නැති එළවිල්ලක්...!"

විමතියට පත් ජෝන්ස් මහතා පස්සට විසි වුණා. යමෙකුට මෙය ඇසුණේ දැයි දැන ගැනීමට ඔහු වහා වටපිට බැලුවා. සෑහෙන දැරියන් පිරිසක් මෙය අසාගෙන සිටිනු දුටු ඔහු රිවර්ස් මහතාගේ සිනාවකින් තොර මුහුණ දැක තවත් වචනයක් හෝ කතා නොකිරීමට තීරණය කළා.

"ඒක හොඳයි තාත්තා... ඒක හොඳයි...!" අසල රැඳී සිටි ෆෙලිසිටි කිව්වා. "ඕනෑ ඔට්ටුවක්, කවුරුවත් මීට ඉස්සර එයාට එහෙම බැණලා නැහැ. ඔයා බැන්න එක හොඳයි...! ජෝත් එයා වගේමයි. අන්න, එයා ඉන්නවා."

ජෝ, ෆෙලිසිටි හා රිවර්ස් මහතා දෙස රවා බැලුවා. ඇත්තෙන්ම ෆෙලිසිටි කියූ දෙය ඇයට ඇසුණේ නැති නමුත් ෆෙලිසිටිගේ පියා තම පියාට බණිනු ඇයට ඇසී තිබුණු අතර ඈ ඒ ගැන නොසතුටු වුණා.

'කමක් නැහැ. පුළුවන් වුවහොත් මෙම වාරයේදී එම පළිය ෆෙලිසිටිගෙන් ගන්නවා.' ඇය සිතුවා.

"අපි යමු, මහත්තයා." රිවර්ස් මහත්මිය මෝටර් රථයෙන් පිටතට නැඹුරු වෙමින් කිව්වා. "ඔයාලගේ හැම දෙයක්ම ගත්තාද? ආයුබෝවන් ඩැරල් දුවේ, ෆෙලිසිටි. ආයුබෝවන් සැලී. සතුටින් ඉන්න... ගිම්හාන වාරය තමයි හොඳම...!"

මෝටර් රථය වේගයෙන් ඇදී ගියා. කැලඹුණ ඇරියන් රොත්ත මැදට පැන ගත් ෆෙලිසිටි නොපෙනී ගියා. සැලී හා ඩැරල් හික්මුණ හය පන්තියේ ඇරියන් ලෙස වඩාත් තැන්පත් ලීලාවෙන් ඇවිද ගියා.

"ඉහළම පන්තියේ ඉන්න එක හොඳයි." ඩැරල් කිව්වා. "ඒත්, කෑ ගගහා දඟලන පහළ පන්තිවල පොඩි අය දකිද්දී මට ඊර්ෂ්‍යා හිතෙනවා. අර බලන්න. කොයි තරම් කට්ටියක්ද?"

ඩැරල් හා සැලී තරප්පු පෙළ නැඟ ගොස් විශාල ශාලාවකට ඇතුළු වුණා.

"අපි අපේ පාඩම් කාමරයට යමු." ඩැරල් කිව්වා. "අපේ බඩු ඒකෙන් තියලා වටපිට ඇවිදලා බලමු."

ඔවුන් ගියේ දෙදෙනාම එක්ව බෙදාගත් කුඩා සුවපහසු කාමරයටයි. දෙදෙනාට එක බැගින් මෙම කුඩා කාමර පාවිච්චි කිරීමට හය පන්තියේ දැරියන්ට අවසර තිබුණා. ඩැරල් හා සැලී ඔවුන්ගේ කුඩා කාමරයට මහත් සේ ඇලුම් කළා.

පාඩම් කාමර මෙන්ම හය පන්තියේ දැරියන්ට ඔවුන්ගේම පොදු කාමරයක් තිබුණා. පොදු කාමරයේ ගුවන් විදුලි යන්ත්‍රයක්, පුස්තකාලයක් සහ දැරියන්ගේ ප්‍රයෝජනය සඳහා නොයෙක් ආකාරයේ කබඩ් හා රාක්ක තිබුණා. එය මුහුදට මුහුණ ලා තිබූ අතර නැවුම් වාතයෙන්, ආලෝකයෙන් හා හිරු එළියෙන් පිරී තිබුණා. දැරියෝ එයට මහත් සේ ඇලුම කළා.

"පහළට ගිහින් මේට්‍රන්ට වාර්තා කළොත් හොඳයි." ඩැරල් කුඩා ඇඳුම් බෑගයේ තිබූ දේවල් ඉවතට ගෙන කිව්වා.

ඇ ඔරලෝසු දෙකක් හා තවත් විසිතුරු භාණ්ඩ තුන හතරක් ගෙන තැන්පත් කළා. එම වාරයේ පාවිච්චිය සඳහා කදිම මේස රෙද්දක් ගෙනවිත් තිබූ අතර ඇ එය ලාච්චුවට දැම්මා. ඔවුන් නිතර කළ පරිදි තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම කදිම බව පෙනුණා.

"ඔයාගේ සෞඛ්‍ය සහතිකය ගෙනාවද?" සැලී ඇසුවා. "මට පුදුම අයිරින් එයාගේ එක ගෙනවිල්ලා ද කියලයි. පහුගිය වාර තුන හතරේදීම එයාට ඒක කොහොම හරි අමතක වෙනවා. මේ අවසාන වාරයේදීත් අමතක වෙලා නම් හරිම අපූරු වැඩක් තමයි."

ඩැරල් හඬ නගා සිනාසුනා. අයිරින්ගේ සෞඛ්‍ය සහතිකය ගෙන ඒමට අමතක වීම පාසලේ කා අතරත් ජනප්‍රිය විහිළුවක්.

"මගේ එක එක්කම ෆෙලිසිටිගේ එකත් මා ළඟ." ඈ කිව්වා. "මම ඒක එයාට දෙන්න ඕනෑ. එන්න, අපි පහළට යමු."

පහළට බැස ගිය ඔවුන් කලබලකාරී දැරියන් රොත්තට මැදිව සිටි නේවාසිකාගාර පාලිකාව සොයා ගත්තා. දැරියන් ඇයට ඔවුන්ගේ සෞඛ්‍ය සහතික භාර දෙමින් සිටි අතර පහළ පන්තිවල දැරියන් ඔවුන්ගේ මුදල් ද ඇයට භාර දිය යුතුව තිබුණා.

"හලෝ, අපි ආයෙත් මෙහේ...!" කටහඬක් නැඟී ඩැරල් හා සැලීට සුබ පැතුවා.

"අයිරින්...!" ඩැරල් හා සැලී එක්වර කිව්වා.

අයිරින් ඔවුන්ට සිනාවක් පෑවා. මීට අවුරුදු හයකට ඉහතදී ඩැරල් ඇයව පළමු වතාවට දුටුවාට වඩා ඇය ඉතා සුළු ලෙස වෙනස් වී සිටියා. මඳක් වයසින් මුහුකුරා ගොස් මඳක් උස් වුව ද පරණ පුරුදු අපිළිවෙළකාරී හා අනුවණ බවින් යුතු වුණා. එහෙත් ඇගේ බාහිර පෙනුම ඇගේ සැබෑ ස්වරූපය වසාගෙන සිටියා. අයරින් සංගීතයේ හා ගණිතයේ සැබෑ ලෙස නිපුණ කෙනෙක් වුණා. ඇය අඥාන වූයේ එදිනෙදා සාමාන්‍ය දේවල දී පමණයි.

"අයිරින්...!" මෙම දැරියගේ සෞඛ්‍ය සහතිකය සම්බන්ධයෙන් පසුගිය වාරවලදී මහත් හිරිහැරයට පත්ව තිබූ නේවාසිකාගාර පාලිකාව හඬ නගා කතා කළා. "මේ වාරයේත් ඔයා සෞඛ්‍ය සහතිකය අමතක කරලා ඇවිදින් නම් මට ඔයාව තනි කරලා තියන්න සිද්ධ වෙයි ද? නැති නම් කවදාවත් නැති විදිහට ගෙනැවිල්ලා තියෙනවා ද?"

"මෙන්න තියෙනවා මේට්‍රන්...!" කී ඈ ලියුම් කවරයක් නේවාසිකාගාර පාලිකාවට දුන්නා.

ඈ ඩැරල්ට හා සැලීට ඇසක් ඉඟි මැරුවා. නේවාසිකාගාර පාලිකාව එය විවෘත කළා. බිමට වැටුණේ අයිරින් පිහිනුම් ඇඳුමකින් සැරසී සිටින ඡායාරූපයක්.

"ඕ... කනගාටුයි මේට්‍රන්. වැරදි ලියුම් කවරය." කී අයිරින් තවත් ලියුම් කවරයක් නේවාසිකාගාර පාලිකාවට දුන්නා.

එය ඉරා විවෘත කළ නේවාසිකාගාර පාලිකාව අයිරින් දෙස රවා බැලුවා.



"මේක විහිළුවක් ද? මේක බල්ලෙකුගේ ලයිසන් එකක්."

"අපොයි...!" අයරින්ට කියැවුණා. "අපේ රෝවර්ගේ ලයිසන් එකට සිද්ධ වෙලා තියෙන්නේ මේකයි එහෙනම්. මම ඒකත් දාගෙන. ගෙදර අය ඕක හැමතැනම හොයනවා. මේක වෙන්න ඕනෑ හරි එක...!"

සැම කෙනෙක්ම කැකිරි පළා සිනාසුණා. මේ වන විට පාලිකාව වටා කලබල කරන පිරිසට ඇලිසියා ද එක්ව තිබුණා. හාස්‍යජනක සිද්ධියෙන් විනෝද වන ඇගේ දීප්තිමත් දෙනෙත් දිලිසුණා. පාලිකාව තුන්වන ලියුම් කවරය විවෘත කළා. ඈ හඬ නගා සිනාසෙන්නට පටන් ගත්තා.

එය සෞඛ්‍ය සහතිකය අමතක කිරීම සම්බන්ධයෙන් ඇය අයිරින්ට බණින අයුරු දක්වන චිත්‍රයක්. අයිරින්ගේ හොඳම මිතුරිය බෙලින්ඩා විසින් අඳිනු ලැබූ එය විහිළුවක් කිරීමට දෙදෙනාම එකතුව තුන්වන ලිපි කවරයට දමා තිබුණා.

"ඔයා ගැන සිහිවටනයක් විදිහට මම මේක තියාගන්නම්, අයිරින්." පාලිකාව කිව්වා. "මතක නැති වෙන කෙල්ලන්ට පාඩමක් හැටියට මම මේක මගේ බිත්තියේ ගහ ගන්නවා. දැන් කොහේද සැබෑ සහතිකය?"

අවසානයේදී සැබෑ සහතිකය ඉදිරිපත් කෙරුණ අතර පාලිකාව සතුට ප්‍රකාශ කළා.

"මම හිතන්නේ අවසාන වාරයේත් ඔයාගේ සහතිකය නැති වීමේ චාරිත්‍රය නොකඩවා කරන්න පුළුවන් වුණා." ඈ මඳ සිනාවකින් යුතුව කිව්වා. "දැන් ජූන්, කෝ ඔයාගේ එක? ඔයා ජෝ?"

ෆෙලිසිටි ඉදිරියට පැමිණි අතර ඩැරල් ඇගේ සහතිකය භාර දීමට ඇයට දුන්නා. අනතුරුව ඈ, සැලී හා ඇලිසියා සමග තව කවුරුන් ආපසු ඇවිදින් ඇතිදැයි දැන ගැනීමට පිටත්ව ගියා.

"ඕනෑම ඔට්ටුවක්...! ඔය එන්නේ විල්." හදිසියේම මාවත දෙසින් අශ්වයින්ගේ කුර ගැටෙන හඬක් ඇසුණ ඩැරල් කිව්වා. "මේ වතාවේ එයාගේ සහෝදරයෝ කී දෙනෙක් එනවාද දන්නේ නැහැ."

විල්හෙල්මිනා, කෙටියෙන් විල්, සහෝදරයින් හත් දෙනෙකුට එකම සහෝදරිය වූ අතර මේ සියලු දෙනා අශ්වයින් ගැන උමතුවෙන් සිටියා. සෑම වාරයකදීම සහෝදරයින් කීප දෙනෙක් ඇයව පාසලට කැඳවා ගෙනආ අතර මෙය බලවත් හැඟීම් දනවන කදිම දර්ශනයක් වුණා. දැරියෝ එය දැක ගැනීමට ජනේල අසලට දිව්වා.

"ඔව්, ඒ විල්. ඒත් සහෝදරයෝ තුන් දෙනෙක් විතරයි ඇවිදින් තියෙන්නේ." සැලී කිව්වා. "අන්න, ක්ලැරිසාත් එනවා. එයත් එන්න ඇත්තේ එයාගේ අශ්වයා, මෙරිලෙග් පිටේ වෙන්න ඇති."

"අන්න... ග්වේන් එනවා...!" ඇලිසියා අවඥා මුසු ස්වරයෙන් කිව්වා. "අම්මලා දුවලා අඬ අඬා වෙන් වෙන හැටි අපි කී සැරයක් නම් දැකලා තියෙනවාද? අපි මේකත් හොඳින් බලාගනිමු. මේ අවසාන වතාව...!"

එහෙත් ග්වේන් මේ වතාවේ ප්‍රවේසම් වුණා. නිතර නිතර දැරියෝ ඇගේ වැලපීම් සහිත සමුගැනීම අනුකරණය කර තිබුණා. ඈ මෝටර් රථයෙන් පිටතට පා තැබුවේ ඇඩිකර ගත් මුහුණකින් යුතුව ප්‍රතාපවත් බවක් පෙන්වමින්. තම මවට හා මහලු ආයා, වින්ටර් මහත්මියට හාද්දක් දුන් ඈ ඔවුන්ට අනුවණ ලෙස හැසිරීමට ඉඩ දුන්නේ නැහැ. එහෙත් ඈ තම පියාට සමුගැනීමේ හාද්දක් දුන්නේ නැහැ.

"ආයුබෝවන්, ග්වේන්...!" ඔහු ඇයට කතා කළා.

"ආයුබෝවන්...!" ග්වේන් කොතරම් ඇඩි හඬකින් කීවේද යත් ඇරියෝ විමතියෙන් එකිනෙකා දෙස බලා ගත්තා.

"මොකක් හරි රණ්ඩුවක් වෙලා." සැලී කිව්වා. "මම හිතන්නේ එයාගේ මොට්ට වැඩකට තාත්තා දොස් කියන්න ඇති. ගොන්ඩොලින් මේරිගේ පවුලේ මොළය තියෙන එක් කෙනෙක් හරි ඉන්න එක ලොකු දෙයක්."

ග්වේන්ගේ මව අත් ලේන්සුව ගෙන තම ඇසේ කඳුළු පිසින්නට වුණා. කැරකී ගිය මෝටර් රථය මාවතේ පහළට ඇදී නොපෙනී ගියා. අනෙක් ඇරියන් පසුපසින් වැටුණු ග්වේන් කාමරය තුළට පැමිණියා.

"හලෝ...!" ඈ කතා කළා. "නිවාඩුව හොඳ ද?"

"හලෝ ග්වේන්." ඩැරල් කතා කළා. "ඔයාට කොහොම ද?"

"වරදක් නැහැ." ග්වේන් කිව්වා. "තාත්තා ටිකක් වසට හිටියා."

අනෙක් ඇරියෝ කිසිවක් කීවේ නැහැ. තම දෙමව්පියන්ට ප්‍රසිද්ධියේ අවමන් කිරීම අශිෂ්ට බව ග්වේන් කිසිදින තේරුම් ගෙන තිබුණේ නැහැ.

'මෙයා කවදාවත් හැදෙන්නේ නැහැ.' ඩැරල් සිතුවා. 'ඇත් පමා වැඩියි.'

ඈ, සැලී හා ඇලිසියා සමග පිටව ගියේ සියලු දෙනා මේ ගැන පිළිකුලින් යුතු බව සිතමිනුයි. ග්වේන් කේන්තියෙන් ඔවුන් දෙස රවා බලාගෙන සිටියා. සෑම කෙනෙක්ම ඇයව මඟ හැර නොසලකා ගිය අතර ඇයට එය නැවැත්වීමට නොහැකි වුණා.

රාත්‍රී ආහාර වේලාව පැමිණි වීට ආපසු පැමිණ සිටියේ හා නොපැමිණ සිටියේ කවුදැයි දැක ගැනීමට ඇරියන්ට හැකි වුණා. තම කුලුනට අලුතින් පැමිණි ඇරියන් හා ගුරුතුමියන් ඔවුන්ට දැකගත හැකි වුණා. සෑම කුලුනකටම එයටම අයත් වූ පොදු කාමර හා කෑම කාමර තිබුණා. ඩැරල් හා ඇගේ මිතුරියන් සිටි උතුරු කුලුන මුහුදට මුහුණලා තිබූ අතර එය වඩාත් හොඳ කුලුන ලෙස සැලකුණා. කෙසේ වෙතත් අනෙක් කුලුනුවල සිටි ඇරියන් තම තමන්ගේ කුලුනු ගැන දැරුවේ එවැනිම අදහසක්.

හය පන්තියට අලුත් සිසුවියන් ඇත්තේම නැති බව ඩැරල්ට විශ්වාසයක් තිබුණා. එතරම් ප්‍රමාද වී මැලෝරි ටවර්ස් පාසලට අලුතින් දැරියක පැමිණීම ඉතා දුර්ලභ දෙයක්. එහෙත් හය පන්තියේ කෑම මේසයේ අලුත් මුහුණු දෙකක් දුටු ඩැරල් මහත් සේ පුදුමයට පත් වුණා.

එක් දැරියක් උස් මහත් වූ අතර ඇගේ දෙකකුල් හා දෙපතුල් විශාල වූ බැවින් හා කොට කොණ්ඩය නිසා ඇයට තිබුණේ තරමක පිරිමි ළමයෙකුගේ පෙනුමක්. අනෙක් දැරිය කුඩා සුන්දර සිරුරක් සහිත කුඩා අත් පා සහිත දැරියක්. ඇගේ කටහඬ ඇසුණ වහාම ඇය ප්‍රංශ ජාතික කෙනෙක් බව ඩැරල්ට වැටහුණා.

මම්සලී ඩූපොන්ට් දීප්තිමත් සිනාවකින් යුතුව ඇයව හඳුන්වා දුන්නා.

"ළමයි...! මේ සූසේන්. මෙයා මම්සලී රොජර්ගේ ලේලියක්. එයා ඉන්නේ දකුණු කුලුනේ. ඒත් මෙයාට ඒකේ ඉඩ නැති නිසා මාත් එක්ක උතුරු කුලුනේ ඉන්න ආවා. මෙයත් හයේ පන්තියට. මෙයාට ඉංග්‍රීසි භාෂාව හොඳින් ඉගෙන ගන්න ඕනෑ. නේද, සූසේන්?"

"ඇත්තෙන්ම, මම්සලී ඩූපොන්ට්." සූසේන් ප්‍රංශ භාෂාවෙන් පිළිතුරු දුන්නා.

ඇගේ දීප්තිමත් කළු දෙනෙත්වලින් හය පන්තියේ දැරියන්ගේ මුහුණු දෙස සිනා මුසුව කැරකී බැලූ ඈ දෙනෙත් පහතට නැඹුරු කර ගත්තා. ඩැරල්ට හදිසියේම ඇය ගැන ඇල්මක් ඇති වුණා.

"අපොයි, ඔයා එක ප්‍රංශ වචනයක්වත් කතා කරන්න එපා." මම්සලී ප්‍රංශ භාෂාවෙන්ම දොස් කිව්වා. "නරක කෙල්ල. ඒක ඉංග්‍රීසියෙන් කියන්න."

ගොත ගසමින් ඉංග්‍රීසි වචන ප්‍රංශ උච්චාරණයෙන් කියන්නට වෑයම් කරන සූසේන් දැරියන්ට මහත් විනෝදයක් වුණා. ඩැරල් සැලීට වැලමිටෙන් ඇන්නා.

"එයා මම්සලීව නටවන්න හදන්නේ." ඈ පහත් හඬින් කිව්වා. "අපිටත් සූසේන් එක්ක විනෝද වෙන්න පුළුවන්."

# 03

ඉන්පසුව මම්සලී අනෙක් දැරිය වෙතට හැරුණා.

"හරි, මේ... මොකක්ද නම කිව්වේ?" ඈ උස් මහත් අලුත් දැරියගෙන් ඇසුවා. "අමන්දා ෂවුටලොට්, ඒ කියන්නේ 'කට සැර' නේද?"

දැරියෝ හඬ නගා සිනාසුණා. අලුත් දැරිය තරමක උදාරම් බැල්මක් මම්සලී වෙත හෙළුවා.

"නැහැ. අමන්දා ෂාර්ටෙලෝ." ඈ උස් කටහඬකින් කිව්වා.

"ඕ... ඒක තමයි මම කිව්වේ." මම්සලී විරෝධය පා කිව්වා. "අමන්දා ෂවුටලොට්, අහිංසක අමන්දා, මෙයාගේ ඉස්කෝලය ගින්නකට අහුවෙලා...! හයියෝ... දැන් ඒ ඉස්කෝලය නැහැ."

කුමක් කිව යුතු දැයි කිසිවෙක් දැන සිටියේ නැහැ. පාන් පෙත්තක් අතට ගත් අමන්දා, මම්සලීව නොසලකා හැරියා. කතා බහේ හිදැසට ග්වේන් වහාම ඇතුළු වුණා.

"අයියෝ... හරිම නරක දෙයක්...! කාටවත් තුවාල නැද්ද?"

"නැහැ." වැඩිපුර සලාද බෙදා ගනිමින් අමන්දා කිව්වා. "ඒක සිද්ධ වුණේ නිවාඩු කාලයේ. ඔයාලා පත්තරේ දකින්න ඇති. ට්‍රෙනිගන් ටවර්ස්."

"ඕ... ඔව්. මම ඒ ගැන කියෙව්වා." ඒ ගැන සිහි වූ සැලී කිව්වා. "ට්‍රෙනිගන් ටවර්ස්...! ඒක තමයි මේ රටේ ක්‍රීඩාවලට හුඟක්ම ප්‍රසිද්ධ ඉස්කෝලය, නේද? මම කියන්නේ, ඔයාලා හැම තරගයක්ම දිනනවා. හැම ටෙනිස් පලිහක්ම, හැම ලැක්රෝස් කුසලානයක්ම දිනනවා නේද?"

"අන්න හරි." අමන්දා කිව්වා. "හරි, ඒක දැන් නැහැ. හදිස්සියේම තවත් ගොඩනැගිල්ලක් හොයා ගන්න කාලය නැති නිසා අපිට සිද්ධ

වුණා එහාට මෙහාට විසිරිලා වෙන ඉස්කෝල හොයා ගත්ත. මම දන්නේ නැහැ කොයි තරම් කාලයක් මම මෙහේ ඉඳීවි ද කියලා. සමහර විට වාරයක් නැති නම් ඊටත් වැඩි වෙයි. ඔයාලට මැලෝරි ටවර්ස්වල ක්‍රීඩාවලට ඒ තරම් කාලයක් නැහැ නේද?"

හය වන පන්තියට පැමිණි දැරියක වුවත් මෙසේ කතා කිරීම ඕනෑවට වැඩි දෙයක්. ඇගේ පාසල, ක්‍රීඩා ගැන ආඩම්බර වීම වෙනම කාරණාවක්. ඩැරල් ඇය දෙස නුරුස්සනා සුලු බැල්මක් හෙළුවා.

"අපේ ඉස්කෝලේ ඒ තරම්ම නරක නැහැ." ඈ කිව්වා.

"සමහරවිට ඔයා කැමති ඇති අපිට ටිකක් පුහුණුවීම් කරන්න." ඇලිසියා මෘදු ස්වරයෙන් කිව්වා.

එම ස්වරය භයානක බව බොහොමයක් දැරියෝ දැන සිටියා.

"මම බලන්නම්." කී අමන්ඩා වෙනත් කිසිවක් කීවේ නැහැ.

දැරියෝ එකිනෙකා දෙස බැල්මක් හෙළුවා. අනතුරුව අමන්ඩා දෙස බැලූ ඔවුන් ඇය ඉතා ශක්තිමත් ඇතැයි සිතුවා. ඈ අඩි පහයි අඟල් දහයක් පමණ උසැති විශාල සිරුරක් ඇති දැරියක්. ඇය කොතරම් බර විය හැකිද?

'ස්ටෝන් (රාත්තල් 14) දහතුනක් විතර මම හිතන්නේ' ඩැරල් සිතුවේ අමන්ඩාව සිහින් ශෝබමාන ප්‍රංශ දැරිය සමග සංසන්දනය කරමිනුයි.

'දෙවියනේ... මුළු වාරයම අපිට මෙයත් එක්ක ජීවත් වෙන්න සිද්ධ වෙනවාද? මෙයාව මෙල්ල කරගන්න එක නම් අමාරු වෙයි...!'

සැලී ද කල්පනා කරමින් සිටියේ ඒ දෙයමයි. ඈ මුළු පාසලේම ක්‍රීඩා නායිකාව. ඉතා වැදගත් තනතුරක්. හය පන්තියේ සිට සියලුම පහළ පන්ති සැලී කියන දේවලට ගරු කළ යුතුව තිබුණා. සැලී පළමු පෙළ ටෙනිස් ක්‍රීඩිකාවක්, පළමු පෙළ ලැක්රෝස් ක්‍රීඩිකාවක් මෙන්ම මැලෝරි ටවර්ස්හි මේතාක් කල් සිට ඇති දක්ෂම පිහිනුම් ශූරියක්. ඩැරල් හැර වෙනත් කිසිවෙකුට ටෙනිස් ක්‍රීඩාවේදී ඇයව පරාජය කළ නොහැකි වූ අතර ඒ ඉතා කලාතුරකිනි.

ඇ දරදඬු, තරමක් අවඥා සහගත පෙනුමෙන් යුතු අමන්දා වෙත තවත් බැල්මක් හෙළුවා. ඇයට නියෝග දීම ඉතා දුෂ්කර වනු ඇත. විශේෂයෙන්ම සැලීට වඩා අමන්දා දක්ෂ ටෙනිස් ක්‍රීඩිකාවක මෙන්ම පිහිනුම් ශූරියක් බව පහසුවෙන්ම ඔප්පු කරන නිසා එය සිදුවිය හැක. සැලී අමන්දා මෙන් උස් මහත් දැරියක් නොවූවාය. එහෙත් ඇයට තිබුණේ ශක්තිමත්, වඩා නම්‍යශීලී සිරුරක්.

"මැලෝරි ටවර්ස්වලට එන්න පුළුවන් වුණ එක ඔයාගේ වාසනාවක්." ග්වේන් හදිසියේම කිව්වා.

"ඇත්තද?" උදාසීන ලෙස අමන්දා කීවේ තමා කිසිසේත් ග්වේන්ට කැමති නැහැ යන්න පළ කරන බැල්මකින් යුතුවයි.

ග්වේන් ඉක්මනින් ඇසිපිය සැලුවා. මොන තරම් දරුණු කෙල්ලක් ද? ඇලිසියා ඇයව මෙල්ල කරගනු ඇතැයි ඇ සිතුවා. ඇලිසියාට ඕනෑම කෙනෙකුව මට්ටු කිරීමට හැකියාව තිබුණා. පාසලේ සිටි හැමකෙනෙකුටම වඩා ඇගේ වචන තියුණු වූ අතර වඩා ඉක්මනින් කතා කර කටින් ජය ලැබීමේ හැකියාව ඇයට තිබුණා.

"මම හිතන්නේ ඔයා ඔලිම්පික් තරගවලට ඉදිරිපත් වෙන්න යනවා ඇති." ඇලිසියා උපහාස කිරීමේ චේතනාවෙන් යුතුව කිව්වා. "ලබන අවුරුද්දේ ඒක පවත්වන්නේ..."

"ඕ... ඔව්. මම හිතාගෙන ඉන්නේ ඉසව් පහකට විතර ඉදිරිපත් වෙන්න." අමන්දා ශාන්තව කිව්වා. "ට්‍රෙනිගන්වල මගේ පුහුණුකාරයා කිව්වේ අඩුම තරමේ ඉසව් දෙකක්වත් මම දිනයි කියලයි."

දැරියෝ මුව විවර කර ගත්තා. ඇලිසියා මහත් විමතියට පත් වුණා. තමාගේ අවඥා සහගත ප්‍රකාශය සත්‍යයක් වනු ඇතැයි ඇයට සිතී තිබුණේ නැහැ. ඇගේ මුහුණට ආරූඪ වූ පරාජිත බැල්ම දුටු අයිරින්ට සිනහ පහළ වුණා.

"ඔයා අපිත් එක්ක මෙහේ ඉන්න එක ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ අමන්දා." ඇ තාලයකට කිව්වා.

ආහාර වේලාව අවසන් කරන සීනුව නාද වුණා. සියලුම දැරියෝ සිනාසෙමින් නැගී සිටියා.

ඩැරල් හා මිතුරියෝ කතා කිරීමට හා ඔපදූප කීමට පාඩම්

කාමර බලා ගියා. සුපුරුදු පිරිස වුණේ සැලී, ඇලිසියා, බෙලින්ඩා, අයිරින්, මේරි ලෝව්, විල් හා ක්ලැරිසායි. මෙල්විස් පැමිණ තිබුණේ නැහැ.

"මෙල්විස් නැතිව හරිම පාළුයි." සැලී කිව්වා. "එයා දැන් ගායිකාවක් වෙන්න පුහුණුවට ගිහින්. දවසක අපි හැමෝම එයාගේ ප්‍රසංගයක් බලන්න එකතු වෙයි."

"අපේ ජේන් නැතිව මටත් පාළුයි." ඩැරල් කිව්වා. "එයා මෝස්තර නිර්මාණ කරන කෙනෙක් හැටියට පුහුණු වෙනවා. එයා ඒකට හුඟක් දක්ෂයි. අපි පහේ පන්තියේ ඉද්දී කරපු නාට්‍යයට එයා නිර්මාණය කරපු ලස්සන ඇඳුම ඔයාලට මතකද?"

"කැතරිනුත් අස්වෙලා ගිහින්." ඇලිසියා කිව්වා. "අනිත් අයට ඕනෑවට වැඩිය උදව් කරන එක විතරයි එයාට තිබුණේ. ඒ වගේ කෙනෙක් මගේ ජීවිතේට දැකලා නැහැ. එයාට කැතරින් සාන්තුවරිය කිව්ව එක පුදුම වෙන්න දෙයක් නොවෙයි."

"එයා ඒ තරම් නරක නැහැ." මේරි ලෝව් පක්ෂපාතීව කිව්වා. "එයාගේ ආශාව අනෙක් අයට උදව් කරන එක."

"එයා ඒක කළේ වැරදි විදිහට, එච්චරයි." විල් කිව්වා. "අනිත් අය වෙනුවෙන් එයා පණ දෙන්න හදනවා. එයා කොහොමද ඒක කරන්න යන්නේ?"

"එයා ගෙදර නැවතිලා අම්මාට උදව් කරන්න යනවා." ඇලිසියා තරමක නුරුස්සනා හඬින් කිව්වා. "ඒක එයාට හරියටම ගැළපෙනවා. එයාගේ අම්මා දැන් ටිකක් ලෙඩ ගානේ. මම හිතන්නේ උපාසක පොඩි දුව හැටියට ඉන්න කැතරින් හුඟක් කැමති ඇති."

"නපුරු වෙන්න එපා, ඇලිසියා." මේරි ලෝව් කිව්වා. "එයාගේ මෝඩ වැඩ තිබුණට එයා හුඟක් කරුණාවන්තයි."

"ඔයා කියන දේ මම විශ්වාස කරන්නම්." මේරි ලෝව්ට සිනාවක් පාමින් ඇලිසියා කිව්වා.

# 04

ඊළඟ දිනයේ, උදයේ සීනුවේ මහත් වූ හඬත් සමග සෑම කෙනෙක්ම අවදි වුණා. උදය සීනුවේ ගිගුම් නාදයට නුහුරු අලුත් දැරියෝ විමතියෙන් ඇඳන් මත වාඩි වුණා. දෙවන පන්තියේ දැරියෝ කෙඳිරි ගා තවත් කෙටි නින්දක් සඳහා ගුළි වුණා. එම වසරේ කම්මැළිකම සම්බන්ධව ඔවුන්ට නරක නමක් පටබැඳී තිබුණා. ඩැරල් නිතරම තම දෙවැනි පන්තියේ නැගණියට ඒ ගැන සරදම් කරමින් සිටියා.

"කම්මැළි රැළක්." ඈ කිව්වා. "හැමදාම ටයි එක බාගෙට ගැට ගහගෙන, සපත්තු ලේස් ගැට ගහන්නේ නැතිව කෑමට පහළට දුවගෙන එනවා. මිස් පාකර් මෙයාලට දඬුවම් දීලා හදන්නේ නැති එක මට පුදුමයි."

"ඕ... එයා එහෙම කරනවා." ෆෙලිසිටි සිනාවක් නගමින් කිව්වා. "ඔයාලා ඉන්න කාලයේත් එයා ඒ හැම එකකටම හොට දැම්මාද, ඩැරල්?"

"ඒකෙන් වැඩක් නැහැ." ඩැරල් කිව්වා.

අසනීප නිසා හෝ වෙන යම් වැදගත් කරුණක් නිසා දැරියෝ දෙදෙනෙක් තුන්දෙනෙක් මේ වන විටත් පැමිණ තිබුණේ නැහැ. හය පන්තියේ මොරියා එදින පැමිණීමට නියමිතව තිබුණා. ඈ හා සැලී ක්‍රීඩා කාලසටහන් හා තරග ඉතා හොඳින් සැලසුම් කර තිබුණා. එහෙත් අනෙක් කටයුතුවලදී මොරියා එතරම් ප්‍රියමනාප කෙනෙක් වූයේ නැහැ.

"එයා හැමතිස්සේම එයා හරි කියලා හිතනවා. හරිම ඇඩි හිතක් තියෙන්නේ...!" දැරියෝ මැසිවිලි නැගුවා. "එයා කවදාවත් වැරදි නැහැ කියලා හිතන්නේ. වැරැද්දක් පෙන්නලා දෙන්න බැහැ. හරි ලොකුකමක් තියෙන්නේ."

ඉතා කඩිනමින් ඇවිද යන අලුත් ඇරිය, අමන්දාගේ දර්ශනය ඩැරල්ගේ නෙතට හසු වුණා. එම ඉක්මන් අධිෂ්ඨාන පූර්වක ගමන ඇයට මොරියා ගැන යමක් සිහිපත් කළා. ඈ තනිවම මඳ සිනාවක් නගා ගත්තා.

'මොරියා අමන්දාට හුඟක් කැමති වෙයිද? ඒ දෙන්නා එකට එකතු වෙලා ඉන්නවා දකින එකත් විනෝදයක් වෙයි. මේ වාරයේ යුද්ධයක් තියෙයි...! හරි, මොනවා හරි සිද්ධ වෙන එකත් හොඳයි. මගේ අවසාන වාරය නිකම්ම ගත කරන්න බැහැ.'

උදේ ආහාර වේලට පසු අනෙක් අය සොයා ඈ පොදු කාමරය බලා ගියා. සැලී, මේරි ලෝව් හා බෙලින්ඩා එහි සිටියා.

"පළමුවෙනි පාඩමට බෙල් එක තව ටිකකින් ගහයි." ඩැරල් කිව්වා. "අපි ඉක්මනට පහළට ගියොත් හොඳයි."

යමෙක් දොරට තට්ටු කළා.

"එන්න...!" ඩැරල් හඬ නගා කිව්වා.

බියපත් පෙනුමකින් යුත් දෙවැනි පන්තියේ ඇරියක් ඇගේ මුහුණ දොරින් ඔබා බැලුවා.

"අනේ, මේ..." ඈ පටන් ගත්තා.

"එනවා ඇතුළට." බෙලින්ඩා කිව්වා. "ඔය ඔළුවට කඳකුත් ඇති නේද? අපිට ඒකත් දකින්න ඕනෑ. අපි තමුසෙව කන්නේ නැහැ."

දෙවැනි පන්තියේ ඇරිය මුළු සිරුරින්ම දොර අසල පෙනී සිටියා.

"මේ..." ඈ කතා කළා. "මිස් ග්‍රේලින් කියනවා ඔයාලගෙන් එක් කෙනෙකුට අලුත් ළමයිව එක්කගෙන එන්න කියලා. එයා කිව්වේ අලුතින් හයට ආව අය නොවෙයි, අනෙක් පන්තිවල අලුත් අය කියලයි. එයා බලාගෙන ඉන්නවා."

"හරි." ඩැරල් කිව්වා. "ළමයි හෝල් එකේ ඉන්නවාද? එහෙනම් දුවනවා."

"ඔව්... ඔව්..." කී බියපත් ඇරිය යටහත් පහත්ව ආපසු දුව ගියා.

කාමරයෙන් පිටත් වූ ඩැරල් පිටත ශාලාව බලා ගියා. අලුත් ඇරියෝ පස්දෙනෙක් එහි සිටියා. පළමු පන්තියේ තුන්දෙනෙක්, දෙවන පන්තියේ එක් ඇරියක් හා තුන්වැනි පන්තියට එක් ඇරියක්. ඔවුන් අසහනයටත්, තරමක් බියටත් පත්ව සිටි බවක් පෙනුණා.

"ඒ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව." තුන්වැනි පන්තියේ ඇරියක් කොඳුරා කිව්වා. "පරිස්සමින් කතා කරන්න."

"එන්න ළමයි, මම ඔයාලව එක්ක යන්නම්. ඇයි මේ බය වෙලා වගේ. ඔයාලා ඇවිදින් තියෙන්නේ මේ රටේ තියෙන හොඳම ඉස්කෝලයට නිසා ඔයාලා හරි වාසනාවන්තයි...!"

අලුත් ඇරියන් පස්දෙනා කැටුව ගිය ඩැරල් තද කහ පැහැයෙන් ආලේප කර තිබූ විදුහල්පතිනියගේ කාමරයේ දොර අසල නැවතුණා. ඈ දොරට තට්ටු කළා. පහත්, සුපුරුදු කටහඬක් නැගුණා.

"ඇතුළට එන්න...!"

ඩැරල් දොර විවෘත කළා.

"මම අලුත් ළමයින්ව එක්ක ආවා, මිස් ග්‍රේලින්." ඈ කිව්වා.

"ස්තුතියි, ඩැරල්." විදුහල්පතිනිය කිව්වා.

තද නිල් පැහැ දෙනෙත් හා තදින් පිය වුණු දෙතොල් සහිත පැසුණු හිසකෙස් හා ශාන්ත පෙනුමැති මුහුණක් ඇති ඈ මේසය අසල වාඩි වී යමක් ලියමින් සිටියා. තමා ඉදිරියේ වෙවුලමින් සිටගෙන සිටි ඇරියන් පස්දෙනා දෙස හිස ඔසවා බැලූ ඇගේ ගැඹුරු නිල් පැහැ දෙනෙත් එකිනෙකා වෙත යමින් සෑම ඇරියකම සමීප ලෙස සැලකිල්ලට භාජනය වුණා.

ඔවුන්ගේ නම් සහ පන්ති මොනවා දැයි අසමින් ග්‍රේලින් මහත්මිය සෑම ඇරියකටම ඇගේ පහත්, පැහැදිලි ස්වරයෙන් කතා කළා. පසුව ඈ සියලු දෙනාම බැරෑරුම් ලෙස ඇමතුවා. මීට වසර හයකට ඉහත දී තමා ඇසූ වචන සිහිපත් කරමින්, කුඩා ඇරියන් මෙන්ම ඩැරල් ද සාවධානව සවන් දුන්නා.

"විනාඩියක් දෙකක් මම කියන දේ ඔයාලා හොඳින් අසා ගන්න ඕනෑ. ඔයාලා දවසක මේ පාසලින් ඉවත් වෙලා ලෝකයට යන්නේ තරුණ කාන්තාවෝ හැටියට. ඔයාලා යද්දී ගෙනියන්නේ උනන්දුව

පිරුණු හිතක්, කරුණාවන්ත හදවතක් සහ අන් අයට උදව් කිරීමේ කැමැත්ත. බොහෝ දේවල් ගැන හොඳ අවබෝධයක් හා වගකීම් භාර ගැනීමේ කැමැත්ත අරගෙන ගිහින් ඔයාලා පෙන්වන්න ඕනෑ අනිත් අයට ආදරය කරන්න පුළුවන්, එයාලට විශ්වාස කරන්න පුළුවන් යහපත් කාන්තාවෝ කියන එක. මේ හැම දෙයක්ම ඔයාලට මැලෝරි ටවර්ස්වලදී ඉගෙන ගන්න පුළුවන්, කැමති නම්."

ඈ මොහොතක් නිහඬ වුණා. සෑම දැරියක්ම උවමනාවෙන් ඈ දෙස බලාගෙන උනන්දුවෙන් කන් දීගෙන සිටියා.

"විභාග සමත් වීම, ශිෂ්‍යත්ව දිනා ගැනීම හොඳ දේවල් වුණත් ඒ අය සාර්ථක අය හැටියට මම ගණන් ගන්නේ නැහැ. හොඳ හදවතක් ඇතිව කරුණාවන්ත වෙන්න ඉගෙන ගන්න. සිහි බුද්ධියෙන් වැඩ කරන, විශ්වාස කළ හැකි, ලෝකයාට යහපතක් කරන අය තමයි මම සාර්ථක අය හැටියට ගණන් ගන්නේ. මෙහේ ඉන්න කාලය තුළදී මේවා ඉගෙන නොගන්නා අය තමයි අපේ අසාර්ථකත්වය."

ග්‍රේලින් මහත්මිය දෙස බලාගෙන කන් දීගෙන සිටින ඔවුන් හුස්ම නොගෙන සිටින බවක් පෙනුණා.

"ඔයාලා සමහර අයට මේවා ඉගෙන ගන්න එක හුඟක් ලේසි වෙයි. තවත් අයට අමාරු වෙයි." ග්‍රේලින් මහත්මිය කියාගෙන ගියා. "ඒත් ලේසි හෝ අමාරු, ඔයාලා මෙහෙන් ගියාට පස්සේ සතුටින් ඉන්න ඕනෑ නම්, අනෙක් අයව සතුටට පත් කරන්න ඕනෑ නම් ඒ දේවල් ඉගෙන ගත යුතුමයි."

"හොඳයි, දැන් එහෙනම් ඔයාලා යන්න." විදුහල්පතිනිය නවක සිසුවියන් පස්දෙනාගේ පෙනුම ගැන සතුටුව කිව්වා.

ඔවුන් යහපත් පිරිසක් බව ඈ සිතුවා. අනාගතයේ පන්ති නායිකාවන්, ක්‍රීඩා නායිකාවන්, සමහරවිට ප්‍රධාන ශිෂ්‍ය නායිකාවන් වීමට හැකි පිරිසක්. ඩැරල් ද පිටව යාමට හැරුණා.

"ටිකක් ඉන්න ඩැරල්." ග්‍රේලින් මහත්මිය කිව්වා. "දොර වහන්න."

දොර වැසූ ඩැරල් මේසය වෙතට පැමිණියා. ඈ විදුහල්පතිනිය දෙස බැලුවා.

"ඔයා අපේ සාර්ථකත්වයක්, ඩැරල්." ග්‍රේලින් මහත්මිය කිව්වා. "අපේ ලොකුම ජයග්‍රහණයක්. සැලී තව කෙනෙක්, ඒ වගේම මේරි ලෝව්. මම හිතන්නේ එකම එක කනගාටුදායක පරාජිතයෙක් ඉන්නවා ඔයාලගේ පන්තියේ. වෙනස් වෙන්න ඕනෑ නම් එයාට තියෙන්නේ මේ වාරය විතරයි. මම කියන්නේ කා ගැනද කියලා ඔයා දන්නවා."

"ඔව්." ඩැරල් කිව්වා. "ගොන්ඩොලින්...!"

ග්‍රේලින් මහත්මිය සුසුමක් පිට කළා.

"සමහරවිට මම දන්නවාට වඩා ඔයා එයා ගැන දන්නවා." ඈ කිව්වා. "එයාට මොනවා හරි දෙයක් කරන්න ඔයාට පුළුවන්ද? එයාගේ අනාගතයට කරන්න ඕනෑ මොනවාද කියන එක ගැන එයාගේ දෙමව්පියෝ එක්ක මේ නිවාඩු කාලයේ ඉතාම අප්‍රසන්න කතා බහක් කරන්න මට සිද්ධ වුණා. අම්මාට ඕනෑ එක දෙයක් තාත්තාට ඕනෑ තවත් දෙයක්. එයාගේ තාත්තා, ඇත්තෙන්ම හරි. ඒත් මට ආරංචියි තාත්තා මේ කාරණය අත් ඇරලා දාන්න යනවා කියලා. ඩැරල්, ඔයාට කොහොම හරි පුළුවන් නම්, මට ඕනෑ එයාගේ තාත්තාගේ අදහසට ගොන්ඩොලින්ව නම්මා ගන්න ඔයා උත්සාහ කරලා බලපෑමක් කරන එකයි. එහෙම නැති නම්, ඒ පවුල දෙකට කැඩිලා හුඟක් දුක් කරදර ඇති වෙන්න ඉඩ තියෙනවා."

"මම උත්සාහ කරන්නම්." ඩැරල් තරමක අවිශ්වාසයෙන් කී අතර සාර්ථක වීමට ඇති ඉඩකඩ ඉතා අල්ප බව ග්‍රේලින් මහත්මියට දැනුණා. "මම මේ හැම දෙයක්ම දන්නවා. ඇත්තෙන්ම මිස් ග්‍රේලින්, ග්වේන්ට මේක තේරෙනවා...! ඒත් තමන්ට ඕනෑදේම කරන්න හිත හදා ගත්තාම ග්වේන්ව වෙනස් කරන්න හරි අමාරුයි."

"හොඳයි, කමක් නැහැ." විදුහල්පතිනිය හදිසි සිනාවක් පාමින් කිව්වා. "සැලීලා, ඩැරල්ලා කීප දෙනෙක් ඉන්න තාක් කල් ග්වේන්ලා විස්සක් හිටියත් මට හදාගන්න පුළුවන්."

# 05

ඩැරල් කාමරයෙන් පිට වූයේ කොතරම් ආඩම්බරයෙන් හා සතුටක් ඇති ද යත් ඇයට හඬ නඟා ගීතයක් ගැයීමට තරම් සිතුණා. හිස කෙළින් කර ගත් ඩැරල් පැද්දෙමින් හය වන පන්ති කාමරයට ගියා. දොර විවෘත කළ ඇ නිහඬව පන්තිය තුළට වැදුණා.

"කනගාටුයි, මම ප්‍රමාද වුණා, මිස් ඔක්ස්." ඇ කිව්වා. "මම අලුත් ළමයින්ව මිස් ග්‍රේලින් ළඟට එක්ක ගෙන ගියා."

"ඔව්, මේරි ලෝව් මට කිව්වා." ඔක්ස් මහත්මිය කිව්වා. "අපි කතා කර කර හිටියේ මේ වාරයේ වැඩ ගැන, ඩැරල්. උසස් සහතික පත්‍ර විභාගය ගන්න ඔයාලා එක කණ්ඩායමක් හැටියට වැඩ කරන අතරේ පන්තියේ අනිත් අය එක්ක ඉඳලා හිටලා පාඩම්වලට එකතු වෙනවා. පසුගිය වාර දෙකේදීම ඔයාලා හුඟක් මහන්සි වෙලා වැඩ කළ නිසා මේ වාරයේදී ඕනෑවට වඩා මහන්සි වෙන්න ඕනෑ නැහැ. ඒත් දිගටම හොඳින් වැඩ කරන්න ඕනෑ...!"

ඩැරල් හිස සැලුවා. උසස් විභාගය සමත් වීමට ඇයට මහත් ඕනෑකමක් තිබුණා. සැලීට ද හොඳින් විභාගය කිරීමට අවශ්‍ය බව ඇයට දැනුණා. ඇලිසියා හා බෙටී ගත් කල ඔවුන්ගේ ඉක්මන් මොළය හා දැඩි මතක ශක්තිය සාර්ථකත්වය උදා කර දෙන බව නිසැකවම පෙනුණා. අනෙක් කුලුනුවලින් පැමිණි අනෙක් දැරියන් දෙස ඇ කැරකී බැලුවා. ඔවුන්ගෙන් සමහරෙක් උසස් විභාගය කරන අයයි. ඔව්, ඔවුන් සියලු දෙනා ද සමත් වනු ඇත. ඔවුන් උනන්දුවෙන් මහන්සි වී වැඩ කරන පිරිසක්.

"මම විභාගය නොකරන එක ගැන මට සතුටුයි." ග්වේන් කිව්වා. "කොහොම වුණත් මම හිතන්නේ, මට ඒක ස්විට්සර්ලන්තයේ මගේ අලුත් ඉස්කෝලයේදී ඕනෑ වෙලාවක කරන්න පුළුවන් වෙයි. නේද මිස් ඔක්ස්?"

ඔක්ස් මහත්මිය ග්වේන් ගැන උනන්දු වූ තරමට වඩා ඇගේ අනාගත පාසල ගැන උනන්දුවක් දැක්වූයේ නැහැ.

"ඔයා මොන ඉස්කෝලයට ගියත්, තවම ඔයා උසස් විභාගය කරන මට්ටමේ නැහැ." ඈ නොපහන් ස්වරයෙන් කිව්වා. "මම බලාපොරොත්තු වෙනවා පහුගිය වාර දෙකට වඩා හොඳින් මේ වාරයේ ඔයා වැඩ කරයි කියලා. දැනට ඔයාට තියෙන හැකියාවත් මීට වඩා හොඳින් පෙන්වලා වැඩ කරන එක ඔයාට අමාරුද?"

ග්වේන් මුහුණ ඇද කර ගත්තා. අනුකම්පාව බලාපොරොත්තුවෙන් ඈ කැරකී මොරීන් දෙස බැලුවා. ඇයට කිසි ප්‍රතිචාරයක් නොලැබුණේ ඇය අපහසුවට පත්වනු දැක මොරීන් නිතරම සතුටු වූ නිසයි.

"අමන්ඩා, මම හිතන්නේ ඔයාගේ පරණ ඉස්කෝලය විනාශ වුණේ නැති නම්, ඔයත් උසස් විභාගය කරන්නයි හිටියේ?" ඔක්ස් මහත්මිය උස් මහත් අලුත් දැරිය දෙසට හැරෙමින් ඇසුවා. "ඔයා මෙහේදී විභාගය ගන්න බලාපොරොත්තු වෙනවාද? ඔයාට ඕනෑ නම් ලබන අවුරුද්දෙදි ගන්න පුළුවන් නිසා, මට ආරංචියි ඒක තීරණය කරන්න ඔයාටම ඉඩ දීලා තියෙනවා කියලා."

"මේ වාරයේදී මම විභාගය කරන්නේ නැහැ." අමන්ඩා කිව්වා. "වෙනස් වෙනස් ගුරුවරු එක්ක වැඩ කරද්දී පැටලෙනවා. ඒක මට වෙන අසාධාරණයක්. ඒ වෙනුවට මම ක්‍රීඩා කරන්න හිතාගෙන ඉන්නේ. ඔලිම්පික් තරගවලට යන්න. කොහොම වුණත් ලබන අවුරුද්දේ පැවැත්වෙන තරගවලට මාව තෝරා ගනියි."

මේ වනතුරු මේ වගක් දැන සිටියේ උතුරු කුලුනේ දැරියෝ පමණයි. අනෙක් කුලුනුවල දැරියෝ මුව අයාගෙන අමන්ඩාගේ නිසැක ඍජු ප්‍රකාශය ගැන කල්පනා කළා. ඔලිම්පික් ක්‍රීඩාවලට යන්න...! එක්කෝ ඇය උමතුවෙන් නැති නම් ක්‍රීඩාවලට ඉතාම දක්ෂයි...!

"ඕ... ඔව්." ඔක්ස් මහත්මිය ශාන්තව කිව්වා. "ඔයා ආවේ ට්‍රෙනිගන් ටවර්ස්වලින් කියලා මට අමතක වුණා. හොඳයි අමන්ඩා. ඔයාගේ වාසනාව. මෙහෙත් ක්‍රීඩා පැත්ත හොඳයි කියලා ඔයාට පෙනෙයි. හොඳට පවත්වාගෙන යනවා."

අමන්ඩා ඇදහිය නොහැකි ලෙස බැලුව නමුත් කිසිවක් කීවේ නැහැ. කෙසේ වුවත් මැලෝරි ටවර්ස්වල ක්‍රීඩා ගැන ඇය එතරම්

පැහැදීමක් නැති බව ඇගේ මුහුණින් පිළිබිඹු වුණා. සැලී මඳක් කලකිරුණ ද ඇයට යම් විනෝදයක් දැනුණා. මොරියා කේන්තියෙන් පසු වුණා. හැකි තරම් ඉක්මනින් ඇගේ උඩඟුකම අඩු කළ යුතු බව සිතමින් ඈ අමන්දා දෙස රවා බැලුවා.

ප්‍රංශ දැරිය, සූසේන්, ඇස අඩවන් කරගෙන වාඩි වී මේ තාක් කතා බහට සවන් දීගෙන සිටියා. හදිසියේම ඕක්ස් ගුරුතුමිය ඇයට කතා කරද්දී ඈ ගැස්සුණා.

"සූසේන්, ඔයා අහගෙනද ඉන්නේ?"

"පොලිස්." සූසේන් කිව්වා.

ඕක්ස් ගුරුතුමිය පුදුමයට පත් වුණා.

"එයා කියන්නේ 'ප්ලීස්' කියන එක." සිනාවක් නැගූ ඩැරල් කිව්වා. "එයාට මොනවා හරි තේරුණේ නැති නම් නිතරම එයා 'පොලිස්' කියනවා. නේද සූසේන්?"

"පොලිස්." වචනයක් හෝ නොතේරුණ සූසේන් කිව්වා. "පොලිස් ඩැරල්. මට තේරුම් ගන්න බැහැ."

"හරි, සූසේන්. ඔයාට ඇස් කන් ඇරගෙන අහගෙන ඉන්න වෙනවා." ඕක්ස් ගුරුතුමිය කිව්වා. "නැතිනම් මෙහේ ඉන්න කාලයේදී ඔයාට ඉංග්‍රීසි වචනයක්වත් ඉගෙන ගන්න බැරි වෙයි. මම හිතන්නේ ඔයා මෙහාට ඇවිදින් ඉන්නේ ඒකට."

"පොලිස්." සූසේන් එකම දෙය කිව්වා.

පෙනුමින් අනුවණ බවක් පළ කරන තම ඥාති දියණිය ගැන මම්සලී රොජර් සමග පෞද්ගලිකව කතා කිරීමට ඈ අදහස් කර තිබුණා. එම වාරයේ කරන්නට තිබූ වැඩ ගැන උපදෙස් දීමටත්, පාවිච්චි කළ යුත්තේ කුමන පොත් ද යන්නත්, දැරියන් තනි තනිව කළ යුත්තේ මොනවාද යන්නත් කීමට ඈ පටන් ගත්තා.

"මම කැමතියි අපේ ඕකේට" ඩැරල් විවේකයේදී කිව්වා. "ඒත් මම හුඟක් කැමතියි එයා ටිකක් විහිළු කරලා ඉන්නවා නම්. එයාට කවම කවදාවත් විහිළු තේරෙන්නේ නැහැ. ඒත් එයා නිතරම සැක කරනවා කවුරු හරි එයාව රවට්ටන්න උත්සාහ කරනවා කියලා."

"ඔව්, අයිරිනුයි එයාගේ තාලයි වගේ." බෙලින්ඩා කිව්වා. "ඒත්

ඇත්තටම, අයිරින් ඒවා කරන්නේ ඇත්තටමයි. අර, දැන් බලන්න. ජනේලය ළඟට වෙලා ගස් දිහා බලාගෙන 'ෂූෂා... ෂූෂා...' ගානවා. අලුත් තාලයක් හොයාගෙන වගේ."

ඇලිසියා නපුරු ලෙස සිනාවක් පෑවා. අයිරින් වෙතට ගිය ඈ ඇගේ උරපත්තට තට්ටු කළා. "මේ, අයිරින්... මටත් කෝච්චි සෙල්ලම් කරන්න පුළුවන් ද? ෂූෂා... ෂූෂා.. එන්න, අපි කෝච්චි සෙල්ලම් කරමු."

පුදුමයට පත් වූ අයිරින් සිදුවන්නේ කුමක් දැයි දැන ගැනීමටත් පෙර හය පන්තියේ දැරියෝ අඩක් පමණ ඇය පසුපසින් පෙළ සෑදී තිබූ අතර ඔවුන් දුම්රිය ඇන්ජිමක් ලෙස හඬ නගමින් සිටියා.

අමන්දා අවඥාවෙන් බලාගෙන සිටියා. මේක පුදුම ඉස්කෝලයක්..! ඈ සිතුවා. මේ වන විට ඇය ට්‍රෙනිගන් ටවර්ස්හි සිටියේ නම් සෑම දෙනාම පිටතට ගොස් ටෙනිස් පහරක් හෝ වෙනයම් දෙයක් හෝ පුහුණු වෙමින් ඉන්නට තිබුණා.

"ඔහොම ඉන්න අමන්දා, ඔහොමම ඉන්න." බෙලින්ඩා හදිසියේම අමන්දාගේ විශාල මුහුණේ වූ අප්‍රසන්න බැල්ම දැක කිව්වා.



ඉක්මනින් එරව්ලි පොත අතට ගත් ඈ කඩිනමින් අඳින්නට වුණා. ඇය කරන්නේ කුමක් දැයි අමන්දාට කිසිම අදහසක් තිබුණේ නැහැ. ඇය අලුත් දැරියක නිසා බෙලින්ඩාට යමක් ඇඳිය හැකි බව හෝ ඈ දැන සිටියේ නැහැ.

භීතියට පත් ඇය දැක ගත්තා බෙලින්ඩා ඇගේ මුහුණත් ඒ මත වූ ප්‍රකාශනයත් ඉතා මනාව අල්ලා ගෙන තිබූ බව. පොත උදුරා ගැනීමට ඇය පැන්න නමුත් බෙලින්ඩා ඉවතට පැන මඟ හැර ගත්තා.

“මම ඒ වගේ නෙවෙයි.” අමන්දා කෝපයට පත්ව කිව්වා. “මම එතැන හිටගෙන කල්පනා කර කර හිටියේ මගේ පරණ ඉස්කෝලය ගැන. මේ වගේ මෝඩ වැඩ කර කර ඉන්නේ නැතිව එළියට ගිහින් ටෙනිස් පුහුණුව හරි මොළය ඇති තව දෙයක් හරි කරනවා.”

“ඇත්තටම...?” මොරියා අකරුණාවෙන් කිව්වා. “මම හිතන්නේ, මේ වෙලාවේ එළියේ වහිනවා කියලා ඔයා දකින්න නැතිව ඇති.”

ඇත්තෙන්ම, අමන්දා දැක තිබුණේ නැහැ. ඈ යුහුසුළුව ඉඳ තිබුණේ අනෙක් අය කරන දේ මෝඩ දේවල් ලෙස අවඥා සහගතව බලා ඉඳීමටයි. මොරියා වෙතට ඉතා අප්‍රසන්න බැල්මක් හෙළූ ඈ ඉවතට යාමට හැරුණා. මොරියා ද එවැනිම බැල්මක් ඇය වෙතට හෙළුවා. ඒ බැලීම් දෙක අතරින් ඉඳිකටු තුඩක් යැවීමට තරම් වෙනසක් නැති බව ඩැරල්ට සිතුණා.

අමන්දා ගමන් කළේ රේඩියෝව තබා ඇති මුල්ලටයි. එය අත පත ගාමින් සිටි ඈ අවසානයේ ක්‍රීඩා ඉසව්වක් සටහන් වූ හඬ පටියක් සොයා ගැනීමට සමත් වුණා. මහත් උද්‍යෝගයෙන් කතා කළ ක්‍රීඩා විස්තර ප්‍රචාරකයාගේ හඬ දැරියන් විවේකය ගත කරමින් සිටි කාමරය පුරා ගිගුම් දෙන්නට වුණා.

ශබ්දය මඳක් හෝ අඩු කරන ලෙස ඇයට කීමට කිසිවෙක් කැමති වුණේ නැහැ. සැලීට වැලමිටෙන් ඇන්න ඩැරල් ජනේලය දෙසට හිස දිගු කළා. වැස්ස නැවතී තිබුණා. සැලී සිනාවක් පෑවා.

ඇය හා ඩැරල් අමන්දාට බාධා නොකර කාමරයෙන් පිට වන ලෙස අනෙක් අයට සංඥා කළා. ඔවුන් එකිනෙකා නිහඬව

කාමරයෙන් පිටතට ගිය පසු සැලී හා ඩැරල් සෙමින් දොර වසාගෙන පිටව ගියා. ක්‍රීඩා ඇඳුම් කාමර වෙත ගොස් කබඩ් සොයා ගත් ඔවුන් ටෙනිස් පිති ගෙන, පාවහන් පැලඳ ගෙන ටෙනිස් පිටි කරා නිහඬව ගියා.

"එයා අපිව දැක්කොත් හොඳයි...!" හති දමමින් මොරියා කිව්වා.

අමන්ඩා දැක්කා. හඬ පටිය අවසන් වූ පසු ඇ රේඩියෝව ක්‍රියා විරහිත කළා. කාමරයේ ඇඩි නිහඬ බවින් හදිසියේම කලබල වූ ඇ කැරකී වටපිට බැලුවා. එය හිස්ව තිබුණා. පිටතින් කටහඬවල් හා ටෙනිස් බෝලවලට තළන හඬ ඇසුණ ඇ ජනේලය වෙතට ගියා. ඇ රවා බැලුවා. නපුරියෝ...! ඔවුන් මේ හැමදේම කරන්නේ ඇයට රිදවීමටයි.

සීනුව නාද වූ විට දැරියෝ හඬ නගා සිනාසෙමින් ආපසු දිව ආවා.

"අපරාදේ... ඔයාට සෙල්ලම් කරන්න හිතුණේ නැත්තේ, අමන්ඩා. ඊළඟ සැරේවත් බලන්න...!" මොරියා කිව්වා.

# 06

සුපුරුදු පරිදි අලුත් වාරයේ වැඩ කිරීමට දැරියෝ ඉක්මනින් හැඩ ගැසුණා. ගිම්හාන වාරය නිතර සුන්දර එකක් වුණා. කිරීමට බොහෝ දේ තිබුණා. මුහුදු වෙරළේ ගල් තලාවක පිහිටි විශාල ගල් වළක් වූ අද්විතීය පිහිනුම් තටාකය පිහිනීම ඇලුම් කළ අයට මහත් සතුටක් ගෙන දෙන තැනක් වුණා.

බොහෝ දැරියෝ තටාකයට ඇලුම් කළා. ඉතා සුළු පිරිසක් කැමති වුණේ නැහැ. පිහිනීම ඉගෙන නොතිබුණ අය බිය වුණා. ශීතල වතුරට අකමැති අය ද තටාකයට කැමති වුණේ නැහැ. ග්වේන්, ඇත්තෙන්ම මේ අයගෙන් කෙනෙක් වූ අතර මොරීන් ද එවැනිම කෙනෙක් වුණා.

අලුත් ප්‍රංශ දැරිය ද තටාකය පිළිබඳ අදහස පවා පිළිකුල් කළා. වරක් දැරියන් පිහිනනු බැලීමට ඇය ඒ වෙතට ගිය අතර කැලඹුණ ජල පහරක් ඇගේ දෙපා අසලට පැමිණීම පවා ඇයට බියෙන් හඬ තැළීමට ප්‍රමාණවත් වුණා.

"සූසේන්, මෝඩියක් වෙන්න එපා." එදින පිහිනුම් භාරව සිටි පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඔයා පළමු පන්තියේ ළමයෙක් වගේ මෝඩ විදිහට කෑ ගහනවා නම් මම ඔයාගේ ඇඳුම් ගලවලා වතුරට තල්ලු කරනවා. මම්සලී ඒක නොකරන්නේ ඇයි කියලා මට හිතාගන්න බැහැ."

කෙනෙකු තටාකයට බැසීමට අකමැති නම් මම්සලී කිසිදින ජලාශයට බැසීමට ඔවුන්ට බල කළේ නැහැ. ඇය ද වතුරට ප්‍රිය නොවූ අතර අනෙක් ප්‍රංශ ගුරුතුමිය, මම්සලී රොජර්, සූසේන්ගේ නැන්දා ද එසේමයි. එංගලන්ත පාසල්වල දරුවන් ක්‍රීඩාවලට මෙතරම් උමතුවක් දක්වන්නේ මන්දැයි ඒ දෙදෙනාටම සිතා ගැනීමට අපහසු වුණා.

"මම ආපසු යනවා." සූසේන් ප්‍රකාශ කළා.

ඊළඟ ජල පහර ඇයට සමීපවත්ම පාසල ඉදිකර තිබූ කඳු මුදුනට යාමට ඇති බෑවුම් සහිත පර්වත මාවත ඔස්සේ ඈ නැග යන්නට පටන් ගත්තා.

ග්වෙන්ට හා මොරීන්ට පැහැදිලි ශීතල වතුරට බැසීමට සිත සාදා ගැනීම සඳහා කල්පයක් ගත වුණ ද ඇත්තෙන්ම ඔවුන්ව තටාකය තුළට යවා තිබුණා. සෑම කෙනෙක්ම වතුරට බැස හමාර වන තුරු ඔවුන් කල් මැරුවේ, ඇලිසියා හෝ මොරියා හෝ බෙට්ටි හෝ අසලකින් ගියහොත් ඉතා පුදුම සහගත ලෙස බැරි වීමෙන් සිදුවන හැප්පීම් සහ තල්ලු වීම් ගැන ඔවුන් දැන සිටි නිසයි. ග්වෙන් පිළිකුල් කළ යමක් තිබුණේ නම් ඒ කිසිදු අනතුරු ඇඟවීමකින් තොරව ඇයව තටාකයට විසි වී වැටීමයි.

මොරියා දක්ෂ පිහිනුම් ශූරියක්. සැලී ද එසේමයි. ඩැරල් නිතරම පිහිනීමට දක්ෂ වුණා. එහෙත් අලුත් දැරිය, අමන්ඩා, මේ සියලු දෙනාම පරාජය කළා.

ඈ ඉතා අද්විතීය පිහිනුම් ශූරියක්. පළමුවර ඇය ජලයට පනිද්දී හැම කෙනෙක්ම මුව අයා බලා සිටියා. උරහිස් ආරට ඉතා ශක්තිමත්ව දිය මතුපිටින් රේඛාවක් මෙන් වේගයෙන් ඇදෙද්දී දැරියෝ ඒ තාක් කලකට දැක තිබූ දක්ෂ පිහිනීම එය බව පෙනුණා.

"අපොයි... පුදුම පිහිනුම් ශූරියක්...!" ඩැරල් කිව්වා. "ඒ වගේ දෙයක් මම කවදාවත් දැකලා නැහැ. එයා ඔලිම්පික් තරගවලට යන්න තරම් හොඳයි. එයාට පුළුවන් අපිව අන්තයට පරාද කරන්න, සැලී."

තටාකය ගැඹුරු විශාල එකක් වුව ද අමන්ඩා ඉන් සෑහීමට පත් වුණේ නැහැ. ඈ මුහුද දෙස බැලුවා.

"මම ගිහින් මුහුදේ පීනනවා." ඈ කිව්වා.

"ඒක තහනම්." අසල සිටි ඩැරල් ඇඟ පිස දමමින් කිව්වා. "වඩදිය එක්ක භයානක ජල ධාරාවක් එනවා."

"ජල ධාරා මම වගේ පිහිනුම්කාරියන්ට භයානක නැහැ." කී අමන්ඩා ඇගේ ශක්තිමත් අත්වල මස් ගොබ පෙනෙන පරිදි අත වැනුවා. පහළ පන්තිවල දැරියෝ ඇය දෙස විමතියෙන් බලා සිටියා. අමන්ඩා පිහිනුම් තටාකයට යන බවට ආරංචිය පැතිරෙන හැම විටකම

ඔවුන් ද තටාකය වෙතට එන මාවතේ පහළට බැස්සේ එතැනට ගොස් ඇස් මහත් කරගෙන බලා සිටීමටයි.

"ඔයා කැමතිද මේ පොඩි අයට ටිකක් පුහුණු කරන්න, අමන්දා?" සැලී එක් දිනක විමසුවා.

පාසලේ ක්‍රීඩා නායිකාව ලෙස, ක්‍රීඩාවට ඇල්මක් ඇක්වූ බාල ඇරියන්ව පුහුණු කිරීමට නිතර සැලී සෙවිල්ලෙන් සිටියා.

"බලමු." අමන්දා උනන්දුවකින් තොරව කිව්වා. "මගේ කාලය නාස්ති වෙන්නේ නැති නම් විතරක්, බලමු."

"හොඳයි, ඔයාට හිතෙනවා නම් විතරයි...!" මොරියා තරමක කෝපයෙන් කිව්වා.

අසලක සිටි ඇයට මේ කතාබහ ඇසී තිබුණා. මොරියා කාටවත් එතරම් ප්‍රියමනාප අයෙකු නොවූව ද ක්‍රීඩාවලදී පහළ පන්තිවලට උදව් කිරීමට නිතර උනන්දු වූ අතර ඈ සැලීට විශාල සහයෝගයක් දුන්නා.

"ට්‍රෙනිගන් ටවර්ස්වලදී අපි කවදාවත් පොඩි අය ගැන කරදර වුණේ නැහැ." කී අමන්දා ඉතා තදින් ඇඟ අතුල්ලා පිස ඇමූ අතර ඇගේ සිරුර තද රතු පැහැයට හැරුණා. "අපිට හුඟක් ක්‍රීඩා පුහුණු ගුරුවරියෝ හිටියා. එයාලා තමයි පොඩි අය ගැන බලාගත්තේ. ඔයාලට මෙහේ ඒ තරම් ක්‍රීඩා ගුරුවරියෝ නැහැ වගේ පෙනෙන්නේ."

මැලෝරි ටවර්ස් ගැන කෙරෙන මෙම විවේචනය ඩැරල්ව කෝපයට පත් කළ ද ඈ එය යටපත් කර ගත්තා. සෑම දෙයක් සඳහාම ප්‍රමාණවත් තරම් ගුරුතුමියන් සිටියා. ට්‍රෙනිගන් පාසල, ක්‍රීඩාව එහි ආගම කරගෙන තිබුණ ආකාරයට මැලෝරි ටවර්ස් ක්‍රීඩාවට මුල් තැන නොදුන් පමණින් මෙම හැඩිඇඩි අමන්දා එය හෑල්ලුවට ලක් කිරීමට තරම් නිර්භීත වෙලා...!

ඩැරල්ගේ මුහුණ දුටු සැලී ඇයට වැලමිටෙන් ඇන්නා.

"මොකවත් කියන එක හොඳ නැහැ." ඈ කියන අතරේ අමන්දා ඉවතට ගියා. "එයාගේ මෝඩකම. එයා ගැනයි, එයාගේ අනාගතය ගැනයි ඕනෑවට වඩා විශ්වාසය තියාගෙන ඉන්නේ. අපිට මොකවත් කියලා එයාව වෙනස් කරන්න බැහැ. ට්‍රෙනිගන් ගින්නෙන් අළු වුණ

එක ගැන එයා හුඟක් දුකින් ඇත්තේ. ඒ වගේම මැලෝරි ටවර්ස් එයාට අලුත්. අනික එයා ක්‍රීඩාවලට ආදරය කරන තරමට අපේ ඉස්කෝලය ක්‍රීඩාවලට උනන්දුව අඩුයි."

"එයාගේ ලොකු වාසනාවක් මෙහාට එන්න ලැබුණ එක." තවමත් කෝපයෙන් බලා සිටි ඩැරල් කිව්වා.

සැලී හඬ නගා සිනාසුණා. ඩැරල්ගේ ප්‍රසිද්ධ ඉක්මන් කේන්ති යාම ඈ දැක තිබුණේ බොහෝ කලකට පසුවයි. එක්තරා කාලයක, ඩැරල් සෑම වාරයකම ඉක්මනින් කේන්තියට පත්වී ඇගේ කෝපයෙන් පාසලම කම්පනයට පත් කළා. එහෙත් දැන් ඩැරල් එය හොඳින් පාලනය කරගෙන තිබූ නිසා එය දැකගත හැකි වූයේ ඉතා කලාතුරකින්.

"එයා එක්ක හැප්පෙන්න යන්න එපා." සැලී කිව්වා. "මම කියන දේ අහන්න. එයා ඉක්මනින්ම මා එක්ක හැප්පෙන්න එනවා. එයා නිතරම කේන්තියෙන් ඉන්නේ ටෙනිස් ගැන. අපිත් එක්ක සෙල්ලම් කරන එකේ තේරුමක් නැහැ කියලා හිතාගෙන ඉන්නේ. දැනටමත් එයා මොරියා එක්ක අවුල් ඇති කරගෙන ඉන්නේ. ළඟදීම ලොකු රණ්ඩුවක් ඇති වෙයි."

දෙවැනි පන්තියේ දැරියෝ ඔවුන්ගේ දිය නෑම සඳහා තටාකයට එහා මාවතේ පහළට දිව ආවා.

ඈ මහත් ආඩම්බරයෙන් ෆෙලිසිටි දෙස බලා සිටියා. ෆෙලිසිටි සහ ඇගේ මිතුරිය, සූසන්, දර්ශනීය ලෙස දියේ කිමිදී විශාල ජලාශයේ ඒ අතට මේ අතට පිහිනා ගියා.

"ඔයාගේ නංගී හොඳට හැදෙන පාටයි." මොරියා ඩැරල්ට කිව්වා. "එයා ගිය වාරයේ හොඳට වැඩ කළා. මේ වාරයේ ඊටත් වඩා හොඳයි. මම හිතන්නේ එයා පසුපස ආරට පිහිනන එක තව දියුණු කර ගත්තොත් අපිට පුළුවන් වෙනවා එයාව පිහිනුම් කණ්ඩායමට දා ගන්න."

"මමත් එහෙම හිතනවා." ඩැරල් කීවේ ෆෙලිසිටි කැපී පෙනෙනු දැකීමට මහත් ආශාවෙන්. "සූසනුත් හොඳයි. ඒත් ඒතරම් වේගවත් නැහැ. හෙලෝ... කවුද අර මුහුදු ඊරි?"

වෙවුලමින්, තටාක ඉවුරේ සිටගෙන සිටියේ නුහුරු බවක් පළ කළ මහත දැරියක්. මේ වන විටත් වතුරට බැස සිටි දෙවැනි පන්තියේ දැරියෝ ඇයට කෑ ගසමින් සිටියා.

"බහින්න ජෝ...! එනවා, ඊරි...! ඉක්මන් කළේ නැතිනම් තමුසෙට වතුරේ ඉන්න වෙන්නේ හරියටම විනාඩි දෙකයි. එච්චරයි...!"

විනාඩි දෙක වුව ද තරබාරු, බියගුලු ජෝට ඕනෑවට වැඩිය. සෑම දෙයකදීම මුරණ්ඩු හා නොහික්මුණ බවක් ගත්ත ද ශීතල වතුර සම්බන්ධයෙන් ඈ බියගුල්ලියක් වුණා. ඈ තම පියාට පිහිනීමෙන් බේරා ගන්නා ලෙස ආයාචනා කර තිබූ අතර ඔහු තම දියණිය අකමැති නම් පිහිනුම්වලට නොයවන ලෙස ග්‍රේලින් මහත්මියට දුරකථනයෙන් දැනුම් දී තිබුණා.

"ඇයි ඒ?" ග්‍රේලින් මහත්මිය නොරිස්සුම් ස්වරයෙන් ඇසුවා. "එයාට පිහිනීම වෛද්‍යවරයා තහනම් කරලාද?"

"නැහැ, මමයි තහනම් කරලා තියෙන්නේ." මහ හඬින් කතා කරන ජෝන්ස් මහතා දුරකථනයෙන් කෑ ගැසුවා. "ඒක හොඳ මදිද?"

"මම හිතන්නේ හොඳ නැහැ." ග්‍රේලින් මහත්මිය ඇගේ දැඩි, තීරණාත්මක ස්වරයෙන් කිව්වා. "ගැහැනු ළමයි මැලෝරි ටවර්ස්වලට එවන්නේ සාමාන්‍ය එදිනෙදා කටයුතු කරන්න. වෛද්‍යවරයෙකුගේ උපදෙස්වලට පටහැනි නොවෙනවා නම් ජෝ පිහිනන එකේ වැරැද්දක් නැහැ. එයා වතුරට බය විතරයි තියෙන්නේ. එහෙමයි ක්‍රීඩා ගුරුතුමිය කියන්නේ. මම හිතන්නේ ඔයා මා සමග එකඟ ඇති ශීතල වතුර ජෝසපින්ව පරාද කරනවාට වඩා ජෝසපින් වතුර පරාද කරන එක හොඳයි කියලා."

තමා ද වතුර පිළිකුල් කළ අතර තමා කළ ලෙසම වතුර අසලකට හෝ ජෝ නොගොස් සිටීමේ වරදක් ඇති දැයි ඇසීමට ජෝන්ස් මහතා ආසන්නව සිටිය ද හදිසියේම ඔහු එම සිතුවිල්ල අත් හැරියා. ඔහුට අනතුරු හඟවන යමක් ග්‍රේලින් මහත්මියගේ ශාන්ත ස්වරයේ ගැබ්ව තිබුණා. ඔහු හදිසියේම රිසිවරය තැබුවා. ඔහු බලපෑමක් කළොත් ජෝට මැලෝරි ටවර්ස්හි ඉඩක් නැති බව ග්‍රේලින් මහත්මිය සොයා ගනු ඇත.

මෙලෙස ජෝගේ කලකිරීමටත්, පුදුමයටත් ඇගේ පියා ඇයට කියා තිබුණේ ඇය පිහිනීමට හැඩ ගැසී එය දිගටම කරන ලෙසයි. සෑම දිනකම තටාකයට යාමට සිදු වූ ඇය දෙවැනි පන්තියේ කෙනෙකු තල්ලු කරන තුරු හෝ වතුරට ඇද දමන තුරු හෝ තටාක

ඉවුරේ බියෙන් වෙවුලමින් සිටියා. පළමු පන්තියේ දැරියන් පවා ජෝව වතුරට තල්ලු කරන බව කවුරුත් දැන සිටියා.

මෙදින ෆෙලිසිටි පසුපසින් රහසිගතව පැමිණ වේගයෙන් මහත් ජල කැලඹුමක් සමග ජෝව තටාකය තුළට පතිත වන සේ තල්ලු කළා. මුව අයා හුස්ම ගනිමින්, වතුර ගසමින් උඩට පැමිණි ජෝ, දැඩි ලෙස කෝපයෙන් යුතු වුණා. මුවින් වතුර පිට කර කතා කර ගැනීමට හැකි වූ වහාම ඈ සිනාසෙමින් සිටි ෆෙලිසිටි වෙතට හැරුණා.

"නපුරි...! තමුසේ මේක කරපු දෙවැනි වතාව. ඉන්නවාකෝ. මම වාඩුව ගන්නම්. තමුසේ තමුසෙගේ තාත්තා වගේ නරකයි...!"

"මොනවද මගේ තාත්තා කළේ...?" ෆෙලිසිටි විනෝදයෙන් ඇසුවා.

"එයා මගේ තාත්තට නරක විදිහට කතා කළා." ජෝ කිව්වා. "එයාව කානුවට තල්ලු කළා කියලා. මම අහගෙන හිටියේ."

"ඕ... හරි. එයා අපේ කාර් එක කානුවට තල්ලු කළා. දැන් මම ඔයාව වතුරට තල්ලු කළා...!" ෆෙලිසිටි කෑ ගැසුවා. "එකට එක...! දැන් අපි සමයි...! පරිස්සම් වෙන්න. මම එන්නේ ඔයාව ගිල්ලවන්න...!"

ඈ දියේ කිමිදුණේ ජෝගේ පාදය අල්ලා ගැනීමටයි. යටිගිරියෙන් හඬ තැළූ ජෝ, පාද ගසා දමන්නට වුණා. ඇගේ පාද ලිස්සා ගොස් ඈ ජලය තුළ නැවත වතාවක් නොපෙනී ගියා. ඈ උඩ මතු වුණේ දැඩි කෝපයෙන්. ජලය සමග පොර බඳා පැත්තකට ගිය ඈ සැලීට හඬ නගා කතා කළා.

"සැලී...! ෆෙලිසිටි වතුරේ බැහැගෙන කරන මෝඩ වැඩ ඔයාට නවත්තන්න බැරිද? එයා නිතරම මගේ කකුල්වලින් අදිනවා."

"එහෙනම් පිහිනන්න ඉගෙන ගන්න." සැලී කිව්වා. "ටිකක් පුහුණු වීම් කරන්න. ඔයා හැම පුහුණුවක්ම මඟ හරිනවා. බලාගෙන... ඔන්න මම තව එක් කෙනෙක් එවනවා ඔයාගේ කකුල්වලින් අදින්න."

අසරණ ජෝ...! ඇය පිටතදී කොතරම් උඩඟු ලෙස හැසිරුණ ද පුරසාරම් දෙඩුව ද තම හොරණෑව පිම්බ ද ඇය තටාකයේදී පළමු පන්තියේ දැරියකටත් වඩා පහත් මට්ටමක සිටියා.

# 07

තම අවසාන වාරය සෙමින් ගත වේවායි ඩැරල් ප්‍රාර්ථනා කළා. සැලී ද එසේමයි. ග්වේන් නිතර නිමක් නැතිව තම ඊළඟ හා අවසාන පාසල ගැන කතා කළා.

"ඒක තියෙන්නේ ස්විට්සර්ලන්තයේ, දන්නවානේ." ඈ සිය වතාවකට වැඩියෙන් කියා තිබුණා. "එහේ තියෙන හොඳම එක. හැම කෙනෙකුටම යන්න බැහැ. හොඳට තෝරලා ගන්නේ. ඒකට කියන්නේ 'අවසන් පාසල' කියලා."

"හරි, මම හිතන්නේ එහේදී ඔයාව හොඳටම අවසන් වෙයි." ඇලිසියා කිව්වා. "ඔයාව අවසන් කරන්න දැන් කාලය හරි."

"මේක විකාර කතාවක් නොවෙයි, ඇලිසියා." තරහා බවක් පෙන්වමින් ග්වේන් කිව්වා. "මට යන්න හුඟක් රණ්ඩු කරන්න වුණා." ග්වේන් කියද්දී සෙසු අය සිහින් කෙඳිරියක් නැගුවා.

ඔවුන් ග්වේන්ගේ රණ්ඩු ගැන ඕනෑ තරම් අසා තිබුණා. ඒ ගැන කතා කළ සෑම විටකම ඇය කියා තිබුණේ ඇය තම පියාට කියා තිබූ වඩාත්ම වඩා නරක දේවල්.

"මම හිතන්නේ නැහැ, ඔය කියන දේවල්වලින් භාගයක්වත් එයා කියන්න ඇති කියලා." ඇලිසියා ඩැරල්ට කිව්වා. "කිසිම තාත්තා කෙනෙක් එහෙම ඉවසන්නේ නැහැ. ලැසී නෝනාත් ග්වේන් එයාගේ විදිහටම හදන්න හුඟක් සැරයක් උත්සාහ කරලා තියෙනවා."

කෙසේ වෙතත්, එය සත්‍යයක් වූවේ, නිවාඩු කාලය අතරතුරේ ග්වේන්ට නපුරු ලෙස තම පියාට කතා කිරීමට ලැසී මහත්මිය ද උදව් කර තිබූ නිසයි. ග්වේන්ට 'කදිම මිතුරියන්' සොයා ගත හැකි විදේශීය විද්‍යාලයකට ඇයව යැවීමට ලැසී මහත්මියට මොන තරම් ඇඩි උවමනාවක් තිබුණේ ද කිවහොත් ඇය තමාට හැකි සියලුම බලය යොදා ගනිමින් ග්වේන්ට හිතුවක්කාර වීමට රුකුල් දුන්නා.

ඇගේ පුරාජේරු ඇසීමට ඇරයනා කැමැත්තක් නොදැක්වුව ද
ඇ මේ හැම දෙයක්ම ඔවුන් සමග පැවසුවා.

"මිස් වින්ටර් නම් මහා මෝඩියක්. එයා කියන්නේම 'ඔයාගේ තාත්තාට මහන්සියි, ගොන්ඩොලින්. ටික කාලයක ඉඳලා එයාට සනිප මදි. එයාට මේ තරම් කරදර කරන එක හොඳ නැහැ කියලා ඔයාට හිතෙන්නේ නැද්ද?' එයා මෝඩ වගේම දුර්වල කෙනෙක්, හැමදාම එහෙමයි."

"කට වහගන්න...!" සැලී කිව්වා. "මම නම් කවදාවත් මගේ තාත්තාට එහෙම සලකන්නේ නැහැ."

"මම මගේ තාත්තාට කිව්වා, 'මම ඔයාගේ එකම දුව නේද? එක අවුරුද්දක් මම සතුටින් ඉන්නවාට ඔයා තරහාද?' කියලා." තමා කී දේවල් රස විඳිමින් ගොන්ඩොලින් දිගටම කතා කළා. "මම කිව්වා, 'ඔයා මට ආදරේ නැහැ. ආදරේ කරලත් නැහැ. එහෙම වුණා නම් ඔයා මට මේ සුළු දෙයට අවසර දෙනවා. අම්මත් කියන්නේ ඒක,' කියලා."

"කට වහගන්නයි කිව්වේ...!" සැලී නැවතත් කිව්වා. "අපිට ඕවා අහන්න උවමනාවක් නැහැ. ඒක ඔයාගේ ලොකුකමක් නෙවෙයි, නපුරුකම."

"ඕ... ඔයාගේ බොරු උපාසකකම, නේද සැලී?" ග්වේන් කිව්වා.

ඇ පුහු අහංකාර ලෙස අනුවණ සිනා හඬක් නැගුවා.

"කොහොම වුණත් මට විශ්වාසයි ඔයාට හයියක් නැහැ තාත්තාට විරුද්ධ වෙන්න."

"තමන් හරියට හැදෙනවා නම් දෙමව්පියන්ට විරුද්ධ වෙන්න උවමනාවක් නැහැ." සැලී කෙටියෙන් කිව්වා.

"ඉතින්, කියන්න ග්වේන්." මොරීන් කාමරයේ මුල්ලක සිට කිව්වා. "හරිම රසවත්. ඔයා හුඟක් ලොකු එක්කෙනෙක් වගේ...!"

මොරීන්ගේ ප්‍රශංසාව ගැන ග්වේන් විමතියට පත් වුව ද මහා සතුටට පත් වුණා. මොරීන් ඇයව දිරිමත් කරන්නේ හැමෝටම ඇය කරදරයක් බවට පත් කර ඇයව එපා කරවීමට බව ඇයට පෙනුණේ නැහැ. අනෙක් අය කොතරම් පිළිකුලට පත්ව සිටියේ දැයි මොරීන් දුටුවා. ඇය ද අනෙක් අයගේ පිළිකුලට බඳුන් වූ කෙනෙක්. ඇය

බොහෝ දුරට ග්වේන් වැනිම වුව ද අඩුම තරමේ ඈ දෙමව්පියන්ට ආදරය කළා.

'ග්වේන් තව තව කතා කරපු දෙන්.' ඈ සිතුවා. 'යක්ෂණී...! ලොකුකම් පෙන්වනවා...!'

මෙලෙස ග්වේන් තම පියාට කියා තිබූ අකරුණාවන්ත දේවල් නැවත මොරීන්ට කියමින් තම ජයග්‍රහණය ගැන උදම් වී දිගටම කතා කළා.

"මම මට ඕනෑ දේ ලැබෙන තුරුම සටන් කළා." ඈ කිව්වා. "දවසක් පුරාම මම ඇඳේ හිටියා. මෙහෙම ගියොත් මට ඇත්තටම අසනීප වෙයි කියලා අම්මා කිව්වා. ඉතින් තාත්තා මගේ කාමරයට ආවා. 'බොහොම හොඳයි, ඔයාට ඕනෑ දෙයක් කරගන්න පුළුවන්. ඔයා හරි. මමයි වැරදි. ඔයාට ස්විට්සර්ලන්තයේ ඉස්කෝලයට යන්න පුළුවන්' කිව්වා."

ඇගේ පියා එලෙස කියූ බව කිසිවෙක් විශ්වාස කළේ නැහැ. මොරීන් හැර කිසිවෙක් වෙන කිසිවක් කිව්වේ නැහැ.

"ලොකු ජයග්‍රහණයක්, ගොන්ඩොලින්." ඈ කිව්වා. "ඕනෑම ඔට්ටුවක්, ඉන් පස්සේ තාත්තා ඔයාට ඕනෑ දේකට ඉඩ දෙන්න ඇති."

"ඔව්, එයා මට මුලින්ම ඉඩ දුන්නා නම් ඉවරයි." මඳක් ව්‍යාකූල බවක් පෙන්වමින් ග්වේන් කිව්වා. "ඒත් අන්තිමට එයා හුඟක් දුකට පත්වෙලා අපි කවුරුවත් එක්ක කතාවත් කළේ නැහැ. මිස් වින්ටර් එක්ක විතරයි කතා කළේ. එයා එහෙම කළේ ඇත්තටම මට රිදවන්න. මම ගණන් ගත්තේ නැහැ. මම සද්ද නැතුව හිටියා. මේ වාරය මුල එයා කාර් එකේ ආපහු යද්දි මම හරියට ආයුබෝවන් කිව්වෙත් නැහැ. අපි මේ වයසට ආවට පස්සේ අපිට පුළුවන් වෙන්න ඕනෑ දෙමව්පියන්ට විරුද්ධ වෙන්න."

ඩැරල් හදිස්සියේම නැගිට්ටා. ඇයට මහත් අපහසුතාවයක් දැනුණා. ඇයට තම පියා, රිවර්ස් මහතා සිහි වුණා. කරුණාවන්ත, මහන්සි වී වැඩ කරන ශල්‍ය වෛද්‍යවරයෙක්. තම බිරිඳ හා දියණියන් වෙනුවෙන් කැපවුණු කෙනෙක්. ඩැරල් ඔහුට විරුද්ධ වී නපුරු වචන කතා කළේ නම්, ග්වේන් කර ඇති පරිදි හැසිරුණේ නම් ඔහුට කුමක් සිතෙනු ඇතිද?

'එයාගේ පපුව පැළෙයි...!' ඩැරල් සිතුවා. 'මට විශ්වාසයි ලැසි මහත්මයාටත් එහෙම හිතෙන්න ඇති. ග්වේන් ආත්මාර්ථකාමීව තපුරු වුණාට මම හිතන්නේ එයා ග්වේන්ට හුඟක් ආදරය ඇති. ග්වේන් ඒ විදිහට හැසිරුණේ කොහොමද?'

ඈ ග්වේන්ට කතා කළ අතර ඇගේ හඬෙහි වූ ස්වරය නිසා හැමෝම හිස ඔසවා බැලුවා.

"ග්වේන්, මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනෑ." ඈ කිව්වා. "මගේ පාඩම් කාමරයට එන්න පුළුවන්ද?"

ග්වේන් පුදුම වුණා. ඩැරල්ට ඇගෙන් අවශ්‍ය මොනවාද? ඇයට ප්‍රතික්ෂේප කිරීමට සිතුණ ද ඈ නැගිට්ටා. ඍජුව කතා කරන ඩැරල්ට ඈ තරමක බියක් දැක්වූවා.

පෙරමුණ ගෙන ඩැරල් පාඩම් කාමරයට ගියා. ඇයට ග්‍රේලින් මහත්මිය කියා තිබූ දේ සිහි වුණා. මේ මොහොතේම, ග්වේන්ට වැරදී ඇත්තේ කොහේ දැයි පෙන්වා දී තමාට යමක් කීමට හැකිවනු ඇතැයි ඇයට හැඟුණා.

"අර හාන්සි පුටුවේ වාඩිවෙන්න, ග්වේන්." ඈ කිව්වා. "මට ඔයාට යමක් කියන්න තියෙනවා."

"මම හිතන්නේ ඔයා මට බණ කියන්න යන්නේ නැහැ." ග්වේන් කිව්වා. "ඔයාගේ මුහුණෙන් පෙනෙන්නේ ඒ වගේ."

"හොඳයි, මම බණ කියන්න යන්නේ නැහැ." ඩැරල් කිව්වා. "මේ බලන්න ග්වේන්, මේ දේවල් දිහා බලද්දී ඔයාගේ තාත්තා ගැන මට හුඟක් දුක හිතෙනවා."

"මගේ තාත්තා ගැන දුකයි...! ඇයි? කොහොම වුණත් ඒකෙන් ඔයාට මොකද?" ග්වේන් මවිතයට පත් වුණා.

"හරි, ඔයා හැම තිස්සේම ඔයාලගේ මේ පවුලේ රණ්ඩුව ගැන අපි එක්ක කියලා තියෙනවා. අහගෙන ඉන්න එක් කෙනෙක් හැටියට මට හිතෙනවා, මේ ගැන යමක් කරන්න."

ග්වේන් එකවරම නිහඬ වුණා. ඩැරල් දිගටම කතා කළා.

"කවුද හරි හෝ කවුද වැරදි කියලා මම වචනයක්වත් කියන්නේ

නැහැ, ග්වේන්." ඩැරල් උනන්දුවෙන් කිව්වා. "මම කාවවත් විවේචනය කරන්න යන්නේ නැහැ. මම කියන්නේ මෙච්චරයි. ඔයා මා එක්ක කී දේවල්වල හැටියට ඔයා ඔයාගේ අපූරු තාත්තව දුකට පත් කරලා තියෙනවා. ඔයා ඔයාට අවශ්‍ය දේ ලබාගෙන තියෙන්නේ තවත් කෙනෙකුගේ සැනසීම නැති කරලයි."

"මට මගේ දෙපයින් නැගිටින්න සිද්ධ වෙනවා, නේද?" ග්වේන් මිමිනුවා.

"ඒක කරන්න ඕනෑ තවත් කෙනෙකුගේ කකුල පාගන්නේ නැතිව." උණුසුම් වෙමින් ඩැරල් කිව්වා. "ඔයා තාත්තාට ආදරේ නැද්ද ග්වේන්? ඔයා තාත්තාට සලකලා තියෙන විදිහට මට බැහැ මගේ තාත්තාට සලකන්න. ඔයා අනිවාර්යයෙන්ම කනගාටුයි කියලා කිව්වොත් හොඳයි."

"මම කියපු දේවල් ගැන මට කනගාටුවක් නැහැ." ග්වේන් ඇඩි හඬකින් කිව්වා. "තාත්තා මට නිතරම නපුරු දේවල් කිව්වේ."

"හරි, ඔයාට එහෙම වෙන්න ඕනෑ." ඉවසීම නැති වෙන්න පටන් ගනිද්දී ඩැරල් කිව්වා. "එයා නපුරු නැහැ. මට හුගක් වතාවල එයාව හම්බවෙලා තියෙනවා. මම හිතන්නේ එයා හුගක් හොඳ කෙනෙක්. ඒ වගේ තාත්තා කෙනෙක් ඔයාට හොඳ වැඩියි...!"

"ඔයා කිව්වා මට බණ කියන්නේ නැහැ කියලා." ග්වේන් අවඥා සහගතව කිව්වා. "ඔයාට තව කොයි තරම් වෙලාවක් ඕනෑද?"

ග්වේන්ගේ අඥාන, දුර්වල මුහුණ දෙස බැලූ ඩැරල් මෙවැනි දුර්වල කෙනෙක් එතරම් ඇඩි හා මුරණ්ඩු වූයේ කෙසේ දැයි විස්මයට පත් වුණා. මින් කිසි ප්‍රයෝජනයක් නැති බව ඇයට විශ්වාසයක් නැගුණ ද ඩැරල් නැවත වතාවක් උත්සාහ කළා.

"ග්වේන්..." ඈ පටන් ගත්තා. "ඔයා කිව්වා ඔයාව ස්විට්සර්ලන්තයට යවන්න වියදම් දරන්න බැහැ කියලා තාත්තා කිව්වා කියලා. එහෙම නම්, ඔයාව යවන්න එයාට තවත් මොනවාගෙන් හරි පාඩුවක් වෙනවා ඇති."

"එයාට වියදම් දරන්න බැරි කතාව වැරදියි." ග්වේන් කිව්වා. "අම්මා කියන්නේ පුළුවන් කියලා. එයා මේ ගැන බය වෙලා. එයා කිව්වා.... එයා කිව්වා, මගේ මෝ... මෝඩකම ඇති, තවත් මෝ...

මෝඩ වෙන්නේ නැතිව හොඳ ර... රස්සාවක් ගත්තොත් ඒකෙන් මගේ වි... විකාර වැඩ අඩු වෙයි කියලා...!"

ආත්ම අනුකම්පාවෙන් යුතුව ගොත ගසමින් ග්වේන් කඳුළු හළන්නට පටන් ගත්තා. ඩැරල් සුන් වූ බලාපොරොත්තුවෙන් යුතුව ඇය දෙස බැලුවා.

"ඔයාට බැරිද තාත්තා ළඟට ගිහින් කනගාටුයි කියන්න? සිද්ධ වුණ දේවල් ඔක්කෝම අමතක කරල එයා කියන දේ අහල රස්සාවක් හොයා ගන්නවා කියන්න." ඈ සුපුරුදු ඍජු බවින් යුතුව ඇසුවා.

ඩැරල්ට එය ඉතා සරල දෙයක් ලෙස පෙනුණා. ග්වේන් ඉකි ගසන්නට පටන් ගත්තා.

"ඔයාට තේරෙන්නේ නැහැ. මට එහෙම දෙයක් කරන්න කොහොමටවත් බැහැ. මට බැහැ හැල්ලු වෙන්න. තාත්තා මට හොඳටම හිනා වෙයි. එයාව දුකට පත් කරපු එක ගැන මට සතුටුයි. ඒකෙන් එයා පාඩමක් ඉගෙන ගනියි."

කොතරම් කුරිරු ලෙස ග්වේන් එය අවසාන කළේ ද යත් ඩැරල් මහත් වූ දෙනෙතින් ඇය දෙස බලා සිටියා. ඈ නැගිට්ටා.

"ඔයා හරිම නපුරුයි, ග්වේන්...! ඔයා තාත්තාටවත් වෙන කාටවත් ආදරය කරන්නේ නැහැ. ඔයා ආදරේ ඔයාට විතරයි. ඔයා හරිම නපුරුයි...!"

කාමරයෙන් පිට වූ ඈ කෙළින්ම ග්‍රේලින් මහත්මියගේ කාමරය බලා ගියා. ග්වේන් සම්බන්ධයෙන් ඈ දැඩි ලෙස සම්පූර්ණයෙන් අසාර්ථක වී සිටියා. ග්වේන්ට බලපෑමක් කිරීමට ග්‍රේලින් මහත්මියට අවශ්‍ය නම් ඇයම එය කළ යුතුයි. එය ඩැරල්ගේ සීමාවෙන් පිටත වූ දෙයක්.

ඈ ග්‍රේලින් මහත්මිය සමග හැමදේම කිව්වා. විදුහල්පතිනිය බැරෑරුම් ලෙස කන් දීගෙන සිටියා.

"ස්තුතියි, ඩැරල්." ඈ කතා කළා. "ඔයා උපරිමයෙන් කටයුතු කරලා තියෙනවා. ඒක බොහොම හොඳයි. දවසක ග්වේන්ට දඬුවම් ලැබෙයි. ඒක... අපොයි, හරිම දරුණු එකක්...!"

"ඒ කියන්නේ මොකක්ද?" ඩැරල් ඇසුවා.



ග්‍රේලින් මහත්මියගේ කටහඬේ ගැබ් වූ බිය උපදවන ස්වරයෙන් ඈ බිය වී සිටියා.

"මම කිව්වේ කෙනෙක් භයානක වැරැද්දක් කරලා ඒ ගැන කනගාටු වෙනවා වෙනුවට ඒක ජයග්‍රහණයක් කියලා හිතනවා නම් එයා භයානක පාඩමක් බලාපොරොත්තු වෙන්න ඕනෑ." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ජීවිතයේ කොහේ හරි තැනක, දඬුවම ග්වේන් එනතුරු බලා ඉන්නවා. ඒක මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒත් නොවැරදීම ඒක සිද්ධ වෙනවා. ස්තුතියි ඩැරල්. ඔයා හුඟක් උත්සාහ කළා."

## 08

තම අවසාන වාරයේ එක් දිනකට වැඩියෙන් විනාශ කිරීමට ග්වේන්ට ඉඩ දීමට ඩැරල්ට අවශ්‍ය වුණේ නැහැ. තමාට ග්වේන් ඊට වඩා හොඳින් මෙල්ල කර ගැනීමට තිබුණේ නම් යැයි සිතමින් නීරස සාකච්ඡාව ගැන දුක් වෙමින් ඩැරල් පාඩම් කාමරයේ පැය කිහිපයක් ගත කළා. අනතුරුව ඈ එය සිතින් බැහැර කළා.

'මම දන්නවා මට ඊට වඩා දෙයක් කරන්න බැහැ කියලා. ඉතින් තවත් මොකටද ඒ ගැන දුක් වෙන්නේ?' ඈ වඩාත් රසවත් දේවල් වෙත ඇගේ සිතුවිලි මෙහෙය වූවා. ටෙනිස් තරග, පිහිනුම් තරග, ඇගේ දෙමව්පියන් පැමිණෙන වාර මැද නිවාඩු දිනය, එමෙන්ම ඊට පෙර දින ෆෙලිසිටි කැකිරි පළමින් ඇයට කී රහස ගැන ද ඈ කල්පනා කළා. 'ඕ... ඩැරල්, අහන්නකෝ...! සූසන්ට අපූරු විජ්ජාවක් ජූන්ගෙන් දැන ගන්න ලැබිලා. හරිම සරල වගේම අහුවෙන්නේ නැති එකක්.'

"ජූන් ළඟ කාන්දමක් තියෙනවා." ඈ කිව්වා. "ඒක හරිම විශේෂ එකක්. කුඩා වුණාට ඒක හුඟක් බලගතු විදිහට හදලා තියෙන්නේ. ජූන් කියන්නේ ඒක අල්ලේ හංගා ගන්න පුළුවන් කියලා."

"හොඳයි, මොනවාද ඔයාලා ඒකෙන් කරන්න හිතාගෙන ඉන්නේ?" ඩැරල් ඇසුවා. "ඒ වගේ පොඩි, සාමාන්‍ය කාන්දම් කෑල්ලකින් කරන්න පුළුවන් දෙයක් නැහැ වගේ."

ෆෙලිසිටි නැවතත් සිහින් සිනා හඬක් නැගුවා.

"හොඳයි, අහගන්නකෝ, ඩැරල්." ඈ කිව්වා. "ඔයා දන්නවානේ මම්සලීලා දෙන්නාම කොණ්ඩය තියා ගන්නේ කොණ්ඩ කටු ගහලා."

ඩැරල් තම නැගණිය දෙස බැලූ අතර ඇයට යමක් වැටහෙන්නට පටන් ගත්තා.

"ඔයා කියන්න හදන්නේ... මී.... මේ, ෆෙලිසිටි, ඔයාලට බැහැ මම්සලීලා දෙන්නා ළඟට ගිහින් කාන්දම අල්ලලා කොණ්ඩ කටු ගලවන්න...!" ඈ කිව්වා.

ඇස් නටවමින් ෆෙලිසිටි හිස සැලුවා.

"ඔව්, ඒක තමයි අදහස." ඈ කිව්වා. "ඕ... ඩැරල්, ඒක අපූරු නැද්ද? ඒක සුපිරියි."

ඩැරල් සිනාසෙන්නට පටන් ගත්තා.

"අපි විජ්ජාව කරන්නේ කොයි වෙලාවෙ ද කිව්වොත්, මොකක් හරි හේතුවක් හොයාගෙන ඔයාට පුළුවන්ද අපේ පන්තියට එන්න?"

"මම බලන්නම්." ඩැරල් කිව්වා.

එහෙත් ඇයට නොහැකි වනු ඇතැයි ඇයට විශ්වාසයක් තිබුණා. ඇය දෙවැනි පන්තියට එන සෑම විටකම තම කොණ්ඩා කටු ගැලවී වැටීම ගැන මම්සලී මවිත වනු ඇත.

ඩැරල් පන්තියේ අයට මේ ගැන කිව්වා. එහෙත් කුඩා රහසක් හෝ කීමට තරම් විශ්වාසයක් තැබිය නොහැකි ග්වේන් හා මොරීන් හැර සියලු දෙනා රහස දැන ගත්තා. අමන්දා එහි සිටි අතර, කාගේත් පුදුමයට මෙන් ඈ මහත් හඬින් සිනාසුණා. ඇගේ හඬ මෙන්ම ඇගේ සිනාව ද මහ හඬක් ගත් අතර සියල්ලෝම උඩ විසි වුණා. උඩඟු අමන්දා සිනාසෙනු මින් පෙර ඔවුන් අසා තිබුණේ නැහැ.

"ඔයාගේ නැදෑ නංගි, ජූන්, අනිවාර්යයෙන්ම පවුලේ චාරිත්‍ර ඉස්සරහට අරගෙන යනවා." මේරි ලෝව් කිව්වා. "කවදාද එයාලා ඔය විකාර විජ්ජාව කරන්න යන්නේ?"

"ඒක බ්‍රහස්පතින්දාවකට දාගෙන තියෙන්නේ. ප්‍රංශ පාඩමක් අවසානයේ. ඒ විවේකයට ඉස්සර අවසාන පාඩම. ඊට පස්සේ කෙල්ලන්ට එළියට ගිහින් ඕනෑ නම් බඩ පැළෙන තුරු හිනාවෙන්න පුළුවන්."

"කවුද පාඩම කරන්නේ? මම්සලී ඩූපොන්ට් ද, මම්සලී රොජර්ද?" ඩැරල් ඇසුවේ පුෂ්ටිමත් මම්සලී ඩූපොන්ට් පැමිණිය හොත් හොඳ බව සිතමිනි.

එහෙත් එය එසේ සිදුවී තිබුණේ නැහැ. පාඩම යෙදී තිබුණේ සිහින්, ඉක්මන් කේන්තිකාරී මම්සලී රොජර්ටයි. ඇගේ කොණ්ඩය කඩා වැටී, කොණ්ඩා කටු අතුරුදහන් වන විට ඇයට මොනවා සිතෙනු ඇතිද?

දෙවන පන්තියේ ඇරියෝ එය ඉතා ප්‍රවේසමෙන් සැලසුම් කර තිබුණා. ජූන් විජ්ජාව නොකළ යුතු බවට ඔවුන් තීරණය කර තිබුණා. සියලුම ගුරුතුමියෝ ඇය ගැන සැකයෙන් පසු වුණා. වෙනත් අයෙක් විජ්ජාව කළ යුතුයි.

"මම කරන්න ද?" ෆෙලිසිටි ඇසුවා. "නැතිනම් සූසන්? සූසන් නිතර පන්තියේ හොඳට ඉන්න නිසා, ඒ වගේ දෙයක් කරයි කියලා කවුරුවත් සැක කරන්නේ නැහැ."

"මම නිතරම හොඳ නැහැ." සූසන් කිව්වේ මෙම ගුණ වර්ණනාව ගැන සිත රිදිලයි. "කොහොම වුණත් මට විජ්ජා කරන්න බැහැ. මට නිකම්ම හිනා යනවා."

"කවුරුවත් හිනා වෙන්න එපා." ජූන් අනතුරු ඇඟෙව්වා. "අපි හිනා වුණොත් අපිව අහුවෙනවා. සැක හිතුවොත් අපිට ආයෙ ඒක කරන්න බැහැ."

"ඒත් අපි කොහොමද හිනා නොවී ඉන්නේ?" නෝරා, අයිරින් මෙන්ම නාසයෙන් පිඹිමින් හදිසියේ හිනා යන ඇරිය ඇසුවා. "මම කියන්නේ හිනා යන එකත් කිවිසුම් යනවා, කහිනවා වගේ දෙයක්. හිනාවක් එද්දී ඒක නවත්තන්න බැහැ."

"ඔව්, පුළුවන්." ජූන් ඇඩි ලෙස කිව්වා.

ඇය පුදුමාකාර ලෙස තමාව පාලනය කරගත් අතර ඉතාම හාස්‍යජනක අවස්ථාවලදී පවා ඇයට මුහුණ ඇඩි කරගෙන සිටීමට හැකි වුණා.

"අපේ සෙල්ලම අහුවෙන විදිහට කෙනෙකුට හිනා යයි කියලා හිතෙනවා නම් අපි ඒක කරන්න ඉස්සර එයා එළියට යනවා නම් හොඳයි. තේරුණාද?"

"ඕ... මට නම් බැහැ. මට ඒක නොදැක ඉන්න බැහැ." නෝරා කිව්වා. "මම හිනාවෙන්නේ නැහැ. මම ලේන්සු තුන හතරක් ගෙනැවිත් ඒවා කටේ ඔබා ගන්නම්."

බ්‍රහස්පතින්දා එළඹුණා. පාඩම ආරම්භ වුණා. ප්‍රංශ පාඩම පැමිණි විට මම්සලී රොජර් පන්ති කාමරයට පැමිණුණා. ඇගේ බර අඩි තැබීමේ හඬ කොරිඩෝව තුළ රැව් දුන්නා. ජූන් දොර විවෘත කර අල්ලා ගෙන සිටියා. සාක්කුවල ලේන්සු පුරවා ගෙන සිටි නෝරාගේ නාසයෙන් සිහින් හඬක් නිකුත් වුණා.

"කට වහනවා...!" කීපදෙනෙක් තදින් කොඳුරා කිව්වා.

නැවතත් නාසයෙන් පිඹීමට සූදානම්ව වටපිට බැලූ මුත් බිහිසුණු රැවීම් දැක ගත් නෝරා එය යටපත් කර ගත්තා. මම්සලී රොජර් පන්තිය තුළට පැමිණියා.

"සුබ උදෑසනක්...!" සුපුරුදු තියුණු ඉක්මන් හඬින් ඈ කිව්වා.

හඬ නඟා පුටු ඇද පන්තිය වාඩි වුණා. ඔවුන් සැකයෙන් දිදුලන ඇස්වලින් මම්සලී රොජර් දෙස බැලුවා. එහෙත් දීප්තිමත් සිනාසෙන ඇස් කොතරම් වත් දැක මම්සලීට හුරුයි. ඈ හඬ නගා උපදෙස් දුන්නා.

"තිස් තුන පිටුව. මම හිතන්නේ ඔයාලා පාඩමට හොඳටම සූදානම් කියලයි." ඈ එයම ප්‍රංශ බසින් සෙමින් කිව්වා. "නෝරා, පටන් ගන්න."

නෝරා ප්‍රංශවලට දුර්වලයි. සිනාසීමේ ආශාව හදිසියේම අත් හළ ඈ නැගී සිට ප්‍රංශ පරිවර්තනය ගොත ගසමින් කියෙව්වා. අනෙක් අය ද වරින් වර එය අනුගමනය කළා. මම්සලී රොජර් සිටියේ කෝපයෙන්. එම උදයේ, අගය කරන වචනවලට වැඩියෙන් ඇගේ මුවින් පිට වුණේ කෝපය මුසු වචන. ඇය විහිළුවට භාජනය වීමට ආසන්නව සිටි නිසා දැරියෝ මහත් සතුටට පත් වුණා.

පාඩම අවසාන වීමට මොහොතකට පෙර මම්සලී ඇගේ සුපුරුදු නියෝගය දුන්නා.

"කළුලෑල්ල පිහින්න."

"සූසන් නැගී සිටියා. බලගතු කුඩා කාන්දම් කෑල්ල ඇගේ අත්ලේ සැඟවී තිබුණා. නොයෙක් දේවල් ගෙන එය අත්හදා බලා තිබූ අතර ප්‍රතිඵල ඉතා ආශ්චර්යජනක වුණා.

සූසන් නොසැලී මම්සලී අසල වූ කළුලෑල්ල වෙතට ගියා.

ලාච්චුව විවෘත කරගෙන එයට අත දමා ගෙන සිටි මම්සලී පොතක් සොයමින් සිටියා. කාන්දම පාවිච්චි කිරීමට එය අනර්ඝ අවස්ථාවක් වුණා.

දෙවන පන්තියේ ඇරියෝ විසිතුන් දෙනෙකු හුස්මක් නැතිව බලා සිටින අතරේ සූසන් මම්සලීගේ හිස පිටුපසට කාන්දම ඇල්ලුවා. ඇයට දී තිබූ උපදෙස් පරිදි ඈ එය මම්සලීගේ හිස පිටුපස සිට අඟල් දෙකක් පමණ දුරින් අල්ලා සිටියා.

ඇගේ දෑස ඉදිරියේම මම්සලී කොණ්ඩ බෝලය රැඳවීමට පාවිච්චි කර තිබූ තරමක් ලොකු කොණ්ඩා කටු ගැලවී පියාඹා විත් නිහඬව හා ඇඩිව කාන්දමේ ඇලුණා. පන්තියට සිනාවක් පෑ සූසන් ඉක්මනින් කළුලෑල්ල වෙත ගොස් එය පිස දැමුවා. මම්සලීට කිසිවක් නොදැනුණ බව පෙනුණා. සීනුව නාද වූ අතර ඈ නැගී සිටියා.

"එළියට යන්න." ඇය කී අතර ඇරියෝ පන්තියෙන් පිට වුණා.

ඒ වන විටත් නෝරා එක් ලේන්සුවක් මුවෙහි ඔබාගෙන සිටියා. බිස්කට් හා කිරි ලබා ගැනීමට විශාල ශාලාවට ගිය ඔවුන් මම්සලී එන තුරු බලමින් සිටියා. ඇය පැමිණියා. දෙවැනි පන්තියේ ඇරියෝ මුවින් සතුටු හඬක් නැගුවා.

"කොණ්ඩය පහළට එනවා. කොණ්ඩ ගුළිය ලෙහිලා...!"

එය එසේ වුව ද මම්සලී කිසිවක් දැක තිබුණේ නැහැ. එහෙත් පීටර්ස් ගුරුතුමිය එක්වරම එය දුටුවා. මම්සලීගේ උරහිසට තට්ටු කළ ඈ කතා කළා.

"ඔයාගේ කොණ්ඩය පහළට වැටිලා, මම්සලී." ඈ කිව්වා.

අත එසවූ මම්සලී ඇඩි පුදුමයකට මෙන් තම කෙස් කළඹ ලෙහී පහළට වැටී ඇති බව දැන ගත්තා. එය නැවත සැකසීමට කොණ්ඩා කටු සොයා ගැනීමට ඈ හිස අතපත ගා බැලුවා.

එක් කොණ්ඩ කටුවක් හෝ ඇගේ හිසේ තිබුණේ නැහැ. එය පුදුමයක් නොවන්නේ, ඒ සියල්ල ඒ වන විට සූසන්ගේ සාක්කුවේ ඇති කාන්දම් කැල්ල සමග ආරක්ෂිතව තිබුණ නිසයි.

මම්සලී වියරුවෙන් මෙන් හිස අතපත ගාමින් කොණ්ඩා කටු

පහළට වැටී අතුරුදහන් වී ඇයි කල්පනා කරන්නට වුණා. පීටර්ස් ගුරුතුමිය කුතුහලයෙන් ඇය දෙස බැලුවා.

"කොණ්ඩා කට්ටක් නැති වෙලාද?" ඈ ඇසුවා.

"එකක් නෙවෙයි, ඔක්කොම නැති වෙලා." මම්සලී තැතිගෙන මහත් විමතියෙන් කිව්වා.

එදින උදයේ තමාට කොණ්ඩය බැඳ ගැනීමට යම් අයුරකින් අමතක වුණි දැයි ඈ කල්පනා කරන්නට වුණා. ඈ පන්තියට ගොස් තිබුණේ කොණ්ඩය පහළට කඩා දමා ගෙනද? මේ සිතුවිල්ලත් සමග ඈ ලැජ්ජාවෙන් රතු වුණා. කෙල්ලෝ මොනවා හිතන්න ඇතිද?

දෙවැනි පන්තියේ දැරියෝ සිනාසෙනු දුටු ඈ නෝරා තම තුන්වෙනි ලේන්සුව ද මුවෙහි ඔබා ගන්නවා දුටුවා. ඈ ඉක්මනින් ආපසු හැරී හනි හනිකට ශාලාවෙන් පිටතට දිව ගියා. දැරියෝ සිනාසෙමින් සිටියා.

"මම පන්තියට ඇවිදින් තියෙන්නේ කොණ්ඩය බඳින්නේ නැතිවයි." අසරණ මම්සලී තමාටම කියා ගත්තා. "හරි වැඩක් තමයි. කොහොමද කොණ්ඩයට කටු ගහන එක මට අමතක වුණේ? කොණ්ඩයට එක කටුවක්වත් ගහලා නැහැ."

තම කාමරයට ගිය ඈ ඉතා ප්‍රවේසමෙන් කටු ගසා කොණ්ඩය නැවත සකසා ගත්තා. තමාට විජ්ජාවක් කර ඇති බවට ඇයට කිසිදු සැකයක් තිබුණේ නැහැ. එහෙත් ගෙවත්තේ හුදෙකලා මුල්ලක තණ පලස මත රෝල් වෙමින් සිනාසෙන දෙවැනි පන්තියේ නපුරු කෙල්ලන්ව ඇයට දැක ගැනීමට හැකි වූයේ නම් ඇත්තෙන්ම ඇයට බොහෝ සැක සිතෙන්නට තිබුණා.

# 09

විභාගය සඳහා ඩැරල් මහන්සියෙන් වැඩ කරමින් සිටි අතර සැලී ද එසේ වුණා. එහෙත් ඔවුන් මහන්සි වී ක්‍රීඩා කළ අතරම සතිය පුරා පවත්වන්නට යෙදුණ විවාද, ගායනා, දේශන හා රැස්වීම්වලට ද සහභාගී වීමට කාලය සොයා ගත්තා. එය සංතෝෂමත්, කාර්ය බහුල ජීවිතයක් වූ අතර ඩැරල් සම්පූර්ණයෙන් විනෝද වුණා.

මේ වන විට වසර හයක් මැලෝරි ටවර්ස්හි හිඳ තිබූ ඈ මහන්සි වී වැඩ කිරීමට ඉගෙන ගෙන තිබූ හෙයින් ඇය බලාපොරොත්තු වූ පරිදි විභාග වැඩ එතරම් දුෂ්කර බවක් පෙනුණේ නැහැ. ඕක්ස් ගුරුතුමිය ඇය ගැන සතුටු වුණා.

ඒ මොහොත වන විට ඩැරල් හා සැලී වාරයේ පළමු ටෙනිස් තරග සඳහා ක්‍රීඩිකා ලැයිස්තු සකසමින් සිටියා. මොරියා ද තම උඩඟු ලීලාවෙන් ඉතා වටිනා උපදෙස් දෙමින් එහි සිටියා. කෙසේ වෙතත්, ඇගේ උදව් වටිනා නිසා සැලී සියල්ල ඉවසා දරා සිටියා. ක්‍රීඩාවලදී මොරියා හරියටම දැන සිටියා ඈ කතා කළ යුත්තේ කුමන දේවල් ද යන්න.

එතැනට පැමිණි අමන්දා නිහඬව ඔවුන්ගේ උරහිස් මතින් එබී බැලුවා. අනිත් අය ඇයව නොසලකා හැරියා. මොරියා පැහැදිලිව පෙනෙන ලෙසම ඇයට පස්ස හැරෙව්වා.

"මම හිතන්නේ, තුන් වැනි කණ්ඩායම සඳහා අපි ජෙනී ස්මිදර්ස් ආමු. එයා තුන පන්තියේ." සැලී කිව්වා. "එයාගේ පිරිනැමීම හොඳයි. එයා ටෙසී ලෝමන් එක්ක හොඳ යුගලයක් හදයි."

"ටෙසී ඒ තරම් හොඳ නැහැ." හදිසියේම අමන්දා කිව්වා. "හොඳ වෙන්නේත් නැහැ, එයාගේ අමුතු පිරිනැමීමේ ක්‍රමය වෙනස් කරගන්නා තුරු. එයා පිත්ත පද්දන ටිකට භාගයක් ජවය නාස්ති කර ගන්නවා."

"ඕනෑම ඔට්ටුවක්, ඔයා දන්නේවත් නැහැ මොන ටෙසී ද කියලා...!" සැලී කිව්වා.

"ඕ... මම දන්නවා." අමන්දා එකවරම කිව්වා. "සමහර වෙලාවට මම ගිහින් පොඩි උන් සෙල්ලම් කරනවා බලාගෙන ඉන්නවා. මට පුළුවන් ඕනෑම වෙලාවක බලාපොරොත්තු තියාගන්න පුළුවන් අය තෝරා ගන්න." අමන්දා තීරණාත්මකව කිව්වා. "මට දැන් කියන්න පුළුවන් පළමු කණ්ඩායමට කාවද තෝරාගන්න ඕනෑ කියලා. ඇත්තටම, ඒක හරි ලේසියි. දෙවැනි, තුන්වෙනි, හතර කණ්ඩායම්වලට. ඒත් තුන්වෙනි කණ්ඩායමට මම නම් ජෙනීවත් ටෙසීවත් ගන්නේ නැහැ. එයාලා ඉක්මනට දුර්වල වෙනවා."

අනෙක් අයගේ සිත රිදුණා. ඇයි මේ අනවශ්‍ය මැදිහත්වීමක්? මැලෝරි ටවර්ස්වලට සති කිහිපයකට පෙර පැමිණි අමන්දා පාසලේ අනෙක් දැරියන්ගේ ක්‍රීඩා හැකියාවන් දකින්නේ කෙසේද?

"හරි එහෙමනම්, තව අවුරුදු තුනකින් ඉස්කෝලයේ ක්‍රීඩා නායිකාව වෙන්නේ කවුද කියලා ඔයාට කියන්න පුළුවන්කම ඇති?" මොරියා උපහාසයෙන් යුතුව කිව්වා. "අපි දැනගන්න කැමතියි."

"ඔව්, මට කියන්න පුළුවන්." කිසිදු පැකිළීමකින් තොරව අමන්දා කිව්වා. "ළමයෙක් ඉන්නවා දෙවැනි පන්තියේ. එයා ඉන්න ඕනෑම පන්තියක එයාට ක්‍රීඩා නායිකාව වෙන්න පුළුවන්. එයා කොයි පන්තියේ හිටියත් ටෙනිස්වලට හොඳටම හොඳයි."

හැරුණ අනෙක් තිදෙනා මහත් වූ දෙනෙතින් අමන්දා දෙස බැලුවා. ඇය මහත් විශ්වාසයකින් කතා කරන බව පෙනුණා.

"කවුද ළමයා...!" අවසානයේ මොරියා ඇසුවේ තිදෙනාම තමන්ට මඟ හැරුණ දෙවැනි පන්ති දැරිය කවුදැයි සිතා ගැනීමට මනස මහත් ලෙස වෙහෙසීමෙන් අනතුරුවයි.

ඒ කවුරු විය හැකිද?

"ඔන්න.... එයා අනිත් අයට වඩා හුඟක් ඉදිරියෙන් ඉන්නේ කියලා මම කිව්වා. එයා ඉන්න පන්තියත් මම කිව්වා. ඒත් ඔයාලට ඒ ළමයා ගැන හිතාගන්නවත් බැහැ." අමන්දා ඉවතට යමින් කිව්වා. "ට්‍රෙනිගන් ටවර්ස්වලදී නම් එයා ඇවිදින් දෙවැනි දවසේදීම එයාව

ඇක ගන්නවා. ඒත් මෙහේ, ලෝක ශූරියෝ ඔයාලට හිටියත් කවුරුවත් හඳුනා ගන්නේ නැහැ...!"

"අමන්දා...! යන්න එපා...!" මොරියා අණ කළා. "ඔයා දැන් හරි ලේසියෙන් ඔයාගේ අදහස් කිව්වා. අපිට තව ටිකක් කියන්න. කවුද ඒ පුදුමාකාර දෙවැනි පන්ති ළමයා...?"

"නැගිටලා ගිහින් එයාලා සෙල්ලම් කරනවා බලන්න. එතකොට පෙනෙයි." අමන්දා නොරිස්සුම් ස්වරයෙන් කිව්වා.

පිටතට යාමට අමන්දා දොර විවෘත කළ ද මොරියා වහා පැන එය වැසුවා.

"නැහැ, අමන්දා." ඈ කිව්වා. "යන්න ඉස්සර අපට කියලා යන්න. නැතිනම් අපි හිතන්නේ ඔයා කටට ආවට කියනවා මිසක් එහෙම අපූරු ළමයෙක් නැහැ කියලයි."

"ඒ විදිහට මට මගේ වචන නාස්ති කරගන්න ඕනෑ නැහැ." අමන්දා අවඥාවෙන් යුතුව කිව්වා. "ඔය විදිහට මට රවන්න එපා, මොරියා. ඔයාට පුළුවන් අනෙක් අයට අණ කරන්න. ඔයා කැමති විදිහට, ඒ අයට කසළ ගොඩවල්වලට වගේ සලකන්න. එයාලට ඒක හුරුයි. මට හුරු නැහැ. ඔය විදිහට ආයෙත් කතා කරන්න ඕනෑ නම් මම ඒක බලා ගන්නම්...!"

නිතරම තමා නිවැරදි යැයි සිතන හිතුවක්කාර මොරියාට විරුද්ධව නැගී සිට ඇයට කරට කර සටනක් දීමට කෙනෙකු ලැබීම ගැන සැලී සතුටු වුව ද ඈ මොරියාව ආරක්ෂා කිරීමට ආවා.

"ඔයා අලුත් ළමයෙක් අමන්දා." ඈ කිව්වා. "ඒක ඔයාට අමතක වෙලා වගේ. ඔයාට බැහැ අපිට එහෙම කතා කරන්න. ඔයා දන්නවාට වැඩිය අපේ ළමයි ගැන දන්නේ අපි. මොරියා කියන එක තේරුම් ගන්න. මම නොදන්නවා වුණත් එයා දන්නවා."

"එයා දන්නේ නැහැ." අමන්දා සාවඥව කිව්වා. "හොඳයි, මම කියන්නම් ළමයා කවුද කියලා. එතකොට බලාගන්න පුළුවන් මම හරි කියලා. ඒ ජූන්...!"

"ජූන්...!" අනෙක් තිදෙනා පුදුමයෙන් කිව්වා.

ජූන්, ඇලිසියාගේ දඹරකාරී, ආවේගශීලී, හිතුවක්කාර ඥාති සහෝදරිය...! හොඳයි, ජූන් ගැන කවුරු නම් හිතයිද?

"එයාට පුහුණුවීම් කරද්දී එයාගේ නම කතා කරද්දී ඔළුව උස්සලා බලන්නේවත් නැහැ." සැලී කිව්වා.

"එයා සෙල්ලම් කරන්නේ එයාට ඕන වෙලාවට." ඩැරල් කිව්වා. "අනික හුඟක් වෙලාවට මෝඩ දඟ වැඩ විතරයි. එයා හොඳ නැහැ."

"ජූන් කවදත් එහෙමයි." මොරියා කිව්වා. "ලැක්රෝස්වලදි, එයා හරියට උත්සාහ කළොත් අනෙක් හැමෝටම වඩා වේගයෙන් දුවන්නයි, හොඳින් බාධා කරන්නයි පුළුවන්. ඒත් අපිට කවදාවත් එයාව කණ්ඩායමකට දාගන්න බැරි වුණා. එයා විකාර වැඩ කරන්නේ නැති නම් එයාට පුළුවන් මාළුවෙකුට වගේ පීනන්න. එයාට උවමනා නම් එයා හරි වේගවත්. ඒත් ජූන් ගැන කිසිම විශ්වාසයක් තියන්න බැහැ."

"බලන්න..." අමන්ඩා කතා කළේ කටහඬේ තීරණාත්මක ස්වරයක් ඇතිවයි. "ඇත්තටම එයා ලැක්රෝස්වලට දක්ෂ ද කියලා මම දන්නේ නැහැ. මම ඔයාලට කියන්නේ, ජූන්ව ටෙනිස්වලටයි, පිහිනීමටයි හොඳින් පුහුණු කළා නම්, ඒ ළමයා මේතාක් කාලයකට හිටිය හොඳම ක්‍රීඩිකාව, පිහිනුම් ශූරිය වෙනවා. ඕ... මම දන්නවා එයා විකාර වැඩ කරනවා. මම දන්නවා එයා යකෙකුටවත් බය නැහැ වගේම කිසිම කෙනෙක්ව තුට්ටුවකට ගණන් ගන්නේ නැහැ කියලා. ඒත් විශ්වාස කරන්න, තමන් යමකට විශිෂ්ටයි කියලා එයා දැන ගත්තොත්, එයා ඉහළ යන්නේ විදුලියක් වගේ...!"

මේ සියල්ල ඉතා පුදුම සහගතයි. කෙසේ වෙතත්, අමන්ඩාගේ උස්, විශ්වාසය ගැබ් වූ ස්වරයෙන් කියැවෙන විට කාටත් එය මැනවින් ඒත්තු යන කාරණයක් වුණා. ඩැරල්, සැලී දෙස බැලුවා. අමන්ඩා නිවැරදි විය හැකිද? කපටි, නොසැලකිලිමත් ජූන් කෙරෙහි ඔවුන්ගේ තිබූ නොකැමැත්ත හා අප්‍රසාදය හේතුවෙන් පළමු පෙළේ ක්‍රීඩා ශූරියකගේ සැඟවුණ දස්කම් දැක ගැනීමේ අවස්ථාව ඔවුන්ට වැළකී ගොස් තිබුණාද?

"හොඳයි." සැලී කතා කළේ සැක මුසුව ජූන්ගේ ටෙනිස් ක්‍රීඩා කිරීම ගැන සිතමිනුයි.

පසුගිය සතියේ ඇය පිටියේ මෝඩ ලෙස හැසිරුණ අයුරු ඇයට සිහිපත් වුණා.

"හොඳයි, මම දන්නේ නැහැ. එයා පුදුම විදිහට ඉක්මන් ක්‍රියාශීලීයි තමයි. ඒ වගේම ශක්තිමත්. ඒත් එයාගේ චරිතය තමයි එයාට හරහට හිටින්නේ. එයා උනන්දුවක් නැහැ."

"එයාට ඕනෑ කවුරු හරි කෙනෙක් එයා ගැන උනන්දු වෙලා එයාව ධෛර්යමත් කරන එකයි." අමන්දා කිව්වා. "මට එයාව මෙහෙයවන්න තිබුණා නම් වැඩිකල් යන්න කලින් මම එයාව හදලා ගන්නවා."

"හොඳයි, ඉතින් කරන්නකෝ." මොරියා උනන්දුවකින් තොරව කිව්වා.

ඇයට හදිසියේම අමන්දා නිවැරදි බව පෙනී ගොස් තිබුණා. ජූන් ස්වභාවයෙන්ම ක්‍රීඩිකාවක්. ඇයට තියුණු ඇසක් හා සුන්දර ශෛලියක් තිබුණා.

'එයා මාව නිතරම රවට්ටලා තිබුණ නිසා මම හොඳ පැත්ත දැක්කේ නැහැ.' මොරියා නොසතුටින් සිතුවා.

ඈ තම ප්‍රශ්නය අමන්දාට යොමු කළා.

"හොඳයි, එහෙම කරනවාද?" කී ඈ අමන්දාගේ පිළිතුර බලාපොරොත්තුව සිටියා.

"ඕ... අමන්දාට බැහැ වෙන කවුරුවත්ව පුහුණු කරන්න. නේද අමන්දා?" සැලී රහසින් ඇසුවා.

උදව් කිරීමට ඇති අමන්දාගේ කැමැත්ත ගැන සැකයක් පෙන්නුවහොත් තමාට මේ ආවේගශීලී, විශාල දැරිය ස්වකැමැත්තෙන් උදව් සඳහා පොලඹවා ගතහැකි බවට සැලීට විශ්වාසයක් තිබුණා. දක්ෂ සැලී...!

අමන්දා එකවරම උගුලේ වැටුණා.

"වටිනා කෙනෙක් නම්, මට පුළුවන් කරදරයෙන් වුණත් පුහුණු කරන්න." ඈ කෙටියෙන් කිව්වා. "හරි, ඔයාලා මම කියන එක පිළිගන්නවා වගේ පෙනෙන එක ගැන මට සතුටුයි. මම ජූන්ව

භාරගන්නම්. තවත් මොනවාද? මම එයාව මේ වාරය අවසන් වෙන්න ඉස්සර දෙවෙනි ටෙනිස් කණ්ඩායමටයි, දෙවෙනි පිහිනුම් කණ්ඩායමටයි දානවා."

ඈ පිටතට ගියේ සුපුරුදු පරිදි දොර මහ හඬින් වසා ගෙනයි. කාමරයේ ඉතිරි වූ තිදෙනා එකිනෙකා දෙස බලා ගත්තා. ගැටලුවක් මතු වූ විට හා පුදුම වූ විට නිතර කරන පරිදි සැලී නාසය ඇතිල්ලුවා.

"හොඳයි, එයා ඇත්තටම හරි. ජූන්ට අවශ්‍ය නම් එයාට හොඳ ක්‍රීඩිකාවක් වෙන්න පුළුවන්. එයා ඇලිසියා වගේ, අතිදක්ෂයි. ඒත් ස්ථාවර නැහැ. තමන්ට අවශ්‍ය දෙයක් හරි, හිතට ගත් දෙයක් හරි කරන තාක් කල් පුදුම විදිහට මහන්සි වෙන්නේ. ඒත් එහෙම නැතිනම් වැඩක් නැහැ."

"මට නම් ඒ වැඩකට නැති පොඩි කෙල්ල, ජූන්ව ගන්න උවමනාවක් නැහැ." මොරියා කිව්වා. "එයා වස නපුරු, කළගුණ නොදත්, නිතරම විකාර වැඩ කරන කෙනෙක්. එයාට අමන්දා එකතු වෙනවා නම් හොඳයි."

"එයා ඇත්තටම කීප දෙනෙක්ම තෝරාගෙන තියෙනවා." සැලී ක්‍රීඩිකා ලැයිස්තුව අතට ගනිමින් කිව්වා. "ඒත් එයා ජූන්ට ක්‍රීඩාවලට උදව් කරනවා නම් ඒකත් එක දෙයක්. කොහොම වුණත් දෙවියන්ට පින් සිද්ධ වෙන්න, අපේ ගැලවිල්ලට අපිට ෆෙලිසිටි ඉන්නවා, ඩැරල්. එයා යන්නේ ඔයාගේ අඩි පාරේ, හරිද?"

ඩැරල් සතුටින් බැබළුණා. ඔව්, ෆෙලිසිටිගේ වැරැද්දක් තිබුණේ නැහැ. ෆෙලිසිටි දක්ෂ වනු ඇත. එහෙත් ජූන් උත්සාහ කළහොත් ඇයට ෆෙලිසිටි මෙන් දෙගුණයක් දක්ෂ විය හැක.

"හොඳයි, සිද්ධ වෙන දේවල් බලාගන්න එකත් රසවත් වෙයි." මොරියා කිව්වා. "හුඟක් රසවත් වෙයි. ලොකුකම හිතට ගත්ත අමන්දායි, ලොකුකම හිතට ගත්ත ජූනුයි. අපොයි... මට ඒ දෙන්නාම පෙන්නන්න බැහැ."

10

අමන්දා යමක් කිරීමට සිතට ගත් විට ඇ එය ඒ වහාම කරනවා. දොරින් පිටතට ආ වහාම දෙවැනි පන්ති දැරියක සොයා වටපිට බැලූ ඇ සූසන්ව දැක ගත්තා.

"ඒයි... මොකක්ද ඔයාගේ නම? සූසන් නේද?" ඇ හඬ නැගුවා. "ගිහින් ජූන්ව හොයලා කියන්න, මම එයාව හොයනවා කියලා. එයාව එවන්න මගේ පාඩම් කාමරයට."

ජූන් කර ඇත්තේ කුමක් දැයි පුදුමයෙන් සිතමින් සූසන් වේගයෙන් දිව ගියා. සාමාන්‍යයෙන් දෙවැනි පන්ති දැරියන්ව මෙලෙස කැඳවන්නේ යමක් පිළිබඳව ඔවුන්ට උපදේශන අවශ්‍ය නම් පමණයි. ජූන්ව සොයා ගත් සූසන් පණිවිඩය දුන්නා.

ජූන් පුදුමයට පත් වුණා. ඇය දන්න තරමට, කීප අවස්ථාවකදී ඔවුන් ටෙනිස් ක්‍රීඩාවේ හා පිහිනීමේ පුහුණුවීම්වල යෙදී සිටින අවස්ථාවල හය පන්තියේ විශාල දැරිය පැමිණ බලා සිටිනු ඇය දැක තිබුණ ද, අමන්දා කිසිවිටක ඔවුන්ගේ නම් දැන ගැනීමට හෝ කරදර වී තිබුණේ නැහැ. ඇ සූසන් දෙස බැලුවා.

"මට විශ්වාසයි, එයාට ඕනෑ මාව නොවෙයි." ඇ කිව්වා. "ඒ වෙන කෙනෙක් වෙන්න ඇති. කොහොම වුණත්, මම වැරැද්දක් කරලා නැහැ. ඒත් මට කවුරු හරි බණින්න ඉන්නවා නම්, ඒ අමන්දා වෙන්න බැහැ. එහෙමනම් සැලී හරි ඩැරල් හරි වෙන්න ඕනෑ. මම යන්නේ නැහැ. මම අමන්දාට කැමති නැහැ."

"ඒත් ඔයා යන්න ඕනෑ." සූසන් කීවේ ජූන් හය පන්තියේ කෙනෙකුට අවනත නොවීම පිළිබඳ වූ සිතුවිල්ලෙන් කම්පනයට පත් වෙලයි.

"මේක වැරදීමක් වුණත් ඔයා ගිහින් හොයලා බලන්න ඕනෑ."

"මට වැඩ." ජූන් කිව්වා. "මට ඉන්න දෙන්න. නොගියොත් කරදරේ වැටෙන්නේ මමනේ. ඔයා නොවෙයි. ඒත් මම ඒ ගැන කරදර වෙන්නේ නැහැ. අමන්දා කතා කරලා තියෙන්නේ වෙන කෙනෙකුට. මට නෙවෙයි."

සූසන් ඉවතට ගියා. බොහොම හොඳයි. ජූන් අමන්දාට අකීකරු වුණාවේ. එයාට ඕනෑ දෙයක් කරපුවාවේ. සූසන් පණිවිඩය දී තිබුණා. ඒ ජූන්ගේ අනුවණ මුරණ්ඩුකමේ හැටි. වැඩිහිටි දැරියන් විසින් ඇයට අණ කරනු ලැබීම ඈ පිළිකුල් කළා.

තම පාඩම් කාමරයට ගිය අමන්දා මඟ බැලුවා. ක්‍රීඩා සඳහා ජූන්ට ඇති විශේෂ දක්ෂතාවය තමා විශේෂයෙන්ම දැක තිබුණ කාරණයට අමතරව අමන්දාට ජූන් ගැන සැබෑ උනන්දුවක් තිබුණේ නැහැ. ඇයට ජූන්ව පුහුණු කිරීමට අවශ්‍ය වුණේ ඇගේ අදහස ඔප්පු කර පෙන්වීමටයි. දෙවන පන්තියේ දැරිය එනතුරු වාඩි වී ඈ බලා සිටියා.

සූසන්ට ජූන්ව සොයා ගැනීමට මඳ වේලාවක් ගතවන බව දැන, ඉවසීමෙන් යුතුව ඈ විනාඩි පහක් කල් මැරුවා. අනතුරුව ඉතාම නොඉවසිල්ලෙන් ඈ තවත් විනාඩි පහක් කල් බැලුවා. සිත රිදුණ ඈ නැගිට දොර වෙතට ගියේ ජූන් පැමිණ දොරට තට්ටු කර තිබුණ ද තමාට යම් ලෙසකින් එය නෑසුණ නිසා ජූන් දොර අසල සිටගෙන සිටිනවා දැයි බැලීමටයි.

පිටත කොරිඩෝව හිස්ව තිබුණා. ජනේලය අසලට ගිය අමන්දා පහළ බැලුවා. පහළ ගෙවත්තේ ජූන් තවත් දෙතුන් දෙනෙකු සමඟ ප්‍රාණවත් සංවාදයක යෙදී ඇවිද යනු ඈ දුටුවා. ඈ ජනේලයෙන් පිටතට කෑ ගැසුවා.

"ජූන්...! මෙහේ එන්න. සූසන් ඔයාට මගේ පණිවිඩය දුන්නේ නැද්ද?"

ජූන් නෑසුණ ලෙස බොරුවට ඇඟෙව්වා. එවිට අනෙක් අය ජූන්ට අතින් ඇන කෑ ගසන අමන්දාව දැක්වූවා. පැකිළීමෙන් යුතුව පිරිසෙන් වෙන් වූ ජූන් ජනේලය යටට ගියා.

"මගේ පාඩම් කාමරයට ඉක්මනට එන්න." අමන්දා අණ කළා. "මම දැන් විනාඩි දහයකට වැඩියෙන් බලා හිටියා...!"



ජූන්ගේ පැරුණු මුහුණ දුටු අනෙක් දෙවැනි පන්තියේ දැරියෝ සිනාසුණා.

"දැන් ඔයාට වැඩේ හරි...!" කැතරින් හඬ නැගුවා. "ඔයා මොනවාද කළේ ජූන්? ඔයාට හොඳ බැණුම් ටිකක් අහන්න වෙයි."

තමන් කළ කිසිම දෙයක් ගැන ජූන්ට සිතාගත නොහැකි වුණා. අනිත් අය ඉදිරියේදී තමාව ඇතුළට කැඳවීම ගැන ඈ නිතරම නොසතුටු වුණා. බුම්මා ගෙන අමන්ඩාගේ දොර වෙත ගිය ඈ පිටත සිට ගත්තා. ඈ තදින් දොරට තට්ටු කළා. සමාව අයදින ලෙස සියුම් තට්ටු කිරීමේ හඬක් අපේක්ෂාවෙන් සිටි අමන්ඩා උඩ විසි වුණා.

"එන්න." ඈ කිව්වා.

ඇතුළට ගිය ජූන් දොර වැසුවා. හය පන්තියේ දැරියෝ කොතරම් උස මහත හෝ බලපුළුවන්කාර යැයි ඔවුන් සිතා සිටිය ද තමන් ඔවුන්ට ගරු සරුවක් නොදක්වන බව අමන්ඩාට පෙන්වීමට ජූන්ට අවශ්‍ය වුණා.

ඔවුන් අතර කිසිම සහයෝගී බැඳීමකට එය එතරම් හොඳ

ආරම්භයක් වුණේ නැහැ. අමන්දා සිත පෑරී සිටියා. ජූන් කේන්තියෙන් සිටියා.

"මම හිතන්නේ සූසන් ඔයාට මගේ පණිවිඩය දීලා නැහැ." අමන්දා කිව්වා.

"ඔව්, එයා කිව්වා." ජූන් කිව්වා.

"එහෙනම්, මොන එකක් හින්දද ආවේ නැත්තේ?" අමන්දා තදින් ඇසුවා.

"මම හිතුවා ඔයාට වැරදීමක් වෙලා කියලා." ජූන් කිව්වා. "මම හිතුවේ නැහැ ඔයා මගේ නමවත් දන්නවාද කියලා?"

"හරිම දුර්වල හේතුවක්." අමන්දා කී අතර ඇත්තෙන්ම එය කියන විට ජූන්ට පවා එය දුර්වල හේතුවක් බව හැඟුණා.

ජූන් ඔරවා ගත්තා. තමා කළ වරද කුමක් දැයි අසා දැන ගැනීමට ඈ බලා සිටියා. ඇය දඬුවම් පොතක් මේසය මත සූදානම්ව තිබෙනු ඇතිදැයි බැලුව ද එවැන්නක් එහි තිබුණේ නැහැ. පහළ පන්තිවල දැරියන් කරන වැරදි අල්ලා ඔවුන්ට පනවන ලද දඬුවම් ලියා ගැනීම සඳහා දඬුවම් පොතක් සියලුම හය පන්තියේ දැරියන් ළඟ තිබුණා. බොහෝ විට දඬුවම වූයේ යමක් කට පාඩම් කර එය පාඩම් දීමයි.

'එයා මම කරපු වැරැද්ද කිව්වා නම් හොඳයි.' ජූන් අමන්දා දෙස දඩබ්බර ලෙස බලමින් සිතුවා.

ඇත්තෙන්ම ජූන් කේන්තියෙන් සිටිනු දුටු අමන්දා ඇයව පුහුණු කිරීමට ඉදිරිපත් වෙනවාද, නැද්ද යන්න ගැන නිහඬව සිතින් තර්ක කළා. ඈ සැලසුම ඉදිරියට ගෙන යාමට තීරණය කළා. එසේ නොකළහොත් මොරියාගෙන් ඇයට එල්ල වන නින්දා සහගත බැලුම් ඇයට දැරිය නොහැකි වනු ඇත.

"මේ බලන්න ජූන්..." ඈ හදිසියේම ආරම්භ කළා. "මම ඔයා දිහා බලාගෙනයි හිටියේ."

ජූන් ත්‍රස්ත වුණා.

"මා දිහා බලාගෙන හිටියා...!" ඈ එක්වරම ආරක්ෂාකාරී ලෙස

ඇසුවා. "ඒ මොකටද? මම දන්නේ නැහැ මා දිහා බලා ඉන්න තරම් හේතුවක් තියෙනවද කියලා. මේ දවස්වල මම කාටවත් හිරිහැරයක් කරලා නැහැ."

"මෝඩ විදිහට කතා කරන්න එපා." අමන්දා කිව්වා. "මම බලාගෙන හිටියේ ඔයා ටෙනිස් සෙල්ලම් කරන හැටියි, පිහිනන හැටියි. ඔයාට හොඳට කරන්න පුළුවන්. ඔයාට පුළුවන් දෙවැනි පන්තියේ හෝ තුන්වැනි පන්තියේ ඕනෑම කෙනෙකුට වඩා හොඳින් සෙල්ලම් කරන්න. විකාර වැඩ කරන්නේ නැතිව, ඔයා ක්‍රීඩා ගැන උනන්දු වෙනවා නම් ඔයාට පුළුවන් හතර පන්තියේ අයත් පරාද කරන්න."

ජූන් මුව අයා ගත්තා. මෙය ඉතා අසාමාන්‍ය හා අනපේක්ෂිත වූ හෙයින් කුමක් කියන්න දැයි ඇයට වචනයක් හෝ සිතා ගැනීමට නොහැකි වුණා. අමන්දා දිගටම කතා කළා.

"ඉතින් මම ඉදිරිපත් වෙනවා ඔයාට පුහුණුවීම් කරන්න, ජූන්. මම සැලීටයි, ඩැරල්ටයි, මොරියාටයි කිව්වා ඔයා ගැන මගේ අදහස. මම එයාලට කිව්වා මේ වාරය ඉවර වෙන්න ඉස්සර ඔයාව දෙවැනි ටෙනිස් කණ්ඩායමටයි, දෙවැනි පිහිනුම් කණ්ඩායමටයි දාන්න තරම් හොඳ තත්ත්වයට පුහුණු කරනවා කියලා. මට ඕනෑ මම හරි කියලා ඔප්පු කරන්න."

තවමත් විස්මයෙන් ඇළලී සිටි ජූන් මහත් කර ගත් දෙනෙතින් අමන්දා දෙස බලා සිටියා. මෙලෙස අමන්දා තමාව තෝරා ගත්තේ ඇයි දැයි ඇයට තේරුම් ගත නොහැකි වුණා. ජූන්ට තමාව රවටා ගැනීමේ සිතුවිල්ලක් තිබුණේ නැහැ. තමා උත්සාහ කළ ද අන් අය පරයා යා නොහැකි බව ඈ දැන සිටියා. එමෙන්ම උත්සාහ කිරීම අනවශ්‍ය කරදරයක්. එමෙන්ම ඇය ගැන මෙසේ කතා කිරීම හරිම බොරු වර්ණනාවක්...!

"හොඳද...?" අමන්දා නොඉවසිල්ලෙන් ඇසුවා. "ඇයි ඔයා මොකවත් කියන්නේ නැත්තේ? මම යෝජනා කරනවා, ඔයාගේ පුහුණුවීම් දැන්ම ම, අද හවස ඉඳලා පටන් ගනිමු කියලා, පුළුවන් නම්."

ජූන් පැකිළුණා. ඈ ගිරයට අසු වූ පුවක් ගෙඩිය මෙන් විකල්ප දෙකක හිර වුණා. ඇය අමන්දාට ඇලුම් නොකළ අතර අමන්දාගේ යෝජනාව නිසා ඇයට මහත්සි වී හා යටහත් පහත්ව වැඩ කිරීමට

සිදුවන නිසා එය ඇගේ මුහුණට දමා ගැසීමට ඇයට උවමනා වුණා. අනිත් අතට, විශිෂ්ට වූ ක්‍රීඩා පාසල, ට්‍රෙනිගන් ටවර්ස්වලින් පැමිණි අමන්දා අනෙක් සියලුම පහළ පන්තිවලින් තමාව තෝරාගෙන, ඇගේ වටිනා කාලයෙන් බොහෝ කොටසක් තමා පුහුණු කිරීමට කැප කිරීම වටිනා බව තීරණය කර තිබෙන බව අනෙක් දැරියන් හා කීම කොතරම් ආඩම්බරයක්ද?

"හා, හොඳයි." ජූන් අවසානයේ කිව්වා. "මට ඔයාගෙන් විශේෂ පුහුණුවක් ගන්න පුළුවන් කියලා සැලී කිව්වා ද?"

"මෝඩ වෙන්න එපා. මම හිතන්නේ ඔයා මේ ගැන හිතන්න ඕනෑ. මම මගේ කාලයෙන් හුඟක් කැප කරන්නයි යන්නේ." අමන්දා නාසයෙන් පිම්බා.

"හොඳයි, ඔයා ඇත්තටම මෙහෙම කරන්නේ ඔයා හරි කියලා ඔප්පු කරන්න, නේද?" ජූන් තීක්ෂණ හඬින් ඇසුවා. "මම ගැන ඇත්තටම උනන්දුවෙන් නොවෙයි. මට කමක් නැහැ. ඔයාට හොඳ නම් මටත් හොඳයි."

අමන්දා මහත් ආයාසයෙන් කතා කිරීමෙන් වැළකී සිටියා. ආරම්භයේදීම මෙම කපටි, නොහික්මුණු බාල දැරිය එරෙහි කර ගැනීම අවාසි විය හැක. එසේ නැතහොත් ඔවුන් අතර සහයෝගයක් හෝ හොඳ ප්‍රතිඵල ඇති වීමට ඉඩකඩ නැතිව යනු ඇත. එහෙත් ඈ කොතරම් කුඩා දැරියට නොමනාපද?

"බොහොම හොඳයි." අමන්දා ඉක්මනින් කිව්වා. "අපි මේක ගනුදෙනුවක් වගේ කරමු. මට ඕනෑ මම හරි කියලා ඔප්පු කරන්න. ඔයාට ඕනෑ ඉස්කෝලයේ කණ්ඩායම්වලට එන්න. අඩුම තරමේ ඔයාට ඒක කරන්න පුළුවන්. දෙවැනි පන්තියේ කෙනෙකුට ඒක හරි ලොකු දෙයක්."

"ඒක හරි." ජූන් තම නොසැලකිලිමත් හඬින් කිව්වා.

"ඒත් ඔයා තේරුම් ගන්න ඕනෑ තව එක දෙයක් තියෙනවා." අමන්දා කිව්වා. "නැතිනම් වැඩ ඔක්කොම ඉවරයි. ටෙනිස්වලටයි, පිහිනීමටයි මම දෙන වෙලාවලට හරියටම එන්න ඕනෑ, තේරුණාද?"

"ඒක හොඳයි." ජූන් කිව්වා.

මෙලෙස ඔවුන් දෙදෙනා අතර ගනුදෙනුවක් ඇති වුණා. දෙදෙනාම දෙදෙනා කෙරෙහි උනන්දුවක් හෝ ඇල්මක් නැති ඇල්මැරුණ ගනුදෙනුවක්. ජූන් ආපසු ගියේ මහත් සතුටින්. මේ පුවත ඇසීමෙන් පසු දෙවන පන්තියේ දැරියෝ කොතරම් කම්පනය වනු ඇතිද?

දෙවන පන්තියේ පොදු කාමරයේ ඇය පෙනී සිටි වහාම අනෙක් අය ඇයට අඬ ගැසුවා.

"මොකක්ද ජූන්? ඇයි එයා ඔයාට කතා කළේ?"

"මේ සැරේ කට පාඩම් කරන්න මොනවාද හම්බ වුණේ?"

"ඔයා එයාව රැවැට්ටුවාද? ඔයා මොනවාද කිව්වේ?"

"එයා මාව කැඳවලා තියෙන්නේ, එයාට ඕනැලු ටෙනිස්වලටයි, පිහිනීමටයි මාව පුහුණු කරන්න." ජූන් නිවේදනය කළා.

මෙය ඉතා විස්මයජනක පුවතක් වූ අතර සියල්ලෝ එක්වර නිහඬ වුණා. ෆෙලිසිටි මුව අයා ගත්තා.

"අමන්ඩා ඔයාව පුහුණු කරනවා? ඒ මොනවාටද?"

"හොඳයි, එයා හිතනවා මම මහන්සි වුණොත් මට දෙවෙනි ටෙනිස් කණ්ඩායමටයි, දෙවෙනි පිහිනුම් කණ්ඩායමටයි යන්න පුළුවන් කියලා." ජූන් උදාරම් ලෙස කිව්වා.

"ඔයාට බැහැ. ඔයා නිතරම ගණන් ගන්නේ නැතිව වැඩ කරන්නේ." සූසන් එක්වරම කිව්වා.

"හරි, ඒත් අමන්ඩා එහෙම හිතනවා වගේ පෙනෙනවා." ජූන් පිළිතුරු දුන්නා.

"ඇත්තටම සිද්ධ වුණ දේ අපිට කියන්න." ෆෙලිසිටි කිව්වා.

"මම ඔයාලට කිව්වේ ඇත්ත. අමන්ඩාට ඕනෑ මට හැමදාම පුහුණු කරන්න. ඉතින් මම එකඟ වුණා. එච්චරයි." ජූන් කිව්වා.

නැවතත් නිහැඬියාවක් ඇති වුණා. දෙවැනි පන්තියේ දැරියන්ට මෙය විශ්වාස කළ නොහැකි වුණා. එහෙත් ජූන් කියන්නේ ඇත්තක් බව ඔවුන් දැන සිටියා. ඈ නිතරම කතා කළේ ඇත්ත.

"හරි, මට කියන්න තියෙන්නේ මේ ටික. ඔයාට ඒ කට සැර ලොකු අලි කෙල්ලගෙන් පුහුණුව ලැබෙන එක හොඳයි." සූසන් කිව්වා. "ඒත් එයා ඉවරයක් නැතිව ඔයාට අණ දෙයි."

"එයාට පරිස්සමින් වැඩ කරන්න වෙයි." ජූන් මෘදු හඬින් කිව්වා. "අණ කිරීම්වලට මම කැමති නැහැ. එයා හරි කියන එක ඔප්පු කරලා මාව දෙවැනි කණ්ඩායම්වලට දාන්න පුළුවන් තරම් හොඳට පුහුණු කරන්න ඕනෑ නම්, එයාට ඒක හරි විදිහට කරන්න සිද්ධ වෙනවා."

"ඔයාලා අපූරු ජෝඩුවක්...!" හැරියට් කිව්වා. "ජාඩියට මූඩිය... මම ඇවිදින් ඔයාලා පුහුණු වෙන හැටි බලා ඉන්නවා."

"ඔයා එන්න ඕනෑ නැහැ." ජූන් කඩිනමින් කිව්වා.

"ඕ... අපි එන්නම ඕනෑ." ෆෙලිසිටි අනෙක් අයට ඇසක් ඉඟි කරමින් කිව්වා. "කොහොම වුණත්, ඔයාට ඉක්මනට දෙවැනි කණ්ඩායම්වලට තල්ලු කරන්න දෙන පුදුම පුහුණුවෙන් අපිටත් පුළුවන් වෙයි මොනව හරි ටිකක් අල්ලා ගන්න."

"ඒක අපිට හිඟන්නන්ට උණු බත් වගේ වෙයි." ජේන් කිව්වා. "හොඳයි... අපූරු ආරංචියක්...!"

# 11

අමන්දා ජූන් සඳහා ඉතා ඇඩි කාලසටහනක් සැකසුවා. එය දුටු විට ජූන් ඉහළට ඇද ගත්තා. සෑම දිනකම ටෙනිස් හා පිහිනුම් පුහුණුව සඳහා කාලයක් වෙන් කර තිබුණා. මෙයට විරුද්ධ වෙන්නද, නොවෙන්නද කියා ජූන් සැකයෙන් කල්පනා කළා. නැහැ, අමන්දා මේ ගැන එතරම් ම උනන්දුයි නම්, එය එසේ වුණාවේ. ජූන් තම ගනුදෙනුවේ කොටස ඉටු කරනවා.

පුහුණුවීම් ආරම්භ වුණා. පළමු හා දෙවැනි පන්තිවල උද්‍යෝගිමත් පිරිසක් නැරඹීමට පැමිණියා. පිරිස දැක අමන්දා මවිත වූ අතර ජූන් එයට කිසිසේත් කැමති වුණේ නැහැ. තමාට සිනාසීම හෝ ඔවුන්ගේ සරදම් ලෙස සෝෂා කිරීම් ඇයට අවශ්‍ය වුණේ නැහැ.

"මේ මොකද?" අමන්දා පිටිය වටා වාඩි වී සිටි නරඹන පිරිස දෙසට අත වනමින් ඇසුවා.

"එයාලා අපිව බලන්න ඇවිත්." ජූන් කිව්වා. "තවත් එයි."

"ඔයාලා ඇවිදින් ඉන්නේ යමක් ඉගෙන ගන්න නම්, ඒකට කමක් නැහැ. නැති නම් අයින් වෙන්න. කවුරුහරි පුහුණුවට බාධා කරනවා නම් එයාට දෙසැරයක් හිතන්න වෙනවා. වෙනදා වගේම මා ළඟ දඬුවම් පොත තියෙනවා." අමන්දා එකවරම පිරිස ඇමතුවා.

මෙය ඇඩි නිහඬ බවකින් පිළිගනු ලැබුවා. අනතුරුව, අමන්දා ඉවත හැරෙත්ම පහත් හඬින් රහස් මිමිනුම් නැගුණා. අමන්දා ස්ථිර වශයෙන්ම ජනප්‍රිය කෙනෙක් වුණේ නැහැ. ඈ ඇත්තෙන්ම ආධිපත්‍ය පතුරුවා ගෙන සිටින මොරියා තරම්වත් ජනප්‍රිය වුණේ නැහැ. දැරියෝ කීපදෙනෙක් නැගිට ඉවතට ගියා. ඔවුන් පැමිණ තිබුණේ හාස්‍යජනක දේවල් කියා ජූන්ට කෑ ගැසීමටයි. එහෙත් ඔවුන්ගේ නම් දඬුවම් පොතේ සඳහන් වන්නට යන නිසා තව දුරටත් රැඳී සිටීමේ පලක් නැති බව පෙනුණා. අනෙක් අය ද පිටව යනු ඇතැයි ජූන් මහත් ඕනෑකමින් ප්‍රාර්ථනා කළා. ඇගේ මහත් සංතාපයට හා විස්මයට මෙන් තමා නැතිගෙන ඇති බව ඇයට හැඟුණා.

ජූන් පන්දුව ආපසු එවන හා ස්ථාන ගත කරන අයුරු තියුණු ලෙස බලමින් අමන්දා පුහුණුව ආරම්භ කළා. පන්දු යැවීමේදී ජූන් තම අත් මෙන්ම හිස ද පාවිච්චි කරන බව ඈ දැක ගත්තා. ඇය දැස පන්දුව වෙත රඳවා ගෙන පිත්ත පද්දන අයුරු හා එය නිවැරදිව පස්සට ගන්නා ආකාරය අමන්දා බලා ගත්තා. ඈ සෑම සුළු කරුණක්ම හිතට ගත්තා. ටෙනිස් ගැන අමන්දා නොදන්නා දෙයක් නැති තරම්. ඒ වන විටත් ඈ පාසල් ශූරතා තරග සඳහා ක්‍රීඩා කර තිබූ අතර ඈ උපන් හපන්කම් ඇති ක්‍රීඩිකාවක් මෙන්ම උපන් හපන්කම් ඇති ගුරුවරියක්.

"මේ... තව කොයි තරම් වෙලා මේක කරනවද?" අවසානයේ ජූන් මැසිවිලි නැගුවා. "මම කියන්නේ බෝල ආන එක."

නරඹන පිරිසෙන් සිනා රැල්ලක් මතු වුණා. ජූන් හාස්‍යජනක වීමට යනු ඇතැයි බලාපොරොත්තුව ඔවුන් කෙළින් වාඩි වුණා.

අමන්දා පිළිතුරු දුන්නේ නැහැ. ඈ තවත් පන්දුවක් ජූන් වෙතට එව්වා. ජූන් එය මඟ හැරුණ බව බොරුවට පෙන්නුවා. වැටෙන්නට යන බවක් ඇඟ වූ ඈ ප්‍රාතිහාර්යකින් මෙන් ඉන් මිදී පසුපසින් පන්දුවට පහර දී නැවත කෙළින් සිට ගත්තා. ඈ අනර්ඝ ලෙස කළේ මෙවැනි විකට වැඩයි.

නරඹන්නන්ගෙන් මහත් සිනා රැල්ලක් නැගුණා.

"අන්න හරි... ජූන්...!" හැරියට් කෑ ගැසුවා.

පන්දුව අතින් රැක ගත් අමන්දා පහළ පන්ති දැරියන් දෙස බැලුවා.

"තව සැරයක් කෑ ගැහුවොත්, හැමෝම ආපසු." ඈ නිවේදනය කළා. "මට දැන් ඔයාලට කෙළින්ම කියන්න පුළුවන්, විකාර වැඩවලදී ජූන්ට උගන්වන්න මට පුළුවන් දෙයක් නැහැ. තියෙන ඔක්කෝම උපක්‍රම එයා දන්නවා. ඒත් එයා නියම ටෙනිස් සෙල්ලම් කරන්න ඒ තරම් දන්නේ නැහැ. අනේ මන්දා. ඔයාලා දැක්කද එයා කොයිතරම් කැතටද පස්සෙන් පහර ගැහුවේ කියලා? මේ විදිහට යන්න ඕනෑ එක, එයා යන්නේ මේ විදිහට. අනික එයා දකුණත් පැත්තෙන් පහර දෙන කොට එයාගේ කකුල එන හැටි දැක්කද? සම්පූර්ණ වැරදියි...!"

ජූන් කෝපයෙන් පිඹිමින් සිටගෙන සිටියා. ඇයි ඇගේ වැරදි නරඹන පිරිසට පෙන්වන්නේ? එහෙත් ඇත්තෙන්ම, ඒ ඇයි කියලා ඈ

දැන සිටියා. ඒ ඇගේ සුළු විකට හැසිරීමට අමන්දාගේ ප්‍රතික්‍රියාවයි. ඇය විකට දෙයක් කරන සෑමවිටම සිනා හඬක් නැගුණ අතර පුහුණුව නවතා අමන්දා ජූන්ගේ වැරදි පෙන්වනවා.

"ඔයාලා ගියොත් හොඳයි. ඔයාලා බලාගෙන ඉද්දී බෝලය දිහා බලන එක හරි අමාරුයි." නරඹන පිරිස අසලට ඊළඟ පන්දුව ගිය අවස්ථාවේ ජූන් ඔවුන්ට සෙමින් කතා කළා.

අමන්දා තමා අදහස් කරන දෙය, තම පිත්ත ගෙන පන්දුව නිසි ලෙස ස්ථාන ගත කරමින්, නිවැරදිව පාද හසුරුවමින්, නොයෙක් ආකාරයෙන් පහරවල් ප්‍රදර්ශනය කර පෙන්වද්දී ජූන් නොදැනුවත්වම අකමැත්තෙන් වුව ද මහත් අගය කිරීමකින් යුතුව අමන්දා දෙස බලා සිටියා.

'මුළු වාරයකදීම මට ඉගෙන ගන්න බැරි තරම් දේවල් මම මේ එක පුහුණුවෙන් ඉගෙන ගත්තා.' ජූන්ට සිතුණා.

එහෙත් ඈ ඒ බවක් අමන්දාට කිව්වේ නැහැ. ශබ්ද නගා කතා කරන කට සැර අමන්දාට ඈ මල් මිටක් පුදන්නට ගියේ නැහැ. අමන්දා ද ජූන්ට ප්‍රශංසා කළේ නැහැ. ඈ නිකම්ම කීවේ, 'අදට ඇති. ඔයාට පෙනෙනවා දැන් ඔයාට හිතන්න හුඟක් දේවල් තියෙනවා කියලා. ඊළඟ සැරේ එද්දී ඒවා හදාගෙන එන්න. අනික හෙට උදේ හරි වෙලාවට තටාකය ළඟට එන්න. මට ඔයාට දෙන්න පුළුවන් විනාඩි දහයයි. මට එක තත්පරයක්වත් නාස්ති වෙන්න දෙන්න බැහැ.'

පසු දින, නියමිත වේලාවට ජූන් තටාකයට ගියා. අමන්දා ද හරි තත්පරයට පැමිණ තිබුණා. ජූන්ව ඉතා වෙහෙසකර විනාඩි දහයක පුහුණුවක යෙදවූ ඈ ටෙනිස් පුහුණුවේදී මෙන්ම ජූන්ගේ පිහිනීමේ ද බොහෝමයක් වැරදි අල්ලා ගත්තා. ඩැරල්, මොරියා හා මේරි ලෝව් ද අහම්බෙන් එහි සිටි අතර ඔවුන් නිහඬව බලා සිටියා.

"ජූන් හරියට කළොත්, මේකෙන් එයාට ලොකු යහපතක් වෙනවා." මේරි ලෝව් කිව්වා. "අපොයි, අමන්දා පුදුම කිමිදුම්කාරියක්. එයා එක තත්පරයක් නාස්ති කරන්නේ නැහැ."

"ජූන්ට හරියට කරන්න පුළුවන්. ප්‍රශ්නය, එයා කරයි ද කියන එකයි." ඩැරල් කිව්වා. "මට හිතෙනවා එයාට ඉක්මනින්ම එපා වෙයි කියලා. පුහුණුව නොවෙයි, ඒක කරන විදිහ. කිසිම අනුකම්පාවක් නැහැ."

දෙවැනි පන්ති ඇරියෝ තුන් හතර දෙනෙක් නෑම සඳහා පැමිණි අතර ඔවුන් අතර ජොසපින් ද සිටියා. සුපුරුදු පරිදි ඇය පුරසාරම් දොඩමින් සිටිය නමුත් කිසිවෙක් ඒවාට කන් දුන්නේ නැහැ. එහෙත් ඇගේ පියා මෙන්ම ඇය ද තමාගේ උදාරම් කටහඬ ඇසීමට ප්‍රිය කළ නිසා අරුත් සුන් දේවල් හඬ නගා කියමින් සිටියා.

"අපේ තාත්තාට කාර් ගොඩක් තියෙනවා. අම්මාට දියමන්ති මාලයක් තියෙනවා. ඒත් එයා ඒක කවදාවත් දාන්නේ නැහැ. ඒක ඒ තරම් වටිනවා. පවුම් පන්සීයක් වටිනා බල්ලෙක් අපේ ගෙදර ඉන්නවා. මගේ උපන් දිනයට නැන්දා පවුම් පහක් එවනවා. අපේ අයියාට තියෙනවා...." ඇයට කයිවාරු ගැසීමට බොහෝ දේ තිබුණා.

ජෝ තොරතෝංචියක් නැතිව කතා කළේ මෙවැනි දේ තමයි. ඒවා සත්‍ය බවට කිසිදු සැකයක් තිබුණේ නැහැ. පිහිනුම් ඇඳුම් අඳින අතරේ ඈ මහ හඬින් මෙවැනි දේවල් කියමින් සිටියා.

"මිස් පාකර් හැමදේටම ඇඟිලි ගහනවා. මම අද නොනා ඉන්න හිටියේ. ඒත් එයා මාව බලෙන් එව්වේ. මම එයාට බැන්නත් එක්ක. මම කිව්වා..."

"කට වහනවා...!" අමන්දා කෑ ගැසුවා.

ඈ ඒ වන විට වතුරේ සිටින ජූන්ට උපදෙස් දෙමින් සිටියා.

"කට වහගෙන වතුරට බහින්න. මම එක් කෙනෙක්ව පුහුණු කර කර ඉන්නේ."

ජෝ සිහින් සිනා හඬක් නැගුවා. ඈ පිහිනුම් ඇඳුමින් සිටි අමන්දාව පළමුව හඳුනාගෙන තිබුණේ නැහැ.

"ඕ... අපි මේකත් බලමු. ටෙනිස් වගේම මේකත් හොඳ ඇති."

කෙසේ හෝ ඇය අමන්දා දිව එන මඟට පැමිණ තිබූ අතර නොඉවසිලිමත් වූ අමන්දා ඇයව තල්ලු කළා. වේදනාත්මක කෑ ගැසීමක් සමග ජෝ ජල කඳ මත පතිත වුණා. ඇගේ මිතුරියෝ කොක් හඬලා මහත් සිනා හඬක් නැගුවා.

එහෙත් ජෝ විසිවී වැටී තිබුණේ තටාකයේ ගැඹුරු පෙදෙසට වූ අතර මුව විවර කර හුස්ම ගනිමින් ජලය මතුපිටට පැමිණුණා. ඈ

පතුලට පා තැබීමට තැත් කළ ද පතුලක් නොතිබූ හෙයින් නැවතත් ජලයේ ගිලුණා.

"අන්න... ඉක්මන් කරන්න... ජෝ වතුරේ ගිලෙනවා...!" ඩැරල් කෑ ගැසුවා. "එයාට පීනන්න බැහැ."

වතුර සමග පොරබදන ජෝ වෙත ජූන් පිහිනා ගොස් ඇගේ දිවි බේරා ගැනීමට වෙහෙසුණා. එහෙත් පාලනයකින් තොර වූ ජෝ කොතරම් බියට පත්ව සිටියේ ද යත් ජූන්ව බදා ගත් ඇ ජූන් සමග නැවතත් වතුරේ ගිලුණා. ඇය තරබාරු හා බර වැඩි බවින් යුතු නිසා ජූන්ට කිසිවක් කර කියාගත නොහැකි වුණා.

ජල කැලඹුමත් සමග අමන්දා ඒ අසලටම ජලයට පැන කිමිදුණා. ක්ෂණයෙන් ජෝ අසලට පැන ගත් ඈ ජෝව ග්‍රහණය කර ගත්තා.

"ජූන්ව අත හරින්න...!" ඈ අණ කළා. "මම බලාගන්නම්...!"

ජෝ අන්ධයකු ලෙස අමන්දාව බදා ගත්තේ කළ හැකි එකම දෙය එය පමණක් බව පෙනුණ නිසයි. අමන්දා හැකි පමණ ඉක්මනින් ජෝ සිහිගැන්විය යුතුයි. එය කළ හැක්කේ ක්ෂණික කම්පනයක් දීම තුළින් පමණයි. නැතහොත් බියපත් දැරිය තටාක ඉවුරට ගෙන යාමට ඉතා දිගු කලක් වැය කිරීමට හා මහත් වෙහෙසක් ගැනීමට සිදුවනු ඇත.

අත එසවූ ඈ ජෝගේ දකුණු කම්මුලට වැරෙන් පහරක් එල්ල කළා. අතුල් පහරේ හඬ තටාකය පුරා රැව් දුන්නා. මුව විවර කර සුසුමක් පිට කළ ජෝ පියවි සිහියට පැමිණියා. එකවරම ඈ මහත් කෝපයට පත් වුණා.

"අන්න හරි... දැන් අහගන්න." අමන්දා අණ කළා. "බදාගන්න එපා. මම ඔයාව අල්ලාගෙන ඉන්නේ. දඟලන්නේ නැතිව ඉන්න. මම ඔයාව ගොඩට ගෙනියන්නම්."

ජෝව ඉවුරට ගෙන ඒමට අමන්දාට ගත වුණේ තත්පර කීපයක් පමණයි. ඩැරල්, මොරියා හා මේරි ලෝව් ඇයව ගොඩට ඇද ගත්තා. ජෝ බිම වැටී වැතිරුණා. ඈ වැලපෙන්නට වුණා. ඈ දෙස් දෙන්නට වුණා.

"මම ගිලිල මැරෙන්න ගියා. මට ගැහුවා. මම තාත්තාට ලියලා යවනවා මාව තල්ලු කළා කියලා. ඔයා මහා නරක කෙල්ලක්...!" ඈ



ලතෝනි දුන්නා. "මට අමාරුයි. මම ගිලෙන්න ගියේ. ඕ... ඔයා මට ගහපු කම්මුල රිදෙනවා."

"මෝඩ වෙන්න එපා." මොරියා කිව්වා. "ඔයාව තල්ලු කළා නෙවෙයි, ඔයා විසිවෙලා වැටුණේ. අනික මේ තරම් කාලයක් ඉගෙන ගෙන තිබුණත් ඔයා පිහිනන්න ටිකක්වත් උත්සාහ කළේ නැහැ."

"අමන්දා ඔයාව බේරා ගත්තේ." මේරි ලෝව් ඇය බියපත්ව සිටිනු දැක මෘදු ලෙස කිව්වා. "එයා දන්නේ නැහැ ඔයාට පිහිනන්න බැහැ කියලා. අනික එයා ඔයාව තල්ලු කළා නොවෙයි."

"එයා නරක කෙල්ලක්" ජෝ වැලපුණා. "මම තාත්තාට කියනවා."

"ඉතින් කියන්න." අමන්දා කිව්වා. "එකම වැරැද්ද ඔයා බය ගුල්ලියක් වීම විතරයි. කැමති නම් මම ඔයාටත් පුහුණුවක් දෙන්නම්. පාඩම් දෙක තුනකින් මම ඔයාව මාළුවෙක් වගේ පිහිනන්න හදන්නම්."

එය ජෝට කළ හැකි අවසාන දෙයයි. ඇඳුම් ඇඳ ගනිමින් ඒ වන විටත් වැලපෙමින් සිටි ඈ පාසල බලා ආපසු යාමට පිටත් වුණා. අනෙක් ඇරියෝ හඬ නගා සිනාසුණා.

"අහිංසක ජෝ...! එයා මැලෝරි ටවර්ස්වලට ගැළපෙන්නේ නැහැ." මේරි ලෝව් කිව්වා. "එයා මොන මෝඩියක් ද?"

ඩියනා නම් පළමු පන්ති ඇරියක හැරුණු විට අනෙක් කිසි කෙනෙක් ජෝට අනුකම්පාවක් දැක්වූයේ නැහැ. ඒ වන විටත් අඩමින් පාසල බලා එමින් සිටි ඇයට ඩියනා මුණ ගැසුණා.

"ඕ... මේ මොකද ජෝ...?" ඩියනා දුකින් ඇසුවා. "ඔයාට තුවාල වුණා ද?"

"මම ගිලෙන්න ගියා." ජෝ කිව්වා.

ඇගේ දෙනෙත්වලින් තව තවත් කඳුළු කඩා හැළෙන්න වුණා.

"මට පිහිනන්න බැහැ කියලා දැන දැනත් අර අමන්දා කියන හරකී මාව වතුරට තල්ලු කළා. ඒ විතරක් නොවෙයි, මගේ කම්මුලටත් ගැහුවා. බලන්න... මම තාත්තාට කියනවා."

"ඕ... එහෙම තමා කරන්න ඕනෑ." ඩියනා කිව්වේ දෙවැනි පන්ති ඇරියක ඇය සමග කතා කිරීම ආඩම්බරයක් ලෙස සලකන අතරේම පළමු පන්ති ඇරියක වූ ඇයට ද පිහිනීමට නොහැකි නිසා වතුරට තල්ලු කළහොත් සිදුවන්නේ කුමක් දැයි හොඳ හැටි තේරුම් ගෙනයි. "අමන්දා හරිම නරක, වස කෙල්ලක්. කවුරුවත් එයාට කැමති නැහැ. ඒක පුදුමයක් නොවෙයි."

ගල් තලාවට නගින අතරමඟ වූ ගල් කුළක අයිනේ වාඩි වූ ජෝ පිටි අත්ලෙන් කඳුළු පිසින්නට වුණා.

"මට සනීප නැහැ වගේ." ඈ කිව්වා. "මගේ ඇඟට අමාරුයි. මම හිතන්නේ මට ලුණු වතුර පෙවුණා වගේ. අද මට කිසිම දෙයක් කන්න බැරි වෙයි."

ජෝට පමණක් නොව මෙය ඩියනාට ද මහත් බිහිසුණු දෙයක් ලෙස පෙනුණා.

"ඔයා වෙවුලනවා." ඈ කිව්වා. "ඔයා ආපහු යන්න. මම මේට්‍රන්ව එක්ක එන්නද?"

"අපොයි දෙවියනේ, එපා..." ජෝ එකවරම කිව්වා.

ඇය නේවාසිකාගාර පාලිකාවට එතරම් ඇල්මක් නොදැක්වූවා මෙන්ම නේවාසිකාගාර පාලිකාව ද ජෝට ඇලුම් කළේ නැහැ. නේවාසිකාගාර පාලිකාව ජෝගේ බොරු රඟපෑම් හා මඟහැර යෑම් නිතර දැක තිබුණා. ඉන් කැපී පෙනෙන එකක් වූයේ, සමහර හවස් වරුවල පා ගමනක් යොදා තිබුණහොත් ජෝට හැදෙන හිසරදයයි.

'හරි වැඩේ.' පාලිකාව කියා තිබුණා. 'ඇවිදින හිසරදය, ඇවිදීම තියෙන දවස්වලම තමයි ඔයාට හිසරදේ එන්නේ, ජෝ. හරි, හිසරදයත් එක්කම ඔයා ඇවිදින්න යන්න. එතකොට සනීප වෙයි.'

මේ නිසා ඇය 'ගිලෙන්නට' ගිය මෙම උදයේදී ඇයට පාලිකාවගෙන් කිසිම සාත්තුවක් අවශ්‍ය වුණේ නැහැ. ඇයට අවශ්‍ය වුණේ කාගෙන් හෝ ලොකු අනුකම්පාවක් විතරයි. එහෙත් ඇයට ලැබුණ එකම අනුකම්පාව වූයේ පළමු පන්ති කුඩා දැරිය, ඩියනාගෙන් පමණයි. අනිත් හැමෝම ඇයට හිනා වුණා.

"ගිලුණා නේද?" සූසන් සමච්චලයට කිව්වා. "ඔයා නිකම්ම වතුර යට ගිහින් කටේ වතුර පුරවා ගත්තා විතරයි, ජෝ."

"ගිලෙන හැටි දැනගන්න ඕනෑම නම් මම තව ටිකක් වේලාවක් ඔයාව වතුරේ ඔබාගෙන ඉන්නවා." ජූන් කීවේ ජෝ තමා ගිලී මිය යන්නට ගිය බව හය වතාවකටත් වඩා කී පසුවයි.

"ජෝ මේ වෙද්දී දොළොස් වතාවක් විතර ඇත්තටම ගිලිලා තියෙනවා." ඩවුන් නමැති දැරිය කිව්වා. "මට හිතාගන්න බැරි ඇයි එයා තවම පිහිනන්න ඉගෙන ගන්නෙ නැත්තේ කියන එකයි. එහෙම කළා නම් කවදාවත් එයා ගිලෙන්නේ නැහැ."

ජෝගේ දෙනෙත්වල කඳුළු පිරුණා.

"ඔයාලා හොඳම නැහැ." ඈ කිව්වා. "හරිම නපුරුයි. ඉන්නකෝ, දවසක මම මෙහෙන් පැනලා යනවා."

"යන්න." ජූන් කිව්වා. "දවසක උදේ නැගිටලා බලද්දී ඔයාගේ

ඇඳ හිස්වෙලා තියෙනවා දකින්න මම හුඟක් ආසයි. මට ලොකු සහනයක් දැනෙයි...!"

සුසුම් ඉහළට අදිමින් මහත් දුක්මුසු පෙනුමක් ගත් ජෝ ඩියනා සොයා පිටත්ව ගියා. ඩියනා තමාට අනුකම්පා කරන බව ඈ දැන සිටියා. එය සැබෑවක්. එය එසේ සිදු වූයේ මීට පෙර දිනක ජෝට ලැබී තිබුණ චොක්ලට් පෙට්ටියක් ඇය කා සමගත් බෙදා නොගෙන එය ඩියනා වෙත රැගෙන ගිය නිසයි.

"මම දෙවැනි පන්තියේ අයට එක චොක්ලට් කෑල්ලක්වත් දෙන්නේ නැහැ." ජෝ ප්‍රකාශ කළා. "අපි මේ ඔක්කෝම කමු, ඩියනා. ගන්න.... පෙට්ටියෙන් බාගයක්ම ඔයා තියාගන්න. මගේ ඊළඟ කේක් එක ආවට පස්සේ මම ඒකෙන් බාගයක්ම ඔයාට දෙනවා."

මේ ආකාරයට කේක් හෝ රසකැවිලි එවීමට ඩියනාට මවක සිටියේ නැහැ. ඇයට සිටියේ මුහුදු ගමන්වල යෙදෙන පියෙකු හා නැන්දා කෙනෙකු පමණයි. නේවාසික පාසල්වල සිටින දැරියන් නොයෙක් වර ගෙදරින් එන පාර්සල බලාපොරොත්තුවෙන් සිටින බවක් මෙම නැන්දා දැන සිටියේ නැහැ. මේ නිසා තමාට ලැබුණු චොක්ලට් ගැන ඩියනා මහත් සතුටට පත් වුණා. ජෝ නිතරම කියන පරිදි ඒවා මහත් අනර්ඝ බවින් යුතු වුණා.

"අපේ ගෙදර අය හොඳම දේවල් හැර වෙන කිසිම දෙයක් ගන්නේ නැහැ." ජෝ කිව්වා.

ජෝ තමාට හැකි හා රිසි පරිදි පුරසාරම් දෙඩූ අතර ඩියනා මේ සියල්ල රස කර ගිල ගත්තා.

"මට අපේ ගෙදර තියෙන නිදන කාමරය ඔයාට පෙන්නන්න තිබුණා නම්, ඩියනා. හැමතැනම රතු පාටයි, රත්තරන් පාටයි."

මෙය සම්පූර්ණ සත්‍යයකි. ජෝගේ පියා මුදල් මත පිහිනන කෙනෙකි.

එක් උදෑසනක, අමන්දා ඇත්තෙන්ම ජෝ සොයා ආවේ ඇය පිහිනීම ඉගෙන ගැනීමට කැමති දැයි ඇසීමටයි. ජෝව වතුරට තල්ලු කිරීම ගැන වරදකාරී බවක් දැනුණ ඈ ජෝට පිහිනීමට බැරි බව සොයා නොබැලීම ගැන ඇයටම දොස් තබාගෙන තිබුණා. ජෝ නපුරු ලෙස ඇයට පිටුපෑවා.

"ඕනෑ නැහැ." ඈ සැර පරුෂව කිව්වා. "ඔයා ගැන තාත්තාට මම ලියුමක ලියලා යැව්වේ නැති එක හොඳයි. මේ ලෝකයේ මොනවා ලැබුණත්, ඔයා ජූන්ට දෙන දේ ලබාගන්න මාව කොහොමවත් කැමති කරවා ගන්න බැහැ...!"

අමන්ඩා සමග සැලී ද සිටියා. ඈ ජෝගේ උරහිසින් අල්ලා කැරකෙව්වා.

"දැන් නපුරු වීම ගැන අමන්ඩාගෙන් සමාව ගන්න." ඈ කිව්වා. "ඉක්මන් කරන්න."

"බැහැ." ජෝ කිව්වේ තමාව අගය කරන ඩියනා අසලක සිටි නිසයි.

"බොහොම හොඳයි." සැලී තම කුඩා දඬුවම් පොත එළියට ගනිමින් කිව්වා. "ප්‍රංශ කවි පොතෙන් පේළි විස්සකට නොඅඩු ඕනෑම ප්‍රංශ කවියක් කට පාඩම් කරන්න ඔයාට පුළුවන්. ලබන බදාදාට පෙර ඒක මට පාඩම් දෙන්න ඕනෑ."

"මම සමාව ගන්නම්." ජෝ බුම්මාගෙන කිව්වා.

ප්‍රංශ ඇය කිසිසේත් ඇලුම් කළ විෂයක් නොවෙයි.

"දැන් පමා වැඩියි." සැලී කිව්වා. "දඬුවම වලංගුයි. ඔය එරවිල්ල නවත්වා ගන්න."

"එපා, ඔහොම ම ඉන්න...!" බෙලින්ඩාගේ කටහඬ පසුපසින් නැගුණ අතර කාටූන් පොත පිටතට ආවා. "ඒ වගේ අපූරු ලස්සන එරවිල්ලක් මට අහුවෙන්නේ හුඟක් කලාතුරකින්. අහා... මෙන්න බලාගන්න, චූටි ජෝ...!"

ජෝ තමාගේම කාටූන් සිතුවම දෙස රවා බැලුවා. ඇය තදින් කෝප වන අවස්ථාවලදී ඇති නපුරු පෙනුම එලෙසමයි. ආපසු හැරුණ ඈ එල්ලා වැටෙන උරහිසින් යුතුව ගමන් කරන්නට වූ විට ඩියනා ද කීකරු බලු පැටවෙකු මෙන් පසුපසින් වැටුණා.

"ඒ පොඩි කෙල්ලට පාලනයක් ඕනෑ." සැලී කිව්වා. "මට ෆෙලිසිටිගෙන් දැනගන්න ලැබුණා එයාට හැමදාම වගේ ගෙදරින් පාර්සල් ලැබෙනවා කියලා. හුඟක් වටිනා ඒවා. එයාට සල්ලි

ලැබෙනවා. එයා සල්ලි විසි කරන වෙලාවක් මට අහු වුණොත් මගේ භාරයට ගන්නවා. නැතිනම් මේට්‍රන් ළඟට යවනවා. පොඩි පන්තිවල ළමයි සල්ලි සම්බන්ධ නීති හරියට පිළිපදින්න ඕනෑ. මුළු වාරයටම වියදම් කරන්න සිලිං දහයක් විතරක් තියෙන අයට ඒක අසාධාරණයක්. එයා අනෙක් අයට වසංගතයක් වෙනවා."

අමන්දාගේ පුහුණුව ගැන ජූන්ගේ උනන්දුව ඉක්මනින් පහව ගියා. නොකැමැත්තෙන් වුව ද ජූන් එය ඉවසා සිටියා. අමන්දා කිසිදින ප්‍රශංසා කළේ නැහැ. ඒ ඇගේ නරකම ලක්ෂණයයි. ජූන් ඇත්තෙන්ම ඉතා දක්ෂ ලෙස ක්‍රීඩා කළ විටක පවා, ඇය වැරදි රාශියක් අල්ලා ගත්තා. 'හොඳයි, අන්තිමේදී හොඳ පාරක් දැක්ක එක ලොකු සතුටක්.' අමන්දාගෙන් අසන්නට ලැබුණේ එවැනි ප්‍රකාශනයක් පමණයි.

පිහිනීමේදී හා ටෙනිස් ක්‍රීඩාවේදී පාසලේ දක්ෂම ක්‍රීඩිකාවන්ටත් වඩා බොහෝ දුරකින් තමා සිටින බව අමන්දා වැඩිකල් නොගොස්ම ඔප්පු කර පෙන්නුවා. පළමු පිහිනුම් කණ්ඩායමට, කිමිදුම් කණ්ඩායමට හා ටෙනිස් කණ්ඩායමට ද ඇය ඉබේටම පත් කෙරුණා. විශාල සිරුරක් සහිතව ඇය ටෙනිස් පිටියේ හෝ තටාකයේ සිටිනු දකින ඩැරල් ඇය දෙස විස්මයෙන් බලා සිටීම කිසිවිට නැවැත්තුවේ නැහැ.

මොරියා හා අමන්දා අතර බොහෝ විට බැණ ගැනීම් සිදු වුණා, විශේෂයෙන්ම කුඩා ඇරියන්ට උදව් කිරීම සම්බන්ධව. මොරියා ඒ සඳහා ඉතා යහපත් වුව ද අමන්දා කිසිදු උනන්දුවක් ගත්තේ නැහැ.

ක්‍රීඩාවලට අමන්දා මෙන්ම දක්ෂ වීමට මොරියා ද කැමති වුණා. ප්‍රංශ ඇරිය, සූසේන්ගේ නිරන්තර විමතියට මෙන් නිතරම මොරියාගේ තදබල ආශාව වූයේ ක්‍රීඩාවයි.

"මේ මොරියා, මේ අමන්දා...." ඈ මම්සලී සමග මැසිවිලි නැගුවේ ප්‍රංශ භාෂාවෙන්.

"ඉංග්‍රීසියෙන් කතා කරන්න, සූසේන්." මම්සලී සැරෙන් කිව්වා. "මම මේක කී සැරයක් ඔයාට කියන්න ඕනෑද?"

"පොලිස්...!" සූසේන් කිව්වා.

"මම කිව්ව දේ ඇහුණද?" මම්සලී කිව්වා. "දැන්, ඔයා කියපු එක ආයෙත් කියන්න. ඉංග්‍රීසියෙන්, ප්ලීස්...!"

"මේ මොරියා, මේ අමන්දා... එයාලා පිගි - හූ - ලියර්." සූසේන් උනන්දුවෙන් කිව්වා.

මම්සලී ඇස් මහත් කර ඇය දෙස බැලුවා.

"මොකක්ද ඒ වචනය?" ඈ විමතියෙන් ඇසුවා.

"පිගි - හූ - ලියර්" සූසේන් නැවත කිව්වා. "ඒක ඇත්ත වචනයක්, මම්සලී ඩූපොන්ට්. ඩැරල් ඒක මට කිව්වා."

"ඩැරල් ඔයාට කිව්වා...?" මම්සලී කිව්වා. "අහ්.. ඒක මොකක්ද කියලා මම එයාගෙන් අහන්න ඕනෑ."

ඇත්තෙන්ම එය පිකියුලියර් නම් වචනය වූ අතර අමුතු ආකාරයේ ඕනෑම දෙයක් සඳහන් කිරීමට එය ඉංග්‍රීසියේ භාවිත වුණා. එවැනි තවත් වචන කීපයක් සූසේන්ට ඉගැන්වීමට ඇලිසියා සමත් වූ අතර එම වචන ඇසීමෙන් මම්සලී තවත් පුදුමයට පත් වුණා.

කිසිවක් සැක නොසිතූ සූසේන් නිතර ඒවා වැරදි ලෙස උච්චාරණය කරමින් කතා කරද්දී දැරියන්ට එය මහත් විනෝදයක් වුණා.

වචන ඉගෙනීමට මහත් කැමැත්තක් දැක්වූ සූසේන් හැකි සෑමවිටම ඒවා පාවිච්චි කළා. සමහර වචනවල තේරුම මම්සලීට අනුමාන කිරීමට හෝ නොහැකි වුණා. සැක පහළ වූ මම්සලී, ඇලිසියාට කතා කළා.

"මේ වචන අහලා තියෙනවාද, ඇලිසියා? මට ඇත්තම කියන්න."

"ඕ... ඔව්, මම්සලී." ඇලිසියා අහිංසක බැල්මක් මම්සලී වෙතට හෙළමින් කිව්වා.

මම්සලීගේ කොණ්ඩා කටුවක් පහළට වැටෙන්නට ආසන්නව තිබූ අතර මේ දර්ශනය ඇයට අරුම පුදුම කාන්දම ගැන සිහිපත් කළා. ජූන් නැවතත් එය පාවිච්චි කරලාද? ඈ ඒ ගැන සොයා බැලිය යුතුයි.

ශබ්දකෝෂය ගෙන තේරුම් සොයන අතරේ මම්සලී අමුතු වචන සෙමින් මතුරන්නට වුණා.

"ඒ වගේ වචන මේකේ නැහැ. සූසේන්, මේ ඩික්ෂනරිය අරගෙන ප්‍රවේසමෙන් පෙරළලා බලන්න."

"පොලිස්..?" සූසේන් විනීතව ඇසුවා.

මම්සලී තරහින් පිපිරුණා.

"ඔව්, හැමතිස්සේම පොලිස් කියන වචනයේත් තේරුම බල ගන්න...!" ඈ කෑ ගැසුවා. "හොඳට තේරුම බලාගන්න. දවසක එයාල ඔයාව අල්ල ගන්න එයි. පොලිස්...! ආහ්, මෝඩ කෙල්ල. කවදාවත් ඉංග්‍රීසි හරියට කතා කරන්න ඉගෙන ගන්නේ නැහැ."

# 13

ජූන්ගෙන් කාන්දම පිළිබඳව ඇසීමට ඇලිසියාට මතක් වුණා. සිනාවක් පෑ ජූන් කලිසම් සාක්කුවට අත දමා ඉතා ප්‍රබල කුඩා කාන්දම් කෑල්ල පිටතට ගත්තා.

ඇලිසියා එය අතට ගත්තා. එය ඉතා බරයි. ඈ එය ඩෙස්කය දිගේ ඇතිල්ලුවා. විශාල පැන්සල් උල්කරනයක් අහසේ පාවී විත් එහි ඇලෙන්නට සැරසුණා. එක්වරම මාලිමාවක් පැමිණියා. පෑන් තල තුන හතරක් හා තවත් ලෝහමය දේ කීපයක් ඇදී විත් ඇලුණා.

"අපි ආයෙත් මම්සලී රොජර්ට විජ්ජාව කළා." ජූන් කිව්වා. "මේ සැරේ කළේ හැරියට්. අපි ටිකක් වෙනස් විදිහට කළාට ඉස්සරලා වගේම විනෝදයි."

"මොකක්ද සිද්ධ වුණේ?" ඇලිසියා ඇසුවා.

"හරි, කොණ්ඩා කටු ඉස්සරලා වගේම ගැලවුණා." පුළුල් සිනාවක් පාමින් ජූන් කිව්වා. "ඉතින් හැරියට් ඒවා ඉක්මනට කාන්දමෙන් ගලවලා ආපහු ඉඳගන්න එන අතරේ දොර ළඟට දැම්මා. කොණ්ඩය පිටිපස්සට කඩා වැටෙන බව මම්සලීට තේරුණා. එයා අතපත ගාලා බැලුවට එක කොණ්ඩා කටුවක්වත් හොයාගන්න බැරිව හොඳටම බය වුණා."

"ඊට පස්සේ ෆෙලිසිටි දොර දිහාට අත දික් කරලා කිව්වා, දොර ළඟ කොණ්ඩා කටු වගයක් වැටිලා තියෙනවා දැක්කා වගේ කියලා. ඒවා මම්සලීගේ ඒව ද දන්නේ නැහැ කියලා. ඒවා එතැනට ගියේ කොහොමද කියලා මම්සලීට හිතාගන්නවත් බැරි වුණා. අපි එක එක දේවල් කිව්වා. මම කිව්වා, මම්සලී ඇතුළට එද්දී ඒවා වැටෙන්න ඇති කියලා. හැරියට් කිව්වා ඒවා මම්සලීගේ වෙන්න බැහැ, වෙන කවුරු හරි අපේ පන්තියට කොණ්ඩ කටු ගෙනැවිත් දමලා කියලා..."

"ඔයාලා හුඟක් දේවල් කියන්න ගියා නම් මම්සලී රොජර්ට

සැක හිතෙන්න ඇති." ඇලිසියා හඬ නඟා සිනාසෙමින් කිව්වා.

"මම හිතන්නේ ඇත්තටම එයාට සැක හිතුණා." ජූන් කිව්වා. "එයා හැමතිස්සෙම කොණ්ඩය අල්ලලා බැලුවා ලෙහිලද කියලා. හැම තිස්සෙම කොණ්ඩ කටුවලට ඇඟිල්ල තියලා ඒවා එහෙම ම තියෙනවාද කියලා බැලුවා...! දැන් එයා නිතරම අපි දිහා බලන්නේ පුදුම සැකයකින්...!"

"මම්සලී ඩූපොන්ට්ට ඒක කරනවා දකින්නයි මම ආසා." ඇලිසියා සුසුමක් හෙළමින් කිව්වා. "එයා තමයි හොඳම විහිළුකාරී."

"පොඩි විහිළුවක්වත් කරන්න බැරි තරමට හයේ පන්තියේ අය ගරු ගාම්භීර ලොකු අය වුණ එක අපරාධයක්. මම හිතන්නේ කවදා හරි මම හයේ පන්තියට ආවොත් මම එහෙම වෙන්නේ නැහැ."

"එහෙම නොවුණොත් ඔයාගෙන් ඇති වැඩක් නැහැ." ඇලිසියා කිව්වා. "හරි, මේක හොඳ විජ්ජාව. මම දෙවැනි පන්තියේ ඉද්දී මමත් කරන්න ඉඩ තිබුණා. කොහොම වුණත් ඔයාලා කරනවාට වඩා හුඟක් හොඳට මට මේක කරන්න තිබුණා."

ඈ ඉවත්ව ගියා. ජූන් ඇය දෙස බලා සිටියා. මීට වඩා තවත් හොඳින් ඇලිසියා මොනවා කරන්නද? වෙන මොකවත් කරන්න බැහැ. ජූන් සෙමින් කාන්දම් කැබැල්ල ආපසු සාක්කුවට දා ගත්තා. ඇගේ ඉක්මන් සිත ඇලිසියා කී සියලු දේ ගැන නැවත නැවත සිතන්නට පටන් ගත්තා.

ඈ ෆෙලිසිටි හා සැලී සොයා ගියා. ඔවුන් තිදෙනාම එක්ව සාකච්ඡා කළා. කාමරයට පැමිණි ජෝ ඔවුන්ව දුටුවා. කලබල කරමින් ඈ ඔවුන් වෙතට ආවා.

"මොකක්ද රහස? මොනවාද කරන්නේ?" ඈ ඇසුවා.

"මොකවත් නැහැ." ජූන් කිව්වා.

"මටත් කියන්න කෝ." ජෝ තරහින් කිව්වා. "ඔයාලා හරිම නරකයි. හැම තිස්සේම මාව හැම දෙයකින්ම අයින් කරනවා. මම මගේ හැම දෙයක්ම බෙදා ගන්නවා. ඊළඟ සතියේ මම ලොකු පාටියක් ගන්න ඉන්නේ. බලන්න... මා ළඟ පවුම් පහක් තියෙනවා."

එදින හතරවැනි වතාවටත් අනෙක් අයට පෙන්වීමට ඈ තම කලිසමේ කකුල තුළ සඟවා ගෙන තිබූ පවුම් නෝට්ටු පිටතට ගත්තා. නේවාසිකාගාර පාලිකාවට අසුවී රැගෙන යනු ඇතැයි බියෙන් ඒවා තම ලාච්චුවේ දමා තැබීමට තරම් ඈ නිර්භීත වුණේ නැහැ.

"දැනටමත් අපි ඕනෑවට වැඩියෙන් ඕවා දැකලා තියෙනවා." ෆෙලිසිටි කලකිරීමෙන් යුතුව කිව්වා. "ඔයාගේ උපන් දිනය වෙනුවෙන් තාත්තා මොනවද එවන්නේ? රෝල්ස් රොයිස් කාර් එකක් ද? නැතිනම් රේස් අශ්වයෙක් ද? නැතිනම් වැඩකට නැති පබළු මාලයක් එවන්න තරම් එයා පහළ වැටෙයි ද?"

ජෝ කෝපයෙන් පසෙකට හැරුණා. බොරු සෝබන නොපෙන්වා ඉන්න ඇය කෙසේ නම් ඉගෙන ගනිවි ද? ෆෙලිසිටි කල්පනා කළා. තම දෙමව්පියන්ගේ සියලු ගති සිරිත් හා නරක පුරුදු සියල්ලම ගෙන ඈ ඔවුන් මෙන්ම හැසිරෙනවා ද?

ඉතාමත් අවාසනාවන්ත දෙය ජෝට සිදු වූයේ ඇය පොදු කාමරයේ සිට පිටව යන විටමයි. ඇගේ කලිසම් කකුලේ ඉලාස්ටික් පටිය කැඩුණා... එය ඇය මුදල් නෝට්ටු සඟවා ගෙන සිටි කලිසම් කකුලයි...! නෝට්ටු නිතර එළියට ඇදීම හා නැවත ඇතුළට එබීම නිසා ඉලාස්ටික් පටිය දුර්වල වීම ගැන සැකයක් නැහැ. කෙසේ වෙතත් එය දෙකට කැඩුණ අතර ඈ එය දැන සිටියේ නැහැ.

තමාව දරුණු ලෙස හුදෙකලාවට ඇද දමා ඇති බව සිතමින් ඈ කොරිඩෝව ඔස්සේ ඉබාගාතේ ඇවිදගෙන ගියා. එම තිදෙනා කොඳුරමින් සිටියේ කුමක් විය හැකිද? ඇයි ඔවුන් ඒ ගැන ඇයට නොකීවේ? ඩියනා සොයා යාමට අධිෂ්ඨාන කර ගත් ඈ නැවත වතාවක් දෙවැනි පන්තියේ දැරියන්ට ඇය සමග දොස් කීමට සිතා ගත්තා. ඩියනා නිතරම කැමැත්තෙන් ඉදිරිපත් වන අසන්නියක් වූ අතර ජෝට ලැබෙන දේවල් බෙදා ගන්න වඩාත්ම කැමැත්තෙන් ඉදිරිපත් වන කොටස්කාරියක් ද වුණා.

නේවාසිකාගාර පාලිකාව ඇගේ කාමරයෙන් පිටතට පැමිණියේ ජෝ එතැන පසුකර ගිය වහාමයි. පවුමේ නෝට්ටුවක් බිම වැටී තිබෙනු දැක ඈ මහත් සේ විමතියට පත් වුණා. ඈ එය අහුලා ගත්තා. ඇත්තෙන්ම එය ජෝගේ කලිසම් කකුල අස්සේ තිබී වැටුණ එකක්. ජෝට එය දැනී තිබුණේ නැහැ. එය තම කබා සාක්කුවේ

ඔබා ගත් පාලිකාව ඉදිරියට ගියා. කොරිඩෝව මැද වැටී තිබූ දෙවැනි නෝට්ටුවක් ද ඇයට හමු වුණා. හරිම අසාමාන්‍ය දෙයක්...!

පාලිකාවට සැක ඉපදුණා. ඒවා සත්‍ය නෝට්ටු ද, නැතහොත් කාගේ හෝ විහිළුවක් ද? කොහේ හෝ දීප්තිමත් දෙනෙතක් ඇය ඒවා අහුලා ගන්නා අයුරු බලා සිටිනවා ද? පාලිකාව වටපිටාවට බැල්මක් හෙළූ නමුත් කිසිවෙකු ජේන මානයක සිටියේ නැහැ. ඈ නෝට්ටු දෙස බැලුවා. ඒවා නිසැකවම සත්‍ය ඒවා බව පෙනුණා.

ඇය සැබෑ ලෙසම විමතියට පත් වුණේ ඇයට තුන් වන නෝට්ටුවත් හමු වූ විටයි. එය බිත්ති මුල්ලේ බිම වැටී තිබුණා. පාලිකාව කල්පනාවෙන් බරව එය අහුලා ගත්තා. නිසැකවම ඒවා දැරියකට අයත් විය නොහැකියි. කිසිවෙකුට එතරම් මුදලක් එකවර ළඟ තබාගත නොහැකියි.

"පවුම් තුනක්...!" ඈ තමාටම කියා ගත්තා. "පවුම් තුනක්... මට භාර නොදී ඉඳලා. ඒත් කොහොමද මේවා මෙතැනට ආවේ, බිම වැටෙන්න...?"

අවසාන නෝට්ටු දෙක ගෙවත්තට පිවිසෙන ගේට්ටුව අසල කොරිඩෝවේ මුල්ලක එක තැන වැටී තිබුණා. පාලිකාව කඩිනමින් ඒවා අහුලා ගත්තා. 'දැන් පහක්...! හොඳයි, කවුරු හරි හුඟක් පොහොසත් කෙනෙක් මේ පැත්තෙන් ඇවිද ගෙන ගිහින් තියෙනවා. ඒත්, ඇයි මේ තරම් සල්ලි විසි කරලා ගියේ?'

පාලිකාව දොරින් පිටත බැලුවා. ඈත සිටින දෙදෙනෙකුගේ ඡායාවක් ඇයට පෙනුණා. ජෝ සහ ඩියනා මහත් උනන්දුවෙන් කතා කරමින් සිටියා.

ජෝ අතින් ඒවා වැටුණා විය හැකියි. දොර අසල සිට ගත් පාලිකාව තළල රැලි ගන්වා ගත්තා. ජෝ ළඟ මීටත් වඩා මුදල් තිබිය හැකි ද? ඈ ඇත්තෙන්ම ඒවා පාලිකාවට දිය යුතුව තිබුණා. එය ඇඩි නීතියක්. ජෝ ගවුම ඔසවා කලිසම් කකුල තුළට අත දමනු ඈ දුටුවා. අත්... එහෙනම් එතැනයි සල්ලි තියාගෙන ඉඳලා තියෙන්නේ...!

ඉන්පසුව ඇත්තටම කකුල වටා ඉලාස්ටික් පටිය කැඩී ඇති බව ජෝ දැන ගත්තා. එමෙන්ම නෝට්ටු තිබුණේ නැහැ. තැති ගත් ඈ බියපත් හඬින් කෑ ගැසුවා.

පාලිකාව නොපෙනී ගියා. ඈ ආපසු තම කාමරයට ගියා. මුදල සේප්පුවට දැමූ ඈ තම ඇඩි පැහැදිලි අත් අකුරින් දැන්වීමක් ලිව්වා. මේ අතරේ තම මුදල් අතුරුදහන්ව ඇති බව දැන ගත් ජෝ භීතියෙන් ඩියනා දෙස බැලුවා.

"බලන්න.... ඉලාස්ටික් එක කැඩිලා. සල්ලි කොහේ හරි වැටෙන්න ඇති. ඉක්මනට එන්න...! අපි ඒවා හොයන්න ඕනෑ.... ඒ තරම් ඈතක වෙන්න බැහැ."

එහෙත් සැබවින්ම නෝට්ටු අතුරුදහන් වී තිබුණා. ජෝට එකක් හෝ සොයා ගැනීමට තිබුණේ නැහැ. අසරණ ඈ දුකින් වැලපුණා. ඩියනා ඇයව සැනසීමට උත්සාහ කළා.

ජෝට ජූන්ව මුණගැසුණා. ෆෙලිසිටි හා සූසන් මහත් සතුටකින් කතා කරමින් කොරිඩෝව ඔස්සේ එමින් සිටියා. ඔවුන් ඉතා කදිම කුඩා සැලසුමක් ගැන සිතා තිබුණ අතර එය කුඩා කාන්දම් කැබැල්ල යොදා ගන්නා එකක්. ජෝ ඔවුන් වෙතට දිව ගියා.

"මගේ සල්ලි නැති වෙලා... ඔක්කෝම...! කාට හරි හම්බ වුණාද කියලා ඔයාලා දන්නවාද?"

"කාටහරි හමුවෙලා තිබුණොත් ලොකු දැන්වීම් පුවරුවට ඉක්මනින්ම දැන්වීමක් වැටෙයි." ෆෙලිසිටි කී අතර තිදෙනාම ඉක්මනින් එතැනින් ඉවතට ගියේ ඔවුන් ඉදිරියේම ජෝට වැලපීමට ඉඩක් නොතබමිනුයි.

"නපුරියෝ...! කරුණාවක් නැති නපුරියෝ...!" ජෝ කිව්වා. "මම මොනවාටද මෙහාට ආවේ? ඩියනා, මේ ඉස්කෝලයටම ඉන්න හොඳම කෙනා ඔයා විතරයි. ඔයා විතරයි මට විශ්වාස කරන්න පුළුවන්. මට හිතෙනවා මෙහෙන් පැනලා යන්න...!"

මීට පෙර බොහෝ අවස්ථාවල ඩියනා මෙය අසා තිබුණා.

"ඕ.... එපා." ඈ සැනසිලි හඬින් කිව්වා. "ඔයා එහෙම කරන්න එපා, ජෝ. ඒ වගේ දේවල් කියන්න එපා."

ෆෙලිසිටි හා අනෙක් අය ආපසු එන විටත් කොරිඩෝවේ තවමත් දණ ගසාගෙන මුදල් නෝට්ටු සොයන ජෝ දැක ඔවුන්ට තදින් සිනා පහළ වුණා. ඔවුන් ඒ වන විටත් විශාල දැන්වීම් පුවරුවේ

දමා තිබූ පාලිකාවගේ ඇන්වීම ඇත තිබුණා. මුදල් අනුලාගෙන තිබුණේ කවුරුන් දැයි යන්න දැනගත් විට ජෝට එය මොන තරම් කම්පනයක් වනු ඇතිද?

"ඇන්වීම් පුවරුව බලන්න." ජූන් කිව්වා. "කෙනෙකුට ඔයාගේ සල්ලි හම්බ වෙලා, ජෝ. ඔයාට දැන් සතුටු හිතෙයි. විනාඩි දෙකක් යන්න ඉස්සර ඔයාට සල්ලි ආපහු ලැබෙයි...!"

ස්තුති පූර්වකව නැගී සිටි ජෝ ඩියනා ද සමග දිව ගියේ ඇන්වීම කියවීමටයි. ජූන් හඬ නගා සිනාසුණා.

"මෙට්‍රන් ජෝට මොනවා කියයි ද කියලා හිතාගන්න බැහැ." ඈ කිව්වා.

එහෙත් තවත් විනාඩියකට වැඩියෙන් ඔවුන් ජෝ ගැන උනන්දුවෙන් කතා කළේ නැහැ. සියල්ල අමතක කිරීමට හැකි තරමට ඔවුන් ඔවුන්ගේ සැලසුම ගැන සතුටු සිතින් යුතු වුණා. ඔවුන් මේ ගැන කීමට නෝරා සොයමින් සිටියා. නෝරා බඩ පැළෙන තුරු හිනාවෙන එක ඒකාන්තයි...! අවසානයේ ඔවුන්ට ඇය හමු වුණා.

"මේ අහන්න, නෝරා." ජූන් කිව්වා. "ඔයා දන්නවානේ අපේ අක්කා, ඇලිසියා. හරි, එයා අපේ කාන්දම අද දැක්කා. ඉතින් එයා කියනවා, ඒක එයාට තියෙනවා නම් අපි කරන දේවලට වඩා හුඟක් හොඳ දේවල් එයාට කරන්න පුළුවන් කියලා. ඉතින් දැන් එයාලා හය පන්තියේ නිසා විහිළු කරන්න බැරි තරමට ආඩම්බර නිසා එයා අඬනවා, වැලපෙනවා."

"ඉතින් අපි තීරණය කළා හය පන්තියට සංග්‍රහයක් දෙන්න." ෆෙලිසිටි අතරමැදින් කිව්වා. "මම්සලී එයාලගේ පන්තියේ ඉන්න වෙලාවක අපි එක්කෙනෙක් ඒ පන්තියට යනවා. යන කෙනා මම්සලී ඩූපොන්ට්ගේ කොණ්ඩා කටු ඔක්කෝම ගලවා ගෙන එනවා...!"

"එතකොට මම්සලී හිතයි, එයාලගෙන් කවුරු හරි තමයි හොර වැඩය කළේ කියලා." සූසන් කිව්වා. "මොනවා කරන්නද කියලා එයාලට හිතාගන්න බැරි වෙයි."

"අපි හිතාගෙන ඉන්නේ දෙසැරයක් හරි තුන් සැරයක් හරි කරන්න. එයාලට වගේම හොඳට විජ්ජා කරන්න අපිටත් පුළුවන් කියන එක පෙන්වනවා." ජූන් කිව්වා.

තෝරා සිනා හඬක් පිට කළා.

"ඕ... මට ඒක කරන්න දෙන්න." ඈ ආයාචනා කළා. "අනේ... අනේ... මම දිවුරලා කියන්නම්. මම හිනාවෙන්නේ නැහැ. දෙවැනි පන්තියේ ඉද්දී විතරයි මට හිනා යන්න එන්නේ. එතකොට මට නවත්තා ගන්න බැහැ. ඔයාලා මට යන්න ඉඩ දෙනවා නම්, මම නඩුකාරයෙක් වගේ මුහුණ හදාගෙන ඉන්නම්."

"හරි, අපි හිතාගෙන හිටියේ, ඔයාව තෝරා ගන්න." ජූන් කිව්වා. "මම්සලී අපිව සැක කරන්න පුළුවන්. අපි මීට ඉස්සර එයාට විහිළු කරලා තියෙනවා. ඒත් එයා ඔයාව සැක කරන්නේ නැහැ. අනික ඔයා එයාගේ හිතට අල්ලලා ගිය කෙනෙක් නිසා ඔයාව දකින්න එයා හුගක් කැමති වෙයි."

"මම ඒක කරන්නම්...!" ඈ ස්ථිරවම කිව්වා. "ඔයාලා කියනවා නම් මම තුන් සැරයක් ඒක කරනවා."

"ඕ.... එපා. ඊළඟ වතාවේ කරන්න ඕනෑ වෙන කෙනෙක්." ජූන් කිව්වා. "මම්සලීට සැක හිතන්න දෙන්න අවශ්‍ය නැහැ. ඔයා නිතර නිතර ගියොත් එයාට සැක හිතෙයි."

"විශේෂයෙන් ඔයා යන හැම වෙලාවකම කොණ්ඩෙ කඩා වැටුණොත්." සූසන් කිව්වා. "අපොයි, මටත් ඒක කරන්න යන්න තිබුණා නම්...!"

"අන්න... ජෝ එනවා." ජූන් කොඳුරා කිව්වා. "අපොයි, එයා ගල් ගැහිලා වගේ...!"

ජෝ ත්‍රස්ත වී සිටියා. ඇන්වීම් පුවරුව වෙතට ගොස් තිබූ ඈ පාලිකාවගේ දැන්වීම දැක තිබුණා.

*පවුම් පහක නෝට්ටු කෝර්ඩෝවේදී නැති වූ*
*කෙනා කරුණාකර මා හමුවන්න.*
*නේවාසිකාගාර පාලිකාව*

ජෝට පොළොව පළාගෙන යාමට තරම් සිතුණා. පාලිකාව...! දැන් ඇය කුමක් කරන්නද? අසරණ ජෝ මහත් බියක් ඇක්වූ කෙනෙක් සිටියේ නම් ඒ පාලිකාවයි.

අසරණ ජෝ තම අවාසනාව ගැන ඩියනා සමග කියමින් දිගු වේලාවක් හඬ නගා වැලපුණා. පාලිකාවට මුදල් අසුවීම හිතාගන්න බැහැ. තමා ළඟ පවුම් පහක් තිබුණ බව ඇය පාලිකාවට කෙසේ නම් කියන්න ද? සම්පූර්ණ පවුම් පහක් නෝට්ටු. ඒවා ආරක්ෂාවට භාර නොදීම කෙසේ නම් පැහැදිලි කරන්න ද?

"ජෝ, ඔයා කෙළින්ම ගිහින් එයාට කියන්න." ඩියනා චකිතයෙන් කිව්වා. "ඔයා නොකිව්වොත් ඔයාට ආපසු සල්ලි ලැබෙන්නේ නැහැ. ඒවා කාගෙද කියලා දැන ගන්නේ නැතිව කොහොමද මේට්‍රන් ඒවා කාටහරි දෙන්නේ?"

"හොඳයි, මම හිතනවා ඒක හොඳයි කියලා." ජෝ කිව්වා.

එහෙත් දොර ළඟට ගිය සැණින්ම ඈ ආපසු ආවා.

"මට බැහැ." ඈ ඩියනාට කිව්වා. "මට එයාට මුහුණ දෙන්න බැහැ. මම බය ගුල්ලියක් කියලා හිතන්න එපා, ඩියනා. ඒත් මේට්‍රන් එයාගේ අර නපුරු මුහුණ පෙන්නලා තරහින් කතා කරද්දී, අවංකවම මගේ දණිස් වෙවුලනවා."

"ජෝ, මම හිතන්නේ මේට්‍රන් කාමරයේ නැති වේලාවක ඔයාට පුළුවන් කාමරයට රිංගලා සල්ලි කොහේ හරි ළඟක තියෙනවාද කියලා බලාගන්න, නේද?" ඈ කොඳුරා ඇසුවා. "කොහොම වුණත්, ඒ ඔයාගේ සල්ලි. ඔයා කරන්නේ ඔයාටම අයිති දෙයක් ගන්න එක විතරයි."

ජෝගේ කුඩා දෙනෙත දිලිසුණා.

"ඔව්." ඈ කිව්වා. "මට එහෙම කරන්න පුළුවන් වෙයි, මේට්‍රන් සල්ලි එළියේ තියලා තිබුණොත්. මම දැකලා තියෙනවා සමහර වෙලාවට සල්ලි කුඩා මිටි බැඳලා මේසය උඩ තියලා තියෙනවා. කුස්සියේ වැඩ කරන අයට පඩි ගෙවන්න. මම හිතන්නේ, නැති වුණ කෙනාට දෙන්න එයා මගේ සල්ලි ඒ විදිහටම තියලා ඇති."

"එයා සල්ලි ආපහු දෙන්නෙ නැහැ." ඩියනා කිව්වා. "ඔයා ඒක දන්නවා. එයා සල්ලි තියාගෙන ටික ටික දෙයි. පහළ පන්තිවල ළමයින්ට එදිනෙදා අවශ්‍ය සල්ලි ටික ටික දෙන්නේ. ඔයාටත් හැම සතියකම ටිකක් හම්බ වෙයි. වාරය ඉවර වෙලා නිවාඩුවට ගෙදර යද්දී ඉතිරි ඔක්කෝම හම්බ වෙයි."

ජෝ තළල රැලි ගැන්වූවා.

"මම හිතාගෙන හිටියේ හොඳ පාටියකට සල්ලි වියදම් කරන්න." ඈ කිව්වා. "ඔයා දන්නවානේ, මගේ උපන් දිනය ළඟයි. මම කොහොම හරි ඒ සල්ලි ආපහු ගන්න ඕනෑ."

"ෂ්... ෂ්..." ඩියනා හඬ නැගුවා. "කවුරු හරි එනවා."

ඒ ෆෙලිසිටි. දොරින් හිස පෙවූ ඈ සිනාවක් පෑවා.

"සල්ලි හම්බ වුණාද, ජෝ?" ඈ ඇසුවා. "එහෙම නැතිනම් ඔයා ඒවා මේට්‍රන්ට තෑගි කරන්නද යන්නේ? මම නම් කෙළින්ම ගිහින් පවුම් පහ මගෙයි කියලා ඉදිරිපත් වෙනවා. විශේෂයෙන්ම ඔය විදිහට කල්පනාවක් නැතිව සල්ලි නැති කර ගත්තා නම්...! ඔයා මොන බූරුවෙක්ද?"

"කට වහගන්න, ෆෙලිසිටි." ජෝ කිව්වා. "හැම තිස්සේම මගේ දොස් කියන්න ඇන් ඕනෑවටත් වැඩිය කට්ටිය ඉන්නවා. මට හිතාගන්න බැහැ දවසේ හැම තත්පරයේදීම ඇයි ඔයාලා මගේ ඇඟටම එන්නේ කියන එක. මම මැලෝරි ටවර්ස්වලට ගැළපෙන්නේ නැහැ කියලා ඕනෑම කෙනෙකුට හිතෙයි."

එය ඇත්තෙන්ම දෙවැනි පන්තියේ දැරියන් හරියටම සිතූ දෙයයි. ෆෙලිසිටි පිළිතුරක් දුන්නේ නැහැ. ජෝ කෙසේවත් ගැළපුණේ නැති බව ඈ ස්ථිරවම දැන සිටියා. පාසලට ගරු කරන හා ජෝට උදව් කරන ගණයේ දෙමව්පියන් ඇයට සිටියා නම් ඇයට යහපත් ලෙස හැදෙන්නට අවස්ථාවක් තිබෙන්නට ඉඩ තිබුණා.

ෆෙලිසිටිට ටෙනිස් පුහුණුව සඳහා යන සූසන්ව මුණ ගැසුණා. ඔවුන් ඉක්මනින්ම ටෙනිස් පිටියට ගිය පසුව ඉවසිලිවන්ත සූසන් වෙතට ෆෙලිසිටි තදින් පන්දු පහර එල්ල කරන්නට වුණා. ටික වේලාවකට පසු නිදැල්ලේ පැමිණි අමන්දා බලා සිටින්නට වුණා. ෆෙලිසිටි ඇගේ පන්දුව පිරිනමන පහරවල් දෙගුණ කළා.

අමන්දා ජූන්ව පමණක් තෝරා ගෙන ඇයව හොඳින් පුහුණු කරමින් සිටි නිසා සෑම පහළ පන්ති දැරියක්ම හය පන්තියේ ලොකු දැරියගේ මද හෝ අවධානයක් ලබා ගැනීමට කැපී පෙනෙන ලෙස පුහුණුවීම්වල නිරත වුණා. ෆෙලිසිටි තද පහරවලින් පන්දු දෙක තුනක් පිරිනැමූ විට සූසන් හඬ නගා අමන්දාට කතා කළා.

"මෙයා හොඳයි නේද, අමන්දා?"

"ඉතින්, ඔහොම යන්." කී අමන්දා කිසිදු උනන්දුවක් නොදක්වන බව පළ කරමින් පසෙකට යන්න වුණා.

"නපුරි" සූසන් සුසුමක් යටපත් කර ගනිමින් කිව්වා. "මොරියා අඩුම තරමේ 'ඔව්' හරි 'නෑ' හරි කියනවා. ඒ වගේම ෆෙලිසිටි වැරැද්දක් කළා නම් එයා ඒක හරි ගස්සනවා. එයාගේ හොඳක් දැක්කා නම් මොරියා ඒකට ප්‍රශංසා කරනවා."

ඇත්තෙන්ම ෆෙලිසිටී ක්‍රීඩා කරන ආකාරය අමන්දා හරිහැටි දැක්කේ නැහැ. ඈ වෙනත් දෙයක් ගැන තදින් සිතමින් සිටියා. ඇත්තෙන්ම කාරණා දෙකක් ගැන. ඈ ජූන් ගැන කලකිරී සිටියා. ඇගේ වර්ධනය ගැන නොවෙයි. ඇත්තෙන්ම ජූන් බලාපොරොත්තු තැබිය හැකි ලෙස වර්ධනය වෙමින් සිටියා. අමන්දා දැන සිටියා මොනවාද හා කොහොමද ඉගැන්විය යුත්තේ කියන එක. එමෙන්ම ජූන්, ඉතා දක්ෂ ඇති ඉක්මනින් ඉගෙන ගන්න සිසුවියක්. එහෙත් ජූන් අමන්දාගේ දැඩි බව හා ප්‍රශංසා විරහිත බව ගැන කලකිරී සිටියා. තියුණු නියෝග හා ගරු සරු නැති අණ කිරීම් ගැන ඇගේ සිත පෑරෙන්නට පටන් ගෙන තිබුණා. කිසිවෙකුට යටත් වීම කිසිදින ජූන්ට පහසු දෙයක් වුණේ නැහැ. කෙනෙකුගේ අණ කිරීම්වලට කැමති නොවූ ඇයට එය දැරිය නොහැකි වුණා. ඒ බව ඊට පෙර දින, ඈ අමන්දාට කියා තිබුණා.

ජූන් අමන්දාගේ සිතේ අරක් ගත් ප්‍රශ්නවලින් එකක්. අනෙක ඇගේ පිහිනීම. පිහිනීම බොහෝ විට ඇගේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ වඩාත්ම අද්විතීය ජයග්‍රහණයයි. අමන්දා වේගයෙන් තටාකය හරහා ඇදී යන දර්ශනය ද අද්විතීය එකක්. ඉන් අධික වේගයෙන් හෝ පිහිනීමට කිසිවෙකුට නොහැකි වුණා. අමන්දා වතුරට බසින විට පළමු පන්තියේ කුඩා දැරියෝ පවා ඔවුන්ගේ කතා නැවැත්වූවා.

එමෙන්ම අමන්දා දැඩි ලෙස සිතමින් සිටියේ ඇගේ පිහිනීම

ගැනයි. තටාකය ඇයට ප්‍රමාණවත් වුණේ නැහැ. ඇයට මුහුදේ ඈතට පිහිනා යාමට අවශ්‍ය වුණා. ඇය මුහුදේ පිහිනීමට නොගියහොත් සැබෑ දිගු දුර පිහිනීම ඇය පුරුදු කරන්නේ කෙසේද? තටාකය ඉතා පුදුමාකාරයි. දිගින්, පළලින් හා ගැඹුරින් යුතුයි. ඒ කෙසේ වෙතත් එය තටාකයක් පමණයි. අඩුම තරමේ සැතපුමක් හෝ පිහිනීමට අමන්දාට අවශ්‍ය වුණා.

'හැතැප්ම දෙකක්.' ඈ ප්‍රමෝදයෙන් සිතුවා. 'හැතැප්ම තුනක්...! ඉංග්‍රීසි ඕඩය හරහා පිහිනන්න තරම් මම ශක්තිමත්. මට ඒක හොඳටම විශ්වාසයි.'

මැලෝරි ටවර්ස්හි කිසිවෙකුට මුහුදේ පිහිනීමට අවසර තිබුණේ නැහැ. එය නොබිඳිය හැකි නීතියක්. සැබෑ මුහුදු නෑමක් අවශ්‍ය ඕනෑම කෙනෙකුට වෙරළේ මඳ දුරක් යන විට හමුවන ස්ථානයකට පිරිසක් සමග ගොස් එහි ආරක්ෂිත ස්ථානයක නෑමට හැකියාව තිබුණා. එහෙත් මැලෝරි ටවර්ස් අසල වෙරළින් මුහුදට බැස පිහිනීමට කිසිවෙකුට අවසර තිබුණේ නැහැ. කිසිවෙකුට එය අවශ්‍ය වූයේ ද නැහැ.

හදිසියේම ඈ හිත හදා ගත්තා.

'මම මුහුදේ පීනන්න යනවා.' ඈ තීරණය කළා.

ප්‍රශ්නය වූයේ, කිසිවෙකුට නොපෙනී ඇයට මෙය කළ හැක්කේ කොයි වේලාවේද? අඩ දබරයකට මැදිහත් වන්නට සිදුවීම ඈ තැකුවේ නැහැ. එහෙත් එය මඟ හැරීමට අවස්ථාව තිබියදීත් එසේ කිරීම අනුවණකමක්. අමන්දා මේ කාරණය සිත තුළ ඒ මේ අත පෙරළුවා.

'උදේ පාන්දරම හුඟක් හොඳයි.' ඈ සිතුවා. 'හුඟක් උදෙන්ම. කවුරුවත් ඒ වෙලාවට ඒ පැත්තේ නැහැ. මට පැය එක හමාරක් විතර හොඳට පිහිනන්න පුළුවන්. දිව්‍ය ලෝකය වගේ තියෙයි...!'

මෙසේ එය නිරාකරණය කරගත් පසු අමන්දාට මහත් සොම්නසක් දැනුණා.

# 15

වාර මැද නිවාඩු දිනය පැමිණ ගෙවී ගියා. එය ඉතා දීප්තිමත් දිනයක් වූ අතර දෙමව්පියන් පාසල් වත්තේ හා මුහුදු වෙරළේ ඇවිද මහත් සේ විනෝද වුණා.

වාර මැද නිවාඩුවෙන් පසු තවත් බොහෝ දේ සිදු වුණා. පළමුව සිදු වූ දෙය වුයේ ජූන් හා අමන්දා අතර රණ්ඩුවයි. ඔවුන් අතර ලොකු අඬ දබරයක් කොයි මොහොතක හෝ ඇතිවන බව බොහෝ දෙනෙක් සිතා තිබුණා. එය එසේම සිදු වුණා.

එය ඇති වූයේ ඉතා සුළු දෙයකින්. වේගවත් පන්දු පිරිනැමීම් පිළිගැනීමට අමන්දා ජූන්ට පුහුණුව ලබා දෙමින් සිටිය අතර පන්දුව පැමිණෙන වේගයට ජූන් තරමක් බියට පත්ව සිටියා. එහෙත් ඉතා නිර්භීත ලෙස පන්දුව ආපසු යවමින් එවැනි පන්දුවලට ප්‍රති ප්‍රහාර දීමට සමත් වීම ගැන සතුටු සිතින් යුතු වුණා.

"ජූන්, ඔළුව පාවිච්චි කරන්න...!" අමන්දා පන්දු එල්ල කිරීම මොහොතකට නවතා කෑ ගැසුවා. "බෝලය ආපහු ගහන එකේ තේරුමක් නැහැ. ඔයා ඒක එවන්න ඕනෑ මට අල්ල ගන්න බැරි තැනකට හරි මම දුවලා යන්න ඕනෑ තැනකට හරි. ඔයා කරන්නේ බෝලය මගේ අතටම එවන එක විතරයි."

"ඒක තමයි ඒ වගේ බෝලවලට මට කරන්න පුළුවන්. බෝලය ස්ථාන ගත කිරීමක් ගැන තව මොන කතාද?" ජූන් පිළිතුරු ලෙස කිව්වා. "මට ටිකක් ඉඩ දෙන්න. අනික පිටියේ මෙතැන තද නැති හින්දා බෝලය උඩට එන්නේ නැහැ. එතකොට මට හුගක් නැමෙන්න, දිග හැරෙන්න වෙනවා."

"බොරු හේතු කියන්න එපා." අමන්දා කිව්වා.

"මම බොරු කියන්නේ නැහැ." ජූන් කෝපයෙන් බෙරිහන් දුන්නා.

එහෙත් ඒ වන විට දැලට උඩින් ඊළඟ පන්දුව අමන්දා එවමින් සිටියා. පන්දුව විදුලියක් මෙන් දැල ඉහළින් ජූන් වෙත ඇදී ආවා. කඩතොලු සහිත තැනක පතිත වූ පන්දුව දකුණුපසට ඇඹරී යද්දී ජූන් එයට වියරුවෙන් මෙන් පහර දුන්නා.

අහසට ඉපිලී ගිය පන්දුව දකුණු අතට හැරී පිටිය වටා ඇති දැල් මතින් ඇදී ගොස් නරඹන දැරියන් පිරිස මැදට වැටුණා. එකා මත එකා ඇද වැටෙමින් පන්දුව අල්ලා ගැනීමට පොරකන දැරියෝ මහත් සිනා හඬක් නැගුවා.

"ඔයාට මෝඩ වැඩ කරන්න ඕනෑ නම් ජූන්, අපි මේක නවත්වමු." අමන්දා අවංකවම ජූන් හිතාමතා දරුණු පහරක් දුන් බව සිතා කෑ ගැසුවා.

ජූන්ට නිතර තදින් කෝපය දැනෙන විට සිදුවන පරිදි ඇගේ හිස තුළ සියුම් පිපිරුම් හඬක් නැගුණ අතර ඈ වහාම නැවතුණා.

පළමුව ඈ කෝපය බාහිරින් පෙන්වූයේ නැහැ. ඈ වහාම නැවතුණා. පිටිය වටා වැටී තිබූ පන්දු කරබාගෙන ඇහිඳ ගත් ඈ පිටිය වටා තිබූ දැලට ඉහළින් ඒවා එකින් එක නරඹමින් සිටි දැරියන් මැදට විසිකර දැමුවා.

"මගේ වැඩ ඉවරයි." ඈ අමන්දාට ප්‍රකාශ කළා. "ඔයත් එක්ක වැඩ කරන එක කොහෙත්ම අමාරුයි. මේ වගේ දෙයකට මම ආයෙත් කවදාවත් කැමති වෙන්නේ නැහැ. මට මේ වැඩවල වැදගත්කමක් නැහැ. ආයුබෝවන්...!"

නරඹන දැරියන්ගේ ප්‍රශංසාත්මක බැලුම් අතරේ පිටිය හරහා සෙමින් ඇවිද ගිය ජූන් සෙමින් තාලයක් මුමුනන්නට වුණා.

"මෝඩියක් වෙන්න එපා, ජූන්. ආපහු එන්න ඉක්මනට." අමන්දා ඇයට අඬ ගැසුවා.

ජූන් කිසිවක් ගණන් ගත්තේ නැහැ. ඈ තවත් ටිකක් හඬ නගා සිවුරුහත් බාමින් ටෙනිස් පිත්ත අහසට විසි කරමින් එය ආපසු පහළට පැමිණෙන විට එය දක්ෂ ලෙස අල්ලමින් ඇවිද ගියා. හිතේ මවා ගත් පහර කීපයක් එල්ල කළ ඈ විකාර ලෙස හැසිරෙන්නට පටන් ගත්තා. නරඹන දැරියෝ කොක් හඬ ලා සිනාසුණා. අමන්දා දිගු පියවරින් ජූන් පසුපසින් ගියා.

"ජූන්, මම ඔයාට කිව්වේ ආපහු එන්න කියලයි. ඔයා ආවේ නැතිනම් මම ඔයාව කිසිම කණ්ඩායමකට තෝරා ගන්න ඉඩ තියන්නේ නැහැ."

"මාව තෝරා ගන්න ඕනෙ නැහැ." ජූන් කිව්වේ ටෙනිස් පිත්ත නැවත උඩ දමා එය අල්ලමින්. "ඔයාට කෑ මොර දෙන්න ඕනෑ නම්, ගිහින් දෙවැනි පන්තියේ වෙන කෙනෙකුව අල්ලා ගන්න. ඔයාගෙ කරුණාව අපරාදේ නාස්ති කරගන්න එපා, අමන්ඩා."

අමන්ඩා කම්පනය වන ආකාරයේ අවඥා සහගත බැල්මක් හෙළූ ජූන්, මෙවර සැබවින්ම ඉවත්ව යන්න ගියා. මෙය දුටු කුඩා නරඹන කණ්ඩායම බියට පත් වුණා. සෙමින් කොඳුරමින් ඔවුන් විසිර යන්නට වුණා.

"ඉස්කෝලය පුරාම පතුරවන්න හොඳ ආරංචියක්. පුදුම රණ්ඩුවක්. ජූන් පුදුම කෙනෙක් නේද?"

"අවංකවම...!" පළමු හා දෙවන පන්තියේ දැරියෝ මිමිනුවා. "අවංකවම එයා කාවවත් ගණන් ගන්නේ නැහැ. අමන්ඩා වගේ ලොකු කෙනෙක්වවත්...!"

මේ ආරංචිය ඩැරල්ට, සැලීට හා මොරියාට දෙනු ලැබුවේ අමන්ඩා විසින්මයි.

"ජූන්ට කේන්ති ගිහින් පුහුණුව නැවැත්තුවා." ඈ නිවේදනය කළා. "ඒ නපුරු, කෙළෙහිගුණ නොදන්නා කෙල්ලට මම තවත් මගේ කාලය දෙන්නේ නැහැ. මට කනගාටු මම දුන්න කාලය ගැනයි. ඒත් ඒකේ ප්‍රයෝජනය එයාට තියෙනවා."

"ඕ... ඒක අපරාධයක්." සැලී කිව්වා. "හෙට ජූන්ගේ පිහිනීමයි, ඊළඟ දවසේ එයාගේ ටෙනිසුයි බලාගන්න අපි යොදාගෙන තියෙන්නේ. ඒ කියන්නේ ඔයා කියපු විදිහට දෙවැනි කණ්ඩායමට ගන්න තරම් එයා හොඳද කියලා බලාගන්න. දැනටමත් එයා තුන්වෙනි කණ්ඩායමටත් හොඳා. එයාට දිගටම තරගවලට ඉන්න තිබුණා."

"හරි, දැන් එයාට බැහැ." අමන්ඩා නපුරු ලෙස කිව්වා. "එයා මේ සතියේ ක්‍රීඩාවලින් අයින් වුණා. එයාව කිසිම කණ්ඩායමකට දාන්න වටින්නේ නැහැ."

ඇලිසියා මේ සම්බන්ධව ජූන් සමග කතා කළා.

"මොකක්ද සිද්ධ වුණේ?" ඈ ඇසුවා. "තව ටික දවසක් ඔයාට ඉවසගෙන ඉන්න බැරි වුණාද? ඔයා පිහිනන හැටියි, ටෙනිස් ගහන හැටියි බලන්න අපි මේ සතියේ එන්නයි හිටියේ. ඒ කියන්නේ ඔයාව තරගවල සෙල්ලම් කරන්න දෙවැනි කණ්ඩායමට තෝරා ගන්න."

"කාගෙන්වත් බැණුම් අහන්න මම ලෑස්ති නැහැ." ජූන් කිව්වා. "වෙන කාගෙන්වත් නොවෙයි, අමන්දාගෙන්. මට ක්‍රීඩා කණ්ඩායමක තරුවක් වගේ බබළන්න උවමනා නැහැ...!"

"ඒත් ජූන්, ඒක හරියට මුහුණත් එක්ක තරහා වෙලා නහය කපා ගන්නවා වගේ වැඩක් නොවෙයිද?" ඇලිසියා ඇසුවා. "ඔයාට තරගවල සෙල්ලම් කරන්න උවමනා නැද්ද? ඒක වැදගත්, දන්නවානේ. අපිට මේ අවුරුද්දේදී දිනන්න ඕනෑ. ගිය අවුරුද්දේ අපි ටෙනිස් කුසලානය පැරදුණා. පිහිනුම්වලින් දෙවැනි ස්ථානය."

ජූන් පැකිළුණා. තරගවල ක්‍රීඩා කිරීමට ඇයට සැබෑ උවමනාවක් තිබුණා. කණ්ඩායම්වලට කීර්තිය හා නම්බුව රැගෙන ඒමට ඈය කැමති වුණා. ඔව්, මැලෝරි ටවර්ස් පාසලට කෙනෙකු ක්‍රීඩා කළ යුත්තේ නිතරම තමා වෙනුවෙන් නොව තම පාර්ශ්වය වෙනුවෙන් බව ජූන්ට සමහර විට අවබෝධ වෙමින් තිබුණා.

"හොඳයි." ඈ අවසානයේ කිව්වා. "මම ඔයාට ඇත්තම කියන්නම්, ඇලිසියා. මම තරගවලට ක්‍රීඩා කරන්න ආශාවෙන් බලා හිටියා වගේම මට හොඳටම විශ්වාසයක් තිබුණා මාව තේරේවි කියලා. ඒත් අමන්දා, වෙන මොකවත් නෙමෙයි, මාව මහන්සි කරවන්නේ වහලියක් වගේ. මාව වහලියක් කරලා එයා හොඳ ප්‍රතිඵල ලබා ගත්තා. ඒත් එයා හරිම අමානුෂිකයි. මට තවත් මොහොතක්වත් එයා එක්ක ඉන්න බැරි වුණා. තරග අත්හැරලා දැම්මත් කමක් නැහැ කියලා හිතුණා."

"ටෙනිස් කුසලානය ආපහු ගන්නයි, පිහිනුම් තරග දිනන්නයි ඉස්කෝලයට ඔයාට උදව් කරන්න පුළුවන් කියන එක දැන දැනත් ඒකට කමක් නැහැ කියලා අත් හැරලා දැම්මා...?"

නිහඬ විරාමයක් ගත වුණා.

"මට ඒ ගැන කනගාටුයි." ජූන් තරමක ආයාසයෙන් කිව්වා.

"මේ ප්‍රශ්නයේ ඒ පැත්ත ගැන මම ඒ තරම් හිතුවේ නැහැ, ඇලිසියා. ඒක දැන් ඉවරයි. මට බැහැ මගේ වචනය වෙනස් කරන්න. මට දැන් පිහිනීමයි, ටෙනිසුයි එපා වෙලා තියෙන්නේ. මට ආයෙත් මේ වාරයේ ටෙනිස් පිත්ත අල්ලන්නවත්, තටාකයට බහින්නවත් ඕනෙ නැහැ. මම නිකම්ම විකාර කර කර ඉන්නවා."

"ඔයා මුළු ජීවිතය පුරාම විකාර කරයි. මට ඒක ජේනවා." නැගිසිටිමින් ඇලිසියා කිව්වා. "ඔයා හිතන්නේ ඔයා ගැනමයි, ඔයාගේ විකාර වැඩ ගැනමයි විතරයි. මට ඒ ගැන කනගාටුයි, ජූන්. ඔයා මගේ නංගී කෙනෙක්. මමත් කැමතියි ඔයා හොඳ දෙයක් කරනවා බලලා එක සැරයක් හරි සංතෝෂයෙන් කෑ ගහන්න. හරියට ෆෙලිසිටි දිහා බලලා ඩැරල් කරනවා වගේ."

ඇය ඉවතට ඇවිද ගියේ ජූන්ට තමා ගැනම අවතක්සේරුවක් හා අපහසුවක් හැඟෙන්නට ඉඩ හරිමින්. එහෙත් කිසිම කිසි දෙයකට නැවත ජූන්ව අමන්දා වෙත යාමට පෙලඹවිය නොහැකි වුණා. සිතේ මවා ගත් ටෙනිස් පිත්තක් උඩ දමා ඇල්ලූ ජූන් තම දත් මිටි සපා කෑවා. ඉවරයි...! තවත් පුහුණුවීම් නැහැ.

නෝරා හති හතිකට දිව ආවා.

"ඇලිසියා නේද හිටියේ? අද අපි මම්සලී ඩුපොන්ට්ට විජ්ජාව කරන බවක් ඔයා එයාට කිව්වේ නෑ නේද?"

"බූරුවෙක් වෙන්න එපා." ජූන් අවඥාවෙන් කිව්වා. "අපි මේ ගැන කාටවත් වචනයක්වත් කියන්නේ නැහැ කියලා පොරොන්දු වුණාට පස්සේ මම ඒක අමතක කරනවා කියලා හිතනවාද?"

"ඕ... හොඳයි. ඔයාලා ලොකු කතාවක ඉන්නවා දැක්ක හින්දයි මම ඇහුවේ." නෝරා කිව්වා. "මම ආවේ කාන්දම ඉල්ලගන්න පුළුවන්ද කියලා අහන්නයි. මම ඒක අහන්න කල්පයක් විතර බලාගෙන හිටියා. ඇලිසියා ඔයා එක්ක රණ්ඩු වුණාද?"

"නැහැ." ජූන් කෙටියෙන් කිව්වා. "අනුන්ගේ දේවල් ගැන ඔය තරම් හාරා අවුස්සන්න එපා. තමන්ගේ වැඩක් බලා ගන්න. මෙන්න කාන්දම."

නෝරා සතුටින් ඉපිලෙමින් එය අතට ගත්තා. උදාරම් හය පන්තියේ කාන්දම් විජ්ජාව කිරීමට තමාව නෝරා ගැනීම පිළිබඳව

ඇය මහත් ආඩම්බරයට පත්ව සිටියා. ෆෙලිසිටිගේ උදව් ඇතිව ඈ සෑම දෙයම ඉතා ප්‍රවේසමෙන් සැලසුම් කර තිබුණා.

"හය පන්තියට රිංගලා මම ඩෙස් එකකින් අභ්‍යාස පොතක් අරගෙන ආවා." ෆෙලිසිටි කිව්වා. "ඔයාට කරන්න තියෙන්නේ, පන්ති කාමරයට ගිහින් සමාව අරගෙන, මේ පොත හය පන්තියේ ළමයෙකුගේ එකක්ද කියලා මම්සලීගෙන් අහන එකයි. එයා පොත බලන අතරේ ඔයාට කොණ්ඩා කටු ගලවා ගන්න පුළුවන්."

එය ඉතා පහසු බව පෙනුණා. එදින හවස, කාලය එළඹි විට නෝරා ප්‍රීතියෙන් හා චකිතයෙන් චංචලව සිටියා. දෙවැනි පන්තිය නිදහසේ සිටි අතර ඉහළ පන්ති යුහුසුළුව වැඩෙහි නිරත වුණා. අභ්‍යාස පොත ගෙන නෝරා හය පන්තියට වේගයෙන් දිව ගියා.

දොර වෙතට ගිය ඇයට යමෙකු හඬ නගා ප්‍රංශ කියවන හඬ ඇසුණා. ඈ දොරට තට්ටු කළා. එක්වරම මම්සලීගේ කටහඬ පැමිණියා.

"ඇතුළට එන්න...!"

නෝරා පොත ගෙන ඇතුළට ගියා.

"සමාවෙන්න, මම්සලී...!" පොත දිගු කරමින් ඈ කිව්වා. "මේ පොත හයේ පන්තියේ කෙනෙකුගේද?"

පොත අතට ගත් මම්සලී එය දෙස බැලුවා.

"අහ්... මේක මේරි ලෝව්ගේ නැතිවුණ පොත." ඈ කිව්වා.

ඇයට පිටුපසින් සිට නෝරා ඇගේ මනාව සකස් කළ කොණ්ඩ ගුළියට අඟල් දෙකක් පමණ දුරින් බලගතු කුඩා කාන්දම් කැබැල්ල අල්ලා ගෙන සිටියා.

ඇලිසියාගේ තියුණු දෙනෙතට ඇගේ ක්‍රියාව අසු වූ අතර ඈ මෙය ඇදහිය නොහැකිව මහත් වූ දෙනෙතින් බලා සිටියා. එක්වරම මම්සලීගේ කොණ්ඩා කටු පියඹා ගොස් කාන්දම් කෑල්ලේ ඇලුණා. ඉක්මනින් එය අතේ සඟවා ගත් නෝරා, 'බොහොම ස්තූතියි' කියමින් නැඟී එන සිනාව පුපුරා යාමට පෙර ඉක්මනින් කාමරයෙන් පිට වුණා. දෙවැනි පන්තියට දුවන අතරේ කුඩා වැඳිරිය නාසයෙන් පිඹින හඬ කොරිඩෝවෙන් තමාට ඇසුණ බවට ඇලිසියාට විශ්වාස ලෙසම දැනුණා.

මම්සලීට යමක් දැනුණ බව පෙනුණා. මම්සලී රොජර්ට වඩා වැඩි කොණ්ඩා කටු ගණනක් ඈ පලඳිනවා. සමහර විට ඒවා ගැලවී යනු ඇයට දැනී තිබුණා විය හැකියි. ඇය අත එසෙව්වා. හදිසියේම කොණ්ඩ ගුළිය දිග හැරී පසුපසට ඇද හැළුණා.

"අපොයි...!" පුදුම වූ මම්සලීට කියවුණා.

සියලු දැරියෝ හිස ඔසවා බැලුවා. තද කරගත් සිනාව පිට කර ගැනීමේ ආශාවෙන් ඇලිසියාට තමන් තවම පළමු පන්තියේ දැරියක ලෙස දැනුණා. මම්සලී කොණ්ඩා කටු සොයා හිස අතපත ගෑවා. ඇයට එකක් හෝ හමුවුණේ නැහැ.

"මේ මොකද? මම්සලී කිව්වා. "හරි අමුතු දෙයක්...!" නැගිට ගත් ඈ කුමක් හෝ අසාමාන්‍ය හේතුවකින් කොණ්ඩා කටු බිම වැටී ඇතිදැයි පුදුම වෙමින් ගෙබිම පරීක්ෂා කරන්නට වුණා.

නැහැ, ඒවා බිම තිබුණේ නැහැ. එය ස්ථිරවම දැන ගැනීමට දැතින් හා දෙදණින් බිම වැටුණ මම්සලී ඇගේ මේසය යටට එබී පරීක්ෂා කර බැලුවා.

දැරියෝ හඬ නගා සිනාසෙන්නට පටන් ගත්තා. සිදුව තිබුණේ කුමක්ද යන්න ඇලිසියා ඉතා ඉක්මනින් ඔවුන්ව දැනුවත් කර තිබුණා. කෙස් වැටිය එක උරහිසකින් එල්ලෙමින්, මේසය යට දණ ගාමින්, එහි නැති වූ කොණ්ඩා කටු සොයන, අන්ධයෙකු සේ අතපත ගාන මම්සලීගේ දර්ශනය හික්මීමෙන් යුතු හය පන්ති දැරියන්ට පවා දැරිය නොහැකි තරමේ එකක් වුණා.

කරදරයට පත් පෙනුමින් යුතුව මම්සලී නැගී සිටියා. ඈ වියරුවෙන් මෙන් කොණ්ඩා කටු සෙවිල්ල නැවැත්තුවේ නැහැ. සමහර විට ඒවා ගෙල පහළට වැටී ඇතැයි ඈ සිතුවා. නැගී සිටි ඈ සිරුර අඹරමින් සෙලෙව්වේ කිපයක් හෝ බිම වැටෙනු ඇතැයි බලාපොරොත්තුවෙන්. මහත් විමතියට පත් බැල්මකින් යුතුව ඈ කොළරය හා මුහුණ අතපත ගා බැලුවා. ඈ සිනාසෙන දැරියන්ව දුටුවා.

"ඔයාලා නරක නපුරු කෙල්ලෝ...!" ඈ කිව්වා. "කවුද මගේ කොණ්ඩා කටු ගත්තේ? ඒවා නැති වෙලා. ආහ්... මේක හරිම පුදුම ප්‍රහේලිකාවක්...!"

"පිහි - හූ - ලියර්." සුසේන්ගේ කටහඬ නැගුණා.

"ඒත් කවුරුවත් ඔයාගේ කොණ්ඩා කටු ගන්න නැතිව ඇති මම්සලී." ඩැරල් කිව්වා. "ඇයි, අද හවස අපි කවුරුවත් ඔයාගේ මේසය ළඟට ආවේ නැහැ."

"ඒක ඇත්ත." කී මම්සලී තැතිගත් බවක් පෙන්නුවා. "ඒක ඇත්ත. මේක විජ්ජාවක් වෙන්න බැහැ, එහෙනම්. මගේ කොණ්ඩා කටු අතුරුදහන් වෙලා. ළමයි, ළමයි... ඒවා කොහේවත් තියෙනවද බලන්න."

සෑම අහු මුල්ලකම හාස්‍යජනක සෙවිල්ලක් සඳහා මෙය සංඥාව වුණා. පාලනය කරගත නොහැකිව, ඩැරල් අසරණව මහ හඬින් සිනාසෙමින් සිටියා. විනාඩි තුන හතරක් යන තුරු, හය පන්ති දැරියෝ සැබැවින්ම දෙවැනි පන්තිය මෙන් හැසිරුණා. අයිරින් කීප වතාවක් සිනා හඬින් පුපුරා ගිය අතර රළු පෙනුමින් යුතු අමන්දා පවා මොර දී සිනාසුණා.

"ළමයි... ළමයි.... අනේ...!" මම්සලී ඔවුන්ට ආයාචනා කළා.

විලියම්ස් ගුරුතුමිය සිටියේ යාබද කාමරයේයි. ඈ කුමක් සිතාවිද?

විලියම්ස් ගුරුතුමිය බොහෝ දේ සිතුවා. සාමාන්‍යයෙන් කලබල නැති හය පන්තියේ මොන නම් දෙයක් සිදුවනවා ඇත්දැයි ඈ කල්පනා කළා. මම්සලී නැගී සිටියා.

"මම කොණ්ඩය ආයෙත් හදාගෙන එන්න යනවා." කී ඇය උදාරම් ලීලාවකින් නමුත් කඩිමුඩියේ අතුරුදන් වුණා.

දැරියෝ තව තවත් සිනාසුණා.

"ඒ අර නෝරා කියන පොඩි වැඳිරි." ඇලිසියා නැවතත් කිව්වා. "මම දැක්කා කාන්දම එයාගේ අතේ තියෙනවා. කපටිකමක මහත. දෙවැනි පන්ති කෙල්ලක් හරියටම අපේ පන්තියට ආව එක."

"කොහොම වුණත් හරිම විහිළුවක්." ක්ලැරිසා කඳුළු පිස දමමින් කිව්වා. "වාර ගණනකින් මම මේ තරම් සිනාසුණේ නැහැ. මම බලාගෙන ඉද්දී, නෝරා ඒක ආයෙත් කළොත් හොඳයි."

"අසරණ මම්සලී, එයා හොඳටම පුදුම වෙලා." මේරි ලෝව් කිව්වා.

"පිහි - හූ - ලියර්." සූසේන් කිව්වා. ඈ විහිළුව ඉතා තදින් රස වින්දා. "හරිම අමුතු විහිළුවක්...!"

පළමු පන්ති භාර පොට්ස් ගුරුතුමිය සමග මම්සලී එක්ව වැඩ කරන කාමරයට ඈ වහාම රිංගා ගත්තා. කොණ්ඩය පසුපසින් කඩා ඉහිරවා ගෙන හදිසියේ මම්සලී කාමරය තුළට පැමිණීම ගැන මඳක් පුදුමයෙන් පොට්ස් ගුරුතුමිය බලා සිටියා. එතරම් ම පුදුමයක් නොවුණේ එකට සිටි වාර ගණනාව පුරාම සමහර අවස්ථාවලදී මම්සලී මෙලෙස අරුම පුදුම ලෙස හැසිරෙන එක පොට්ස් ගුරුතුමියට හුරුව තිබුණ නිසාමයි.

"මිස් පොට්ස්...! මගේ ඔක්කෝම කටු කොණ්ඩෙ ගැලවිලා." හදිස්සියට මම්සලී වරද්දමින් කිව්වා.

"කටු කොණ්ඩේ...! මොන කටු කොණ්ඩයද?" පොට්ස් ගුරුතුමිය ඇසුවා. "ඔයා කියන්නේ කොණ්ඩ කටුද? කොහොමද ඒවා ගැලවුණේ?"

"ඒක තමයි මම දන්නේ නැත්තේ?" මම්සලී කීවේ කොතරම්

තැති ගත් හා ශෝකී දෙනෙතකින් යුතුව ද යත් පොට්ස් ගුරුතුමියට හඬ නගා සිනාසෙන්න සිතුණා.

"එක සැරයක් මගේ කොණ්ඩය, එයා හරියට ඔළුව උඩ හිටියා. ඊළඟට, මෙන්න එයා ලෙහිලා. ඉතින් මම කොණ්ඩ කටු හොයද්දී, එයාලා ගිහින්."

මෙය යම් උපායක් බව පොට්ස් ගුරුතුමියට පෙනුණ අතර ඈ මම්සලීට ඒ ගැන කිව්වා.

"නැහැ... නැහැ... මිස් පොට්ස්...!" මම්සලී විශ්වාසයෙන් යුතුව කිව්වා. "අද හවස එක ළමයෙක්වත් වාඩිවෙලා ඉන්න තැනින් නැගිටලා මා ළඟට ආවේ නැහැ, එක් කෙනෙක්වත් නැහැ."

"ඕ... හොඳයි." පොට්ස් ගුරුතුමිය කිව්වේ මෙය ද නිතර මම්සලීට සිදුවන දහසකුත් එකක් අසාමාන්‍ය දේවල්වලින් එකක් ලෙස කාරණය පසෙකට දමමින්නුයි. "මම හිතන්නේ ඔයා කොණ්ඩයට අවශ්‍ය තරම් කටු ගහලා නැහැ. ඒකයි පහළට කඩා වැටුණේ."

කොණ්ඩා කටු කීපයක් සොයා ගත් මම්සලී ඒවා කොණ්ඩ ගුළියට ඉතා තදින් ගැසූ නිසා ඇගේ කොණ්ඩය අමුතුම පෙනුමක් ගත්තා. මේ වතාවේ ඇයට කිසිම අවදානමකට මුහුණ දීමට අවශ්‍ය වුණේ නැහැ. බේරාගත් තම නම්බුවත් සමග ඈ නැවත පන්ති කාමරයට ගියා.

දෙවැනි පන්ති සිසුවියන් වෙතට ගිය නෝරා තමා කළ දෙය විස්තර කළා. ඔවුන් කොක් හඬලා සිනාසුණා.

"ඕනෑම ඔට්ටුවක්, හය පන්තිය මම්සලීගේ කොණ්ඩය කඩා වැටෙනවා දැකලා හොඳටම හිනාවෙන්න ඇති." ජූන් කිව්වා. "අපරාදේ ඔයාට නැවතිලා ඉඳලා බලලා එන්න බැරි වුණ එක."

ඔවුන් පළමුව දැක ගත් හය පන්ති ශිෂ්‍යාව වූයේ ප්‍රංශ දැරිය සූසෙන්. ඈ කඩිනමින් සිනාසීගෙන ඔවුන් වෙතට ආවා.

"අහ්... මේ නරක නෝරා...!" කෑ ගැසූ ඈ ප්‍රීතිය දනවන ප්‍රංශ වචන පේළියක් කියවාගෙන ගියා.

ප්‍රංශ විෂයට දක්ෂ සූසන් ඒවා ඉක්මනින් ඉංග්‍රීසියට පරිවර්තනය

කළ අතර විමතියට හා කලබලයට පත් මම්සලීගේ විචිත්‍ර විස්තරයක් ඉන් කියවෙද්දී ඇරියෝ සතුටින් උඩ පනිමින් සිනාසුණා.

"ක්ලැරිසා කියනවා, ඔයා ඒක ආයෙත් කරද්දී එයාටත් බලාගෙන ඉන්න තියෙනවා නම් හොඳයි කියලා." සූසේන් ප්‍රංශ බසින් කිව්වා. "ඒක කරනවා බලන්න අපි ආසයි. ඇත්තටම මට හරිම ආසයි. අපි හුඟක් වැඩිහිටි, ලොකු අය නිසා විහිළු කරන එක අපේ තත්ත්වයට හොඳ නැහැ. ඒත් ඔයාලා කරන දේවල් බලාගෙන හිටියට කමක් නැහැ."

මෙය සූසේන්ගේ දඟකාරකමයි. කොතරම් කැමති වුව ද කිසිදු හය පන්ති ඇරියක් පහළ පන්ති සිසුවියකට තම පන්ති කාමරයට පැමිණ දඟ වැඩක් කිරීමට දිරිමත් කිරීමක් කරන්නට තරම් අනුවණ වන්නේ නැහැ. එහෙත් සූසේන් එවැනි දෙයක් කිරීමට ඔවුන්ව දිරිමත් කරමින් සිටියා. ඒ සූසේන් ප්‍රංශ ඇරියක නිසයි. වගකීම් පිළිබඳව ඉංග්‍රීසි ඇරියන්ට තිබූ අදහස ඇයට තිබුණේ නැහැ.

නිතරම ඇයට පාඩම් එපා වී තිබූ අතර කුමන ආකාරයක හෝ හාස්‍යජනක දේවලට ඇලුම් කළා. දෙවැනි පන්ති ඇරියන් එවැනි යමක් සපයන්නේ නම් ඈ එය අනර්ඝ ලෙස සැලකුවා.

"හරි." ජූන් එක්වරම කිව්වා. "ඔයාට ඕනෑ ඒක නම්, ඒක කරන්නම්. හය පන්තියට විනෝද වෙන්න තව මොනවා හරි පොඩි දෙයක් ගැන මම හිතන්නම්."

නිසියාකාරව පිහිනීම හා ක්‍රීඩා කිරීම ප්‍රායෝගිකවම අත්හැර දමා තිබූ නිසා මේ වන විට ජූන්ට මහත් කුසීතකමක් දැනී තිබුණා. ඕනෑම ආකාරයක නපුරුකමකට හෝ දඟ වැඩකට යෝග්‍ය නොසන්සුන් තත්ත්වයකට ඈ පත්ව සිටියා. ඊටත් වඩා හොඳ වෙන දෙයක් තියෙනවාද? ඈ එක්වරම තම තියුණු කල්පනාව ඒ කෙරෙහි යෙදෙව්වා.

නෝරා විසින් කොණ්ඩා කටු විජ්ජාව හය පන්තියේදී කරන බව තමාට නොකීම පිළිබඳව ජෝ මහත් දුකට පත්ව සිටියා.

"ඔයාලට මට කියන්න තිබුණා." ඈ කිව්වා. "හැම තිස්සේම ඔයාලා මාව අයින් කරනවා."

"ඔයා හැමතිස්සේම, හැම දෙයක්ම අර පළමු පන්තියේ බබා

එක්ක කියනවා. මොකක්ද එයාගේ නම, ඩියනා." ජූන් කිව්වා. "අන්න ඒකයි, අපි ඔයාට අපේ රහස් කියන්නේ නැත්තේ."

"අද මට ආව පාර්සලය ඔයාලා එක්ක බෙදා ගන්නේ නැතිව පළමු පන්තිය එක්ක බෙදා ගන්න මට හිතෙනවා." ජෝ කිව්වා.

"ඉතින් බෙදා ගන්න." ජූන් කිව්වා. "කෑම දීලා ඔයාට පුළුවන් එයාලව යාළු කර ගන්න. ඒක යාළුකම සල්ලිවලට ගන්නවා වගේ වැඩක්. ඒත් අවාසනාවට වගේ ඔයාට බැහැ, අපේ යාළුකම සල්ලිවලට ගන්න. පව්... ඒක එහෙම තමා."

ජෝ මහත් දුකට පත් වුණා. මහා සල්ලි කන්දරාවකින්, රසකැවිලි හා කෑම ගොඩකින් දැරියන්ගේ සිත දිනා ගැනීමට නොහැකි බව ඇයට තේරුම් යන්නට පටන් ගත්තා. එහෙත් සමහර විට, තම උපන් දිනය වෙනුවෙන් මධ්‍යම රාත්‍රියේ රහසිගත සාදයක් සූදානම් කර සියලු දැරියන් එයට සහභාගි කරවා ගතහොත්, එමෙන්ම එය ඉතා චමත්කාර ලෙස පවත්වා සියලු දෙනාට මිත්‍රශීලී ලෙස කටයුතු කළහොත්, කෙසේ වෙතත් ඔවුන් තමා නරක නැති යැයි සිතනු ඇතිද?

එහෙත් මුදල් නොමැතිව ආකර්ෂණීය සාදයක් පවත්වන්නේ කෙසේද? කිසිවක් මිලට ගැනීමට ඇයට මුදල් නැහැ. පාලිකාව ළඟ ඇති තමාගේ මුදල ගැන ඈ දුක් වන්නට වුණා. මේ වන තුරු ඇයට එහි හිමිකම කියා ගැනීමට නොහැකිව තිබුණා.

"ඒවා මගේ කියලා කිව්වොත්, මේට්‍රන් මට සල්ලි දෙන්නේ නැහැ." ඇය විසිවෙනි වතාවටත් වැලපෙමින් ඩියනා සමග කිව්වා. "මම කොහොම හරි එයාගේ කාමරයට රිංගලා බලාගන්න ඕනෑ එයා මගේ සල්ලි තියලා තියෙන්නේ කොහේද කියලා."

හදිසියේම, ඉතා අනපේක්ෂිත අවස්ථාවක් උදා වුණා. ජෝව හමුවීමට අවශ්‍ය බව කියමින් පාලිකාව සූසන් අත පණිවිඩයක් එවා තිබුණා. ජෝ සුදුමැලි වුණා.

"ඒ මොනවාටද?" ඈ ඇසුවා.

"මම දන්නේ නැහැ." සූසන් කිව්වා. "සමහර විට ඔයා ඔයාගේ රතු මේස් තිල් පාට නූල්වලින් අණ්ඩ දාලා ඇති."

මහත් දුකට පත් ජෝ පාලිකාව සොයා ගියා. පවුම් පහක නෝට්ටු තමාගේ දැයි ඇසීමට පාලිකාව සූදානම්ව සිටින බව ඈ

නිසැකවම දැන සිටියා. පිළිතුරු සොයමින් මොළය වෙහෙසන ඇගේ සිරුර සලිත වුණා.

පාලිකාවගේ දොර වෙත ගිය ඈ එය විවෘතව ඇති බවත් කිසිවෙකු එතුළ නැති බවත් දැක ඇතුළට ගියා. සැබවින්ම ඇතුළත කිසිවෙකු සිටියේ නැහැ. කොරිඩෝවේ ඈත කෙළවරින් යමෙකු වේදනාවෙන් කෑ ගසන හඬක් ඇසුණා. කවුරුන් හෝ කෙනෙකු කොරිඩෝවේ ඇද වැටී තුවාල ලබා ඇති නිසා පාලිකාව ප්‍රථමාධාර දීම සඳහා පිටව ගොස් තියෙනවා. ජෝ කාමරය වටා කැරකී බැල්මක් හෙළුවා. ඇගේ ඉක්මන් බැල්මට අසු වූයේ එක් සුපුරුදු දෙයක්. අහ්... තිත්ත බෙහෙත් බෝතලය...!

කිසිම මුදලක් පෙනෙන්නට තිබුණේ නැහැ. එහෙත් තමාව ගල් ගැස්වීමට තරම් වූ එක් දෙයක් ජෝ දැක්කා.

ලැබෙන සෑම මුදලක්ම තැන්පත් කර ගැනීමට, පාලිකාවට එක් මුල්ලක කුඩා සේප්පුවක් තිබුණ අතර දැරියන්ගේ එදිනෙදා මුදල්, මුළුතැන්ගෙයෙහි සේවක වැටුප් වැනි සෑම මුදලක්ම එහි තැන්පත් කෙරුණා. ජෝගේ මහත් විස්මයට මෙන් සේප්පුවේ දොර මඳක් විවරව යතුරු කැරල්ල දොරේ එල්ලෙමින් තිබුණා. පැහැදිලි ලෙසම පාලිකාව සේප්පුව ඇරීමට හෝ වැසීමට යද්දීම ඇයට වේදනාත්මක කෑ ගැසීම ඇසී තිබුණා විය හැක. සේප්පු දොරෙහි යතුරු හිලෙහි යතුර අමතක වූ ඈ පිටතට දිව ගොස් තිබුණා.

කාමරයේ දොර වෙත දිව ගිය ජෝ එළියට එබී බැලුවා. වටපිට කිසිවෙකු සිටින සලකුණක් තිබුණේ නැහැ. සේප්පුව වෙත දිව ගිය ඈ එහි දොර විවෘත කළා. එක් තට්ටුවක නෝට්ටු මිටි තිබූ අතර අනෙක් තට්ටුවේ රිදී කාසි ගොඩවල් තිබුණා. නෝට්ටු රැසක් අතට ගත් ජෝ ඒවා තම කලිසම් සාක්කු තුළට ඔබා ගෙන කාමරයේ දොරින් පිටතට පැන ගත්තා.

ඇය පිටතට එනු කිසිවෙක් දුටුවේ නැහැ. ඇය කොරිඩෝව ඔස්සේ දිව යනු කිසිවෙක් දුටුවේ නැහැ. ඩියනාව සොයා ගිය ඈ, ඇය සමග නාන කාමරයට වැදී දොර වසා ගත්තා.

"මේ බලන්න...!" කලිසම් කකුල අස්සේ තිබූ නෝට්ටු පිටතට අදිමින් ජෝ කිව්වා. "මේට්‍රන්ගේ කාමරයේ කවුරුත් හිටියේ නැහැ. මම මගේ සල්ලි ආපහු ගත්තා."

"ඒත් ජෝ, මෙතන මට පෙනෙන්නේ, පවුම් පහකට වඩා තියෙනවා...!" ඩියනා කිව්වා.

ඇත්තෙන්ම එය එසේ වුණා. අලුත්ම පිරිසිදු පවුම් නවයක නෝට්ටු එහි තිබුණා.

"අපොයි.... මම හිතුවේ නැහැ මේ තරම් ගොඩක් තියෙනවා කියලා." ජෝ කිව්වා. "ඒකට කමක් නැහැ. වැඩිපුර හතර මම ණයට ගන්නවා. මම ඊළඟ සැරේ තාත්තාට ලියද්දී පවුම් හතරක් ඉල්ලනවා. එතකොට මට පුළුවන් ඒක ආපහු ගිහින් දාන්න."

"එතකොට.... එතකොට අපි මේක දැන්ම ම ආපහු ගිහින් නොතිබ්බොත් මේක හොරකමක් කියලා කියන එකක් නැතිද?" බියට පත් ඩියනා ඇසුවා.

මුදල් ආපසු ගිහින් තබන ලෙස ඩියනා තමාට බල කරනු ඇතැයි ජෝ දැඩි ලෙස බියට පත් වුණා. ඒ ඇය නැවත වතාවක් ආපසු ගොස් හොර ගල් අහුලමින් පාලිකාවගේ කාමරය අසල ගැවසුණොත් තමාව නිසැකවම අසුවන බව ඇයට හැඟුණ නිසයි. ඈ එම අදහස එක්වරම ප්‍රතික්ෂේප කළා.

"නැහැ, ඇත්තෙන්ම නැහැ." ඇය කිව්වා. "මෝඩ වෙන්න එපා. මට ඕනෑම වෙලාවක ඕනෑ තරම් සල්ලි තියෙනවා. මම හොරකම් කරන්න ඕනෙ නැහැ නේද? මම ඔයාට කියන්නේ, මේ සල්ලිවලින් පවුම් පහක් මගේ. ඉතිරි හතර මම ණයට ගත්තා. ඉතින් මම ඒක ලබන සතියේ ආපහු දෙනවා."

ඩියනා සතුටට පත් වුණා.

"අපි දැන් ගිහින් පාටියට ඕනෑ දේවල් ගෙනෙමුද?" ඈ ඇසුවා. "අපොයි, මොන තරම් දේවල් අපිට ගන්න පුළුවන්ද? අපිට ටවුමට යන්න අවසර ලැබුණ ගමන්ම අපි ගිහින් ඕනෑ කරන හැමදේම මේ සල්ලිවලට ගනිමුද?"

ජෝ කරමල ඔසවා ගත් ජයග්‍රාහී කුකුළෙකුගේ ලීලාව ඉසිලුවා. ඉතා නිර්භීත දෙයක් කදිමට කළ හැඟීමක් ඇයට තිබුණා. හැට්ටා කටු දෙකක් ගත් ඈ, නැවතත් ඇගේ කලිසමේ ඉලාස්ටික් පටි කැඩී යනු ඇතැයි බියෙන්, නෝට්ටු කලිසම් කකුලේ ඉහළට වන්නට තබා කටු ගැසුවා.

ඊළඟ දිනයේ ඔවුන් දෙදෙනා සාප්පු සවාරි යාමට පිටත් වුණා.

"අපි කොහොමද, මේ බඩු හංගන්නේ?" ජෝ ඇසුවා. "නිදන කාමරවල මේවා තියන්න මට බයේ බැහැ. පොදු කාමරත් ඒ තරම් ආරක්ෂිත නැහැ."

"හොඳයි. මේ දවස්වල වැස්සත් නැති නිසා, අපිට පුළුවන් කොහේ හරි පඳුරක් අස්සේ හංගන්න." ඩියනා කිව්වා.

ඔවුන් බොහෝ දේ මිලදී ගත්තා. බිස්කට් පැකට් වර්ග, නෙස්ලේ කිරි ටින්, සාඩින් ටින්, චොක්ලට් බොහොමයක් හා පලතුරු ජෑම් වර්ග. බඩු තොගයෙන් භාගයක් ගෙන, ඉතිරිය රැගෙන යාමට නැවත එන පොරොන්දුව පිට ඔවුන් අපහසුවෙන් ඇවිද ආවා. බෑග රැගෙන ගිය ද ඒවාට ඇමිය හැකි වූයේ භාණ්ඩවලින් අඩක් පමණයි.

බඩු සියල්ල සඟවා තැබිය හැකි කදිම ස්ථානයක් අතරමඟදී ඔවුන්ට හමු වුණා. පැරණි ගසක කඳක් පෙරළී තිබූ අතර එය යට ආවරණය වූ බෙනයක් තිබුණා. කදිමට වියළී තිබූ බෙනය තුළට දැරියෝ සියලු දේ ඔබා ඇමුවා. ඉතිරි බඩු රැගෙන ඒමට ඔවුන් ආපසු කඩමණ්ඩියට ගියා.

ඔවුන් බිල ගෙව්වා. පවුම් හතයි, සිලිං නවයයි, පැන්ස හය හමාරක්...! ඩියනාට තම දෙසවන් ඇදහිය නොහැකි වුණා. එය ඇයට අවුරුදු පහකට වියදම් කරන්න ලැබෙන මුදලටත් වඩා වැඩියි.

දෙවැනි බඩු තොගය ද හංගා, වැල් හා වියළි තණකොළවලින් බෙනයේ විවරය වැසූ ඔවුන් තම කාරිය ගැන මහත් සතුටින් යුතුව ආපසු පාසල බලා ගියා.

භාණ්ඩ ආපසු ගැනීමට පාසලේ දහ දොළොස් දෙනෙකුට කතා කළ යුතු බවට ඔවුන් තීරණයක් ගත්තා. එසේ නොවුණොත් ඔවුන්ට සිදුවන්නේ මඟ දිගට වැටි වැටී ඒවා ඔසවා ගෙන ඒමට බව ඔවුන් ඒකාන්තයෙන්ම දැන සිටියා.

එහෙත් මෙම විස්මයජනක භාණ්ඩ තොගය ගැන කිසිවෙකුට කීමට පෙර ජෝ කරදරයකට ඇද වැටුණා. ඇය පිටතට යා යුතුව තිබුණේ තවත් දෙවැනි පන්තියේ සිසුවියක හෝ ඊට වඩා වැඩිමහලු සිසුවියක සමගයි. පළමු පන්ති දැරියක ඇවිදීමට යා යුතුව තිබුණේ

හය පන්තියේ සිසුවියක හෝ ගුරුවරියක සමග වුව ද සමහර විටකදී පමණක් මේ නීතිය වෙනස් වුණා. ජෝ මෙම නීති උල්ලංඝනය කර තිබුණා පමණක් නොව ඈ ඩියනාව ආපසු කැඳවා ගෙන ඇවිත් තිබුණේ සූදානම් පන්තියකට පැයක් ප්‍රමාදවයි.

එලෙස, එදින සැඳෑවේ දෙවැනි පන්ති භාර පාකර් ගුරුතුමිය ජෝ කම්පනයට පත් කළා. ඇයට කුඩා ලිපි කැබැල්ලක් ලැබී තිබූ අතර ඇය මේසයට තට්ටු කළ විට පාඩම් කරමින් සිටි දැරියෝ හිස් ඔසවා බැලුවා.

"මට දැන්වීමක් ලැබිලා තියෙනවා." පාකර් ගුරුතුමිය කිව්වා. "මට දැනුම් දීලා තියෙනවා පළමු පන්තියේ ඩියනා බේකර්ව දෙවැනි පන්තියේ ළමයෙක් පිටතට කැඳවාගෙන ගිහින් තියෙනවා කියලා. ඒක නීතියට විරුද්ධයි. ඒ වගේම පළමු පන්තියේ සූදානම් පාඩම පටන් අරගෙන පැයකට පස්සෙයි ආපසු ඇවිදින් තියෙන්නේ. ඩියනා දෙවැනි පන්තියේ ළමයාගේ නම කියලා නැහැ. ඒ නිසා මම කියනවා ඒ කවුද කියලා මට දැනගන්න ඒ ළමයාට නැගිටින්න කියලා."

සැබවින්ම ඒ ජෝ බව කවුරුත් දැන සිටියා. ජෝ ඩියනා සමග පිටව යනු ඔවුන් දැක තිබුණ අතර එසේ නොවුව ද ඔවුන්ට එය අනුමාන කිරීමට හැකියාව තිබුණා. ඩියනාට දෙවැනි පන්තියේ සිටි මිතුරිය, ජෝ පමණයි. කීප දෙනෙක් ජෝ දෙස බැලුවා.

ජෝ ඉදිරිපත් වීමට බිය වූවා. ඔවුන් ගියේ කොහේද, මිලදී ගත්තේ මොනවාද, මුදල් ලැබුණේ කොහෙන්ද? යන දේවල් කීමට ඈ බිය වුණා. තම අසුනේ වාඩි වී වෙවුලමින් සිටි ඈ දෙනෙත් බිමට නැඹුරු කරගෙන සිටියා. ඇගේ දෙකම්මුල් රත් පැහැ ගැන්වී තිබුණා. පාකර් ගුරුතුමිය නිහඬව විනාඩි දෙකක් බලා සිටියා.

"බොහොම හොඳයි." ඈ කිව්වා. "වැරදිකාරිය ඉදිරිපත් වන්නේ නැතිනම්, මම මුළු පන්තියටම දඬුවම් කරනවා. දෙවැනි පන්තියේ අයට දවස් තුනක් පිහිනීමට යාම තහනම්."

එහෙත්, ජෝ නැගිට්ටේ නැහැ. ඇයට එය නොහැකියි. ඕ... දැරියන්ට එය වැටහුණේ නැහැ. එය නිකම් ම ඩියනා පිටතට කැඳවා ගෙන ගිය වරද පිළිගැනීමක් නොවෙයි. අනෙක් සියලු දේ එළිදරව් වීමක්. උදාහරණයකට පවුම් නවය...!

පවුම් නවය. නවයක්ම පවුම්. හදිසියේම එය ටිකෙන් ටික ලොකුවට හා තවත් ලොකුවට පෙනෙන්නට වුණා. ඇයි ඇය එතරම් මුදලක් ගත්තේ? ඇයට හිමි මුදල් ආපසු ගැනීමට, ව්‍යාජ නිර්භීතකමක් - ඩියනාගේ සිත දිනා ගැනීමට. පාඩමේ ඉතිරිය පුරා ජෝ හිස නමාගෙන සිටි අතර ඇයට කිසිසේත් කිසිවක් කිරීමට නොහැකි වුණා.

එදින රාත්‍රියේ නිදන කාමරයේ කුණාටුවක් ඇති වුණා.

"ජෝ, ඇයි ඔයා ඉදිරිපත් වුණේ නැත්තේ?" ජූන් තදින් ඇසුවා. "ඔයා දැන්ම ගිහින් ඉදිරිපත් වෙන්න. යන්න...!"

"ඩියනා එක්ක ගියේ මම නොවෙයි." ජෝ දුර්වලව කිව්වා.

"ඕ... ජෝ...! ඔයා හොඳටම නරක් වෙලා. ඔයා කොහොමද එහෙම කියන්නේ?" ෆෙලිසිටි කෑ ගැසුවා. "ගිහින් ඉදිරිපත් වෙන්න. ඔයාට ඕනෑ මුළු පන්තියම දවස් තුනක් පිහිනුම්වලට නොයවා ඉන්නද? ඔයාට එහෙම කරන්න දෙන්න බැහැ. ඔයාට පිස්සුද?"

"හරි, මට පිස්සු තමයි." ජෝ කිව්වේ කෝපයෙන් හා චෝදනා මුඛයෙන් තමා වෙත සියලු මුහුණු හැරී තිබෙනු දැක දඩයමට ලක් වූ සතෙකු බඳු හැඟීමකින් යුතුවයි.

"ඔයා මැලෝරි ටවර්ස්වල ඉන්න සුදුසු නැහැ." සූසන් නපුරු හඬින් කිව්වා. "මට හිතාගන්න බැහැ ඔයා මොනවාට මෙහාට ආවද කියලා. ඔයා හැදෙන්නේ නැතිව එන්න එන්නම නරක් වෙනවා."

"නැහැ." ජෝ දෙනෙතේ කඳුළු පුරවා ගනිමින් කිව්වා.

"අන්න හරි... අඬන්න..." කැතරින් කිව්වා. "ඔයාට එහෙම වෙන්න ඕනෑ. අවසාන වතාවට අහන්නේ ඔයා ගිහින් ඉදිරිපත් වෙනවාද, නැද්ද?"

"මම ඩියනාව එක්ක ගියේ නැහැ." ජෝ මුරණ්ඩු ලෙස නැවත කිව්වා.

"අපි ඔයා එක්ක කතා බහ නවත්වනවා." ජූන් කිව්වා. "අපි කිසිම කෙනෙක් ඔයා එක්ක කතා නැහැ. සම්පූර්ණ සති තුනක් තිස්සේ ඔයා එක්ක කිසිම ගනුදෙනුවක් නැහැ. හරිද? ඔයා වගේ හැසිරෙන අයට දෙන්න ඕනෑ ඒ වගේ දඬුවමක්, ජොසපින් ජෝන්ස්. තමන් කරන වැරදිවලට අනුන්ට දඬුවම් විඳින්න සලස්වනවා. වැරැද්ද පිළිගන්න බැරි බයගුල්ලී. අපි සති තුනක් යන තුරු ඔයා එක්ක කතා කරන්නේ නැහැ...!"

"ඒත්.... මගේ උපන් දිනය ළඟයි. මම පාටියක් ලෑස්ති කරලා තියෙන්නේ හැමකෙනාටම...!" ජෝ වියරුවෙන් මෙන් කෑ ගැසුවා.

"ඔයාගේ පාටියට එන එකම කෙනා ඔයා විතරයි." ජූන් රවාගෙන කිව්වා. "ඔයා අර මෝඩ ඩියනාට කිව්වොත් එයා නම් එයි. හැමෝම මේකට එකඟයි නේද? මේ මොහොතේ ඉඳලා අපි කවුරුවත් ජෝ එක්ක කිසිම ගනුදෙනුවක් නැහැ...!"

හුදෙකලා කිරීමේ දඬුවමක් ගැන ජෝ මින් පෙර අසා තිබුණේ නැහැ. එය ඇයට අලුත් දෙයක්. ඉන් අදහස් වුණේ කිසිම කෙනෙක් ඇයට කතා කරන්නේවත්, ඇයට පිළිතුරු දෙන්නේ හෝ අඩුම තරමේ ඇය දෙස බලන්නේ හෝ නැහැ. එදින රාත්‍රියේ ඇය සිටිනවාද කියා හෝ කිසිවෙක් සොයා බැලුවේ නැහැ. ජෝ ඇඳේ වැතිර හැඬුවා. නැන්දාගෙන් පවුම් පහ ලද විගසම ඇයි ඇය එය නේවාසිකාගාර පාලිකාවට නොදුන්නේ? එතැන් සිටයි මේ සියලු කරදර ඇරඹුණේ.

අනෙක් අය නින්දට වැටෙන තුරු බලා සිටි ඈ ඩියනා සොයා පිටත් වුණා. දෙදෙනා එක්ව කොරිඩෝවට පැමිණ කොඳුරන්නට වුණා.

"ඩියනා, මට මේක ඉවසන්න බැහැ." ජෝ වැලපුණා. "මම

පැනලා යනවා. මට ගෙදර යන්න ඕනෑ. මෙහේ හැමදෙනාම මා එක්ක තරහයි. ඔයා විතරයි මට ඉන්නේ."

"මම ඔයා එක්ක සාප්පු නොගිහින් ඉන්න තිබුණේ." ඩියනා කෙඳිරුවා. "මේ කරදරවලට හේතුව මම."

"ඕ... ඩියනා, මම පැනලා යනවා නම් ඔයත් එනවාද මාත් එක්ක?" ජෝ ඉකි ගසමින් ඇසුවා. මට තනියම යන්න බයයි. අනේ... අනේ... කියන්න, ඔයා මා එක්ක එනවා කියලා."

ඩියනා පැකිළුණා. පැන යාමේ අදහස ඇයව බිය වැද්දුවා. එහෙත් දුර්වල කෙනෙකු වූ ඇයව පහසුවෙන් පොලඹවා ගත හැකි වුණා. දෙදෙනාගෙන් වඩා බලවත් වූයේ ජෝ. එමෙන්ම ජෝ ඇයට බොහෝ සේ ත්‍යාගශීලී වුණා.

"හරි, මමත් එනවා." ඇය කී විගසම ජෝ මහත් සතුටට පත් වුණා.

ඔවුන් සැලසුම් කිරීම ඇරඹුවා.

"මම කියන්නම් අපි කරන්නේ මොනවාද කියලා." ජෝ කිව්වා. "අපි අපේ කෑම ඔක්කෝම ගෙනියමු අර මඩුවට. ගිය සතියේ අපි ඇත ඇවිදින්න යද්දී පහු කරගෙන ගිය මඩුව. ඔයාට මතකද? පළමු පන්තියයි, දෙවෙනි පන්තියයි එකට යද්දී අපි ඒ මඩුවේ සෙල්ලම් කළා. ඒක තියෙන්නේ පාළු හරියක. අපි එතෙන්ට ගෙනිහින් ගෙදර යන්න ක්‍රමයක් හොයාගන්න තුරු දවසක් දෙකක් ඒකේ නවතිමු."

මෙය තරමක ප්‍රීතිමත් වීර චාරිකාවක් ලෙස ඩියනාට පෙනුණා. එයට ඈ එකවරම කැමති වුණා.

"අපි හෙට උදේම නැගිටිමු." ඈ කිව්වා. "ඊට පස්සේ ගිහින් බඩු ටික අරගෙන යමු. අපිට ඒවා දෙගමනකට තමයි ගෙනියන්න වෙන්නේ. අනික මඩුවට හුඟක් දුරයි."

ජෝට මහත් ප්‍රීතියක් දැනුණා. හුදෙකලා කිරීමේ දඬුවම නිසා ඇය පැන ගොස් ඇති බව දැන ගත් විට දෙවැනි පන්ති ඇරියන්ට කුමක් සිතෙනු ඇතිද? හදිසියේ අතුරුදහන් වීම නිසා පාසල හා තම දෙමව්පියන් කොතරම් කරදරයට පත්වනු ඇති දැයි ජෝ සිතුවේ නැහැ. සම්පූර්ණයෙන් ආත්මාර්ථකාමී වූ ඈ මේ සියල්ල දුටුවේ ඉතා අපූරු දඩබ්බරකමක් ලෙසයි.

කෙසේ හෝ ඊළඟ උදයේ, හිම්දිරියේම අවදි වීමට ඇ සමත් වුණා. ඇඳුම් ඇඳ ගත් ඇ ඩියනා අවදි කිරීමට ගියා. වාසනාවකට මෙන් ඇගේ ඇඳ තිබුණේ නිදන කාමරයේ දොර අසලමයි. දෙදෙනා නිහඬව ගමන් ආරම්භ කළා. භාණ්ඩ සඟවා තිබූ ගස් බෙනය වෙත පැමිණි ඔවුන් දිගු ගම්බද මාවත ඔස්සේ ගමන් ඇරඹුවා. මඩුවට යාමට ඔවුන් සිතා තිබුණාට වඩා දිගු වේලාවක් ගත වුණා. මඩුව සැඟව සිටීමට කදිම ස්ථානයක් වුණා. මාවත්වලට බොහෝ එපිටින් පිහිටි එයට ළඟා විය හැකි වූයේ ඉතා පටු පාරකින් පමණයි. එම පාර පයින් යන අයට වඩා යෝග්‍ය වූයේ අශ්වාරෝහකයින්ටයි. ඉඳහිට පයින් යන්නෙක් හැර කිසිවෙක් එහි ළඟා වූයේ නැහැ.

"ඇන් හරි." ජෝ පලතුරු ටින් තැන්පත් කර තබමින් මහත් සතුටින් කිව්වා. "අපි මතක් කරලා කටර් අඬුවක් ගේන්න ඕනෑ ටින් අරින්න. අපිට ඇත්තටම සතියක් ජීවත් වෙන්න කෑම තියෙනවා, ඩියනා."

"අපි ඉක්මනට ආපහු යන්න ඕනෑ." ඩියනා තම අත් ඔරලෝසුව දෙස බලමින් කිව්වා. "උදේ කෑමට අපි හොඳටම ප්‍රමාද වෙයි. අපි මොනවා කළත්, ආයෙත් එකට ඇවිදින්න යන බව පෙන්වන්න හොඳ නැහැ."

"මේ වනතුරු කවුරුවත් අපිව දැක්කේ නැහැ." ජෝ කිව්වා. "අපි වාසනාවන්තයි."

මේ වන විට විල් ඇගේ අසු, තන්ඩර් පිටත්, ක්ලැරිසා මෙරිලෙග් පිටත් නැගී ඔවුන්ගේ සුපුරුදු උදෑසන සවාරියක් යමින් සිටියා. ඔවුන් අසුන් වේගයෙන් මෙහෙයවමින් සිටියේ මඩුවට වඩා නුදුරින් වූ පටු මාවතේයි. මඩුව තුළට යන දෙදෙනෙකුගේ ඡායාව විල්ගේ තියුණු දෙනෙතට හසු වුණා.

"හරි විකාරයක්...!" ඇ කිව්වා. "මැලෝරි ටවර්ස් ළමයි දෙන්නෙක් වගේ. එකම නිල ඇඳුම. සමහර විට උදේම ඇවිදින්න ආව දෙන්නෙක්."

"වෙන්න ඇති." කී ක්ලැරිසා ඒ ගැන තව දුරටත් සිතුවේ නැහැ.

ඉතා කදිම අශ්ව සවාරියකින් පසුව ඔවුන් හැල්මේ ආපසු

පැදෙව්වේ වෙනස් ගේට්ටු දෙකකින් පාසල තුළට පැමිණීමට ප්‍රවේසම වූ ජෝ හා ඩියනා පැමිණීමට මඳකට පෙරයි.

සියලු දෙනා ඇඳන්වලට ගොස් නිදා ගත් විට එදින රාත්‍රියේ පැන යාමට ඔවුන් සැලසුම් කර තිබුණා. එදින ජෝගේ හැසිරීම ගැන දෙවන පන්තියේ දැරියන් පුදුමයට පත් වුණා. සම්පූර්ණයෙන්ම හුදෙකලා කර තැබීම දැඩි දඬුවමක් නිසා ඔවුන් ඇය දැඩි දුකටත්, අවාසනාවටත් පත්ව සිටිනු ඇතැයි බලාපොරොත්තු වී තිබුණා. එහෙත් ඒ වෙනුවට හුදෙකලා කිරීම ගණන් නොගන්නා බවක් පෙන්වමින් ජෝ දීප්තිමත් දෙනෙතින් යුතුව සතුටින් හැසිරුණා.

"එයා ලැජ්ජා නැති ඊරියක්." ජූන් ෆෙලිසිටිට කිව්වා.

ජූන් ගණන් නොගෙන ඉඳීම එකට දෙගුණයක් ලෙස කරමින් සිටියා. ඈ ගණන් නොගෙන සිටියේ ජෝව පමණක් නොවෙයි, අමන්ඩාවත් ගණන් නොගෙන සිටියා. එම දින කීපය තුළදී දිනකට බොහෝ වාර ගණනක් ඔවුන් එකිනෙකා මුණ ගැසුණු අතර කැපී පෙනෙන ලෙස අමන්ඩාට පස්ස හරවා යාමට ඒ හැමවිටම හැකි වීම ගැන ජූන් සතුටට පත් වුණා.

එදින රාත්‍රියේ දෙවැනි පන්ති නිදන කාමරයේ දැරියන් තද නින්දේ පසුවෙද්දී අවදි වූ ජෝ ඉතා නිහඬව ඇඳුම් දා ගත්තා. ඇඳ ඇතිරිල්ල ද ගත් ඈ ඩියනාගේ නිදන කාමරයට හොරෙන් ඇතුළු වුණා. ඩියනා අවදිව සිටියා. කාලය ළං වත්ම ඇගේ බිය ද වැඩි වුණා. පැන යාමේ අදහස සම්පූර්ණයෙන්ම අත්හැර දැමීමට ඇයට සිත් වී තිබුණා.

එහෙත් අදහස අත් හැරීමට හෝ ඩියනාට අත් හැරීමට ඉඩ දීමට හෝ ජෝට අදහසක් තිබුණේ නැහැ. වැඩි වේලාවක් ගතවීමට පෙර දෙදෙනාම ඇඳ ඇතිරිලි පොරවා ගෙන සඳ එළියෙන් නැහැවුණු කොරිඩෝව ඔස්සේ රහසින් ගමන් කරමින් සිටියා. ගේට්ටුව විවෘත කරගෙන පිටියට යාම ඉතා පහසු වුණා.

"හඳ එළිය තියෙන එක හොඳයි." ඩියනා බියෙන් යුතු වුව ද සතුටු හඬින් කිව්වා. "කරුවළේ යන්න මම කැමති නැහැ. ඕ... ජෝ, ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා ඔයාට හොඳටම විශ්වාසද? ඔයා එක්ක මමත් එනවට ඔයාලගේ ගෙදර අය මොකවත් කියන්නේ නැහැ කියලා ඔයාට විශ්වාසද?"

"ඔ.... නැහැ. එයාලා මගේ යාළුවා හැටියට ඔයාව පිළිගනියි." ජෝ කිව්වා. "අපේ ගෙදර අය අපේ වීරකම ගැන හිතාවෙයි. මම ඒක දන්නවා. මේක නම් අපූරු දෙයක් කියලා එයාලා කියයි."

අන්තිමේදී ඔවුන් මඩුවට ළඟා වුණා. කෑම වර්ග සියල්ල එලෙසම තිබුණා. ඇඳ ඇතිරිලි ගෙබිමෙහි ඇතිරූ ඔවුන් ඒ මත වැතිරී නිදා ගත්තා. තරමක උණුසුමක් තිබුණ ද යම් වේලාවක් ගතවන තුරු දෙදෙනාටම නින්ද ගියේ නැහැ. අවසානයේදී ජෝ බිස්කට් පැකැට්ටුවක් කඩා විවෘත කළ අතර ඔවුන් කඩිනමින් බිස්කට් පැකැට්ටුව හිස් කර දැමුවා. අනතුරුව ඩියනා පළමුව නින්දට වැටුණ පසු ජෝ නිදි කිරන්නට පටන් ගත්තා.

හෙට අනෙක් දැරියෝ කුමක් සිතනු ඇතිද? තමා පන්නා දැමීම පිළිබඳව ඔවුන් කනගාටු වනු ඇතැයි ජෝ සිතුවා. පාකර් ගුරුතුමිය කී නපුරු දේවල් ගැන ඈ කනගාටු වනු ඇත. මම්සලීට ද එයම සිදුවනු ඇත. එයම... එහෙත් ජෝ තද නින්දට වැටුණ හෙයින් ඔවුන්ට මඩුව තුළට රිංගා ගත් කුඩා ඉත්තෑවාගේ 'සර සර' හඬ හෝ ඇසුණේ නැහැ.

උදයේ කිසිවෙක් දැරියන්ගේ හිස් ඇඳන් විශේෂයෙන් දුටුවේ නැහැ. කෙනෙකු උදයේම අවදි වී ඇවිදීමට හෝ පිහිනීමට යාම සාමාන්‍ය දෙයක්. සුපුරුදු පරිදි කතා බස් කරමින්, පළමු හා දෙවෙනි පන්ති දැරියෝ උදේ ආහාරය සඳහා පහළට බැස ගියා.

එහෙත් වැඩි වේලාවක් ගතවීමට පෙර ජෝ හා ඩියනා අතුරුදන් වී ඇති ආරංචිය පාසල පුරා පැතිරුණා.

"කවුරුවත් දන්නේ නැහැ එයාලා කොහේ ගිහින්ද කියලා. එයාලව හැමතැනම හොයනවා...!"

දෙවැනි පන්තියේ දැරියන්ට යම් වරදකාරී හැඟීමකින් වැළකී සිටිය නොහැකි වුණා. ජෝ පැන ගොස් තිබුණේ ඔවුන්ගේ දඬුවම නිසාද? නැහැ. මීට පෙර බොහෝ අවස්ථාවල තමා පැන යන බව ඈ නිතර නිතර කියා තිබුණා. එමෙන්ම, සමහරවිට හුදෙකලා කිරීම ඉවසිය නොහැකි තැන ඈ පැන යන්නට ඇති. එමෙන්ම කුඩා දුර්වල ඩියනා ද ඇය සමග කැටුව යන්න ඇති. කුමක් සිදුවෙයිද? ඔවුන් කොහේ නම් ගොස් ඇතිද?

පොලීසියට දැනුම් දෙනු ලැබුණා. ග්‍රේලින් මහත්මිය ජෝන්ස් මහතාට දුරකථන ඇමතුමක් දුන්නා. ඔහුගේ දියණිය අතුරුදහන්ව ඇති බවත්, ඇයව සොයා ගැනීමට බලාපොරොත්තු වන බවත්, ඇය තවත් දැරියක කැටුව ගොස් ඇති බවත් ඉන් කියැවුණා. ඔවුන් වැඩි ඈතක ගොස් තිබිය නොහැකියි.

තමා දුන් පණිවිඩයට ජෝන්ස් මහතා දැක්වූ ප්‍රතිචාරය දැක ග්‍රේලින් මහත්මිය මහත් විමතියට පත් වුණා. ඔහු කලබලයට හා දුකට පත් වනු ඇතැයි ද, සමහර විට ජෝ කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීම ගැන දොස් පවරනු ඇතැයි ද ඇ අපේක්ෂා කර තිබුණා. එහෙත් දුරකථනය ඔස්සේ පැමිණියේ මහා හඬින් සිනාසෙන හඬක්.

"හහ්... හහ්... හා...! ඔන්න අපේ ජෝගේ ඇත්තම විදිහ...! දන්නවානේ.... එයත් මම වගේමයි. මමත් ඉස්කෝලේ නොගිහින් කී සැරයක් කැලේ පැනලා තියෙනවාද? අපේ ජෝ ගැන කලබල වෙන්න එපා, මිස් ග්‍රේලින්. එයා දන්නවා හරියටම මොනවාද කරන්න ඕනෑ කියලා. සමහර විට එයා ගෙදර එන්න මග ඇති. එයා ආවොත් මම පණිවිඩයක් දෙන්නම්."

"මිස්ටර් ජෝන්ස්, අපි පොලීසියට දැනුම් දීලයි තියෙන්නේ." ග්‍රේලින් මහත්මිය කිව්වේ තම පණිවිඩය ජෝගේ පියා භාරගත් ආකාරය ගැන පිළිකුලින් යුතුවයි. "මේ සිද්ධිය පත්තරේට යන එක නවත්තන්න මම මට පුළුවන් තරම් උත්සාහ කරන්නම්."

"ඕ.... ඔයා ඒ ගැන කලබල වෙන්න එපා." පුදුම උපදවන ජෝන්ස් මහතා කිව්වා. "මම කැමතියි, අපේ ජෝගේ වීරකම පත්තරයක සිරස්තලයක් වෙනවා දකින්න. එයා ශ්‍රේෂ්ඨ ළමයෙක් නේද?"

ග්‍රේලින් මහත්මියගේ අන්තයේ රිසිවරය තදින් පහත තබන හඬ ඇසී ඔහු පුදුමයට පත් වුණා.

"මේ ගෑනිට මොනවා වෙලාද?" ඔහු පුදුමයෙන් කල්පනා කළා. "ඒ විදිහට මාව කපලා දැම්මෙ. හේයි... නෝනා, ඔයා කොහේද? අපේ ජෝ කරලා තියෙන දෙය ඔයා දන්නවාද?"

එදින උදයේ ඉතා කරදරකාරී ප්‍රවෘත්තියක් ග්‍රේලින් මහත්මියට

ලැබුණා. එය පැමිණියේ ඇරියන්ගේ අතුරුදහන් වීම ගැන දැනුම් දෙන ලද පොලිස් සැරයන්වරයාගෙන්. ශ්‍රේලින් මහත්මිය ඔවුන්ගේ අතුරුදහන් වීම හා ඔවුන්ගේ විස්තර ලබා දුන්නාට පසුව සැරයන්වරයා උගුර පාදා තරමක් අමුතු ලෙසකින් කතා කළා.

"අහ්... මීට ඉස්සර මට වාර්තා කරපු සිද්ධිය ගැන, මිස් ශ්‍රේලින්." ඔහු කිව්වා. "මේට්‍රන්ගේ සේප්පුවෙන් හොරකම් කරපු නෝට්ටු ගැන. ඔයාට මතක ඇති නෝට්ටුවල අංක මට මේට්‍රන් දුන්නා. ඒවා එක පිළිවෙළකට තිබුණේ. හොඳයි, අපි ඒවා පස්සෙන් ගියා."

"ඔහ්...!" ශ්‍රේලින් මහත්මිය කිව්වා. "එහෙනම් හොරකම් කළේ කවුද කියලා ඔයාලා දන්නවා ඇති, නේද?"

"හොඳයි, මැඩම්. ඔව්, එක විදිහකට දන්නවා කියන්න පුළුවන්." සැරයන්වරයා කිව්වා. "ඒ නෝට්ටු ටවුමේ කඩයකට දීලා තියෙන්නේ මැලෝරි ටවර්ස් ළමයෙක්. ඒ ළමයා තවත් ළමයෙක් එක්ක ඇවිදින්. කෑම වර්ග ගොඩක් අරගෙන තියෙනවා. ටින් වර්ග මහා ගොඩක්."

ශ්‍රේලින් මහත්මියගේ හදවත කඩා වැටුණා. ඈ දෙනෙත් තද කර වසා ගත්තා. මැලෝරි ටවර්ස් ඇරියක් විය නොහැකියි. එවැනි හෙරක් කෙසේවත් ඇරියන් අතර සිටිය හැකිද?

"බොහොම ස්තුතියි, සාජන් මහත්මයා." අවසානයේදී ඈ කිව්වා. "ඒ ළමයි කවුද කියලා මම හොයලා බලන්නම්. සුබ උදෑසනක්."

සාප්පු සවාරියේ ගොස් තිබුණේ ජෝ හා ඩියනා බව ඉතා ඉක්මනින් හොඳින් පැහැදිලි වුණා. සෑම දෙයක්ම ටිකින් ටික හෙළිදරව් වුණා. තමාට නෝට්ටු ලැබුණ ආකාරය හා ඒවා ජෝගේ බව තමා දැනගත් ආකාරය පාලිකාව කිව්වා. ජෝ ඒවා ඉල්ලීමට පැමිණ තිබුණේ නැහැ.

උපන් දින සාදයකට භාණ්ඩ මිලට ගැනීමට ජෝ අදහස් කර තිබූ බව දෙවැනි පන්තියේ දැරියක් හෙළිදරව් කළා. ඩියනා දෙවැනි පන්ති දැරියක සමග පිටතට ගොස් තිබූ බවත්, දෙවැනි පන්ති දැරියකට ඉදිරිපත් වන ලෙස කීවද ඇය ඉදිරිපත් නොවූ බවත් පාකර් ගුරුතුමිය කිව්වා.

"ඒත්..." ඈ කිව්වා. "ඒ ජෝ කියන එකේ කිසිම සැකයක් නැහැ."

"ඔව්." අවාසනාවන්ත කතන්දරය හරි හැටි දැන ගත් ග්‍රේලින් මහත්මිය කිව්වා.

පාලිකාවගේ කාමරය තුළට ගොස් තිබූ ජෝ තමා අදහස් කළ පමණට වඩා මුදල් ගෙන තිබුණා. ඉන්පසුව එය ආපසු තැබීමට බැරි තරමට බියපත්ව තිබුණා. කරදරයට පත් වූ පසු, බියත් අවාසනාවන්ත සිතුවිලිත් හේතුවෙන් ඈ පැන ගොස් තිබුණා. අඥාන, අයහපත් ලෙස හදාවඩා ගෙන තිබූ නරක් වූ ජෝ...!

"හුඟක්ම එයාගේ දෙමව්පියන්ගේ වැරැද්ද, ඇත්තෙන්ම." ග්‍රේලින් මහත්මිය පාලිකාවට කිව්වා. "ඒකට කරන්න දෙයක් නැහැ. අනේ මන්දා, වැඩිහිටියෝ එයාට කිසිම සහයෝගයක් නැහැ."

දොරට තට්ටු කරන හඬක් ඇසුණා. විල් හා ක්ලැරිසා පිටත රැඳී සිටියා. පෙර දින උදයේ පාළු මඩුව අසලදී ඔවුන් දුටු ඡායා දෙක ගැන ඔවුන්ට සිහිපත් වී තිබුණා. ඒ ජෝ හා ඩියනා විය හැකිද?

"හුඟක් දුරට වෙන්න පුළුවන්." ග්‍රේලින් මහත්මිය කිව්වා.

"එයාලා එතැන එයාලගේ කෑම හංගන්න ඇති. එතැන තිප්පොළක් හදාගෙන ඇති. ඔයාලා පාර දන්නවාද?"

"ඔ... ඔව්." විල් කිව්වා. "අපි නිතරම ඒ හරියෙන් අශ්වයෝ පදිනවා. තන්ඩර්වයි, මෙරිලෙග්වයි පදින්න තියෙන ඉක්මන්ම පාර ඒක කියලයි අපි හිතාගෙන ඉන්නේ. මිස් ශ්‍රේලින්, අපි ගිහින් බලන්නද එයාලා ඉන්නවාද කියලා?"

"මිස් පීටර්ස්ටත් එයාගේ අශ්වයා පිටේ යන්න පුළුවන්." ශ්‍රේලින් මහත්මිය කිව්වා. "ළමයි හිටියොත් එයාට පුළුවන් එයාලව ආපහු එක්ක එන්න."

මෙලෙස අසු පිට නැගුණ තිදෙනා ගමන් ආරම්භ කර කඳු ගැට තැනිතලා පසු කර පරණ මඩුවට දිවෙන පටු මාවත බලා පැමිණියා. මඩුව තුළ ගෙබිමෙහි වාඩි වී හතර වැනි වතාවටත් කෙටි කෑම වේලක් ගනිමින් සිටි ජෝට හා ඩියනාට අස් කුර හඬ ඇසුණා. ඩියනා පිටතට එබී බැලුවා.

"ඒ විල්, ක්ලැරිසාත් එක්ක." බියපත්ව ආපසු හැරී බලමින් ඈ කිව්වා. "මිස් පීටර්ස් එයාලා එක්ක එනවා."

"අපි මෙහේ ඉන්නවා කියලා එයාලා දන්නේ නැහැ." කල-බලයට පත් ජෝ කිව්වා.

එහෙත් ඇත්තෙන්ම ඔවුන් එය අනුමාන කර තිබුණා. ඔවුන් තිදෙනා මඩුව අසලටම පැමිණි පසු අසු පිටින් බට පීටර්ස් ගුරුතුමිය මඩුව තුළට එබී බැලුවා. අපිරිසිදුව, අපිළිවෙළව, බියපත්ව මුල්ලක ගුළි වී සිටින ඔවුන් දෙදෙනාව දැක ගැනීමට ඇයට පුළුවන් වුණා.

"එහෙමනම් ඔයාලා මෙහේ." ඈ කිව්වා. "මොන මෝඩ ජෝඩුවක්ද? ඉක්මනට එළියට එන්න. මේ විකාර වැඩ දැන් අපිට ඇතිවෙලා තියෙන්නේ."

බියට පත් බලු කුක්කන් දෙදෙනෙකු සේ ජෝ හා ඩියනා මඩුවෙන් පිටතට රිංගා ආවා. විල් හා ක්ලැරිසා ඔවුන් දෙස බැලුවා.

"එතකොට ඊයේ අපි දැක්කේ ඔයාලව තමයි." විල් කිව්වා. "මොකක්ද ඔයාලගේ මේ සෙල්ලම? රතු ඉන්දියානු හරි ඒ වගේ දෙයක්ද?"

"විල් අපිට ලොකු කරදරයක් වෙයිද?" බියෙන් සුදුමැලි වූ ඩියනා ඇසුවා.

මඩුවේ ගත කළ රාත්‍රිය ඇයට විනෝදයක් වී තිබුණේ නැහැ. සුළඟක් හැමීමට පටන් ගෙන තිබූ අතර හිම්දිරි උදයේ ඇයට තද ශීතලක් දැනී තිබුණා. අවදි වූ ඇයට නැවත නින්දට යාමට නොහැකි වී තිබුණා. එමෙන්ම, මඩුව තුළ තරමක දුර්ගන්ධයක් ද ඇති බව දැනුණු අතර සමහරවිට ඒ මීයන්ගේ ගඳ විය හැකි යැයි මීයන් කෙරෙහි මහත් බියක් දැක්වූ ඩියනාට සිතී තිබුණා.

සුදුමැලිව සිටි ඩියනා දෙස බැලූ විල්ට ඇය කෙරෙහි අනුකම්පාවක් ඇති වුණා. ඇය පළමු පන්ති දැරියක්, දහතුන් වියැති, බියගුලු චරිතයක්. කයිවාරු ගැසීමටත්, අනුවණ වැරදි කිරීමට පොලඹවා ගැනීමටත් ජෝව තෝරා ගත හැකි හොඳම වර්ගයේ දැරියක්.

"බලන්න ඩියනා, ඔයා මහා මෝඩියක්. එදා ඔයාලා මෙහේ ආපු වෙලාවේ ක්ලැරිසායි මමයි ඔයාලව දැක්කේ නැතිනම් ඔයාලා මහා කරදරයකට හේතු වෙන්න තිබුණා." විල් කිව්වා. "තවම සිද්ධිය පත්තරවල වැටිලා නැත්තේ දේව කරුණාව නිසයි. ඔයාට කරන්න පුළුවන් හොඳම දේ තමයි මේ ගැන සම්පූර්ණයෙන්ම අවංකව කතා කරලා, ආයෙත් වැරදි නොකරන බවට පොරොන්දු වෙලා, ජීවිතේ අලුත් පිටුවක් පෙරළන්න උත්සාහ කරන එක. එතකොට මට බය නැතිව කියන්න පුළුවන් ඔයාට තව එක අවස්ථාවක් ලැබෙනවා කියලා."

"මාව අස් කරයි ද?" එම සිතුවිල්ලෙන් භීතියට පත් ඩියනා කම්පනයෙන් යුතුව ඇසුවා. "මගේ තාත්තාට හොඳටම දුක හිතෙයි. මට අම්මා කෙනෙක් නැහැ."

"ඔයාව ගෙදර යවන එකක් නැහැ මම හිතන්නේ." විල් කරුණාවන්තව කිව්වා. "මම දන්නා තරමින් ඔයාගේ නම ඒ තරම් නරක් වෙලා නැහැ. හරි, දැන් එන්න. ඔයාට පුළුවන් මගේ පිටිපස්සෙන් තන්ඩර් පිටට නගින්න."

ඩියනා අශ්වයින්ට බිය වුව ද විල්ට අකීකරු වීමට ඇ ඊටත් වඩා බිය වුණා. තවත් කරදරයට පත් වීමට අකමැති වූ ඇය තන්ඩර් පිටට නැග ගත් අතර ජෝව පීටර්ස් ගුරුතුමියගේ අසු පිටට නංවා

ගනු ලැබුවා. පීටර්ස් ගුරුතුමිය කුණු තැවරී අවුල්ව සිටි ජෝට වචන කිපයක් පමණක් කිව්වා.

"පැනලා යන එකෙන් කිසිම යහපතක් සිද්ධ වෙන්නේ නැහැ." ඈ කිව්වා. "කෙනෙකුට කරදරවලින් පැනලා යන්න බැහැ. ඒවාට මුහුණ දෙන්න ඕනෑ. ඒක මතක තියාගන්න, ජෝ. දැන් මාව අල්ල ගන්න. අපි යමු."

විවේක කාලය ආසන්නයේදී ඔවුන් ආපසු පැමිණියා. ඔවුන් පාසල් මාවත ඔස්සේ පැමිණෙද්දී නැගුණ අස් කුර හඬ නිසා ජෝ හා ඩියනා ආපසු රැගෙන එනවා ඇති දැයි දැක ගැනීමට දැරියෝ දුව ආවා. කුණු තැවරී අවුල් වී දුකට පත් පෙනුමක් ඉසිලූ යුවළ දෙස ඔවුන් නිහඬව බලා සිටියා.

දෙදෙනාම කෙළින්ම ග්‍රේලින් මහත්මිය වෙතට රැගෙන යනු ලැබුවා. මේ වන විට ඩියනා මහත් වූ දුක්ඛිත තත්ත්වයකට පත්ව සිටියා. ඇය කෙසේ නම් ජෝ සමග යාමට කැමති වුණා ද? ඇගේ පියා කුමක් කියනු ඇති ද? ඔහුට තිබූ එකම වස්තුව ඈ පමණයි. ඔහු ඇයව එවා තිබූ පාසලට අපකීර්තියක් රැගෙන ඒම ගැන ඔහු මහත් ලැජ්ජාවටත්, කනගාටුවටත් පත්වනු ඇත.

දෙකම්මුල් දිගේ කඳුළු රූරා වැටෙද්දී, ග්‍රේලින් මහත්මිය වචනයක් හෝ කීමට පෙර ඈ තමාට හැඟෙන සෑම දේම කියන්න පටන් ගත්තා.

"මිස් ග්‍රේලින්, මට කනගාටුයි. අනේ මගේ තාත්තාට කියන්න එපා, අනේ. එයාට මම විතරයි ඉන්නේ. මිස් ග්‍රේලින්, අනේ මාව අස් කරන්න එපා. මම ආයෙත් කවදාවත් ඒ වගේ දෙයක් කරන්නේ නැහැ. තාත්තාට මාව විශ්වාසයි. මම පොරොන්දු වෙනවා. මට හිතාගන්න බැහැ, ඇයි මම එහෙම දෙයක් කළේ කියලා. මට තව එක අවස්ථාවක් ලැබුණොත් මම හොඳට වැඩ කරනවා, මිස් ග්‍රේලින්. ඇත්තමයි... අනේ මාව විශ්වාස කරන්න...!"

එක් වරක් දුටු පමණින්, ග්‍රේලින් මහත්මියට සැබෑ පසුතැවීම හඳුනාගත හැකියි. මේ කරදරයෙන් බේරීමට උත්සාහ කරන කෙනෙක් නොවෙයි. මේ තමා කළ දෙය නිසා තමන් ආදරය කරන කෙනෙකුට ඒ ගැන කුමක් සිතෙනු ඇති දැයි අවංකවම හැඟී, ඒ ගැන කම්පාවට

පත්ව අලුත් පිටුවක් පෙරළීමට උත්සාහ කරන කෙනෙක්. යහපත් ලෙස වෙනස් වීමට දැඩි ආශාවක් ඇති කෙනෙක්.

"මම කියන දේ මම කරලා ඔප්පු කරලා පෙන්වන්නම්." ඩියනා කියාගෙන ගියා.

ආයාචනා කරමින් කිලිටි ඇතින් මුහුණේ කඳුළු පිසින අතරේ ඇගේ මුහුණේ තව තවත් කුණු තැවරුණා.

"කැමති ඕනෑම දඬුවමක් මට දෙන්න. මම ඕනෑම දෙයක් කරන්නම්. ඒත් අනේ, තාත්තාට නම් කියන්න එපා. එයා නාවිකයෙක්. එයා පැනලා යන කෙනෙක් නෙමෙයි. එයා මා ගැන හුඟක් ලැජ්ජා වෙයි."

"පැනලා යාමෙන් අපි කාටවත් යහපතක් වෙන්නේ නැහැ." ග්‍රේලින් මහත්මිය බැරෑරුම් ලෙස කිව්වා. "එය බයගුල්ලන්ගේ වැඩක්. ප්‍රශ්නවලට මුහුණ දෙන එකයි වීරකම. ඔයාට කරන්න ඕනෑ මොකක්ද කියන එක හිතලා මම පස්සේ කියන්නම්. මට විශ්වාසයි මම මොනවා තීරණය කළත් ඔයා ඒවාට බය නැතිව මුහුණ දීලා පිළිගනියි කියලා."

විශාල කාමරයේ මුල්ලක වාඩි වී යමක් ගොතමින් සිටි පාලිකාව වෙතට ඇ හැරුණා.

"ඩියනාව එක්ක යනවාද?" ඈ කිව්වා. "එයාට ඉස්සරලාම නාන්න ඕනෑ. ඊළඟට පිරිසිදු ඇඳුම්. අද උදේ එයාව පන්තියට යවන්න එපා. ඔයාට පුළුවන් එයාගෙන් මොකක් හරි වැඩක් ගන්න. මේ කලබල අඩු වුණාට පස්සේ මම එයාට කතා කරන්නම්."

ශාන්ත, කරුණාවන්ත, ක්‍රියාශීලී පාලිකාව ගෙතුම ඇගේ මල්ලට දමා ගත්තා.

"එන්න, මගේ දරුවෝ." ඈ ඩියනාට කිව්වා. "මම ඉක්මනට ඔයා ගැන බලා ගන්නම්. මගේ ජීවිතේට, මේ තරම් කුණු තැවරුණ මුහුණක් තියෙන පළමු පන්ති ළමයෙක් මම දැකලා නැහැ. උණු වතුර ටිකක් නාලා, පිරිසිදු ඇඳුම් දා ගත්තාට පස්සේ ඔයාට ලොකු සනීපයක් දැනෙයි. ඊට පස්සේ ඔයාට පුළුවන් මගේ ඇඳුම් අල්මාරි පිළිවෙළ කරගන්න මට උදව් කරන්න. එතකොට ඔයාට වැඩක් තියෙනවා. වැඩ කරද්දී දඟ වැඩවලට හිත දුවන්නේ නැහැ."

ඇය කරුණාවන්ත ලෙස ඇරියගේ බාහුවෙන් ඇල්ලූ අතර බියනා සැනසුම් සුසුමක් හෙළුවා.

වචනයක් හෝ කතා කිරීමට බියෙන්, මේ මුළු කාලය පුරාම ජෝ නිහඬව සිටගෙන සිටියා. ග්‍රේලින් මහත්මිය ඇය දෙස බැලුවා.

"තව විනාඩි දහයකින් ඔයාගේ තාත්තා එයි කියලා මම බලාපොරොත්තුවෙන් ඉන්නේ. නැතිනම් ඔයාවත් තාන්න පිටත් කරන්න තිබුණා. ඒත් දැන් එයා එනතුරු බලන එක හොඳයි."

ජෝගේ හදවත ඉපිලුණා. දැන් ඇගේ පියා ඉක්මනින් එනු ඇති. ඔහු මේ ගැන කේන්ති නොගනු ඇත. ඔහුට මෙය විනෝදයක් වනු ඇත. මේ ගැන ඔහු හඬ නගා සිනාසී විහිළු කරනු ඇත. ඔහු තත්ත්වය සමථයට පත් කරනු ඇත.

ජෝ සැනසුම් සුසුමක් හෙළුවා.

"වාඩිවෙන්න." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ඔයාගේ තාත්තා ආවට පස්සේ අපි මේ අවාසනාවන්ත සිද්ධිය ගැන සාකච්ඡා කරමු. ඔයාලා හැංගිලා ඉන්නේ කොහේද කියන එක මට විල්ගෙනුයි, ක්ලැරිසාගෙනුයි දැන ගන්න ලැබුණ වහාම මම එයාව කැඳවලා පණිවිඩයක් දුන්නා."

ග්‍රේලින් මහත්මිය ලිපියක් ලිවීම ආරම්භ කළා. ජෝ නිහඬව වාඩි වී සිටියා. තමා මේ තරම් කිලිටි පාටට නොසිටියා නම් හොඳ යැයි ඇයට සිතුණා. ඇගේ කබායේ විශාල සිදුරක් තිබුණ අතර දණිස්වල කුණු තැවරී තිබුණා.

විනාඩි දහයකදී ඇවැන්ත මෝටර් රථයක් පාසල් මාවත ඔස්සේ පැමිණියා.

'තාත්තා...!' ජෝට සිතුණා. 'එයා ප්‍රමාද නැහැ.'

තිරිංග හඬ නංවමින් රථය නැවතුණා. රථයෙන් බැස්ස කෙනා මහත් හඬක් නගමින් දොර වසා ඇමුවා.

සේවිකාව ඉක්මනින්ම ජෝන්ස් මහතා කාමරයට කැඳවාගෙන ආවා. සතුටින් ඉපිලුණ සිනාවකින් යුතුව ඔහු ඇතුළට ආවා.

"එතකොට ඔයාලට පුළුවන් වුණා තක්කඩි කෙල්ලව හොයා

ගන්න, නේද?" ඔහු කිව්වා. "මේ ඉන්නේ...! මෙයා නම් මගෙයි කෙල්ලක් නේද, මිස් ග්‍රේලින්?"

"වාඩිවෙන්නකෝ." ග්‍රේලින් මහත්මිය අපූර්ව ශාන්ත බවකින් යුතුව කිව්වා. "මට අවශ්‍යයි මේ කාරණය ඔයත් එක්ක සාකච්ඡා කරන්න, මිස්ටර් ජෝන්ස්. අපි මේකේ බරපතළ පැත්තක් දකිනවා. අනේ මන්දා, වාසනාවකට මේ සිද්ධිය පත්තරවලට ගියේ නැත්තේ."

"ඔව්, ඒත් මේ බලන්න... මොකක්ද ඔය තරම් බරපතළ?" ජෝන්ස් මහතා හඬ නගා කතා කළා. "ඒක පොඩි විනෝදයක් විතරයි. ජෝ දඟකාර, ක්‍රියාශීලී කෙනෙක්. එයාගේ කිසිම වැරැද්දක් නැහැ...!"

"හුඟක් වැරදි තියෙනවා." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ඒ තරමටම. මිස්ටර් ජෝන්ස්, ඔයා අදම ජෝව ඉවත් කරගෙන යන එකයි මට අවශ්‍ය. අනික මට කනගාටුයි කියන්න, අපිට එයාව ආපහු ගන්න බැහැ. එයා මේ ඉස්කෝලයට කරන බලපෑම හොඳ නැහැ."

ජෝන්ස් මහතා ජීවිතයේ කිසි දිනක එවැනි හදිසි හා අප්‍රසන්න පුදුමයක් අත්විඳ තිබුණේ නැහැ. තම දෙසවන් ඇදහිය නොහැකිව විවර වූ මුවින් යුතුව ඔහු වාඩි වී සිටියා. ජෝ... ජෝව නෙරපනවා...! ඔවුන්ට අවශ්‍ය තමාට ජෝව ඉවත් කරගෙන යාම මිස ආපසු භාර දීම නොවෙයි. ඇයි...? ඇයි...?

ජෝ කම්පනයටත්, භීතියටත් පත් වුණා. කටේ කෙළ සිඳුණා. ඈ තම පියා දෙස මහත් කරගත් දෙනෙතින් බලා සිටියා. අන්තිමේ ඔහු කටහඬ අවදි කළා. ඔහු ගර්ජනා කරන්නට පටන් ගත්තා.

"ඔව්, ඒත් මේ බලන්න. එහෙම දෙයක් කරන්න බැහැ. කවුරුත් දන්නවා, ඒක පොඩි විනෝදයකට කරපු දෙයක්. මම පිළිගන්නවා ජෝ එහෙම නොකර ඉන්න තිබුණා කියලා. මේ වගේ කරදර නොකර ඉන්න වගේම, අනිත් දරුවාවත් කැන්දන් යන්නේ නැතිව ඉන්න තිබුණා. ඒත්... ඒත්... ඔයාලට බැහැ ඒ වගේ දෙයකට එයාව අස් කරන්න, ඇත්තෙන්ම...!"

"අපිට පුළුවන් ජෝන්ස් මහත්මයා. එයා ඉස්කෝලයට අයහපත් බලපෑමක් කියලා අපි හිතනවා නම්." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ඇත්තෙන්ම මේ වගේ දේවල් නිතර සිදුවෙන්නේ නැහැ. ඒක ඇත්ත. ඉතා කලාතුරකින් සිදුවන දෙයක්. නමුත් මේ සිද්ධියේදී ඒක ඇත්තටම

සිද්ධ වෙනවා. බලන්න.... මේක මේ පැතලා යාමේ සිද්ධිය විතරක් නොවෙයි. සල්ලි ටිකක් ගත්ත පොඩි කාරණයකුත් තියෙනවා."

ජෝ ඇතිත් සිය මුහුණ වසා ගත්තා. ඇයට එතැනම පොළොව පළාගෙන යන්නට සිතුණා. එහෙනම් ශ්‍රේලින් මහත්මිය මේ සියල්ල දන්නවා. ඇගේ පියා දැඩි විමතියට පත් බවක් පෙනුණා. නැගිට ගත් ශ්‍රේලින් මහත්මිය දෙස බැලූ ඔහුගේ කටහඬ වෙවුලන්නට වුණා.

"මොකක්ද ඒ කතාව...? ඔයාට කියන්න බැහැ මගේ ජෝ හොරක් කියලා. එහෙම කියන්න බැහැ. මම ඒක විශ්වාස කරන්නේ නැහැ. එයාට ඕනෑම වෙලාවක ඕනෑ තරම් සල්ලි තියෙනවා."

ශ්‍රේලින් මහත්මිය කිසිවක් කිව්වේ නැහැ. ඇය කළේ ඒ වන විටත් ඉදිරියට නැමී, දෑතින් මුහුණ වසාගෙන, ඇඟිලි අතරින් කඳුළු පෙරමින් සිටි ජෝව දැක්වීම පමණයි. ඇගේ පියා හොල්මනක් දුටු ළමක මෙන් මහත් වූ දෙනෙතින් ඇය දෙස බැලුවා.

"ජෝ...!" ඔහු කතා කළේ හදිසියේම ගොරෝසු වූ බැරෑන්ඩි කටහඬකින්. "ජෝ.... ඔයා හොරකම් කළේ නැහැ නේද? ඕ... හොරකම් කළේ නැහැ නේද? මට මේක අදහන්න බැහැ...!"

ජෝට හැකි වූයේ තම හිස සැලීමට පමණයි. අපොයි... අර එපාම කරපු සල්ලි. ඇගේ කලිසම් කකුලේ ඉහළ තවමත් ඉතිරිය තිබුණා. ඇය එහා මෙහා යන විට ඒවා 'සර සර' හඬක් නඟන බවට ඇයට ඇනී තිබුණා. හදිසියේම පහතට නැමුණු ඈ පවුමේ නෝට්ටුවක් හා සිලිං දහයක නෝට්ටුවක් පිටතට ඇද්දා. ඈ ඒවා ශ්‍රේලින් මහත්මිය ඉදිරියේ මේසය මත තැබුවා.

"මෙච්චරයි ඉතිරි වුණේ." ඈ කිව්වා. "ඒත් මම ඉතිරිය ආපහු දෙනවා."

"මම දෙන්නම් හැම දෙයක්ම. සෑම සතයක්ම... මම දෙගුණයක් දෙන්නම්." ජෝන්ස් මහතා පෙර වූ ගොරහැඬි කටහඬින් කිව්වා. "ජෝ ගැන හිතාගන්න බැහැ. මගේ ජෝ සල්ලි ගන්නවා?"

ලැජ්ජාවක් නැති ජෝ හා ඇගේ පියා පළමුව පුහු අහංකාර ලෙස හැසිරුණ ද ශ්‍රේලින් මහත්මිය දෙස දුකට හා අවාසනාවට පත්ව නිහතමානී බවක් පළ කරමින් බැලුවා. ඈ ඔවුන් දෙදෙනාටම අනුකම්පා කළා.

"මම හිතන්නේ තවත් වැඩිපුර යමක් කියන්න අවශ්‍ය නැහැ." ඈ ශාන්තව කිව්වා. "මේ ගැන ජෝගෙන් මට කිසිම දෙයක් අහන්න අවශ්‍ය නැහැ. ඔයාට කැමති නම් එයාගෙන් හැමදේම දැන ගන්න පුළුවන්. ඒත්... මේක හිතට ගන්න, මිස්ටර් ජෝන්ස්. මට තවදුරටත් ජෝව මෙහේ තියාගන්න බැහැ. එයාට මැලෝරි ටවර්ස්වල අපූරු අවස්ථාවක් තිබුණාට එයා ඒක ප්‍රයෝජනයට ගත්තේ නැහැ. අතික මම හිතනවා මම මේ ටිකත් කියන්න ඕනෑ කියලා. මේකට අඩක් වැරදිකාරයෝ එයාගේ දෙමව්පියෝ. ඔයාලා එයාට සහයෝගයක් හෝ එයාට අවශ්‍ය උදව් දුන්නේ නැහැ."

"ඔව්, ඔයා මාව නරක් කළා, තාත්තා...!" ජෝ ඉකිගසා හඬමින් කිව්වා. "ඔයා කිව්වා, මම පන්තියේ අන්තිමයා වුණාට කමක් නැහැ කියලා. ඔයා හැමදාම අන්තිමයා වුණා කිව්වා. ඔයා කිව්වා මට නීති පිළිපදින්න ඕනෙ නැහැ, මම කැමති නම් නීති කඩන්න කියලා. ඔයා කිව්වේ මම සතුටු ඕනෑම දෙයක් කරන්න කියලයි. ඒත් ඒක එහෙම හරියන්නේ නැහැ. ඒක වැරදියි...!"

ගල් ගැසුණු ජෝන්ස් මහතා නිහඬ වුණා. ඔහු හදිසියේම ග්‍රේලින් මහත්මිය දෙසට හැරුණා.

"මම පිළිගන්නවා ජෝ හරි කියලා." විමතියට පත් කටහඬකින් ඔහු කිව්වා. "ඒ වගේම මම පිළිගන්නවා, මම හරි විදිහට වැඩ කරලා තිබුණා නම් ඔයා ජෝට තව අවස්ථාවක් දෙන්න තිබුණා කියලා. ඒත් මමත් වැරදි කරලා තියෙනවා. එන්න ජෝ.... අපිට වැරදුණ තැන දැන්ම හදා ගන්න ඕනෑ. එන්න... අපි ගෙදර යමු."

ඔහු අත දිගු කළ අතර ඉකි ගසමින් ජෝ ඔහුගේ අත අල්ලා ගත්තා. ග්‍රේලින් මහත්මියට අත දිගු කළ ජෝන්ස් මහතා අනපේක්ෂිත ලෙස නම්බුකාර ලෙස කතා කළා.

"ආයුබෝවන්, මිස් ග්‍රේලින්. මම පිළිගන්නවා. ඇත්තටම වැරදිකාරයා මම. ජෝ නෙමෙයි. ඔයා අර කාරණය පැතිරෙන්න ඉඩ දෙන්නේ නැහැ නේද? ඒක ජෝගේ නමට හොඳ නැහැ. මම කිව්වේ සල්ලි සම්බන්ධ සිද්ධිය..."

"ඇත්තෙන්ම නැහැ." අතට අත දෙමින් ග්‍රේලින් මහත්මිය කිව්වා. "ඒ වගේම මිස්ටර් ජෝන්ස්, ඔයා යාළුවෝ එක්ක දඩබ්-බරකම් ගැන මොනවා කතා කළත් මම විශේෂයෙන්ම කියන්නේ

ජෝ සම්බන්ධයෙන් මේක විහිළුවක් කරගන්න එපා. මේක බරපතළ කාරණයක්. හොඳට හෝ නරකට මේක එයාගේ ජීවිතයට එක කඩඉමක්. අනික එයාට අයිතියක් තියෙනවා තමන්ගේ දෙමව්පියෝ එයාට හරි පාර පෙන්වයි කියලා බලාපොරොත්තු වෙන්න."

ඊළඟ මිනිත්තු කීපයේදී ඇවැන්ත මෝටර් රථය හඬ නංවමින් පාසල් මාවතේ පහළට ඇදී ගියා. ජෝ යන්න ගියා.... මැලෝරි ටවර්ස් වෙතින් සදහටම යන්න ගියා. එක් පරාජිත චරිතයක්. සමහර විටෙක දෙමව්පියන්ගේ නිසි සහයෝගය ලැබුණහොත් දිනක සාර්ථක විය හැකි චරිතයක්.



'දෙමව්පියන් මොන තරම් වැදගත් වෙනවා ද?' ග්‍රේලින් මහත්මිය සිතුවා. 'මම හිතන්නේ දෙමව්පියන්ටත් කවුරු හරි ඉස්කෝලයක් ආරම්භ කළා නම් හොඳයි...!'

ඩියනා පාසලින් නෙරපුණේ නැහැ. ඇගේ එකම ව
දුර්වලකම වූ අතර එය හරි ගස්සා ගැනීමට අවස්ථාවක් තිබුණා. ඇය
තව දුරටත් රැඳී සිටීමට හැකියාව ඇති බව දැනගත් මොහොතේ
ගයා නැටීමට තරම් ඇයට සිතුණා. ජෝ පිළිබඳව ඇය කම්පනය
පත් වුව ද ජෝගේ බලවත් පාලන අධිකාරියෙන් නිදහස් වීම ගැ
ඈ රහසින් සතුටු වුණා.

මුළු පාසලම කම්පනයට පත් වුණා. පාසලින් ඇරියක නෙරප
යැවීම ඉතා කලාතුරකින් සිදුවන්නක්. එහෙත් ජෝ තවදුරටත් තබ
ගැනීමට නොහැකි බව හැමෝම පිළිගත්තා.

මේ අතර ඊළඟ උදයේ මුහුදේ පිහිනීමට යාම සඳහා මුහු
රළ සුදුසු තත්ත්වයේ ඇති බව අමන්දා තීරණය කළා. ඈ මහ
උද්‍යෝගයෙන් කල් බලමින් සිටියා. අවසානයේ දීර්ඝ පිහිනීමක්...!

තවත් තිදෙනෙකු සමග ඈ සිටියේ හය පන්තියේ කුඩා නිදා
කාමරයකයි. අනෙක් සියලුදෙනා සුව නින්දේ පසු වුණා. මොරිය
සැලී හා විල්, ඔවුන් අවදි නොකර ඇයට පහසුවෙන්ම පැන ගැ
හැකියි. ඇය කරන්නට යන දෙය හෝ පිහිනීමට ගිය පසු ඇය කළ දෙ
හෝ කිසිවෙකු සමග කීමට ඇයට අදහසක් තිබුණේ නැහැ. ඔවුන් නීති
ආරක්ෂා කිරීමට තදින් බැඳී සිටියා. එහෙත් එවැනි නීතිවලට නිය
ඔලිම්පික් ක්‍රීඩිකාවක නවතාලිය නොහැකි බව අමන්දා සිතුවා.

උදැසන හතර හමාර වන විට ඈ අවදි වුණා. එම හිමිදිරියේ අහ
රිදී පාට එළිවලින් බැබළුණා. හිරු නැග එත්ම එය රෝස පැහැයට හ
රන්වන් පැහැයට හැරෙනු ඇත. එය දිව්‍යමය දවසක්...!

ඇඳුම් දමා ගත් ඈ නිහඬව පහළට බැස්සා. පාසලේ කිසි
තැනකින් ඇහෙන තරමේ ශබ්දයක් නැගුණේ නැහැ.

ඉක්මනින් තටාකය පසෙකින් සිටගෙන සිටි අමන්දා තම ඇඳුම්
උනා දමමින් සිටියා. ඈ පිහිනුම් ඇඳුම් යටට ඇඳ සිටියා. පළමු

ඈ තටාකයට පැන දෙවරක් ගිලුණා. ඉතා කදිමයි. ඇගේ ශක්තිමත් බාහුවලින් ජල කඳ හරහා පහර වැදුණ අතර ඇගේ ශක්තිමත් සිරුර ඒ හරහා ඇදී ගියා. උඩුබැලි අතට හැරුණ ඈ පාවෙමින් තමා ඔලිම්පික් තරගවලට සහභාගී වන ඊළඟ අවුරුද්ද ගැන සිහින මැව්වා. රැස්ව සිටින පිරිස සිහිනෙන් දැක ගත් ඇයට මිනිසුන්ගේ ප්‍රීති ඝෝෂා හා අත්පොළසන් හඬ ඇසෙන්නට වුණා.

එය ඉතා ප්‍රියජනක පින්තූරයක්. අමන්දා එය රසවින්දා. අනතුරුව තටාකයෙන් පිටතට පැමිණි ඈ පහළ ගල් කුළු අද්දරට බැස ගියා. වෙරළ ඔබ්බෙහි ඈත දියඹ නිසංසල බවක් ගත්ත ද රළ ගෙඩි පැමිණ මහත් වේගයෙන් ගල් කුළු මත හැපුණා. අමන්දා ඈත දීප්තිමත් මුහුද දෙසත්, අහස දෙසත් බැලුවා. ගල් කුළු අතර ගැඹුරු ස්ථානයට පැන කිමිදුණ අමන්දා ඇළක් ඔස්සේ පිහිනා විවෘත මුහුදට අවතීර්ණ වුණා.

'අන්තිමේදී...' බාහුවලින් දිය දෙබෑ කරමින් දෙපා පහරවලින් ඍජුව ඉදිරියට ඇදෙමින් අමන්දා සිතුවා. 'අන්තිමේදී... මම ඇත්තටම පිහිනනවා.'

ඈ තමා සැලසුම් කර තිබූ දිශාවට පිහිනුවා. අහසේ මඳක් ඉහළට නැගුණ හිරු බැබළුණා. එය උණුසුම් දිනයක් බවට පත් වෙමින් තිබුණා. දිය මත තැන තැන හිරු එළියෙන් දිලිසුණා. අමන්දා සතුටින් හිනැහුණා. ඈ තව තවත් ඉදිරියට පිහිනුවා.

ඇය පිටව යනු කිසිවෙක් දුටුවේ නැහැ. කිසිවෙකු හිමිදිරියේ දිය නෑමට පැමිණීමට පෙර ආපසු යෑමට ඈ සැලසුම් කර තිබුණා. ඒ සඳහා උදෑසන හතවත් විය හැක. ඇයට සෑහෙන තරම් කාලය තිබුණා.

එහෙත් එදින උදයේ හතට පෙර කෙනෙක් පහළ තටාකය වෙත ආවා. උදේම අවදි වූ ජූන්ට නැවත නින්දට යා නොහැකි වුණා. හිරු එළිය කෙළින්ම ඇගේ මුහුණේ පතිත වුණා. ඈ ඔරලෝසුව දෙස බැල්මක් හෙළුවා. අපොයි... සූදානම් වන සීනුව නාද වෙන්න තව කල්පයක් තියෙනවා. ඇඳ මත වාඩි වූ ඈ උඩු කබාය අතට ගත්තා.

'පහළට ගිහින් මම පිහිනනවා.' ඈ සිතුවා. 'විකාර කරන්නේ නැතිව හොඳට පිහිනනවා. අමන්දා එක්ක රණ්ඩු වුණාට පස්සේ

මම හරියට පිහිනුවේ නැහැ. එයා කියලා දුන්න ඒවා මතකද කියලා උත්සාහ කරලා බලන්න ඕනෑ.'

තරප්පුව දිගේ නිහඬව බැස ගිය ඈ හිරු එළියෙන් නැහැවුණු පිට්ටනියට ළඟා වුණා. ඉක්මනින්ම තටාකය වෙතට ගිය ඈ වේළෙන්නට දමා තිබූ ඇගේ පිහිනුම් ඇඳුම් රැගෙන ඒමට ගියා. ඇඳුම් ඇඳ ගත් ඈ කදිමට කිමිදුම් පිම්මකින් තටාකයට පැන්නා.

හුදෙකලාව පිහිනීමට තටාකය ඉතා සතුටු උපදවන සුන්දර තැනක් වුණා. ටික වේලාවකින් එය සෙනඟ පිරුණ තැනක් වනු ඇත. ජූන් අලස ලෙස දිය මත පා වුණා. අනතුරුව ඈ පිහිනන්නට පටන් ගත්තා. ඔව්, අමන්දා ඇයට උගන්වා තිබූ සෑම දෙයක්ම ඇයට මතක තිබුණා. ඇගේ කුඩා සිරුර මාළුවෙකුගේ මෙන් නම්‍යශීලී වූ අතර ඈ වේගයෙන් දිය කඳ හරහා ඇදී ගියා. ඇඩී ලෙස මහන්සි දැනෙන තුරු ඈ ඉහළ පහළ පිහිනුවා.

අව්ව තපිමින් විවේකයක් ගැනීමට ඈ පිටතට පැමිණියා. වෙරළ පහළට බැස මුහුදු ඉවුරේ ගල් කුළු මත වාඩි වී රළ පහර ඇඟට විසිවෙන සේ සිටීමට ඈ තීරණය කළා. මෙසේ පහළට බැස්ස ඈ රළ බිඳී විසිරෙන ජලය දෙපාවල වදින තරමට උස් වූ ගල් කුළක් මත වාඩි වුණා.

අලසකමින් ඈ ඈත මුහුද දෙස බැලුවා. කොතරම් චමත්කාරජනක නිල් පැහැයක් ද? නිල් කටරොළු මල් පාට ඇයට සිතුණා. ඒ සමගම හදිසියේම, තරමක් ඈත මුහුදේ ඉහළ පහළ යන කළු තිතක් ඇගේ නෙත ගැටුණා. සැඟවුණු ගල් කුළක් පෙන්වීමට සවි කර ඇති බෝයාවක් ද? මින් පෙර කිසිදින ජූන් එය දැක තිබුණේ නැහැ.

ඉන්පසු සුදු අතක් වැනි යමක් එසවෙනු ඈ දුටුවා. ඈ වහා නැගිට ගත්තා. මගෙ දෙයියනේ... ඒ පිහිනන කෙනෙක්. ඈත දියඹේ, දිය පහරකට අසුව ගල් කුළුවල හැපීමෙන් බේරීමට පලක් නැති උත්සාහයක යෙදෙමින් පිහිනන කෙනෙක්.

හදවත වේගයෙන් ගැහෙද්දී ජූන් ගල් ගැසී සිටගෙන සිටියා. ඈ උනන්දුවෙන් බලා සිටියා. ඒ ගැහැනියෙකු ද පිරිමියෙකු ද හඳුනා ගැනීමට නොහැකි වුව ද කවුරුන් හෝ පිහිනන කෙනෙක්. තමා දිය පහරකට අසුව ඇති බවත්, ඉහළට එසවී වේගයෙන් ගල් කුළු මත හැපෙන රළ සමග තමා ඇදී යන බවත් ඔහු හෝ ඇය දන්නේ ද?

ඔව්, අමන්දා එය දැන සිටියා. ඇයට පහළින් ඇති බලවත්, වේගවත් සැඩ පහර ඇයට දැනුණා. එය පිහිනුම්කරුවන් දහයකට නොව විස්සකට ද වඩා ප්‍රබලයි. එය සමා විරහිතව ඇයව ඇදගෙන යමින් සිටි අතර ඇය කොතරම් එයට එරෙහිව පිහිනුව ද ඇය විරුද්ධ දිශාවට ගසාගෙන යමින් සිටියා.

අමන්දා හොඳටම හෙම්බත් වී සිටියා. බොහෝ වේලාවක් කුරිරු සැඩ පහරට එරෙහිව සටන් වැදී සිටි ඇගේ සියලු ශක්තිය වැය වී තිබුණා.

කඩතොලු සහිත ගල් කුළු වියරුවෙන් මෙන් දැක ගත් ඇයට ඒවා ගැන අනතුරු අඟවා තිබූ බව සිහිපත් වුණා. වියරු රළක් ඇයව ඔසවා ගෙන ගොස් ඒ මත පතිත කළහොත් ඇයට අවස්ථාවක් ඉතිරි නොවනු ඇත. ඇයව කැබලිවලට කැඩෙනු ඇත.

පිහිනුම්කරු රළ පහරට එරෙහිව පිහිනන්නට උත්සාහ කරනු ජූන් බලා සිටියා. ඉන් පලක් නොවන බව ඈ දැන සිටියා. ඇය කුමක් කරන්න ද? ඇයට ආපසු පාසලට දිව ගොස්, අනතුර ගැන කියා, ඔවුන් මගින් දුරකථන ඇමතුමක් දී ආධාර ලබා ගැනීමට ඇයට කාලයක් තිබේ ද? නැහැ, ඇයට කාලයක් තිබුණේ නැහැ.

පිහිනුම් ඇඳුම පිටින්ම ඈ කුඩා බෝට්ටු මඩුව වෙතට වේගයෙන් දිව ගියා. එය තිබුණේ වෙරළේ ගල් කුළු නැති හා රළ පහර වදින්නේ නැති ස්ථානයකයි. යතුර සොයා ගත් ජූන් දොර අගුළු හැර කුඩා බෝට්ටුවක් පිටතට ඇද්දා. එය මුහුද රළු නැති දිනවල, බෝට්ටුකාරයා, ටොම් පොලඹවා ගෙන දැරියන් මුහුදේ පදින වර්ගයේ එකක්.

කුඩා බෝට්ටුවක් වුව ද මෙය ඉතා බර විය. ජූන් එය ඇද නැවත රළ එන මානයට තල්ලු කළා. අවසානයේ රළත් සමග එය මුහුදට ඇදුණා. එතුළට පැන ගත් ජූන් හබල් අල්ලා ගත්තා. ඇය හැකි උපරිම වේගයෙන් බෝට්ටුව පදින්නට වුව ද ඉක්මනින්ම හති වැටීම නිසා වේගය අඩාල වුණා. පිහිනුම්කරු සොයමින් ඈ වටපිට බැලුවා.

ඔහු එපිටින් සිටියා. නැහැ, තෙතබරිතව එල්ලෙන කොණ්ඩයක් ඇති නිසා ඒ ගැහැනු කෙනෙකු විය යුතුයි. මොන මෝඩියක් ද? මේ වන විට පිහිනුම්කාරිය ගල්පර ආසන්නයටම ගසාගෙන යමින් සිටිනු දැක භීතියට පත් ජූන් හැකි වෙර යොදා හබල් ගැසුවා.

වාසනාවකට මෙන් මුහුද නිසල වූ අතර ගල්පර මත සුපුරුදු ලෙස වේගයෙන් හැපෙන කුරිරු රළ එතරම් චණ්ඩ වූයේ නැහැ. ජූන් පිහිනුම්කාරියට කෑ ගැසුවා.

"ඔයි... මෙහේ, ඔයි....!"

පිහිනුම්කාරියට ඇසුණේ නැහැ. ඒ වන විට අමන්දා හොඳටම හෙම්බත් වී සිටියා. ඇගේ බාහු යන්තම් එහේ මෙහේ වැදුණා. තවදුරටත් ඇයට සැඩ පහර හා සටන් කළ නොහැකි වුණා.

"ඔයි....!" ජූන් නැවත මොර දුන්නා.

මෙවර අමන්දාට ඇසුණා. ඈ හිස හැරෙව්වා. බෝට්ටුවක්...! ඕ... මොන තරම් ආශිර්වාදාත්මක, චමත්කාර දර්ශනයක් ද? එහෙත්, වෙලාවට ඇයට එය වෙත ළඟා වීමට හෝ එයට ඇය වෙත ළඟා වීමට හැකි වෙයි ද?

බෝට්ටුව ඉදිරියට ආවා. වේගයෙන් නැගුණ රළක් හදිසියේම අමන්දා එහි ග්‍රහණයට ගෙන ශක්තිමත්ව ඔසවා ඇයව ඉදිරියට විසි කළා. දිය යට සැඟවුණු ගල්පරයක ඇගේ පාදය ගැටෙද්දී ඈ මහත් වේදනාවෙන් කෑ ගැසුවා.

'දෙවියනේ... තව ටිකෙන් එයා ගල් උඩට වැටෙනවා.' වියරු වැටුණ ජූන්ට සිතුණා.

උමතුවෙන් මෙන් බෝට්ටුව පැද්ද ඈ අවසානයේ පිහිනුම්කාරියට ළඟා වුණා. ඒ වන විට අතපය සොලවා ගැනීමට නොහැකි වූ ඇය පිහිනීම අතහැර පාවී යමින් සිටියා.

බෝට්ටුවේ පැත්තකට ගිය ජූන් ඇයව අල්ලා ගැනීමට නැඹුරු වුණා.

'මේ අමන්දා....' මහත් විමතියෙන් උපන් කම්පනයෙන් යුතුව ජූන්ට අවබෝධ වුණා. 'හරි, කවුද හිතන්නේ මෙයා මේ තරම් මෝඩියක් කියලා.'

හාස්කමකින් මෙන් රළ නැගුම විනාඩියකට දෙකකට නතර වූ අතර ජූන් අමන්දාව ඇද්දා.

"එන්න.... අල්ලාගෙන ඉස්සෙන්න...!" ඈ කෑ ගැසුවා. "ඉස්සිලා ඇතුළට එන්න....!"

අමන්දා බෝට්ටුව තුළට පැමිණියේ කෙසේ දැයි ඇයම දන්නේ නැහැ. ජූන්ට ද එය කියන්නට මතකයක් නැහැ. අමන්දාගේ දරුණු ලෙස තුවාල වූ අත් පා ඇතිව එය කළ නොහැකි දෙයක් ලෙස පෙනුණා. එහෙත් කෙසේ හෝ එය සිදු වූ අතර අන්තිමේදී ඇඩී සේ විඩාපත්ව, වේදනාවෙන් වෙවුලමින් ඈ බෝට්ටු පතුලේ වැතිර සිටියා. ඇඩී ආයාසයකින් 'ස්තුතියි' පමණක් කී ඇයට ඊට එහාට වචනයක් හෝ කෙඳිරීමට නොහැකි වුණා.

දැන් තමාට සැඩ පහරට එරෙහිව බෝට්ටුව පැදවීමට සිදුව ඇති බව ජූන්ට පෙනුණා. ඒ වන විට ඇඩී වෙහෙසට පත්ව සිටි ඇයට එය කළ නොහැක්කක් ලෙස පෙනුණා. එහෙත් ආධාර තිබුණේ වැඩි දුරක නොවෙයි. උදයේම නෑම සඳහා පැමිණි පිරිසක් බෝට්ටුවක් දැක තිබූ අතර එක් හතර පන්ති දැරියක් දුරදක්නයක් ද රැගෙන විත් තිබුණා. බෝට්ටුව අනතුරට පත්වන්නට යන බව දුටු වහාම, බෝට්ටුකරු ටොම්ට, පණිවිඩයක් යැවුණා. මේ වන විට ඔහුගේ කුඩා මෝටර් බෝට්ටුව වේගයෙන් ගලවා ගැනීමේ කාර්යය සඳහා ඇදෙමින් තිබුණා.

විඩාවට පත්ව සිටි දැරියන් දෙදෙනාව ඉක්මනින්ම ගොඩට ගෙන එනු ලැබුවා. දුරදක්නයෙන් ජූන්ව හඳුනා ගනු ලැබූ වහාම නේවාසිකාගාර පාලිකාව කැඳවනු ලැබ තිබුණා. අමන්දා බෝට්ටුව පතුලේ වැතිර සිටි නිසා කිසිවෙකු මුලදී ඇයව දැක තිබුණේ නැහැ. ඔවුන්ව වට කර ගත් දැරියෝ භීතියෙන් කෑ ගැසුවා.

"ඕ..... අර බලන්න. අමන්දාගේ කකුලයි, අතුයි. ඕ... හරිම දරුණුයි."

ආරංචිය ලැව් ගින්නක් සේ පාසල පුරා පැතිරුණා...!

"අමන්දා මුහුදේ පිහිනන්න ගිහින් සැඩ පහරකට අහු වෙලා...! ජූන් තටාකයේ පිහිනන්න ගියාට පස්සේ එයාව දැකලා. ජූන් පොඩි බෝට්ටුවක ගිහින් එයාව බේරගෙන. ඒත් අමන්දාට හොඳටම තුවාලයි.

"බලන්නකෝ, ජූන් බේරාගෙන තියෙන්නේ එයාගේ ලොකුම තරහකාරී." පහළ පන්තිවල දැරියෝ කිව්වා. "අසරණ ජූන්...! එයාට නැගිටින්නවත් පණ නැහැ කියලා මේට්‍රන් කියනවා. ඒ දෙන්නාම අසනීප කාමරයේ."

ජූන් ඉක්මනින් සුවය ලැබුවා. ඇය දැඩි සේ වෙහෙසට පත්ව තිබූ අතර හදිසියේ ඇති වූ බලවත් ත්‍රාසයෙන් පැය කීපයක් යන තුරු කම්පනයට පත්ව තිබුණා. අනතුරුව හදිසියේ නැගිට වාඩි වූ ඇ තමාට සුවයක් දැනෙන බවත්, අමන්දාව බැලීමට යාම අවශ්‍ය බවත් කිව්වා.

"තවම බැහැ." පාලිකාව කිව්වා. "නිදාගෙන ඉන්න. මේ වගේ දක්ෂ ජීවිත ගැලවුම්කාරියකට තදින් කතා කරන්න මම කැමති නැහැ. ඒත් කියන දේ අහන්නේ නැති නම් මට එහෙම කරන්න වෙනවා. එයා ඇත්තටම අමන්දාගේ ජීවිතය බේරුවා."

"අමන්දාට කොහොමද?" ජූන් ඇසුවේ අමන්දාගේ තැළුණු, පොඩි වුණු, ඉදිමුණු, කැපුම් සහිත අත් පාවල තුවාල සිහි වී වවුලමිනුයි.

"එයාට ඒ තරම් හොඳ නැහැ." පාලිකාව කිව්වා. "අත්වල වාල ඒ තරම් නරක නැහැ. ඒත් කකුලේ මස්පිඬු දරුණු විදිහට රිලා. ගලක හැපිලා මම හිතන්නේ."

ජූන් නිහඬව වැතිරුණා.

"මෙට්‍රන්, එතකොට ඒ කියන්නේ අමන්ඩාට මේ වාරයේ පිහිනන්නවත්, සෙල්ලම් කරන්නවත් බැහැ?"

"ඊට වැඩි දෙයක් වෙන්නත් පුළුවන්." පාලිකාව කිව්වා. "ජේෂින් හරියට හැදිලා, හොඳට සනීප වුණේ නැතිනම් මේක එයාගේ හැම ක්‍රීඩාවකම අවසානය වෙන්න පුළුවන්."

"ඒත්, ලබන අවුරුද්දේ ඔලිම්පික්වලට යන්නයි අමන්ඩා බලාගෙන හිටියේ." ජූන් කිව්වා. "එයා ඒකට හුඟක් හොඳයි, මෙට්‍රන්."

"මම ඒ හැමදේම දන්නවා." පාලිකාව කිව්වා. "සිද්ධ වුණේ නරක දෙයක්, ජූන්. කෙනෙකුට ශක්තිය, ශරීර සෞඛ්‍ය එක්ක ක්‍රීඩාවලට හොඳ හැකියාවක් ලැබිලා තියෙද්දී, එක පැයක තහනම් සතුටක් විඳින්න ගිහින් ඒ හැමදේම නැතිකර ගන්නවා නම් ඒක අවාසනාවක්. දැන් ඒ අහිංසක කෙල්ල වැතිරිලා ඉඳගෙන මොනවා හිතනවා ඇතිද කියන එක ගැන මම හිතන්නවත් කැමති නැහැ."

ජූන් ද ඒ ගැන හිතීමට කැමති වුණේ නැහැ. අමන්ඩාට එය කොතරම් බිහිසුණු ද? මේ සියල්ල තමා විසින්ම කර ගත් දේවල් ලෙස සිතන එක තවත් බිහිසුණු සිතුවිල්ලක් වනු ඇත.

"මට ගිහින් අමන්ඩාව බලන්න පුළුවන් ද?" හදිසියේම ඈ පාලිකාවගෙන් ඇසුවා.

"අද බැහැ." පාලිකාව කිව්වා. "අනික, මම මේ කියන දෙය අහගන්න, ජූන්. මම දන්නවා අමන්ඩායි, ඔයයි අතර තියෙන ගැටුම. කවුරු හරි ද, කවුරු වැරදි ද කියන එක මට වැඩක් නැහැ. ඒ ළමයට උදව් උපකාරයි, අනුකම්පාවයි ඕනෑ වෙනවා. ඔයාට ඒ විදිහේ දෙයක් කරන්න බැරි නම් ගිහින් එයාව බලන්න එපා. ඔයා එයාගේ ජීවිතය බේරා ගත්තා. ඒක ශ්‍රේෂ්ඨ දෙයක්. දැන් ඔයාට තියෙන්නේ තව සුළු දෙයක් කරලා එයා එක්ක එකතු වෙන්න."

"මම එහෙම කරනවා." ජූන් කිව්වා. "ඔයා නම් බණ කියන්න හරිම හොඳ කෙනෙක්, මෙට්‍රන්. මට හිතාගන්න බැහැ මම ඔයාට කැමති ඇයි කියලා."

"ඒක අන්‍යෝන්‍ය බැඳීම." පාලිකාව කිව්වා. "දැන් කරුණාකරලා නිදා ගන්නවාද?"

අවසානයේ ඇඳෙත් බැස පාසලට නැවත ගිය පසු තමා වීරවරියක බවට පත්ව ඇති බව ජූන්ට වැටහුණා. ඇය තරමක් අපහසුවෙන් පොදු කාමරය වෙත එද්දී නැඟුණ ප්‍රීති ඝෝෂා ඇසීමෙන් හදිසියේම තරමක ලැජ්ජාවක් දැනුණා. සූසන් ඇගේ පිටට තට්ටු කළා. ෆෙලිසිටි ඇගේ දකුණු අත ඉහළ පහළ අත ගාද්දී නෝරා ඇගේ වම් අත ස්පර්ශ කළා.

"අනේ.... අපේ ජූන්...!" දැරියෝ ගායනා කළා. "අනේ... අපේ ජූන්...!"

"කට වහගන්න." ජූන් කිව්වා. "මොකක්ද ලොකු ආරංචිය? මට හිතෙන්නේ මම හුඟක් කල් ඇත්වෙලා හිටියා වගේ. හයේ පන්තියේ විජ්ජාව කළා ද?"

"අපොයි දෙවියනේ, නැහැ...!" අපි කල්පනා කර කර හිටියේ ඔයයි, අමන්දයි ගැන....!" ෆෙලිසිටි කිව්වා. "විජ්ජා ගැන එක මොහොතකටවත් මතක් වුණේ නැහැ. ඒත් දැන් අපිට කරන්න ඕනෑ ඔයාගේ නිර්භීතකම සමරන්න...!"

"බූරු කතා නොකියා ඉන්නවා නම් හොඳයි." ජූන් කිව්වා. "අහම්බෙන් මම එතෙන්ට ගියාට පස්සේ අමන්දා කරදරේ වැටිලා ඉන්නවා දැක්කා විතරයි. වෙන කෙනෙක් වුණත් ඒ දෙයම කරන්න තිබුණා."

එහෙත් දෙවැනි පන්තියේ දැරියෝ ජූන් කෙරෙහි ඔවුන්ට වූ ආඩම්බරය සැඟවූවේ නැහැ. ඇලිසියා ද සතුටටත්, ආඩම්බරයටත් පත්ව සිටියා. තම ඥාති සොහොයුරිය සොයා පැමිණි ඈ ජූන්ගේ පිටට තට්ටු කළා.

"හොඳ වැඩක්, ජූන්...!" ඈ කිව්වා. "ඒත්... අමන්දාට ඒක හරි අවාසනාවක්, නේද? වාරයේ ඉතිරි ක්‍රීඩා තරගවලට වඩා ලබන අවුරුද්දේ ඔලිම්පික් තරගවලට යන්න අවස්ථාව නැතිව යයි."

අමන්දාගේ අහංකාරකමටත්, තම ශක්තිය ගැන ඇගේ නිරන්තර පුරසාරම්වලටත් මේ සිදු වූ දෙය ඇයට 'හොඳ වැඩේ' යි කිසිවෙකු කීවේ හෝ සිතුවේ නැහැ. පහළ පන්තිවල කිසිවෙකු හෝ අමන්දාට ඇලුම් නොකළ ද ඔවුන් කිසිවෙක් පවා එසේ කතා කළේ නැහැ. ඇගේ අවාසනාව හේතුවෙන් ඔවුන්ගේ අනුකම්පාව ඉපදුණා.

අමන්දාට සිදු වූ දෙය රහසින් හෝ සතුටු වීමට සිතුවේ නම් ඒ ප්‍රංශ ඇරිය, සූසේන්. සූසේන් අමන්දාගේ දරදඬු හැසිරීම ප්‍රිය කළේ නැතුවා පමණක් නොව අමන්දා ද සූසේන්ව රිස්සුවේ නැහැ.

අමන්දා දිගු දුර පිහිනීමට ගියේ මන්දැයි පමණක් නොව සූසේන්ට තේරුම් ගත නොහැකි වූයේ එතරම් දිගු කලක් ක්‍රීඩාවලින් ඉවත්ව සිටීමේදී ඇතිවන කලකිරීම ද ඇයට තේරුම් ගත නොහැකි වුණා.

ජූන්ගේ වචනය මෙන්ම ක්‍රියාව ද හොඳයි. අවසර ලත් වහාම සීනි කැට යෙදූ ඉඟුරු විස්කෝතු ද රැගෙන ඈ අමන්දා බැලීමට ගියා.

"හලෝ අමන්දා...!" ඈ කතා කළා. "දැන් කොහොමද?"

"හලෝ ජූන්...!" තවමත් විඩාබරව සුදුමැලිව සිටි අමන්දා කිව්වා. "ඕ... මේ... විස්කෝතුවලට ස්තුතියි."

පාලිකාව කාමරයෙන් පිටතට ගියා. අමන්දා ඉක්මනින් ජූන් දෙසට හැරුණා.

"ජූන්, මට හරියට කෙනෙකුට ස්තුති කරන්න තේරෙන්නේ නැහැ. ඒත් ඔයා කරපු හැමදේමට ස්තුතියි. මට ඒක කවදාවත් අමතක වෙන්නේ නැහැ."

"දැන්, මම තව දෙයක් කියන්නම්." ජූන් කිව්වා. "අපි දෙන්නාම වෙනුවෙන් මම මේක කියන්නේ. ඊට පස්සේ අපි ඒක අමතක කරලා අමු. පුහුණුවීම්වලදී අපි දෙන්නාම මෝඩකම් කළා. අපි දෙන්නාම... රණ්ඩුව ඇති නොවුණා නම් හොඳයි කියලා හිතුණාට දැන් ඒක වෙලා ඉවරයි. ඇත්තටම සීයට පනහ පනහ. අපි ඒක අමතක කරමු."

"ඔයාට කණ්ඩායම් දෙකේම ඉන්න තිබුණා." පසුතැවිල්ලෙන් යුතුව අමන්දා කිව්වා.

"මම ඒක කරනවා." ජූන් කිව්වා. "මම ඒක හිතාගෙනමයි ඉන්නේ. මම ආයෙත් හොඳටම පුහුණු වෙනවා. ඔයා විශ්වාස කරනවාද, හැමදාම මොරියා මට පිහිනන්න වෙලාව දීලා තියෙනවා වගේම හැම හවසකම මට ටෙනිස් පුහුණුවට උදව් කරනවා...!"

අමන්දා එකවරම බැබළුණා.

"ඒක හොඳයි." ඈ කිව්වා. "ජූන්, මම මේවා ඒ තරම් ගණන් ගන්නේ නැහැ. හැමදේකින්ම අයින් වෙලා ඉන්න එක. ඔයාව කණ්ඩායම්වලට තේරෙනවා නම් මම නැති එක පාඩුවක් කියලා මම හිතන්නේ නැහැ."

"හරි." ජූන් කිව්වා. "මම උපරිම උත්සාහ කරනවා."

"අනික තව දෙයක් තියෙනවා." අමන්ඩා කිව්වා. "මට නැගිටින්න අවසර ලැබුණු වහාම මම කාලය ගත කරන්නේ පහළ පන්ති පුහුණු කරමින්. මගේ කකුලට ප්ලාස්ටරය දැම්මාට පස්සේ මට කොර ගහ ගහ එන්න පුළුවන්. මට සෙල්ලම් කරන්න එන්න බැරි වුණත් අඩුම තරමේ අනිත් අය හොඳින් සෙල්ලම් කරන හැටි බලා ඉන්න පුළුවන්."

"හරි." ජූන් කිව්වා. "දිනන්න පුළුවන් අය කීප දෙනෙක් මම ඔයාට හොයලා දෙන්නම්, අමන්ඩා. ඔයා එයාලව බලා ගන්න."

"යන්න වෙලාව හරි, ජූන්." පාලිකාව නැවත කඩිනමින් ඇතුළට එමින් කිව්වා. "ඔයාගේ දෙඩවිලිවලින් අමන්ඩාට මහන්සි ඇති. ඒත්... අපොයි, මෙයා සතුටින් බබළනවා...! ඔයා තව සැරයක් එන්න, ජූන්."

"මම ආයෙත් එනවා." සිනාවක් පා සමු ගනිමින් ජූන් කිව්වා. "අමන්ඩාගේ ඔක්කොම බිස්කට් ටික ඔයා කන්න එපා, මේට්‍රන්. මම ඔයාගේ කපටිකම් දන්නවා."

"එපාම කරපු කපටි, තක්කඩි කෙල්ල...!" පාලිකාව ලොකු පනාවක් ඔසවා ජූන්ට පසුපසට මිත්‍රශීලීව පහරක් දීමට දිව එමින් කිව්වා.

එහෙත් ඒ වන විට ජූන් පැන ගොස් තිබුණා. පාලිකාව පනාව ආපසු තැබුවා. අමන්ඩා මහත් සොම්නසින් සිටිනු දැක ඈ සතුටට පත් වුණා.

"ජූන් හරියටම එයාගේ තක්කඩි නැනා, ඇලිසියා වගේමයි." ඈ කිව්වා. "ඔව්, ඇලිසියා එයාගේ අම්මා වගේ. එයාගේ අම්මා කුඩා කාලයේ මෙහේ ඉද්දී මමත් හිටියා. අනේ අපොයි..., මම දැන් වයසට ගිහින්. එයාගේ අම්මත් මෙහේදී කරපු කපටි වැඩ. මගේ හිසකෙස් සුදු වෙන්න තිබුණේ ඒ කාලයේදීයි."

අමන්දාට හවස් යාමයේ නිදා ගැනීමට ඉඩ හැර ඈ පිටත්ව ගියා. එහෙත් අමන්දා නිදා ගත්තේ නැහැ. ඈ කල්පනා කරමින් වැතිර සිටියා. අසනීපව වේදනාවෙන් ඇඳන්වල වැතිර සිටින අයට කොතරම් දිගු සිතුවිලි පහළ වෙනවාද? අසනීපව සිටින කාලය තුළ දී, අමන්දා බොහෝ දේවල අවුල් ලිහා ගත්තා.

උඩඟුකම විනාශයට මුල බව කිසිවෙකු ඇයට පෙන්වා නොදුන්න නමුත් එය තමාටම සිය වතාවකට වැඩියෙන් පෙනුණා. වැටුණ විට කළ යුත්තේ වැටීම ගැන සිතීම නොව වැටෙන වාරයක් පාසා නැගිටීම හා ඉදිරියට යාමට උත්සාහ කිරීම බව ඇයට කිසිවෙකු පෙන්වා දුන්නේ නැහැ. බොහෝ තැන් පිළියම් කර ගැනීමට ඈ අදහස් කර ගත්තා.

'මගේ කකුලේ මාංසපේෂි මට හරියට සෙල්ලම් කරන්න පුළුවන් තරමට ශක්තිමත් නොවුණොත්, මම කන් කෙඳිරි ගාන්නේ නැහැ.' ඈ සිතුවා. 'ඒ මොනව වුණත් ධෛර්යයයි වැදගත් වෙන්නේ. කෙනෙකුට සිද්ධ වුණ දේ නොවෙයි. ධෛර්යය උපදවා ගන්න පුළුවන් තාක් කල් ඕනෑම දෙයකට මුහුණ දෙන්න පුළුවන්. වීර්යය, ධෛර්යය මට ඕනෑ තරම් තියෙනවා. මටම ගිහින් ක්‍රීඩා කරන්න බැරි වුණොත් මම ක්‍රීඩා ගුරුවරියක් වෙනවා. මම කැමතියි පුහුණු කිරීම්වලට. ඒ වගේම මම ඒකට දක්ෂයි. ඒ තමයි ඊළඟ හොඳම දෙය. තවත් දෙවැනි දක්ෂකමක් මා ළඟ තියෙන එක මගේ වාසනාවක්.'

මෙලෙස නැගිට කොර ගසමින් ඇවිදින්නට පුළුවන් වූ විට සියලු පහළ පන්තිවල දැරියෝ ඇයව පිළිගෙන ඇය ඉදිරියේ කැපී පෙනෙන්නටත්, ඇයට කොර ගසමින් ඇවිදීමට සිදුවීම ගැන කනගාටු වන බව පෙන්වීමටත් පටන් ගත්තා. ඔවුන්ගේ කෙටි මතකය ගැන අමන්දා මවිතයට පත් වුණා.

'ජූන්ට හැර වෙන කාටවත් උදව් කරන්න මම කැමති වුණේ නැති එක එයාලට අමතක වෙලා.'

ඇගේ පාදයේ ආබාධය නොතිබුණා නම්, ඇයට තම ක්‍රීඩා සඳහා වෙන්ව තිබූ සම්පූර්ණ කාලය උද්‍යෝගිමත් කුඩා දැරියන් සඳහා ඈ කැප කරන්නට ඉඩ තිබුණා.

"එයා උපතින්ම ක්‍රීඩා ගුරුවරියක්." ක්‍රීඩා භාර ගුරුතුමිය පොට්ස් ගුරුතුමිය සමග කිව්වා. "ආයෙත් එයා ජූන්ව පුහුණු කරන්න

පටන් අරගෙන. ජූන් දැන් හොඳට හික්මීමෙන් පුහුණු වෙනවා. පොඩි කෙල්ල දෙවැනි කණ්ඩායම්වලට වැඩිකල් යන්න ඉස්සර ඇතුළු වෙනවා."

එය එසේ සිදු වුණා. ඩැරල්, සැලී හා මොරියා ඇත්තෙන්ම ඒකමතිකව තෝරා ගැනීම සිදු කළා. අමන්දාට හදිසි ආඩම්බරයක් දැනුණා. එහෙත් ඒ මීට පෙර ඇයට දැනී තිබූ ආඩම්බරයට වඩා වෙනස් ආකාරයක ආඩම්බරයක්. මෙවර එය තමා කෙරෙහි වූ ආඩම්බරයක් නොව වෙනත් කෙනෙකු කෙරෙහි වූ ආඩම්බරයක්.

"දැන් මගේ කෙල්ලේ...!" ඇලිසියා ජූන්ට කිව්වා. "දැන් ඔයාට පුළුවන් ඔයා මොන වගේ කෙනෙක්ද කියලා පෙන්වන්න. අපි බලාපොරොත්තු තියාගෙන හිටියේ පාඨශාලාන්තර තරගවල හැම පලිහක්ම, කුසලානයක්ම අමන්දා අපිට දිනලා දෙයි කියලා. ඒත් දැන් එයා ඉවත. දැන් ඔයා හිතන්න ඕනෑ තැනකට ඇවිදින් වෙනස් වෙන්න...!"

# 21

ඊළඟට සිදු වූයේ මහත් සේ සතුටු විය හැකි දෙයක්. උසස් සහතික පත්‍ර විභාගයට වාඩි වන ඇරියෝ විභාගයට පෙනී සිටියා. මහත් හිරිහැරයට පත්ව, සුදුමැලි වී සිටි ඔවුන් අවසානයේ විභාගය අවසන් කළා. ඔවුන්ගේ අවසාන විභාගය හමාර වීමත් සමගම ඔවුන් ආශ්චර්යමත් ලෙස සැනසිලි සුවයට පත් වුණා.

"දැන් ඉතින්..." ඇලිසියා කතා කළා. "මට ඕනෑ බඩ පැළෙන තුරු හිනා යන විදිහේ මෝඩ වැඩක් කරන්න. ආයෙත් දෙවැනි පන්තියේ ළමයෙක් වෙන්න ඉඩ දෙනවා නම් මම ඕනෑම දෙයක් දෙනවා. ඒ පන්තියේ ඉඳගෙන කාට හරි පිස්සු විහිළුවක් කරන්න තියෙනවා නම් කොයි තරම් හොඳ ද?"

ඉන් අනතුරුව විජ්ජා සිද්ධ වෙන්න පටන් ගෙන තිබුණා. ඒවා ඇත්තෙන්ම සැලසුම් කර තිබුණේ මෙල්ල කළ නොහැකි දෙවැනි පන්තිය විසින්, විශේෂයෙන්ම විභාග සතිය තුළ මහන්සි වී වැඩ කළ ඇලිසියා හා ඩැරල් ගැන දුක සිතුණ ෆෙලිසිටි හා ජූන් විසිනුයි.

එක්ව කටයුතු කළ මේ දෙදෙනා උපායන් කීපයක් ඉතා සැලසුම් සහගතව සකස් කර තිබුණා. ඔවුන් මේ ගැන දෙවන පන්ති ඇරියන්ට කියද්දී ඔවුන් කැකිරි පළමින් සිනාසුණා.

"මේ විජ්ජා නියම වෙලාවට කරන්න ඕනෑ." ජූන් කිව්වා. "එකක් අපි දැනටමත් දන්න එකක්. කොණ්ඩ කටු විජ්ජාව. අනිත් එක මම ගෙන්වා ගත්ත එකක්. ඒක මගේ අලුත්ම විජ්ජා පොතේ දැන්වීමක තිබුණේ."

ජූන් සතුව විජ්ජා පොත් රාශියක් තිබූ අතර නිතර ඒවා රාජසන්තක වුව ද අඛණ්ඩව ඒවා එකතු කරගැනීම කිසිවකින් වෙහෙසට පත් නොවන ජූන් විසින් නවත්වනු ලැබුවේ නැහැ.

"කොණ්ඩා කටු විජ්ජාව කරලා ඇති කියලා අපිට හිතුණේ

නැහැ." ෆෙලිසිටි කිව්වා. "ඒක තවම කරන්න පුළුවන්. ඒත් අපි හිතුවා ඒක තවත් එකක් එක්ක සම්බන්ධ කරන්න. ඒක හය පන්තියේ ළමයි වගේම මම්සලීවත් පුදුමයට පත් කරයි."

"හොඳටම හොඳයි." උද්‍යෝගිමත් අසන්නියෝ කෑ ගැසුවා. "ඒක මොන වගේද?"

"හරි, අහගන්න. මේ පෙති බලා ගන්න. මේවා සම්පූර්ණයෙන් සාමාන්‍ය පෙති වගේ පෙනෙන්නේ මේවාට වතුර ටිකක් වැටෙන තුරු විතරයි. වතුරේ පොඟවලා පැය කාලක් යද්දී මෙයාලා නයි වගේ 'සූ' කියන්න පටන් ගන්නවා...!" ජූන් කෙටියෙන් පැහැදිලි කළා.

"සූ..." නෝරා දිලිසෙන ඇසින් යුතුව ඇසුවා. "මොකක්ද 'සූ' කියන්නේ?"

"සූ කියන්නේ මොකක්ද කියලා ඔයා දන්නේ නැද්ද?" ජූන් ඇසුවා.

"මේ වගේ...!" කී ජූන් ඉතා බිහිසුණු ලෙස නයෙකු මෙන් නෝරාට පිම්බ අතර නෝරා තැතිගෙන ඇකිළුණා.

"ඒත් කොහොමද මේවා 'සූ' ගාන්නේ?" ඈ ඇසුවා.

"මම දන්නේ නැහැ. ඒක තමයි විජ්ජාව." ජූන් නොඉවසිල්ලෙන් කිව්වා. "මේවා තෙත් වුණාම, පිම්බිලා නයි වගේ කෑ ගහනවා. ඇත්තමට, පුදුම විදිහේ 'සූ' ශබ්දයක් එන්නේ. මම දැනටමත් එකක් තෙමලා අර ඩෙස්කයේ තියලා තියෙන්නේ. ඔයාලට බලා ගන්න පුළුවන් තව විනාඩි කීපයකින් වැඩේ කොහොමද කියලා."

"හූහ්...!" දෙවැනි පන්තියේ ඇරියෝ සතුටින් කෑ ගැසුවා.

ජූන් දිගටම කතා කළා.

"අපිට කරන්න තියෙන්නේ, මම්සලී හය පන්තියේ ඉන්න අතරේ අපේ කෙනෙක් ගිහින් කාන්දම් විජ්ජාවෙන් එයාගේ කොණ්ඩා කටු ගලවා ගන්නවා." ජූන් කිව්වා. "මම්සලී ආයෙත් කොණ්ඩය හදා ගන්න පිටට යන අතරේ මේ පෙත්තක් පොඟවලා චිමිනියේ සූදානම් කරලා තියනවා. ඒ ළඟම කටු ගහන පොඩි කොට්ටයක් තියෙනවා. නිකම් කටු වෙනුවට ඒකේ ගහලා තියෙන්නේ කොණ්ඩා කටු. හරියට මම්සලීගේ කොණ්ඩ කටු වගේම ඒවා...!"

"මට තේරෙනවා දැන්. මට තේරෙනවා...!" කැතරින් ඇස් නටවමින් කිව්වා. "මම්සලී ආපහු ඇවිදින් වැඩ පටන් ගද්දීම තයි පෙත්ත 'සූ' ගාන්න පටන් ගන්නවා. හැම කෙනාටම ඒක ඇහෙනවා..."

"ඔව්." ෆෙලිසිටි කිව්වා. "එයාලා සද්දේ එන්නේ කොහෙන්ද කියලා හොයද්දී, විමිනිය උඩ තිබිලා හම්බ වෙනවා මම්සලීගේ කොණ්ඩ කටු ගහපු කුඩා කොට්ටය...!"

"ඒත් එයාලා තයා දකින්නේ නැද්ද?" නෝරා ඇසුවා.

"නැහැ, ඒක ඉවර වෙද්දීම දූවිලි වගේ විසිරිලා යනවා." ජූන් කිව්වා. "ඒක පෙනෙන්නේ නැහැ. ඒක තමයි ලස්සනම වැඩේ. එයාලා කොට්ටය හොයා ගත්තට පස්සේ කට ඇරගෙන බලාගෙන ඉඳියි. අපේ ඇලිසියා අක්ක කල්පනා කරයි මේ මොකද වුණේ කියලා...!"

"ඒ විතරක් නෙමෙයි." ෆෙලිසිටි කිව්වා. "තවත් වැඩ තියෙනවා. අපි එක් කෙනෙක් ආයෙත් ගිහින් මම්සලීගේ දෙවැනි කටු ටිකත් ගලවාගෙන එනවා. එයා ආයෙත් කොණ්ඩය හදාගෙන එනකොට තවත් වතුරේ පොඟවපු පෙත්තක් කළු ලැල්ලේ පිටිපස්සේ තියනවා. ඒක ළඟත් කටු ගහපු කුඩා කොට්ටයක් තියෙනවා...!"

දෙවැනි පන්තියේ ඇරියෝ හඬ නගා සිනාසුණා. ඕ.. මේ හැමදෙයක්ම සිද්ධ වෙන්නේ හය පන්තියේ...!

"ඉතින්, කළුලැල්ල අස්සේ හැංගුණ තයා 'සූ' ගානවා, මහා හයියෙන්." ජූන් කිව්වා. "සූ සද්දේ හොයාගෙන එද්දී එයාලට ආයෙත් කටු ගහපු කොට්ටයක් හම්බ වෙනවා."

"හරිම අපූරුයි." හැරියට් කිව්වා.

"පුදුම වැඩක්." නෝරා කිව්වා.

"මේක ටිකක් නුවණක්කාර වැඩක්." ආඩම්බරයක් පෙන්වමින් ජූන් කිව්වා. "මමයි, ෆෙලිසිටියි එකතු වෙලා මේක ගැන හිතුවේ. අමාරු විභාගයකට පස්සේ මේක හය පන්තියේ අහිංසක ළමයින්ට හොඳ සංග්‍රහයක්."

නැවත මම්සලී හවසක හය පන්තියට එන වේලාවක් ගැන ඔවුන් ඇස ගසාගෙන සිටියා. එය දෙවන පන්තිය නිදහස්ව හෝ පිහිනීමට හා

ක්‍රීඩා කිරීමට හෝ යන වේලාවක් විය යුතුව තිබුණා. එවිට පහසුවෙන් පන්තියෙන් පැන ගැනීමට අවසර සැලසෙනු ඇත.

"බදාදා, තුනට කාලක් තියෙද්දී." ජූන් තම පන්තියේ හා හය පන්තියේ කාල සටහන් පරීක්ෂා කර බලා කිව්වා. "මුලින්ම කාන්දම අරගෙන යන එකට නෝරා හොඳ නැද්ද? ඊට පස්සේ, ෆෙලිසිටි, ඔයා යනවා. එහෙම නේද?"

"මම මුලින්ම යන්නම්." ෆෙලිසිටි කිව්වා. "කවුද පන්ති පටන් ගන්න කලින් පොඟවපු පෙත්ත තියන්නේ විමිනිය උඩ?"

"ඒක කරන්නේ මම." ජූන් කිව්වා.

මෙලෙස බදාදා සවස එළඹෙන විට දෙවැනි පන්ති දැරියන් අතර මහත් සේ චකිතයෙන් යුතු සතුටක් හා කැකිරි පළන සිනාවක් ඇති වුණා. ඔවුන් කුමකට අර අදින්නේ දැයි පාකර් ගුරුතුමිය සැක මුසුව කල්පනා කළා. එහෙත් ඒ උණුසුම පිටම ඒ ගැන සොයා බැලීමට ඈ කරදර වුණේ නැහැ.

තුනට කාලක් වීමට මත්තෙන් ජූන් ඉහළ මාලයට ගියා. තෙත් කළ මැජික් පෙත්ත හා කොණ්ඩා කටු ගැසූ කුඩා කොට්ටය ද ඈ රැගෙන ගොස් තිබුණා. දුම් කවුළුවේ මඳක් ඉහළින් තිබූ දුම් මැස්සේ නයි පෙත්ත තබා එය ඉදිරියෙන් කටු කොට්ටය තැබූ ඈ වහාම පලා ගියා.

විනාඩි කිහිපයකට පසුව පන්තියේ සිසුවියන් පිරුණා. මම්සලී පැමිණියා. ඒ සමගම ෆෙලිසිටි හති දමමින් දුවගෙන ආවා.

"මේ, මම්සලී, ඔයාට ලියුමක්." කී ඈ ලිපි කවරය මම්සලී ඉදිරියේ තැබුවා.

ඒ මත වූ නම වෙනස් කළ අත් අකුරින් ලියා තිබුණේ ජූන්. එහි සඳහන් වූයේ 'මම්සලී රොජර්' යන්නයි.

"ඇයි, ෆෙලිසිටි, මගේ දරුවෝ. ඔයා තවම දන්නේ නැද්ද? මගේ නම මම්සලී ඩූපොන්ට් කියලා, රොජර් නොවෙයි." මම්සලී කිව්වා. "මේක අනිත් මම්සලීට. මේක පහ පන්තියේ ඉන්න එයාට දෙන්න."

ෆෙලිසිටි සිටියේ මම්සලීට ටිකක් පිටුපසින්. පන්තිය ඇය දෙස සැක මුසුව බැලුවා. ඇයි මේ දෙවන පන්තියේ කෙල්ලගේ මුහුණේ

ලොකු හිනාවක්? මම්සලීගේ කොණ්ඩය පසුපසින් කාන්දම තත්පර කිපයක් අල්ලා සිටිනු ඔවුන් දුටුවා. අනතුරුව ෆෙලිසිටි කාන්දම හා ඒ මතට ඇදුණු කොණ්ඩා කටු අතේ ගුළි කර ගෙන, ලිපිය ද රැගෙන කඩිනමින් පිටව ගියා.

එය කොතරම් විගසින් කළේ ද යත් හය පන්ති ඇරියෝ මුව අයා ගත්තා. හදිසියේම තම කෙස් කළඹට යමක් සිදු වූ බව මම්සලීට දැනුණා. අත ඔසවා කොණ්ඩය ස්පර්ශ කළ ඈ වැලපුම් හඬක් නැගුවා.

"ඕ... ල... ලා...! මෙන්න මගේ කොණ්ඩය ආයෙත් ලෙහුණා...!"

නැවත වරක් ඈ කොණ්ඩා කටු සොයා නිරර්ථක උත්සාහයක යෙදුණා. එක් කොණ්ඩා කටුවක් හෝ සොයා ගැනීමට නොහැකි බව පළමු අත්දැකීමෙන් දත් ඈ නැවත කොණ්ඩය සැකසීමට පන්තියෙන් පිටව ගියා. ඈ දැඩි ලෙස ව්‍යාකූලත්වයට පත්ව සිටියා. මේ දිනවල ඇගේ කොණ්ඩයට කුමක් සිදුවෙනවා ද? ඒ වගේම කොණ්ඩා කටුවලට සිදුවන්නේ කුමක් ද? තම කොණ්ඩය කොටට කැපිය යුතු ද නැති ද කියා මම්සලී බැරෑරුම් ලෙස සිත යොමු කළා.

තම කාමරයට දිව ගිය ඈ නැවත කොණ්ඩය ගුළි කර නැවත පිටතට නොඑන පරිදි කොණ්ඩා කටු ඉතා තදින් ගැසුවා. කොණ්ඩා ගුළිය ප්‍රවේසමෙන් අල්ලා බලමින් ඈ ආපසු පන්තියට දිව ආවා.

'සූ' හඬ නැගුණේ ඈ වාඩි වන විටමයි. දුම් කවුළුව තුළ වූ තයි පෙත්ත මහත් හඬින් නොනවත්වාම 'සූ' හඬ දෙන්නට වුණා.

"ස්..... ස්.... සූස්... ස්.... ස්... සූස්..."

හය පන්ති ඇරියෝ හිස් ඔසවා බැලුවා.

"මොකක්ද මේ ශබ්දය?" මම්සලී නොඉවසිල්ලෙන් ඇසුවා. "ඇලිසියා ඔයාද 'සූස්' ගාලා පිඹින්නේ?"

"නැහැ, මම සූස් ගාන්නේ නැහැ. සමහරවිට පිටතින් එන ශබ්දයක්, මම්සලී."

"ඒක වෙන්න බැහැ." මොරියා කිව්වා. "මේ කාමරයෙන් එන්නේ. මට ඒක හොඳටම විශ්වාසයි."

සූ හඬ තවත් වැඩි වුණා.

"ස්.... ස්... ස්.... සූ....!"

"හරියට කොහේ හරි නයෙක් පිඹිනවා වගේ." ඩැරල් කිව්වා. "නයි කෑ ගහන්නේ ඒ විදිහට තමයි. පොළඟෙක් නම් වෙන්න බැහැ."

මම්සලී යටිගිරියෙන් හඬ තළමින් උඩ පැන්නා.

"නයෙක්...! නැහැ... නැහැ... මේ කාමරයේ නයෙක් ඉන්න බැහැ."

"එහෙම නම් මොකක්ද, දෙවියනේ...?" ව්‍යාකූල වූ සැලි කිව්වා.

ඔවුන් සියලු දෙනාම නිහඬව සවන් දුන්නා.

"ස්.... ස්.... සූස්... ස්... ස්.... සූස්..."

නයි පෙත්ත එතුළ වූ රසායනික ද්‍රව්‍ය ප්‍රබල ලෙස ප්‍රතික්‍රියා කරන අතරේ නොකඩවා වඩ වඩාත් හඬ නගමින් සිටියා.

ඇලිසියා නැගිට්ටා.

"මම ඌව හොයනවා." ඈ කිව්වා. "ඌ මේ උඳුන ළඟ කොහේ හරි ඇති."

දණ ගසා අත් බිමට තද කර ගත් ඈ කන් දුන්නා.

"ඌ ඉන්නේ චිමිනිය ඇතුළේ...!" ඈ විමතියෙන් හඬ නැගුවා. "මම අත දාලා බලන්නම් මොකාද ඉන්නේ කියලා."

"එපා.. එපා.... ඇලිසියා. ඒක කරන්න එපා." මම්සලී බියපත්ව කෑ ගැසුවා. "නයෙක් ඉන්නේ....!"

එහෙත් කිසිදු සර්පයෙකු නැති බවට හොඳින්ම විශ්වාසය ඇතිව ඇලිසියා දුම් මැස්ස අතපත ගා බැලුවා. යමක් අතේ ස්පර්ශ වූ විට ඈ එය දුම් කවුළුවෙන් පිටතට ගත්තා.

"මගේ දෙවියනේ...!" ඇයට කියැවුණා. "මේ බලන්න... ඔයාගේ කොණ්ඩා කටු මම්සලී.... කටු කොට්ටයක ගහලා...!"

හය පන්ති දැරියන්ට ඔවුන්ගේ ඇස් ඇදහිය නොහැකි වුණා. කිසිවෙක් කොණ්ඩා කටු තැබීමට දුම් කවුළුව අසලකට හෝ නොගොස් තිබූ විටකදී ප්‍රාතිහාර්යයක් මෙන් ඒවා දුම් කවුළුවෙන් මතු වුණේ කෙසේද? එමෙන්ම 'සූ' හඬ නැගුණේ කුමකින්ද?

"කා ළඟ හරි ටෝච් එකක් තියෙනවාද?" ඇලිසියා ඇසුවා. "ඒ ගමන 'සූ' සද්දේ නැවතුණා."

සූ හඬ නැවතී තිබුණා. පෙත්ත ක්ෂයව ගොස් තිබුණා. නාගයා ඉතා සියුම් කුඩක් බවට පත්ව තිබුණා. ඇලිසියා විදුලි පන්දම අල්ලා කුඩා දුම්මැස්ස පරීක්ෂා කරද්දී, ඇත්තෙන්ම දකින්න කිසිවක් තිබුණේ නැහැ.

මම්සලී ඇඩි ලෙස කෝප වී සිටියා. ඈ තරහින් කඩා පැන්නා.

"හරිම නරකයි, හරිම කැතයි." ඈ කෑ ගැසුවා. "ඇලිසියා, මේ වැඩේ...! ඔයා දැන් හය පන්තියේ නේද? හරිම කැතයි...! මොන නරක හැසිරීමක් ද? මුලින්ම මගේ කොණ්ඩා කටු ටික අරගෙන ඒවා කොට්ටයක ගහලා චිමිනිය ඇතුළේ හැංගුවා. ඊට පස්සේ 'සූස්' ගෑවා...!"

"අපි 'සූස්' ගෑවේ නෑ මම්සලී." ඩැරල් විරෝධය පළ කළා. "අපි නොවෙයි 'සූ' ගෑවේ. ඔයා දකින්නේ නැතිව, අපි මේ හැම දෙයක්ම කරන්නේ කොහොමද?"

එහෙත් ඔවුන්ට එවැනි හාස්කම් සහිත දේවල් කරන්නට හොඳින්ම හැකියාව ඇති බව ඈ සම්පූර්ණයෙන් විශ්වාස කළ අතර ඇලිසියා හෝ වෙනයම් කෙනෙක් ඉතා සූක්ෂම උපායක් කර ඇති බවට ඈ තදින්ම සිතුවා. කටු කොට්ටය උදුරා ගත් ඈ බිහිසුණු ලෙස එය කුණු කුඩයට දමා ගැසුවා.

"හරිම කැතයි...!" ඈ කෝපයෙන් කෑ ගැසුවා. "කැතම කැතයි...!"

මෙම සිදුවීම අතරමැද දී දොර විවෘත වී ඇතුළට පැමිණියේ තමාව පාලනය කර ගැනීමට වෙහෙසෙන බවක් පළ කරන නෝරායි. මම්සලී කෝපයෙන් ගුගුළමින් කටු කොට්ටය කුණු කුඩයට දමා ගසන

අයුරු දැක ගැනීමට ඇයට හැකි වුණා. ඇය සිනාවෙන් පිපිරෙන්නට ආසන්නව සිටියා. එහෙම නම් උපාය සාර්ථක වෙලා.

"සමාවෙන්න. මම්සලී." ඈ විනීත ලෙස සිනාවක් පාමින් පුදුමයට පත්ව සිටි ප්‍රංශ ගුරුතුමියට කිව්වා. "මිස් පාකර්ගේ පොතක් ඔයාගේ මේසය උඩ තියෙනවාද?"

තමා වඩාත් ප්‍රිය කරන දැරියක දැකීමෙන් මම්සලී තරමක් දුරට සන්සුන් වුණා. කොණ්ඩා ගුළිය කටුත් සමග එසේම ඇති දැයි බැලීමට ඈ හිස අත ගෑවා. ඈ තමාව පාලනය කර ගනිමින් කතා කළා.

"ටිකක් ඉන්න. මම බලන්නම්." කී ඇය මේස ලාච්චුව විවෘත කළා. කල් ඇතිව ජූන් ප්‍රවේසමෙන් පාකර් ගුරුතුමියගේ පොතක් සූදානම්ව තබා තිබූ නිසා එය සොයා ගැනීමට ඇයට එතරම් අමාරු වුණේ නැහැ.

එමෙන්ම නෝරාට ද, ඇත්තෙන්ම කාන්දම මම්සලීගේ අවාසනාවන්ත කොණ්ඩ ගුළියට ළං කර අල්ලා ගැනීමට ද එතරම් අමාරු වූයේ නැහැ. ඇය කරමින් සිටි දෙය දුටු හය පන්ති දැරියෝ පිටතට ඇසෙන පරිදි මුව අයා හුස්මක් ඉහළට ඇද්දා. කපටිකම...! එක පාඩමකදී දෙසැරයක්ම...! සූ හඬ හා කටු කොට්ටය එකම උපායක කොටස් ද? ඇලිසියාගේ සිත වේගයෙන් වැඩ කරන්නට පටන් ගත්තා. කොහොමද ඔවුන් ඒක කළේ? පොඩි වැදිරියෝ...!

කළුලැල්ල රඳවා තිබූ බිත්ති ගැට්ට මත කළුලැල්ලට හොඳින් වැසෙන පරිදි එය පිටුපසින් තෙත් කළ පෙත්ත හා කොණ්ඩා කටු ගැසූ කුඩා කොට්ටය ක්ෂණයෙන් සඟවා තැබීමට නෝරාට ප්‍රමාණවත් තරම් කල් තිබුණා. මොහොතකට මම්සලීට මුවා වූ ඇයට මෙය කාටවත් නොපෙනෙන පරිදි කර ගැනීමට හැකි වුණා.

ස්තුති පූර්වකව පොත ගත් නෝරා පිටතට ගොස් කොරිඩෝව ඔස්සේ යන අතරේ නැගී එන සිනාව මැඩ ගනිමින් තදින් ඉක්කා ගසමින් දිව යන්නට වුණා. අතරමඟදී ඇයට හමු වූ පොට්ස් ගුරුතුමිය සැක මුසුව ඇය දෙස බැලුවා. නෝරා මොනවා කරන්නද අර අඩින්නේ?

නෝරා දොර වසාගෙන පිටවනවාත් සමගම මම්සලීට සුපුරුදු හැඟීමක් හිසෙහි ඇති වුණා. ඇගේ කොණ්ඩය පහළට වැටෙමින්

තිබුණා. ඇගේ කොණ්ඩා ගුළිය දිග හැරෙමින් තිබුණා. මහත් භීතියෙන් යුතුව හිස අත ගෑ ඈ හඬ නඟා වැලපුණා.

"මෙන්න ආයෙත්, මගේ කොණ්ඩා කටු අතුරුදහන් වෙලා ගිහින්. මගේ කොණ්ඩය... එයා පහළට වැටෙනවා...!"

ඇරියෝ මහ හඬින් සිනාසුණා. මම්සලීගේ බියපත් මුහුණ වචනයෙන් කීමට බැරි තරම් හාස්‍යජනකයි. සූසේන් කොතරම් සිනාසුණේ ද යත් ඈ පුටුවෙන් විසිවී බිම වැටුණා. මම්සලී කෝපයෙන් නැඟී සිටියා.

"ඔයා, සූසේන්....! ඇයි ඔය තරම් හිනාවෙන්නේ? ඔයා ද මේ විජ්ජාව කළේ?"

"නැහැ, මම්සලී. නැහැ...! මම හිනාවෙන්නේ ඒක ඒ තරම් ම පිහි - හු - ලියර්." කඳුළු අතරින් සූසේන් කිව්වා.

සූසේන්ව පන්තියෙන් එළියට යැවීමට නියෝග කිරීමට ආසන්නව සිටි මම්සලී එක්වරම නැවතුණා. 'සූ' හඬ නැවත පටන් අරගෙන තිබුණා. පෙරදී වගේමයි.

"ස්.... ස්... සූස්...!"

"මේක ඕනෑවට වැඩියි." අවධානය බිඳුණු මම්සලී කෑ ගැසුවේ කිසිදු කොණ්ඩා කටුවක් නැතිව නැවත කොණ්ඩය හිස මත ගුළි කර තබා ගැනීමට නිරුත්ඵල උත්සාහයක යෙදෙමිනුයි. "ආයෙත් අර නයා. ඇලිසියා, බලන්න චිමිනිය උඩ."

"මේ සැරේ සද්දේ එන්නේ චිමිනියෙන් නෙමෙයි, මම්සලී." ඇලිසියා කිව්වා. "අහගන්න මම්සලී. මට විශ්වාසයි චිමිනියේ නොවෙයි."

ඔවුන් හැමෝම කන් දුන්නා.

"ස්... ස්... සූස්...!" හඬ කදිමට ඇසුණා.

ඇරියෝ එකිනෙකා දෙස බලා ගත්තා. ඇත්තෙන්ම දෙවැනි පන්තියේ අය හරිම දක්ෂයි. ඒත් බය නැතිව මෙවා කරන්නේ කොහොමද? මේ ගැන බොහෝ දේ ෆෙලිසිටි හා ජූන්ට කිව යුතු යැයි ඩැරල් හා ඇලිසියා නොරිස්සුමින් යුතුව හිත හදා ගත්තා.

"ස්... ස්... සූස්...!"

"ඒ පාර ඔයාගේ පිටිපස්සේ, මම්සලී. මට හොඳටම විශ්වාසයි." මොරියා හදිසියේම කිව්වා.

බලවත් ලෙස වේදනාත්මක හඬක් නැගූ මම්සලී කොතරම් බිහිසුණු ලෙස ඉදිරියට පැන්නේ ද යත් කුණු කූඩය මතට වැටුණු ඈ බිම පෙරළුණා. ඇත්තෙන්ම ඇයට සිතුණේ නයෙකු ඇගේ පසුපසින් එන බවයි.

ඇලිසියා අසුනින් නැගිට මම්සලීගේ මේසයට යන අතරතුරේදී ඩැරල් හා සැලී මම්සලීට නැගිටීමට උදව් කළා.

"මේ කොහේ හරි තැනක ඇති." සොයමින් ඇලිසියා මිමිනුවා. "ඒ විදිහට 'සූ' ගාන්නේ මොකක් වෙන්න පුළුවන් ද?"

කළුලෑල්ල රඳවා ඇති බිත්ති ගැට්ට දක්වා ඇගේ සෝදිසිය යොමු වුණා. ඈ ප්‍රවේසමෙන් කළුලෑල්ල පසුපසට අත දැම්මා. නැවත පිටතට ගත්තේ කොණ්ඩා කටු පිර වූ කුඩා කොට්ටයක්...! හය පන්ති දැරියෝ මුව අයා ගත්තා. පුටුවේ වාඩි වූ මම්සලී වැලපුණා.

"අන්න මගේ කොණ්ඩා කටු ආයෙත් සැරයක්...!" ඈ කිව්වා. "ඒත් කවුද ඒවා මගේ කොණ්ඩයෙන් ගලවා ගත්තේ? කවුද ඒවා කොට්ටයේ ගැහුවේ? කවුරු හරි නොපෙනෙන කෙනෙක් මේ කාමරයේ ඉන්නවා. ආහ්...!"

කළුලෑල්ල පිටුපස දකින්නට කිසිම දෙයක් තිබුණේ නැහැ. නැවත වතාවක් නයි පෙත්ත සියුම් දූවිලි බවට පත්ව සූ හඬ නැවති තිබුණා. දැරියෝ නැවතත් නවතා ගත නොහැකිව සිනා හඬ නගන්නට වුණා. මොරියා මම්සලීගේ පිටුපස සිට 'සූ' හඬක් නැගූ විට අසරණ මම්සලී සර්පයෙකු දෂ්ට කළ කලක මෙන් උඩ පැන්නා. සිනාව නවතා ගත නොහැකි වූ සූසේන් නැවත වතාවක් පුටුවෙන් විසි වී වැටුණා.

දොර විවර වූ අතර සියලු දෙනා උඩ ගියා. පොට්ස් ගුරුතුමිය ඇතුළට ආවා.

"කරදරයක් නැහැ නේද?" ඈ ඇසුවේ තම දෑස හමුවේ ඇති දර්ශනය ගැන ව්‍යාකූලවයි. "මම මෙතනින් යද්දී හරිම අමුතු සද්දයක් ආවා."

බිම සිටි සූසේන් නැගිට්ටා. අනෙක් අය සිනාව නැවැත්තුවා. ඇලිසියා කටු කොට්ටය මේසය මත තැබුවා. කොණ්ඩය සකසා ගැනීමට උත්සාහ කරමින් මම්සලී අසුනේ වාඩි වුණා.

"ඔයා කියන්න හදන්නේ නැවත වතාවක් ඔයාගේ කොණ්ඩා කටු නැති වුණා කියලද, මම්සලී?" පොට්ස් ගුරුතුමිය ඇසුවා. "ඔයාගේ කොණ්ඩය ලෙහිලා."

මම්සලී කටහඬ අවදි කළා. පන්තියේ හැම අස්සක මුල්ලකම නයි පිරී උන් තමන්ට පිඹින බවත්, කොණ්ඩා කටු අතුරුදහන් වීම හා ඒවා නැවත දර්ශනය වීම ගැනත්, නැවත නයි පිඹින බවත්, මුල සිට අගටත්, අග සිට මුලටත් මම්සලී මවිතය දනවන කතා පෙළක් පටන් ගත්තා.

"ඔයා මා එක්ක එන්න, මම්සලී." පොට්ස් ගුරුතුමිය සැනසිලි හඬින් කිව්වා. "මම ආපසු ඇවිදින් මේ ගැන බලන්නම්. එන්න... ආයෙත් ඔයාගේ කොණ්ඩය හදා ගත්තාට පස්සේ ඔයාට පහසුවක් දැනෙයි."

"මම කොණ්ඩෙ කොටට කපන්න යන්නේ." මම්සලී කිව්වා. "මම දැන්ම යනවා, මිස් පොට්ස්. මේ මොහොතේම... මම කියන්නේ, මිස් පොට්ස්..."

එහෙත් ඇය තවත් මොනවා කීවේද යන්න පොට්ස් ගුරුතුමියට හෝ හය පන්ති දැරියන්ට දැන ගන්නට ලැබුණේ නැහැ. අසුන්වල වාඩි වූ ඔවුන් කොක් හඬ ලා සිනාසුණා. දෙවැනි පන්ති නපුරියෝ...! ඔවුන් වඩාත් දක්ෂ උපායක් කර ඇති බව පිළිගැනීමට ඇලිසියාට පවා සිදු වුණා.

# 22

කෙසේ වෙතත් කිසිවෙක් දෙවැනි පන්ති දැරියන්ට දොස් කිවේ නැහැ. එදින සවස තමන්ට පුදුම විනෝදයක් ලැබුණ නිසා ඔවුන් සමග දබරයක් ඇති කර ගැනීම සාධාරණ නොවන බව හය පන්ති දැරියෝ එකඟ වුණා.

"අර භයානක විභාග සතියට පස්සේ ඒ වගේ දෙයක් තමයි අපිට ඕනෑ වෙලා තිබුණේ." ඩැරල් කිව්වා. "අසරණ මම්සලී, දැන් එයාට හොඳයි. ඒත් දෙවන පන්තියේ නපුරියෝ එයාගේ පස්සෙන් යන ඕනෑම වෙලාවක 'සූ' ගාලා පිඹිනවා. එයා හාවෙක් වගේ දුවන්නේ."

"අපි ඒ පන්තියේ හිටපු කාලයේ වගේ නොවෙයි, එයාලා ඊට වඩා නරකයි." ඇලිසියා කිව්වා. "මම හිතුවේ නැහැ, ඒ තරම් දෙයක් පුළුවන් කියලා."

මේ වන විට වාරය ඇත්තෙන්ම ඉතා ඉක්මනින් ගතවී යන්නට පටන් ගෙන තිබුණා. දින ගතවේගෙන යද්දී ඩැරල් නොඉවසිලිවන්ත වුණා. තරග පැවැත්වුණ අතර දිනුම් ලැබුණා. පිහිනුම් තරග පැවැත්වුණා. දිනුම් ලැබුණා. මොරියා, සැලී හා ඩැරල් දීප්තිමත් ලෙස ක්‍රීඩා කළ අතර හොඳින් පිහිනීම් කළා. එහෙත්, ඇත්තෙන්ම දීප්තිමත් තරුව වූයේ ජූන්. ක්‍රීඩා හා පිහිනීම් සඳහා ඒ තාක් කාලයකට දෙවැනි කණ්ඩායමේ සිටි ළාබාලම ක්‍රීඩිකාව වූයේ ඇයයි.

තවමත් කොර ගසමින් ඇවිදින අමන්දා ජූන් ගැන ආඩම්බර වුණා.

"බලන්න...! මමයි එයාව තෝරා ගත්තේ. ඉස්කෝලයේ ඉන්න බලාපොරොත්තු තියාගන්න හොඳම ළමයා එයා කියලා මම කිව්වේ." ඈ ප්‍රීතියෙන් උදම්ව හය පන්ති දැරියන්ට කිව්වා. "පුහුණු කිරීමේ වන්දිය එයා ගෙවයි. එයා හරි පුදුම ළමයෙක්...!"

සැලී හා ඩැරල් එකිනෙකා දෙස බැලුවා. දැන් අමන්දා කොතරම් වෙනස් වූ කෙනෙක් ද? අඩුම තරමේ වසරක් පමණ යන තුරු ඇයට පුහුණුවීම්වලට යාමට අවසර නොලැබෙන නිසා ඇය මැලෝරි ටවර්ස්හි ම නැවතී සිටිය යුතු බවට තීරණය කරනු ලැබ තිබිණ. එමෙන්ම මේ වන විට අමන්දාගේ අවධානය තව දුරටත් ඇය වෙතටම යොමු කළ නොහැකි නිසා ඈ එය ජූන් හා බලාපොරොත්තු තැබිය හැකි අනෙකුත් බාල ක්‍රීඩිකාවන් වෙත යොමු කරමින් සිටියා. ඒ වන විටත් ඔවුන් අතර ක්‍රීඩාවේ මට්ටමේ විශාල වෙනසක් ඈ ඇති කර තිබුණා.

"මට පුළුවන් වෙයි, ජූන්ටයි තව දෙතුන් දෙනෙකුටයි ඇහැ ගහගෙන ඉන්න." අමන්දා සතුටින් කිව්වා. "ඒත් ඔයාලා අස්වෙලා යන එක ගැන මට දුකයි. ඔයාලා නැතිව හරි අමුත්තක් දැනෙයි. ඔයාලට දුක නැද්ද යන්න?"

"ග්වේන් විතරයි මැලෝරි ටවර්ස් ආලා යන්න සතුටින් ඉන්න එකම කෙනා." ඩැරල් කිව්වා. "අනිත් කවුරුවත් එහෙම නැහැ. අපිට යන්න විශ්වවිද්‍යාලය තිබුණා වුණත්, බෙලින්ඩා චිත්‍ර පාසලකට යනවා. අයිරින් සංගීත පීඨයට."

"එතකොට මම විල් එක්ක අපේ අසුන් පැදවීමේ ඉස්කෝලයට." ක්ලැරිසා කිව්වා. "අනික මොරියා...."

"අපොයි..." ඩැරල් බාධා කරමින් කිව්වා. "ලබන වාරය ගැන අපි තවම කතා නොකර ඉඳිමු. අපි ඊළඟ වාරයේත් ආපහු එනවා කියලා හිත හිතා මේ අවසාන සතිය දෙක ගත කරමු. මේ වාරයේ අපිට හුඟක් දුක්වීම්, සතුටුවීම් තිබුණා. දැන් අපි විනෝද වෙමු."

ඔවුන් හැමෝම සතුටින් කල් ගත කළා, එක් ඇරියක හැරුණ විට. ඒ ග්වේන්. කිසිදා අමතක නොවන දිනයක් ග්වේන් වෙත පැමිණියා. එය පැමිණියේ ඇය කිසිසේත් අපේක්ෂා නොකළ මොහොතකයි.

පොදු කාමරයට පැමිණි නේවාසිකාගාර පාලිකාව ඇයව හමු වුණා.

"ග්වේන්..." ඈ කතා කළේ තරමක බැරෑරුම් කටහඬකින්. "ඔයා මිස් ග්‍රේලින්ගේ කාමරයට යනවා ද? එතැන එක්කෙනෙක් ඉන්නවා ඔයාව හමුවෙන්න."

ග්වේන් තැති ගත්තා. වාරය අවසාන වෙන්න ආසන්නයේ ඇයව හමුවීමට කවුරු පැමිණියා විය හැකිද? ඇ ඉක්මනින් දිව ගියා. ග්‍රේලින් මහත්මිය ඉදිරියේ බියසුලුව වාඩි වී සිටින ඇගේ මහලු ආයා වින්ටර් මහත්මිය දැක ඇ ඇඩි විමතියට පත් වුණා.

"ඇයි... මිස් වින්ටර්?" පුදුම වූ ග්වේන් ඇසුවා.

නැගිට ගත් වින්ටර් මහත්මිය ඇයට හාද්දක් දුන්නා.

"ඕ.... ග්වේන්..." ඇ කතා කළා. "ඕ... ග්වේන්...." හදිසියේම ඇ කඳුළු සලන්නට වුණා.

ග්වේන් චකිතයෙන් ඇය දෙස බැලුවා. ග්‍රේලින් මහත්මිය කතා කළා.

"ග්වේන්, මිස් වින්ටර් නරක ආරංචියක් ගෙනැවිත් තියෙන්නේ. අනේ මන්දා... එයා...."

"ග්වේන්, ඔයාගේ තාත්තා ගැන." වින්ටර් මහත්මිය කඳුළු පිසිමින් කිව්වා. "එයාට හොඳටම අමාරුයි. ඉස්පිරිතාලෙ නවත්තලා. ඕ... ග්වේන්, ඔයාලගේ අම්මා අද උදේ මා එක්ක කිව්වා එයා ජීවත් වෙන එකක් නැහැ කියලා."

කවුරුන් හෝ එක්වරම තම හදවත ඩැහැ ගත් බවක් ග්වේන්ට දැනුණා. අන්ධයෙකු ලෙස පුටුවක වාඩි වූ ග්වේන් මහත් වූ දෙනෙතින් වින්ටර් මහත්මිය දෙස බලා සිටියා.

"ඔයා ආවේ.... ඔයා ආවේ මාව එක්ක යන්න ද?" ඇ ආයාසයෙන් ඇසුවා. "මට පුළුවන් වෙයිද, වෙලාවට යන්න?"

"ඕ... ඔයාට එයාව දකින්න ලැබෙන එකක් නැහැ." වින්ටර් මහත්මිය වැලපුණා. "එයාට හුඟක් අමාරුයි. එයා ඔයාව දකින එකක් නැහැ. මම ආවේ ඔයාව අම්මා ළඟ තියන්න ගෙදර එක්ක යන්න. එයා පුදුම දුකකින් ඉන්නේ, ග්වේන්. මට කිසිම දෙයක් එයත් එක්ක කරන්න බැහැ. මෙලෝ දෙයක් බැහැ. බඩු අහුරාගෙන ඇත්ම එන්න පුළුවන් ද?"

මෙය ග්වේන්ට දරුණු කම්පනයක් වුණා. ඇගේ පියාට අසනීපයි, මව දුකට පත් වෙලා, ඇයට ඉක්මනින් පිටත් වෙන්න සිද්ධ වෙලා. එවිටම තවත් සිතුවිල්ලක් ඇය කරා පැමිණි අතර ඇ කෙඳිරි ගෑවා.

මෙහි තේරුම වන්නේ ස්විට්සර්ලන්තයේ පාසලක් අහිමි වීමයි. ක්ෂණයෙන්, ඇගේ සම්පූර්ණ අනාගතය නොපැහැදිලිව දර්ශනය වුණා. ප්‍රියජනක පාසලක සතුටින් යුතුව දීප්තිමත්ව බබළන එකක් නොව නිතර මැසිවිලි නගන ගැහැනියක් වූ හා උමතු ලෙස හැසිරෙන තම මව සනසමින් ඈ වෙනුවෙන් නිමාවක් නැති වෙහෙසකර ක්‍රියාවන් කරමින් ගත කරන අඳුරු අනාගතයක්, පසුබිමෙහි සෘජු කරුණාවන්ත පියෙක් ද නැතිව.

තම පියා ගැන සිහිවෙන විට ග්වේන් ලැජ්ජාවෙන් හා පසුතැවිල්ලෙන් යුතුව දෑතින් මුහුණ වසා ගත්තා.

"මම එයාට ආයුබෝවන් කිව්වේත් නැහැ...!" ඈ හඬ නගා අඬමින් වින්ටර් මහත්මිය හා ශ්‍රේලින් මහත්මියව විමතියට පත් කළා. "මම.... ආයුබෝවන් කීවේ නැහැ...! එයා අසනීපයෙන් කියලා දැන ගෙනත් මම ලියුමක්වත් ලිව්වේ නැහැ. දැන් ප්‍රමාද වැඩියි."

හොඳටම ප්‍රමාද වැඩියි. කොතරම් භයානක වචන ද? තමාට කනගාටු බව කීමට ප්‍රමාද වැඩියි, ආදරය දැක්වීමට ප්‍රමාද වැඩියි, යහපත් හා කරුණාවන්ත වීමට ප්‍රමාද වැඩියි.

"මම නපුරු දේවල් කිව්වා. මම එයාට රිදෙව්වා. ඕ... මිස් වින්ටර්, ඇයි ඔයා මාව නැවැත්තුවේ නැත්තේ?" සුදුමැලි මුහුණේ කඳුළු නොමැති ඇසින් යුතුව ග්වේන් කෑ ගැසුවා.

නිතරම කඳුළු ග්වේන් ආසන්නයේම තිබුණ ද මේ අවස්ථාවේ කඳුළු පැමිණියේ නැහැ. මඳක් කරුණාවන්ත බවක් පෙන්වන ලෙස හා හිතුවක්කාර ලෙස තමන්ට අවශ්‍ය දේම නොකරන ලෙස කී වාරයක් තමා ඇයට ආයාචනා කළා ද යන්න මතක් කර දීමට තරම් නිර්භීත නොවූ වින්ටර් මහත්මිය නිහඬව ග්වේන් දෙස බැලුවා.

"ග්වේන් දුවේ, මට මේ ගැන බොහොම කනගාටුයි." ශ්‍රේලින් මහත්මිය කරුණාවන්ත හඬින් කිව්වා. "මිස් වින්ටර්, ඊළඟ කෝච්චියේ ආපහු යන්න හිතාගෙන සිටින නිසා, මම හිතන්නේ ඔයා දැන් ගිහින් බඩු අසුරා ගත්තොත් හොඳයි. ඔයාගේ අම්මාට ඔයාව ඕනෑ නිසා ඔයා දැන්ම යන්න, ග්වේන්. මේතාක් වන තුරු ඔයා හැදෙන්න ඕනෑ විදිහට ඔයා හැදිලා නැහැ. දැන් තමයි අපි හිතනවාට වඩා යමක් ඔයා තුළ තියෙනවා කියලා පෙන්වන්න අවස්ථාව."

ග්වේන් කාමරයෙන් පිටතට ඇදුණා. වින්ටර් මහත්මිය බඩු අසුරා ගැනීමට උදව් කිරීම පිණිස පසුපසින් ගියා. වාඩි වූ ග්‍රේලින් මහත්මිය කල්පනා කළා. 'සතුට උපයන අයට කොයි මොහොතක හෝ සතුට ලැබෙනවා මෙන්ම දඬුවම උරුම නම් ඒ අය කරා කෙසේ හෝ දඬුවම පැමිණෙනවා. ඔබට නෙළා ගැනීමට ලැබෙන්නේ ඔබ වැපිරූ දෙයෙහි ඵලයයි. සෑම කෙනෙක්ම මෙය ඉගෙන ගන්නවා නම් ලෝකයේ මෙතරම් දුකක් තිබිය නොහැකියි.' ග්‍රේලින් මහත්මිය කල්පනා කළා.

ග්වේන් බඩු අසුරමින් සිටින අතරේ ඩැරල් නිදන කාමරයට පැමිණියා. කඳුළු පිරි ඇසින් ග්වේන් හඬමින් සිටියා.

"ග්වේන්... මේ මොකද?" ඩැරල් ඇසුවා.

"ඕ... ඩැරල්, මගේ තාත්තාට හොඳටම අමාරුයි. එයා ජීවත් වෙන එකක් නැහැ." ග්වේන් වැලපුණා. "ඕ... ඩැරල්, මම මේ වාරයේදී කියපු නරක, නපුරු දේවල් අමතක කරන්න. එයා ජීවත්ව ඉද්දීම මට ගිහින් සමාව ගන්න පුළුවන් නම්, මම එයා කියන හැම දෙයක්ම කරන්න සූදානම් කියලා කියන්න මට අවස්ථාව ලැබෙනවා නම්, මම ලෝකයේ තියෙන නීරසම, අවාසනාවන්තම රස්සාව වුණත් කරනවා. ඒත් දැන් ප්‍රමාද වැඩියි."



ඩැරල් වචනයෙන් කිව නොහැකි තරම් කම්පනයට පත් වුණා. කුමක් කිව යුතු දැයි නොදැන ඇ ග්වේන් වටා තම අත දමා ගත්තා. වින්ටර් මහත්මිය බියගුලුව කතා කළා.

"අපි කෝච්චිය අල්ලා ගන්න ඕනෑ, ග්වේන් දුවේ. මෙච්චරද අහුරා ගන්න තියෙන්නේ?"

"මම එයාගේ ට්‍රන්ක පෙට්ටිය අහුරලා එවන එක බලා ගන්නම්." ඩැරල් කිවේ යමක් කිරීමට ඉදිරිපත් වීමට ලැබීම ගැන සතුටින්. "බඩු ටිකක් විතරක් අරන් යන්න, ග්වේන්. කුඩා බෑග් එක විතරක්."

අවාසනාවන්ත අවස්ථාවේදී, ඇ ග්වේන් සමග ඉදිරි දොර දක්වා ගියා. මැලෝරි ටවර්ස්වලින් සමුගෙන යාමට මෙය මොන තරම් ශෝචනීය ආකාරයක් ද? අසරණ ග්වේන්...! ඇගේ සියලු අපේක්ෂාවන් හා සිහින දුමක් මෙන් විසිරී ගිහින්. එමෙන්ම බිහිසුණු වචන. ප්‍රමාද වැඩියි...! තම අකරුණාවන්තකම ගැන සිහිපත් වන විට ග්වේන්ට කොතරම් භීතියක් දැනෙනවා ඇතිද? ඇයට සමු දීමට ග්‍රේලින් මහත්මිය ද පැමිණි අතර මෝටර් රථය පාසල් මාවත ඔස්සේ ගමන් ඇරඹූ පසුව ඇ නිහඬව දොර වැසුවා.

"ඒ ගැන ඒ තරම් දුක් වෙන්න එපා." ඇ ඩැරල්ට කිව්වා. "ඒකෙන් ග්වේන් හැදෙයි. ඒකෙන් ඔයාගේ අවසාන සතිය දෙක තරක් කර ගන්න එපා, ඩැරල් දුවේ...!"

හදිසියේම ග්‍රේලින් මහත්මිය පුදුමයට පත් කරමින් හාද්දක් දුන් ඩැරල් අනතුරුව තමා එවැනි දෙයක් කිරීමට තරම් නිර්භීත වූයේ කෙසේ දැයි පුදුමයෙන් සිතන්නට වුණා. ඇ ආරංචිය අනෙක් අයට පැවසීමට දිව ගියා.

ග්වේන්ට එය උරුම විය යුතු යැයි බොහෝ දෙනෙක් රහසිගතව සිතුව ද, එම සිද්ධියෙන් හැමෝගේම සිත් තුළ දුක්මුසු අඳුරක් පැතිරුණා. ග්වේන්ට නියම මිතුරියක නොමැති අතර කිසිදින ඉඳ තිබුණේ ද නැහැ. මැලෝරි ටවර්ස්හි ඇය සිටි වසර ගණනාව පුරාම ඇය කන් කෙඳිරිගෑම්, මැසිවිලි නැගීම් හා වැලපීම්, පුරසාරම් දෙඩීම් කර තිබූ අතර ඇ ඉතිරි කර ගොස් තිබුණේ අමිහිරි මතකයක් පමණයි. එහෙත් ඩැරල්, සැලී, මේරි ලෝව් සහ තවත් කීප දෙනෙක් පමණක් ඇය ගැන කරුණාබරිතව සිතන්නට උත්සාහ කළේ ඇය වැටී සිටි මහත් කරදරය නිසායි.

ඉක්මනින් ඇති වූ අනෙක් සිද්ධීන් නිසා ඇරියන්ට ග්වෙන් අමතක වුණා. ආදිශිෂ්‍යාවන් සමග පැවැත්වුණු ටෙනිස් තරගයෙන් ඩැරල් හා සැලී ජය ගත්තා. මොරියා කේවල තරග ජය ගත්තා. යමෙකුගේ උපත් දිනයක් යෙදී තිබුණ අතර ඇගේ මව කොතරම් අද්විතීය ගණයේ කේක් එකක් එවා තිබුණේ ද යත් එය මුළු පාසලටම ප්‍රමාණවත් වුණා...! එය ගෙනෙනු ලැබුවේ විශේෂ වෑන් රථයකින් වූ අතර මිනිස්සු දෙදෙනෙක් එය ඔසවා ගෙන ආවා...!

ඉන්පසු ජෝ පිළිබඳ ප්‍රවෘත්තිය පැමිණියා. එය පැමිණියේ ඩියනා හරහායි. ඇයට ජෝගෙන් පාර්සලයක් හා ලියුමක් ලැබී තිබුණා.

'මෙන්න ඔයාට පොඩි බඩුවක්.' (ජෝ ලියා තිබුණා.) 'මමයි මේක පාර්සල් කළේ. ඉදිරියේදී මොනවා කරන්නද කියලා මම තවම දන්නේ නැහැ. තාත්තා කියනවා මැලෝරි ටවර්ස් වගේ හොඳ ඉස්කෝලයක් මට හොයලා දෙන්න එයාට පුළුවන්කමක් නැහැ කියලා. මට යන්න සිද්ධ වෙන්නේ මාව ගන්න කැමති මොකක් හරි ඉස්කෝලයකට. මම ආයෙත් මෝඩ වැඩ කරන්නේ නැහැ කියලා කියන්න මට ලැජ්ජාවක් නැහැ. තාත්තා කළු ගලක් වුණාට එයත් දැන් දුකට පත් වෙලා. එයා නිතරම කියනවා ඒක එයාගේ වැරැද්ද කියලා. අම්මාට මාව එපා වෙලා. මම මැලෝරි ටවර්ස්වල ඉගෙන ගන්නවා කියලා එයා හුඟක් පුරසාරම් කියවලා. පවුලේ නම්බුව විනාශ කළා කියලා එයා මට දොස් කියනවා. අපි දැන් නිකම්ම 'ජෝන්ස්' විතරයි.

ඔයාවත් කරදරයක පටලවාපු එක ගැන මට කනගාටුයි. ඔයාව අස් නොකරපු එක ගැන මට සතුටුයි. මම වෙනුවෙන් තව එක දෙයක් කරන්න. දෙවැනි පන්ති ළමයින්ට කියන්න, විශේෂයෙන් ෆෙලිසිටිට. එදා මම වරද පිළි අරගෙන ඉදිරිපත් නොවුණ එකට මම සමාව අයදිනවා කියලා. ඒක කල්ප ගණනක් යනතුරු මගේ හෘද සාක්ෂියයි.

මට මැලෝරි ටවර්ස් අහිමි වීම පාඩුවක්. දැන් මට ආපහු එන්න බැරි වුණත් මම දන්නවා ඒක හරිම සුන්දර තැනක්.

මේ පාර්සලයට ඔයා කැමති වෙයි.

ජෝ.'

ඩියනා ලිපිය ෆෙලිසිටි වෙත ගෙන ගිය අතර නිහඬව එය කියවූ ඈ එය ආපසු දුන්නා.

"ස්තූතියි." ඈ කිව්වා. "මම අනිත් අයට කියන්නම්. අනික දෙවැනි පන්තියෙන් සුබ පැතුම් කියලා ලියන්න, හරිද? අමතක කරන්න එපා."

ග්වේන්ගෙන් ද ආරංචි ආවා. ඩැරල්ට සැනසුම් සුසුමක් හෙළිය හැකි ආරංචි. ග්වේන්ගේ පියා මිය ගොස් තිබුණේ නැහැ. ග්වේන් පසුව දැනගෙන තිබුණා. කෙසේ වෙතත් හොඳටම ප්‍රමාද වැඩි වී තිබුණේ නැහැ. ඔහු දිවියේ ඉදිරි කාලය සදාකාලික රෝගියකු වන අතර ග්වේන්ට නිසැකවම රැකියාවක් සොයා ගැනීමට සිදුව තිබුණා. එමෙන්ම ඇය හොඳින් එය කිරීමට සිතාගෙන සිටියා.

'අම්මා තමයි අමාරු.' (ග්වේන් ලියා තිබුණා.) 'එයා අඬනවාමයි වැඩේ. මේක මට සිද්ධ නොවුණා නම් මමත් එයා වගේ කෙනෙක් වෙන්න තිබුණා. ඔයා, ඩැරල්, නැතිනම් සැලී, විල් හෝ ක්ලැරිසා වගේ ශක්තිමත් හිතක් ඇති ධෛර්ය සම්පන්න කෙනෙක් වෙන්න කවදාවත් මට බැරි වෙයි. ඒත් මම හිටියා වගේ ආත්මාර්ථකාමී, දුර්වල කෙනෙක් වෙන්නේ නැහැ. බලන්න... කොහොම වුණත් තවම ප්‍රමාද වැඩි නැහැ. ඒකෙන් මම හුඟාක් වෙනස් වුණා. මට දැනෙන්නේ මට තවත් අවස්ථාවක් දීලා වගේ.

අනේ... අනේ... මට ලියන්න. මට නිතරම මැලෝරි ටවර්ස්වල ඔයාලා හැමෝම මතක් වෙනවා. මම දන්නවා ඔයාලා කාටවත් මාව මතක් වෙන එකක් නැහැ. ඒත් ඉඳලා හිටලා මට ලියුමක් එවන්න.

පන්තියේ හැමෝටම සුබ පතනවා.

ග්වේන්.'

ඩියනා ඇත්තෙන්ම ආපසු ලිපියක් ලිව්වා. ඈ එය එක්වරම තැපැල් කළා. ඩැරල් සතුටින් සිටි අතර ප්‍රීතිමත් අනාගතයකට අත වනමින් සිටි ඇයට එම ප්‍රීතියෙන් බිඳක් ග්වේන්ගේ නීරස දුක්මුසු ජීවිතය සමග බෙදා හදා ගැනීමට හැකි වුණා. සැලී ද ලිපියක් ලියූ අතර මේරි ලෝව් ද ලිව්වා. විල් හා ක්ලැරිසා ඔවුන් සරත් සෘතුවේදී

ආරම්භ කරන අශ්ව පාසලේ ඉස්තාලවල ඡායාරූප යැව්වා.

දැන් සැබෑවටම අවසාන වාරය නිමාවට ඇදෙමින් තිබුණා. කබඩ් හා රාක්ක පිළිවෙළ කිරීම ආරම්භ වුණා. හය පන්ති පාඩම් කාමරවල තිබූ පෞද්ගලික බඩු බාහිරාදිය නිවෙස්වලට යැවුණා. සොල්දරයේ වූ ට්‍රන්ක පෙට්ටි බිමට ගැනුණා. වාර අවසාන දිනවලදී ඇසෙන සුපුරුදු හඬ නැවත ඇරඹී තිබුණා. බෙලින්ඩා ඇගේ අවසාන 'එරවිල්ල' ඇන්ද අතර අයිරින් ඇගේ අවසාන තාලය මිමිනුවා. වාරය අවසානයට පැමිණ තිබුණා.

# 23

"අවසාන දවස, ඩැරල්." සැලී කීවේ අවසානම දින උදයේ ඔවුන් අවදි වූ පසුවයි. "දෙවියන්ට ස්තුති වෙන්න හොඳට ඉර පායලා බබළනවා. වැහි දවසක පිටත් වෙලා යන එක ඉවසන්න බැහැ."

"අපේ අවසාන දවස." ඩැරල් කිව්වා. "ඔයාට පළමු දවස මතකද, සැලී? මීට අවුරුදු හයකට ඉස්සර. අපි කුනිස්සෝ වගේ අවුරුදු දොළහේ පොඩි උන්. ෆෙලිසිටිට, ජූන්ට වඩා කුඩයි. කාලය ඉගිලිලා ගිහින් තියෙන හැටි...!"

උදය කෑමෙන් පසුව අවසාන දිනයේ උද්‍යෝගිමත් කඩිමුඩිය ආරම්භ වුණා. කිසිවෙකු කිසිදින කලබල වී හෝ අවුල් සහගතව සිටිනු නොදැක තිබූ ග්‍රේලින් මහත්මිය හැර පාසලේ සිටි අයගෙන් ශාන්තව සිටි එකම කෙනා නේවාසිකාගාර පාලිකාව පමණයි. සුපුරුදු පරිදි මම්සලී කේන්තියෙන් තොරව සතුටින් ඉපිල සිටියා. පොට්ස් ගුරුතුමිය පළමු පන්තියේ ඒවා මේවා මොනවා හෝ නැති කර ගත් අය සමග යුහුසුළුව සිටියා.

බොහොමයක් ට්‍රන්ක පෙට්ටි කල් ඇතිව පිටත් කර යැවූ අතර මෝටර් රථවලින් රැගෙන යන ඒවා පාසල් මාවතේ පසෙක ගොඩ ගසා තිබුණා. නඩත්තු වැඩ භාර ගත් පොප්, හාවෙකු මෙන් එහේ මෙහේ දුවමින් ඉතා බරැති ට්‍රන්ක පෙට්ටි ඔහුගේ පුළුල් උරහිස මත තබාගෙන ගියේ ඒවා රාත්තලක් දෙකක් බර ඒවා ලෙසයි. පාසල් මාවතට ප්‍රථමව පැමිණි මෝටර් රථය නළාව හැඬෙව්වා. තම දෙමව්පියන්ගේ රථය දැක තැති ගත් තුන්වන පන්ති දැරියක් තරප්පුවේ ඉහළ සිට පහළටම පෙරළී යන්න ආසන්න වී බියෙන් කෑ ගැසුවා.

"අපොයි...!" කී මම්සලී ඇයව අල්ලා ගත්තා. "මේ විදිහටද තරප්පු බහින්නේ? හැම තිස්සේම ඔයා ඕනෑවට වැඩිය කලබලයි, හැරියට්...!"

"තටාකය ළඟට එන්න, සැලී." ඩැරල් කිව්වා.

තද බෑවුම් සහිත මාවතේ ගිය ඔවුන් ඉඳහිට ගල්පර වසා නැගී විත්

තටාකයට වැටෙන රැලිවලින් වැසී යන, හිරු එළියට තැන් තැන් දිලිසෙන දඟකාර ජල කඳ දෙස බලාගෙන තටාකය පසෙක සිටගෙන සිටියා.

"අපි මෙතන විනෝද වෙලා තියෙනවා." ඩැරල් කිව්වා. "දැන් අපි යමු රෝස උයනට."

එහි ගිය ඔවුන් කාන්තිමත් රෝස මල් සමූහයක් දෙස බලා සිටියා. දෙදෙනාම නිහඬව ඔවුන් ආදරය කර තිබූ ස්ථානවලට ආයුබෝවන් කියමින් සිටියා. ඔවුන් පළමු පන්තියේ සිට හය පන්තිය දක්වා වූ පොදු කාමරවලට යමින් ඒ සෑම එකකම සිදු වූ දේවල් සිහිපත් කරමින් සිටියා. කෑම කාමරයට එබී බැලූ ඔවුන් සෑම පන්ති කාමරයකටම එබුණා. ඔවුන් මොන තරම් විනෝද වී තිබුණා ද? ඔවුන් තවත් මොන තරම් විනෝද වෙන්න යනවා ද?

"අද අපි ආපස්සට හොඳ බැල්මක් දාමු. ඊට පස්සේ අපි ඉදිරියට ඇස් යොමු කරමු." සැලී කිව්වා. "විශ්වවිද්‍යාලය මීට වඩා විනෝදයි කියලා හැමකෙනාම කියනවා, ඩැරල්."

ජූන් හා ෆෙලිසිටි හය පන්ති ඇරියන් දෙදෙනා ඒ මේ අත ඇවිදිනු දුටුවා. ජූන් ෆෙලිසිටිට වැලමිටෙන් ඇන්නා.

"අන්න... එයාලා සමු ගන්නවා. එයාලගේ පෙනුම බරපතළ නැද්ද?"

ජූන් දිව ගොස් හය පන්ති ඇරියන්ට එක් වුණා.

"හලෝ...!" ඈ කතා කළා. "ඔයාලට එක දෙයක් අමතක වෙලා."

"මොකක්ද?" සැලී හා ඩැරල් ඇසුවා.

"ඔයාලට ආයුබෝවන් කියන්න අමතක වෙලා ඉස්තාලයටයි, දර මඩුවටයි. තව...."

"මේක විකාරයක් නොවෙයි." ඩැරල් කිව්වා. "ඔයාගේ අවසාන දවස එනතුරු ඉන්නකෝ. චූටි ජූන්...!"

"ජූන්ට කිසිම හැඟීමක් නැහැ, නේද ජූන්?" මුල්ලකින් හදිසියේම මතුව ආ ඇලිසියා කිව්වා. "අද මටත් බරපතළ ගතියක් දැනෙනවා. මේ... ඔය පොඩි දෙන්නා, ඔයාලටත් මේ දවස බරපතළ වෙයි."

ජූන්ගේ ඇඩි මවිතයට මෙන් ඇලිසියා ඇගේ උරපතුවලින් අල්ලා ඇගේ දෙනෙතට එබුණා.

"මා වෙනුවෙන් වැඩ කරන්න." ඈ කිව්වා. "තත්ත්වය තවත් ඉහළට ගෙනියන්න...! ඔයා පොරොන්දු වෙනවාද, ජූන්?"

"මම පොරොන්දු වෙනවා." තැති ගත් ජූන් කිව්වා. "ඔයාට... ඔයාට මාව විශ්වාස කරන්න පුළුවන්, ඇලිසියා."

"මමත් පොරොන්දු වෙනවා, ඩැරල්." ෆෙලිසිටි ද එවැනිම හඬකින් කිව්වා. "මම මැලෝරි ටවර්ස් බාල්දු කරන්නේ නෑ. මම තත්ත්වය තවත් ඉහළට ගෙනියනවා."

ඇලිසියා ජූන්ගේ උරහිස් නිදහස් කළා.

"හොඳයි." ඈ කිව්වා. "තත්ත්වය භාර දෙන්න කවුරු හරි කෙනෙක් ඉන්න එක ගැන මට සතුටුයි. සමහරවිට අපේම දුවලා දවසක මේ චාරිත්‍ර ඉදිරියට අරගෙන යයි."

"ඒ වගේම විල්ගෙයි, ක්ලැරිසාගෙයි අසුන් පදින ඉස්කෝලයේ ඉගෙන ගනියි.". සියල්ලෝම හිනා ගස්වමින් ෆෙලිසිටි කිව්වා.

පාසල් මාවතෙන් රථ නළා හඬ වැඩියෙන් නැගෙන්නට වුණා.

"එන්න අපේ ගෙවල්වල උදවිය එන්න ඉස්සර අපිට ලෑස්ති වෙන්න බැරි වෙයි." ඇලිසියා කිව්වා. "ඒ හෝන් කළේ අපේ සෑම් අයියා වගේ. එයා කිව්වා මාව එක්ක යන්න එනවා කියලා."

කැකෑරෙන පිරිස මැදට ඔවුන් ගියා. කොහේ හෝ ගිය කෙනෙකුට මම්සලී හඬ නගා බණිමින් සිටි අතර සූසේන් තමා එතැන නොසිටි බවට කරුණු කියමින් සිටියා. යමෙකුගේ බෑගයකින් වැටුණු බව පෙනුණු පිජාමාවක් ගෙන පොට්ස් ගුරුතුමිය අයිතිකාරිය සොයමින් සිටියා. පාලිකාව කුතුහලයෙන් පළමු පන්ති කුඩා ඇරියක් පසුපසින් දුවමින් සිටි අතර ඒ ඇයි දැයි කිසිවෙකුට සිතාගත නොහැකි වුණා. එය පරණ හුරු පුරුදු අවසන් දින තැති ගත් චකිතය හා ප්‍රීතිය මුසු කඩිමුඩියයි.

"ඩැරල්...! ෆෙලිසිටි...!" හදිසියේම රිවර්ස් මහත්මියගේ කටහඬ ඇසුණා. "මේ තරම් වෙලා මොන ලෝකයක හිටියා ද? අපි මෙතැනට වෙලා වරු ගණනක්."

"ඕ... අපිට ඇහුණේ එහෙනම් තාත්තා හෝන් ගහනවා." ෆෙලිසිටි කිව්වා. "මට හිතාගන්න බැරි වුණා. එන්න ඩැරල්, බෑග් එක ගත්තා ද?"

"ඔව්, මේ මගේ ටෙනිස් පිත්ත." ඩැරල් කිව්වා. "කෝ ඔයාගේ එක?"

ෆෙලිසිටි පිරිස අතරේ අතුරුදහන් වුණා. ඩැරල්ට හාද්දක් දුන් රිවර්ස් මහතා හඬ නගා සිනාසුණා. "අතුරුදහන් වෙන වැඩේ තවමත් කියෙනවා."

"ආයුබෝවන්, ඩැරල්....! අමතක කරන්න එපා මට ලියුම් ලියන්න." ඇලිසියා කෑ ගැහුවා. "ඔක්තෝබරයේදී සෙන්ට් ඇන්ඩෘස්වලදී හමුවෙමු."

ආපසු අඩිය තැබූ ඇය මම්සලීගේ කකුල තදින් පෑගුවා.

"ඕ.... කනගාටුයි, මම්සලී."

"ඔයා හැම තිස්සේම මගේ කකුල පාගනවා." තරමක් අසාධාරණ ලෙස මම්සලී චෝදනා කළා. "ඔයා කැතරින්ව දැක්ක ද? එයා ටෙනිස් පිති අලා ගිහින්."

ෆෙලිසිටි තමාගේ පිති රැගෙන දිව ආවා.

"ආයුබෝවන් මම්සලී. නිවාඩු කාලයේදී නයින්ගෙන් පරිස්සම් වෙන්න. හොඳද?"

"අහාහ්....! නරක කෙල්ල." මම්සලී කිව්වා. "මමත් ඔයා වගේ පිඹිනවා. ස්ස්සූස්....!"

මෙය ග්‍රේලින් මහත්මියව සෑහෙන දුරකට විමතියට පත් කළා. ඒ අසලම සිටි ඈ මම්සලීගේ නපුරු පිඹීම හොඳින්ම දැක ගත්තා. ව්‍යාකූල බවින් වැසී ගිය මම්සලී ඉක්මනින් අතුරුදහන් වුණා. ඩැරල් හඬ නගා සිනාසුණා.

"ඕ... අපොයි... මම මේ අවසාන මිනිත්තුවටත් ආසයි. ඕ... අපි යනවාද තාත්තා...? මම්සලී ආයුබෝවන්. ආයුබෝවන් මැලෝරි ටවර්ස්...!"

"එහෙම නම් ඔබටත් ආයුබෝවන් ඩැරල්... වාසනාවන්...!"

***මැලෝරි ටවර්ස් පාසලේ කතා මාලාව***
***මෙතෙකින් සමාප්තයි...!!***